86 වන කාණ්ඩය
9 වන කලාපය

බ්‍රහස්පතින්ද
1969 අගෝස්තු 21

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

සුරාබද්දු (සංශෝධන) පනත් කෙටුම්පත [තී. 1554] :
පළමුවන වර කියවන ලදී.

විසර්ජන පනත් කෙටුම්පත (1969-70) [හත්වන වෙන් කළ දිනය] [තී. 1554] :
දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදී.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 1749]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 86
இல. 9

வியாழக்கிழமை
21 ஒகஸ்ட் 1969

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

மதுவரி (திருத்தம்) மசோதா [ப. 1554]
முதன்முறை மதிப்பிடப்பட்டது

ஒதுக்கீட்டு மசோதா (1969-70) [ஒதுக்கப்பட்ட ஏழாம் நாள்] [ப. 1554]
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

விஞக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 1749]

Volume 86
No. 9

Thursday
21st August 1969

PARLIAMENTARY DEBATES

(HANSARD)

HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

EXCISE (AMENDMENT) BILL [Col. 1554] :
Read the First time

APPROPRIATION BILL (1969-70) [Seventh Allotted Day] [Col. 1554] :
Second Reading—Debate adjourned

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 1749]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
பிரதிநிதிகள் சபை
House of Representatives

1969 අගෝස්තු මස 21 වන බ්‍රහස්පතින්දා
வியாழக்கிழமை, 21 ஓகஸ்ட் 1969
Thursday, 21st August 1969

පූ. භා. 10 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායක තුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை, மு. ப. 10 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

The House met at 10 A.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Of the hon. Members who have given notice of Questions not a single hon. Member is present. The Answers that have been received from the Ministers will be published as Written Answers.

As regards Question No. 1, three weeks' time and as regards Questions Nos. 3 and 6 three months' time each have been asked for to prepare the answers. The requests are allowed.

එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.
(මිනුවන්ගොඩ)
(திரு. எம். பி. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

You will save half an hour.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

That is not going to help us. We need over nine hours' speaking time today.

කෙටුම්පත් පණත් පිළිගැන්වීම්
சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்
BILLS PRESENTED

සුරා බදු (සංශෝධන) පනත් කෙටුම්පත
மதுவரி (திருத்தம்) மசோதா
EXCISE (AMENDMENT) BILL

"to amend the Excise Ordinance."

පිළිගන්වන ලද්දේ ස්වදේශ කටයුතු ඇමති වෙනුවට, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමති ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන විසිනි. 1969 අගෝස්තු 22 වන සිකුරාදා දෙවන වර කියවිය යුතු යයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

உள்நாட்டு விவகார அமைச்சர் சார்பாக கைத்தொழில், கடற்றொழில் அமைச்சர் கௌரவ டீ. பீ. ஆர். குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1969 ஓகஸ்ட் 22, வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

Presented by the Hon. D. P. R. Gunawardena, Minister of Industries and Fisheries, on behalf of the Minister of Home Affairs; to be read a Second time upon Friday, 22nd August 1969, and to be printed.

විසර්ජන පනත් කෙටුම්පත, 1969-70
ஒதுக்கீட்டு மசோதா, 1969-70
APPROPRIATION BILL, 1969-70

කල් තබන ලද විවාදය නැවත ඇරඹීම පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [අගෝස්තු 2.]

"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු වන්නිනායක.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

ஓகஸ்ட் 2 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிக்கப்படுமாக" [கௌரவ யூ. பி. வன்னிநாயக்க].

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

Order read for resuming Adjourned Debate on Question—[2nd August.]

"That the Bill be now read a Second time."—[*The Hon. Wanninayake.*]

Question again proposed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පූ. භා. 10.2

මෛත්‍රීපාල සේනානායක මයා. (මැද වච්චිය)

(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)

(Mr. Maithripala Senanayeke—Medawachchiya)

ගරු කථානායකතුමනි, ජාතික රජයේ පස්වන නැතහොත් අවසාන අයවැය ලේඛනය ගැන සාකච්ඡා කරන්නට අවස්ථාවක් ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. අයවැය ලේඛනය පිළිබඳ යමක් කියන්නට මත්තෙන්, ඊයේ රාත්‍රි ප්‍රකාශයට පත් වුණු ඉන්දියාවේ ජනාධිපති තරඟයේ ප්‍රතිඵල සම්බන්ධයෙන් අප පක්ෂයේත් විරුද්ධ පාර්ශ්වයේත් ප්‍රීතිය ප්‍රකාශ කරන්නට මම මේ අවසථාව පාවිච්චි කරනවා. එහිදී බහුතර මහජන මතය ජය ග්‍රහනය කිරීම ගැන අප ඉතාමත්ම සන්තෝෂ වෙනවා. අද දින "දවස" පත්‍රයේ කතු වැකියේ කොටස් කිහිපයක් උපුටා දැක්වීමෙන් මේ ජයග්‍රහනය පිළිබඳ අපේ අදහස් පැහැදිලිව ප්‍රකාශ කරන්නට පුළුවන් වෙනවා. ඒ කතුවැකියේ මෙසේ සඳහන් වෙනවා:

"ඉන්දියාවේ ඉරණම පිළිබඳ වරමත් ද පුරා විසි එක් වසරක් සුරතේ දරා සිටි ඉන්දියා ජාතික මහා සංගමයේ වෘද්ධතර පක්ෂය ගත් මතය අනුමත නොකොට, පොදු ජනතා මතය හැටියට තමන් ගත් මගෙහිම අභීතව ඉදිරියට ගමන් කළ ඉන්දිරා ගාන්ධි මැතිනියගේ මනෝරථය සර්වප්‍රකාරයෙන්ම පරිපූර්ණය විය.

එහෙයින් මේ ජයග්‍රහණය වූකලී ගිරිගේම ජය ග්‍රහණයක් නොවේ: පොදු ජනතාවගේ ජයග්‍රහණයකි: පොදු ජන මතය—බහුජන මතය—ගරු කළ ඉන්දිරාගේ අනුවේදනීය වූ අපරාජිත වූ ජයග්‍රහණයකි.

ඉන්දියාවේ බැංකු ජනසතුවෙන් අනතුරුව උදා වූ දේශපාලන අවධානමේදී නියෝජ්‍ය අගමැති පදවියෙන් වියෝ වූ ජාතික සංගමයේ දක්ෂිණාංශයේ පැරැන්නකු වූ මොරාජී දේසායි ප්‍රධාන ඒ පන්තයේ දේශපාලනඥයන් විසින් ඉන්දියා අග මැතිනිය වෙත එල්ල කරන ලද දෝෂාරෝපණ සියල්ලම අල් බොල් සුළඟේ ගසාගෙන ගිය දහසියා බවට පත්වීම මේ ජයග්‍රහණයෙහි දක්නට ලැබෙන අති විශේෂ සිද්ධියකි.

ඉන්දිරා අනුගමනය කළ මේ ක්‍රියා මාර්ගය නිසා භාරතයේ අනාගතය කොමියුනිස්ට් වාදයට බිළි වෙතැයි ජාතික සංගමයේ උග්‍ර දක්ෂිණාංශය කියා සිටිද්දී, මෙය නියම ජනතා සමාජවාදයට හිස නැම්මක් බව බහුතර පක්ෂය කියා සිටි.

කෙසේ වෙතත්, ඉන්දිරා කෙල්ල කාලයේ, 1930 ගේ දී, උපන් දින තෑග්ගක් හැටියට සිය පිය ජවහර්ලාල් නේරු විසින් සිර මැදිරියේ සිර කපොලු අතරින් ඇය වෙත යවන ලද සුබ පැතුම මේ මොහොතේ අපට මතක් වෙයි:

'ඔබ උපන් අවුරුද්ද—1917—ලෝක ඉතිහාසයේ සඳහන් වන ඉතා වැදගත් වර්ෂ අතුරින් එකකි. තම රට වාසී දුක්පත් පීඩිත ජනතාව කෙරේ පතළා වූ ආදරයකින් අනුකම්පාවකින් යුත් මහා වීරයකු තම ජනතාව ලවා කවදාවත් අමතක නොවන සදානුස්මරණීය ඉතිහාසයක පරිච්ඡේදයක් ලිය වූයේ එම අවුරුද්දේ දීයි.

ලෙනින් රුසියාවේ හා සයිබීරියාවේ මුහුණුවර වෙනස් කළ මහා විප්ලවය ආරම්භ කළේ ඔබ උපන් අවුරුද්දේ හරියටම ඔබ උපන් මාසයේයි. සාගින්නෙන් හා දරුඳඩු පාලනයෙන් පෙළෙන ජනතාව ඒ පීඩාවෙන් මුදා සිය රටට නිදහස ලබා දීම සඳහා ජනතා ආදරයකින් අනුකම්පාවකින් හා ඉමහත් වූ ආත්ම පරිත්‍යාගයකින් ඉදිරිපත් වී ජනතාව ජාතික සටන සඳහා මෙහෙයවන එබඳුම වීරයෙක් අද අප අතරත් සිටී. ඒ වීරයා මහත්මා ගාන්ධියි. ඒ ආලෝකයේ දියණියක් වූ ඔබ නොබා නොසැළී නොඇඹරී මේ වීර සටනේ වීර සෙබලෙක් විය යුතුයි.' "

එම ප්‍රාර්ථනය ඊයේ ඇති වුණු ජනාධිපති තරඟයෙන් සාර්ථක වුණාය කියා විශේෂයෙන්ම මේ රටේ පොදු ජනතාව වෙනුවෙන් අපට සන්තෝෂ වන්නට පුළුවන් බව මා මතක් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, මීට ප්‍රථම කථා කළ මේ පැත්තේ සිටින ගරු මන්ත්‍රීවරුන් සමග අපේ සංතෝෂය ගරු මුදල් ඇමතිතුමාට පුද කරන්න සතුටුයි, නොකඩවාම අවුරුදු පහක් මෙම ආණ්ඩුවේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමට එතුමාට පුළුවන් වීම ගැන. එමෙන්ම මෙම අයවැය විවාදය මෙම ආණ්ඩුවේ අවසාන අයවැය විවාදය බව මතක් කරන අතරම, එය මෙම ආණ්ඩුවේ අවසානම අයවැය විවාදය වේවායි අප ප්‍රාර්ථනා කරනවා.

අවුරුදු නවයක පමණ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සභාග ආණ්ඩු දෙකක් තිබුණා. නමුත් පසුගිය මහා මැතිවරණයේදී අප රට ජනතාවගේ අදහස්වල ඇති වුණු යම්කිසි වෙනස් වීමක් නිසා නැතිනම් ඒ ආණ්ඩු පිළිබඳව පැහැදිලි දැනුමක් ඇති නොවීම නිසා, ජයග්‍රහණය නොලැබී ගිය බව, එසේ නැතිනම් මහජනතාව වෙනස් අන්දමට සිය අදහස් ප්‍රකාශ කළ බව අප කවුරුත් දන්නවා. එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙනස් වීම උඩ, මේ රටේ ජනතාවට කොයි අන්දමේ ආණ්ඩුවක්, මහජනතාවට හිත කර ආණ්ඩුවක්, අනාගතයේදී ඇති විය යුතුද යන නිගමනයට බැස ගැනීමට, මෙම අවුරුදු හතරහමාරක පාලනයම ප්‍රයෝජනවත් වී තිබෙනවාය කියා කල්පනා කර අපට එයින් සන්තෝෂ වන්නට පුළුවනි. එම නිසා පරාජය කෙසේ වෙතත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මෙම වෙනස් වීම ගැන අපට සන්තෝෂ වන්න පුළුවනි. ඒ වෙනස් වීම නිසා මේ රටේ තරුණ පරපුර පසුගිය මහා මැතිවරණයේදී ලොකු බලාපොරොත්තුවකින් යුතුව මේ ආණ්ඩුවට සහයෝගය දුන්නත් අනාගතයේදී ඇති වන මැතිවරණයේදී ඒ අයගේ සහයෝගය කොයි පැත්තට ලැබේද යන්න ගැන අපේ සිතේ නම් කිසි සැකයක් නැහැ. එදා අප පරාජයට පත් වුණත් ඒ සම්බන්ධයෙන් කණගාටු වන්නේ නැත කියා ප්‍රකාශ කරන්නේ ඒ නිසයි.

ගරු කථානායකතුමනි, මේ විවාදයට සහභාගි වූ රජයේ ඇමතිවරුන් අතරෙන් ගරු රාජ්‍ය ඇමතිතුමා, එතුමාගේ කථාවේදී කරුණු කීපයක් මේ සභාව ඉදිරිපිට තැබුවා. ඒ කරුණුවලින් වැදගත් එකක් නම් විරුද්ධ පාර්ශ්වයටත්, ආණ්ඩු පක්ෂයටත් එකට එක් වී රටේ දියුණුව සඳහා සාකච්ඡා කිරීමට වැඩිපුර අවස්ථාවන් ලැබෙන්නේ නැත යන්නයි. ඒ නිසා ඒ සම්බන්ධව විශේෂයෙන් යමක් කියන්නට මා බලාපොරෙත්තු වෙනවා. එතුමා ඒ ප්‍රකාශයෙන්, විරුද්ධ පාර්ශ්වයේ සිටින අය වශයෙන් අප ආණ්ඩුව කරන සෑම දෙයක්ම අනුමත කළ යුතුය, සෑම දේම ඒ අය කරන පිළිවෙළට කිරීමට ආධාර කළ යුතුය කියා බලාපොරොත්තු වෙනවා නම් එය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවක් නොවන බවත්, විරුද්ධ පාර්ශ්වයේ සිටින අපට එවැනි සහයෝගයක් දීමට බැරි බවත් පැහැදිලිව ප්‍රකාශ කරන්නට ඕනෑ. පසුගිය අවුරුදු හතරහමාර ඇතුළත මේ රජයේ යම් යම් අමාත්‍යාංශවල ඇති වී තිබෙන දූෂණ ගැන කල්පනා කරන විට, අපට මේ රජයට යම්කිසි සහයෝගයක් දිය හැකි නම් ඒ සහයෝගය වන්නේ, ඒ අමාත්‍යාංශවලින් කෙරෙන දූෂණයන් ගැන සොයා බලන්නට පත් කරනු ලබන පාර්ලිමේන්තු කමිටුවකට ඒ කටයුත්ත කිරීමට දෙන සහයෝගය පමණක් බව ප්‍රකාශ කරන්නට ඕනෑ. අමාත්‍යාංශ කීපයක් ගැන අපට ලැබී තිබෙන ආරංචි අනුව, මේ ගරු සභාවට කරුණු කීපයක් දිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා. පළමුවෙන්ම මා අදහස් කරන්නේ ජනසතු සේවා අමාත්‍යාංශය පිළිබඳව කරුණු කීපයක් ඉදිරිපත් කිරීමටයි.

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම අපි පෙට්‍රල් සංස්ථාව ගැන බලමු. පෙට්‍රල් සංස්ථාව මාගීයෙන් මේ රටේ ඇති කිරීමට තීරණය කර තිබෙන තෙල් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානය ගැන ඉතාමත්ම භයානක ආරංචි රාශියක් අපට ලැබී තිබෙන බව ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. තෙල් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානයක් මේ රටේ ඇති කිරීමේදී, ආර්ථික වශයෙන් පමණක් නොව දේශපාලන වශයෙනුත් යම් යම් අදහස් ඉටු කර ගැනීමට මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා. තෙල් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානයක් මේ රටේ ඇති කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පිටරටට ඇදී යන විදේශ විනිමය විශාල ප්‍රමාණයක් මේ රටේ ඉතිරි කර ගන්නා අතරම, දේශපාලන වශයෙන් පිටරටවලින් ඇති වන බලපෑම්වලට යට නොවී අපේ දේශපාලන නිදහස ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළක් සඳහා අත්තිවාරම් දමා ගැනීමටත් ඒ මගින් හැකි වේය කියා මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා. එහෙත් අද ඇති වී තිබෙන තත්ත්වය කුමක්ද?

1965 දී අප ආණ්ඩුව භාර දෙන විට තෙල් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානය සඳහා ටෙන්ඩර් කැඳවා තිබුනා. අපට එදා උපදෙස් දුන් විශේෂඥයන්ගේ අදහස් අනුව අප බලාපොරොත්තු වුණේ වෙළඳ හුවමාරු අනුව ලෝකයේ ඕනෑම රටකින් අමු තෙල් ලබාගෙන අපේ තෙල් පිරිසිදු කිරීමේ මධ්‍යස්ථානයේ දී ඒ අමු තෙල් පිරිසිදු කිරීමටයි. උපදෙස් ලබා ගැනීම සඳහා අපි එදා යොදා ගෙන හිටියේ ප්‍රංශ කොම්පැනියක්. ඒ සඳහා ප්‍රංශ කොම්පැනියක් යොදා ගැනීමට එදා අපි තීරණය කළේ ලෝක බලවතුන් දෙගොල්ලක් හැටියට සැලකෙන අමෙරිකාවට හෝ නැගෙනහිර යුරෝපීය රටවලට හෝ පක්ෂ නොවී මධ්‍යස්ථ විය යුතු යයි කල්පනා කිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසයි. ඒ නිසා මේ කාර්යයේදී අපට අවවාද අනුශාසනා නැත්නම් "කොන්සල්ටන්ට්ස්" වශයෙන් ක්‍රියා කිරීම සඳහා ප්‍රංශ කොම්පැනියක් තෝරා ගෙන අපි ඒ කටයුත්ත කර ගෙන ගියා. ඒ අනුව ඒ අයගේ උපදෙස් උඩයි එදා ටෙන්ඩර් ප්‍රසිද්ධ කර තිබුණේ. එහෙත් මේ රජය බලයට පත්වීමෙන් පසුව කළ පළමු වැනි කටයුත්ත කුමක්ද? අර විශේෂඥයින් අස් කර දමා නැවත වරක් මේ රටේ ආර්ථික බලයටත් නිදහසටත් පහර වදින්නට පුළුවන් වන අන්දමට, අමෙරිකන් තෙල් කොම්පැනිකාරයින්ගේ උපදෙස් අනුව, ඔවුන්ගේ උපදේශක මණ්ඩලයකටයි මේ විශාල කර්මාන්තය සඳහා අවවාද අනුශාසනා දීමේ කටයුත්ත බාර දුන්නේ. ඒ අයගෙන් ලැබුණු උපදෙස් මොනවාද? කලින් තීරණය කර තිබුණු වැඩ පිළිවෙළට පටහැනිව තෙල් ගැනීම මැද පෙරදිග රට වල් කීපයකින් පමණක් කළ යුතු වන අන්දමේ කර්මාන්ත ශාලාවක් තමයි දැන් අපට ලැබී තිබෙන්නේ. ඒ නිසා සිදු වන්නේ කුමක්ද? අපේ තේ රබර් පොල් වැනි ද්‍රව්‍යයන් විකුණා අමු තෙල් ලබා ගැනීමට කලින් තිබුණු වෙළඳ ගිවිසුම් වෙළඳ පහසුකම් ආදිය මේ නිසා නැති වී ගොස් තිබෙන බව කියන්නට පුළුවන්. මේ රජය තෙල් පිරිසිදු කිරීමේ කර්මාන්ත ශාලාවේ වැඩ කටයුතු කරගෙන යන්නට අදහස් කරන්නේ අන්න එවැනි උපදෙස් අනුවයි.

ගරු කථානායකතුමනි, ඒ උපදෙස් අනුවම කරගෙන යන මේ තෙල් පිරිසිදු කිරීමේ කර්මාන්ත ශාලාවේ වැඩ නිමා කිරීම මාස 6 කින් ප්‍රමාද වී තිබෙනවා. ඒ ප්‍රමාදය ඇති නොවුණා නම් මාසයකට රුපියල් කෝටි 1.8 ක ලාභයක් විදේශ විනිමය වශයෙන් අපට ලබා ගැනීමට පුළුවන්කම තිබුණා. ඒ නිසා ඒ ප්‍රමාදය හේතු කොටගෙන මාසයකට කෝටි 1.8 ක විදේශ විනිමයක් වියදම් කරන්නට අපට සිදු වී තිබෙනවා. අපට ඒ පාඩුව විඳින්නට සිදු වී තිබෙන්නේ මේ උපදේශක මණ්ඩලයේ අවවාද අනුව ක්‍රියා කිරීම නිසයි. එමෙන්ම ලෝක වෙළඳ පොළෙන් අමු තෙල් ගන්නට සකස් කර තිබුණු වැඩ පිළිවෙළ වෙනස් කර ඒ සඳහා රටවල් කීපයකින් පමණක් ඇනවුම් කැඳෙව්වා. එදා ටෙන්ඩර් බාර ගත් ඉතාලි කොම්පැනියට මේ කර්මාන්ත ශාලාව ඉදි කිරීමේ කාර්යය බාර දෙන විට නැත්නම් ටෙන්ඩර් ප්‍රසිද්ධ කර ඇනවුම් කැඳවූ අවස්ථාවේ එහි තිබුණු එක කොන්දේසියක් තමයි කර්මාන්ත ශාලාව හදන කොම්පැනියම එම කර්මාන්ත ශාලාව පවත්වා ගෙන යෑමට අවශ්‍ය වන ඉංජිනේරුවන් සහ කාර්මිකයින් පුහුණු කිරීමේ කටයුත්තත් කළ යුතුය යන්න. එහෙත් මේ රජයේ වැඩ පිළිවෙළ අනුව එක කොම්පැනියක් කර්මාන්ත ශාලාව හදන අතර එය පවත්වා ගෙන යෑමේ කටයුත්ත තවත් කෙනෙකුට පවරනවා. ඒ නිසා සිදු වී තිබෙන්නේ කුමක්ද? කර්මාන්ත ශාලාව ආරම්භ කිරීමේ පළමු වැනි පස් පිඬල්ලේ සිටම ඒ කර්මාන්ත ශාලාවේ වැඩ කටයුතු ගැන දැනුමක් ලබා ගැනීමට අපේ කාර්මිකයින්ට තිබුණු අවස්ථාව සම්පූර්ණයෙන්ම නැති වී ගොස් තිබෙනවා. ගරු ඇමතිතුමාගේ නැත්නම් මේ රජයේ අනුමැතිය ඇතිව ද මා දන්නේ නැහැ, මේ සංස්ථාව අද නැවත වරක් මේ රටේ තෙල් කොම්පැනි ජනසතු කිරීමේ පියවරට විරුද්ධවත් මේ රටේ නිදහසට විරුද්ධවත් මේ රටේ ආර්ථික දියුණුවට විරුද්ධවත් ඇඟිලි ගැසීමට අවස්ථාවක් ෂෙල් කොම්පැනිය වැනි ආයතනවලට සලසා දී තිබෙනවාය කියා අපට කියන්නට සිදු වී තිබෙනවා. අද මේ කර්මාන්ත ශාලාව පාලනය කිරීමේ වැඩ පිළිවෙළ යටතේ ෂෙල් කොම්පැනියයි නැවත වරක් සම්පූර්ණ බලය ලබා තිබෙන්නේ.

ඊළඟට මොකක්ද සිදු වුණේ? අමු තෙල් සැපයීම දැන් ඒ කොම්පැනියට බාර දී තිබෙනවා. වෙන රටවල් නම් තෙල් සම්බන්ධයෙන් හය මාසයක කාලයකට වැඩි කාලයක් සඳහා බල පවත්වන ගිවිසුම් අත්සන් කරන්නේ නැහැ. එහෙත් මේ ආණ්ඩුව ෂෙල් කොම්පැනියත් සමග අවුරුදු පහක් බලපවත්වන ගිවිසුමකට අත්සන් කර තිබෙනවා. ලෝක වෙළෙඳ පොළේ අමු තෙල් මිළ නිතරම ඉහළ පහළ යන තත්ත්වයක් තිබෙන නිසා අනෙක් රටවල් හය මාසයකට වැඩි කාල සීමාවක් තුළ බලපවත්වන ගිවිසුම්වලට එළඹෙන්නේ නැහැ. තේ, රබර්, පොල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන ද්‍රව්‍ය විකුණා අපට වුවමනා දේ ලබා ගැනීමට තිබුණු එකම ආයුධය—ආර්ථික ප්‍රශ්න විසඳා ගන්නට තිබුණු එකම ආයුධය—වන වෙළෙඳ හුවමාරුව නැති වී ගොස් තිබෙනවා. රුපියල් කෝටි 50 ක් පමණ වැය කර තෙල් ලබා ගැනීමටයි, අද අපට සිදු වී තිබෙන්නේ. අලුත් වැඩ පිළිවෙළ නිසා අපට මුහුණ පාන්නට සිදු වී තිබෙන තත්ත්වය ඒකයි. තෙල් ටොන් එකක් සඳහා ඇමෙරිකානු ඩොලර් 1 කුත් ශත 41 ක් ගෙවන්නට අපේ තෙල් සංස්ථාව තීන්දු කරගෙන සිටිනවා. එහෙත් අද ඉන්දියාව පවා තෙල් ගන්නේ ඩොලර් 1 කුත් ශත 28 කට පමණයි. එහෙත් එළඹී ඇති ගිවිසුම අනුව අපට රුපියල් ලක්ෂ 20 ක පාඩුවක් ලබන්නට අපට සිදු වී තිබෙනවා.

ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)
(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)
(Mr. Leslie Goonewardene—Panadura)
ඔකෙන් කොමිස් එකකුත් ලැබෙනවාද ?

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)
රුපියල් කෝටි 50 ක තෙල් ගැනීමේදී කොමිස් වශයෙන් දශම 5 ක් ලැබුණත් විශාල ජාවාරමක් ගෙන යන්නට ඉඩ තිබෙන බව අපට හිතා ගන්නට පුළුවනි.

ගරු කථානායකතුමනි, තෙල් පිරිසිදු කිරීමේදී බන්කර් තෙල්, ලාම්පු තෙල්, පැට්‍රල් යනාදිය සම්බන්ධයෙන් ක්‍රියා කරන්නට එදා තීන්දු කර ගෙන තිබුණා. එහෙත් අද වැඩිපුරම කරන්නේ මොකක්ද ? බන්කර් තෙල්—නැත්නම් නැව්වලට වුවමනා කරන තෙල්—එසේ නැත්නම් එන්ජින් දුවවන්නට වුවමනා කරන තෙල් වැඩිපුර නිෂ්පාදනය කිරීමට ක්‍රියා කිරීමයි. මෙතෙක් කල් ෂෙල් කොම්පැනිය වැනි කොම්පැනි පිටරටින් ගෙනැවිත් බන්කර් තෙල් විකුණුවා. දැන් මෙහි නිපදවන බන්කර් තෙල් ශත 8 ක් අඩුවෙන් ෂෙල් කොම්පැනියට දෙන්නට තීන්දු කරගෙන සිටිනවා. ශත 8 ක් අඩුවෙන් ෂෙල් කොම්පැනියට දී ලෝක වෙළෙඳ පොළේ පවතින මිළට අමු තෙල් ගන්නට අපට සිදු වෙනවා. මෙය සැලකිය යුතු කාරණයක්. මේ රටේ ආර්ථික හා දේශපාලන නිදහසට ලොකුම රුකුලක් වන මෙවැනි කර්මාන්ත ශලාවක් ඇති කර බන්කර් තෙල් විකිණීමේ සම්පූර්ණ අයිතිය සංස්ථාව අත තබා නොගත්තේ මන්දැයි මේ අවස්ථාවේදී අපට ප්‍රශ්න කරන්නට සිදු වී තිබෙනවා. මෙයින් අපට රුපියල් කෝටියක පාඩුවක් සිදු වෙනවා. ස්පාඤ්ඤය, ඉතාලිය, බටහිර ජර්මනිය, එංගලන්තය හා ජපානය වැනි රටවල් පවා මෙසේ අමු තෙල් ගැනීමේදී වෙළඳ ගිවිසුම් ඇති කර ගන්නවා. එපමණක් නොව එවැනි ගිවිසුම් ඇති කර ගැනීමේදී ණයට දීමත් කොන්දේසියක් වශයෙන් ඇතුළත් කර ගැනීමට ජපානය වැනි රටවල් කටයුතු කර තිබෙනවා.

ඒ කර්මාන්තශාලාවත් සමඟම පෝර කර්මාන්තශාලාවකුත් ඇති කිරීමටයි, අප වැඩ පිළිවෙළ සකස් කර තිබුණේ. අද වන තුරු ඒ වැඩ පිළිවෙළ අවසාන කර නැහැ. එම නිසා, තෙල් පිරිපහදු කම්හලේ අතුරු නිෂ්පාදනයක් වන "නැප්තා" නමැති ද්‍රව්‍ය ටැංකිවලට එකතු කොට පිටරට පටවන්නටයි, දැන් සිදු වී තිබෙන්නේ. අපේ වැඩ පිළිවෙළ මේ වන විටවත් නිම කොට තිබුණා නම් එයින් පෝර නිෂ්පාදනය කරන්නට පුළුවන්කම තිබුණා. මේ "නැප්තා" එක්රැස් කොට තැබීම සඳහා ටැංකි හැදීමට එක්තරා කොම්පැණියකට—මා හිතන හැටියට "බෝනාස්" කොම්පැණියට—කොන්ත්‍රාත් දී තිබුණා. අත්හදාබැලීමක් වශයෙන් ඒ ටැංකිවලට වතුර පිරවූ අවස්ථාවේදී ටැංකි ඇල වුණාලු. එසේ ඇල වන්නට හේතුව ඒවායේ පදනම ශක්තිමත් නොවීමයි. මෙවනි අක්‍රමිකතාවන් සොයා බලා ඒවාට යෙදිය යුතු ප්‍රතිකර්ම පෙන්නා දීමට නම්, රාජ්‍ය ඇමතිතුමා ඉල්ලූ පරිදි විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය දීමට සැම අවස්ථාවකදීම අප සූදානමින් සිටින බව මතක් කරන්නට කැමැතියි. බලන්න කථානායකතුමනි, එක දෙයක් සම්බන්ධයෙන් පමණක් කොතෙකුත් චෝදනා ඉදිරිපත් කරන්නට අපට සිදු වී තිබෙනවාද කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දී ඇති කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ඉතා මත් භයානක, කණගාටුදායක ආරංචි අපට ලැබී තිබෙනවා. මා දන්නා තරමින්, සපුගස්කන්දේ තෙල් පිරිපහදු කම්හල දක්වා අමු තෙල් ගෙන යන පයිප්ප ඇම්මට රුපියල් 50,00,000 ක කොන්ත්‍රාත්තුවක් දී තිබෙනවා. කලින්, කොන්ත්‍රාත්තුව දී තිබුණේ අඟල් 44 ක් විෂ්කම්භය ඇති පයිප්ප ඇම්ම සඳහා නමුත් එය ප්‍රමාණවත් නැති නිසා අඟල් 88 ක් විෂ්කම්භය ඇති පයිප්ප ඇමිය යුතු යයි සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු නියෝග කර තිබෙනවා. වුවමනාය කී ප්‍රමාණය එසේ දෙගුණ කිරීම නිසා අර කොන්ත්‍රාත්තුව භාර ගත් කොම්පැණියට කලින් පොරොන්දු වූ මුදල මෙන් දෙගුණයක් ගෙවන්නට අන්තිමේදී සිදු වුණා. මේ විධියටයි, ඔය සංස්ථාවේ වැඩ කෙරෙන්නේ.

මා දැන් සඳහන් කරන්නට යන කාරණය සම්බන්ධයෙන් නම්, එක්තරා විධියකින් බලන විට ඇමතිතුමාට දොස් කියන්නට බැහැ. ඒ ඇමතිතුමා තමාගේ ඡන්දදායක කොට්ඨාශයේ උදවියට හොඳින් සලකන බව ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් හොඳහැටි දන්නවා. එතුමා ඉල්ලුම් පත්‍ර කැඳවීමක්වත් නොකර 55 දෙනකුට රැකීරක්ෂා සපයා දී තිබෙනවා. ජූලි මාසෙ 1 වෙනිදා සිට අගෝස්තු මාසෙ 16 වෙනිදා වන විට අපේ ඇමතිතුමාගේ කොට්ඨාශයෙන් නම් 55 ක් අරගෙන තිබෙනවා. ඒ සියලු දෙනාම ජම්පටා වීදිය සහ ඒ අසළ අය විශයෙනුයි පෙනී සිටින්නෙ. ඒකයි පුදුමය. අපි ඇමතිතුමාට ප්‍රසංශා කළ යුතුයි එතුමාගේ කොට්ඨාශයේ රැකී රක්ෂා ප්‍රශ්නය නම් දැන් විසඳී තිබීම ගැන. කථානායකතුමනි, මෙහි නම් 55 ක් තිබෙනවා. එය සම්පූර්ණයෙන් කියවීමට කාලය ගත වන නිසා එම නම් ලැයිස්තුව හැන්සාඩ් වාර්තාවේ පළ කිරීම පිණිස මා එය සභාමේසය මත තබන අතර ඊට තමුන්නාන්සේගේ අවසරය ලැබෙනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා:

සභාමේසය මත තබන ලද ලැයිස්තුව මෙසේයි:

சபாபீடத்தில் வைக்கப்பட்ட நிரல் வருமாறு

The list tabled is as follows:

1.	M. Gunasena, 77/38, Jampettah St. Kotahena	Asst. Sec. Officer
2.	S. A. Navaratne, 89/169, Jampettah St. Kotahena	Labourer
3.	M. Dharmalingam, 89/42, Jampettah St. Kotahena	do.
4.	H. Shelton Jayatissa, 19, Jampettah St. Kotahena	do.
5.	V. Ramachandran, 151/13, Jampettah St. Kotahena	do.
6.	H. A. M. Premaratne, 43/34, Jampettah St. Kotahena	do.
7.	W. Newton Perera, 43/17, Jampettah St. Kotahena	do.
8.	E. Nandasiri, 7/43, Jampettah St. Kotahena	do.
9.	A Joseph, 217/89, Jampettah St. Kotahena	do.
10.	R. A. Dharmaratne, 115/121, Sri Gunananda Mawata, Kotahena	do.
11.	M. L. D. A. Prematilaka, 115/210, Sri Gunananda Mawata, Kotahena	do.
12.	J. Ferandopulle, 115/216, Sri Gunananda Mawata, Kotahena	do.
13.	P. A. Karunadasa, 134, Sri Gunananda Mawata, Kotahena	do.
14.	L. Ananda, 115/206, Sri Gunananda Mawata, Kotahena	do.
15.	Anton de Silva, 115/209, Sri Gunananda Mawata, Kotahena	do.
16.	B. G. D. Padmasiri, 115/30, Sri Gunananda Mawata, Kotahena	do.
17.	H. Shelton Rodrigo, 75/7, Galpotta Rd. Kotahena	do.
18.	M. K. W. Chandrasiri, 75/1, Galpotta Rd. Kotahena	do.
19.	M. M. Wijedasa, 11/9, Galpotta Rd. Kotahena	do.
20.	W. H. Ratnasoma, 75/9, Galpotta Rd. Kotahena	do.
21.	P. A. C. Jayasekera, 21/2, Galpotta Rd. Kotahena	do.
22.	K. K. J. Weerasinghe, 75/7, Galpotta Rd. Kotahena	do.
23.	T. L. G. Wijeratne, 75/8, Galpotta Rd. Kotahena	do.
24.	A. M. F. Ameer, 218, Modera St. Colombo 15	Asst. Sec. Officer
25.	M. L. E. Perera, 98/7, Walls Lane, Modera	do.
26.	W. P. P. A. Perera, 125, St. Andrew Place, Modera	Labourer
27.	W. M. C. B. Perera, 135, St. Andrew Place, Modera	do.
28.	W. A. D. Gunasena, 33/5, Kotahena St. Kotahena	do.
29.	T. H. P. Martinus, 33/3, Kotahena St. Kotanena	do.
30.	K. D. S. Ariyawansa, 73, 7th Lane, St. Benedict Rd. Kotahena	Asst. Sec. Officer
31.	M. M. Fernando, 82/1, Rajamalwatte Rd. Colombo 15	do.
32.	E. J. de Silva, B3-F33, Bloemendhal Flats, Kotahena	do.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

33.	Miss E. A. C. Perera, 69, 4th Lane, Kotahena	Typist
34.	E. V. B. Rosiora, 217, Skinners Rd. North, Kotahena ..	Asst. Sec. Officer
35.	U. K. M. D. Perera, 42, Nagalagam St. Colombo 14	do.
36.	M. P. S. Sahabdeen, Sri Kadiresan St. Kotahena	do.
37.	A. S. Ardihetti, 47, Blomendhal Rd. Kotahena	do.
38.	C. M. Anthony, 76/3, St. James St. Colombo 15	Driver
39.	G. M. Dayananda, 28/27, Barber St. Kotahena	do.
40.	S. S. Wignarajah, 120, St. Joseph St. Colombo 14	
41.	M. W. Sahul Hameed, 389, Grandpass Rd. Colombo 14 ..	Dispenser
42.	A. R. Ranasinghe, 440, Grandpass Rd. Colombo 14	Fireman
43.	B. D. Perera, 1/18, Pickerings Rd. Kotahena	Labourer
44.	M. J. Junaid, 112, Muthuwela Mawata, Colombo 15	Driver
45.	M. J. Douglas, 173/11, Wolfendhal St. Colombo 13	do.
46.	C. Nagaleswarau, 34/5, Moobey Lane, Colombo 15	Sales Supervisor
47.	K. A. S. Jayasiri, 41/7, Sumithrarama Mawata, Kotahena ..	Labourer
48.	K. K. Premadasa, 47/39, Sumithrarama Mawata, Kotahena ..	de.
49.	H. D. Dharmadasa, 129/9, Gintupitiya St. Colombo 13 ..	Driver
50.	W. Wimalasena, 128/46, Gintupitiya St. Colombo 13.. ..	Labourer
51.	D. N. K. S. Nanayakkara, 217/65, Church Lane, Colombo 15 ..	do.
52.	D. Douglas Fernando, 33/57, Modera St. Colombo 15 ..	do.
53.	K. M. A. Clarence Perera, 25, Madampitiya Rd. Colombo 15 ..	do.
54.	Shelton Orr, 60/6, Ratnam Rd. Colombo 13	do.
55.	N. P. S. Wickremarachchi, 333, Ferguson Rd. Mattakkuliya ..	do.

මෛත්‍රීපාල සේනානායක මයා.

(திரு. மைத்திரிபால சேனநாயக்க)

(Mr. Maithripala Senanayeke)

මෙම නම් ලැයිස්තුවේ තිබෙන්නේ කිසිම ඉල්ලුම්පත්‍ර කැඳවීමක් නැතුව, මෙම ජූලි මාසෙ 1 වෙනිදා සිට අගෝස්තු මාසෙ 16 වෙනිදා දක්වා අතරතුර කාලයේදී බඳවා ගත් අයගේ නාමයි. මෙම සංස්ථාවෙ වැඩ කෙරෙන්නේ ඔන්න ඔය විධියටයි. ඉල්ලුම් පත්‍ර කැඳවීමක් නැහැ. ලැයිස්තුව අරිනවා. එවිට ක්‍රියාකාරී අධ්‍යක්ෂක අණ දෙනවා. මා හිතන්නේ ගරු ඇමතිතුමාත් දන්නවා ඇති, එහි "වර්කිං ඩිරෙක්ටර්" කෙනෙක් සිටි බව. මේ "වර්කිං ඩිරෙක්ටර්" අර නම් ලැයිස්තුවෙ නම් ලබාගෙන ඒ අය සොයා ගොස් මුදල් කොල්ල කාගන්නවා. එය සී. අයි. ඩී. එකටත් භාර දී දැන් නඩුවක් ඇමීමට පවා කටයුතු සලස්වා තිබෙනවා. ඔන්න ඔය විධියටයි එම සංස්ථාවෙ කටයුතු කෙරීගෙන ගියේ.

මෙම සංස්ථාව සම්බන්ධ කාරණය අවසන් කරන්න කලින් විශේෂයෙන් ඉදිරිපත් කළ යුතු තවත් කරුණක් තිබෙනවා. එනම් මෙවැනි ලොකු කර්මාන්ත ශාලාවක් ඉදි කරන අවස්ථාවේදී මුල සිටම —කර්මාන්තශාලාව ඉදි කිරීමට පළමුවෙනි පස් පිඩැල්ල කපන අවස්ථාවේ සිටම—එම කර්මාන්තශාලාවට අවශ්‍ය ඉංජිනේරු මහත්වරුන් සහ අනෙකුත් කාර්මික මහත්වරුන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් ප්‍රතිපත්තියක් වශයෙන් එදා තිබුණා. එහෙත් එම වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අත හැර දමා අද ෂෙල් කොම්පැනියට භාර දී තිබෙනවා. ඒ නිසා තමයි මෙවැනි ප්‍රශ්න ඇති වී තිබෙන්නේ.

කොන්ත්‍රාත්කරුවකු විසින් කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම පමණක් භාරගෙන ඒ කටයුත්ත අවසන් කළාට පසුව එය භාර දී යනවා. ඒ පිළිබඳව ඔහුගේ වගකීම් එතැනින් ඉවරයි. එහෙත් අපි ටෙන්ඩර් කැඳවන කාලයේදී කොන්දේසියක් ඇතුළත් කර තිබුණා, කර්මාන්ත ශාලාවක් සාදා අවුරුදු ගණනක් එය නඩත්තු කර ඊට අවශ්‍ය නිලධාරීන්ද පුහුණු කර දීමට. අපේ කොන්ත්‍රාත්තු දීමේ විශේෂ ලක්ෂණයක් වූයේ ඒකයි. එහෙත්, අද එය සම්පූර්ණයෙන්ම කඩා බිඳ දමා තිබෙනවා. එක් කෙනෙක් හදනවා; එක් කෙනෙක්, නැත්නම් තවත් කොටසක් පාලනය කරගෙන යනවා. අන්තිමේදී, කවදා නමුත්, ලාංකිකයන් එය භාර ගන්න අවස්ථාව වන විට ඒ කර්මාන්තය කවර තත්ත්වයකට පත් වී තිබෙනු ඇද්දැයි කියන්නට අමාරුයි. අන්න ඒ විධියේ තත්ත්වයකයි අද කර්මාන්තශාලා තිබෙන්නේ. මේ ගැන විශේෂයෙන් සොයා බලා ක්‍රියා කළ යුතුයි. අපට දක්ෂ කාර්මිකයන් ඉන්නවා; දක්ෂ ඉංජිනේරු මහත්වරු ඉන්නවා. ඒ අයට මේවා ඉදිරියට ගෙන යැමද, අවශ්‍ය පුහුණුව ලැබෙන ආකාරයට වැඩ පිළිවෙළ වෙනස් කළ යුතු බවයි මා ඉතාක් කරන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

ඊළඟට, කර්මාන්ත හා ධීවර ඇමතිතුමාගේ කටයුතු ගැන යමක් කියන්නට සිදු වී තිබෙනවා. අද මේ රටේ තිබෙන හැම කර්මාන්තයක්ම ගරු ඇමතිතුමා ඇමති ධුරයේ වැඩ භාර ගත්තාට පස්සේ ඇති වූ ඒවා හැටියටයි හැම තැනම වාගේ ප්‍රචාරය කරගෙන යන්නේ. රන්වැට ගැන අද පත්‍රයේ වාර්තාවක් මට දකින්නට ලැබුණා. එය විරුද්ධ පාර්ශ්වයේ ගරු නායකතුමිය විසින් හෝ මා විසින් කරන ලද්දක් නොවෙයි. එය රන්වැට කොමිටියෙන්ම කරන ලද ප්‍රකාශයක්. මොකක්ද රන්වැට කොමිටිය කළ ප්‍රකාශය? 1963 දී, රන්වැට සෑදීම සඳහා අවශ්‍ය පිත්තල ගෙන්වා ගැනීමේදී තීරු බද්ද අස් කිරීමට කැබිනට් සන්දේශයක් මගින් අපේ ආණ්ඩුව සහභාගි වී තිබෙන බවයි රන්වැට කොමිටිය ප්‍රකාශ කර තිබෙන්නේ. අපේ ඒ සහභාගිත්වය ගැන අප කළ ප්‍රකාශයක් නොවෙයි, එය. රන්වැට කොමිටියෙනුයි ඒ ප්‍රකාශය කර තිබෙන්නේ. ගරු ඇමතිතුමා අම්පාරේදී කියා තිබෙනවාලු, අපි බොරු කියනවා, කියලා. මීට පිළිතුරක් දෙන්නට වුවමනාවක් නැහැ. ගරු අගමැතිතුමාත් සහභාගි වූ උත්සවයේදී රන්වැට කොමිටියෙන්ම ඊට නිසි පිළිතුරු ලැබී තිබෙනවා.

අපේ ආණ්ඩුව තිබුණු පසුගිය කාලයේ ඥාති සංග්‍රහ සිදු වුණායයි ගරු කර්මාන්ත ඇමතිතුමා අපට විරුද්ධව ලොකුවට චෝදනා කළා. මගේ බෑණා කෙනෙකුත් රෙදි සංස්ථාවේ එදා සිටියාය යනුවෙන් ගරු ඇමතිතුමා ලොකුවට පුරසාරම් දෙඩුවා. එහෙත්, අපේ ගරු ඇමතිතුමා නම් එහෙම වැඩ කරන්නේ නැහැ කියනවා. මට දැන ගන්නට ලැබී තිබෙන දේවලින් කිහිපයක් පමණක් මම සඳහන් කරන්නම්. අද පිගන් කර්මාන්ත සංස්ථාවේ සභාපතිවරයා කවුරුද? පට්ටිආරච්චි මහත්මයා නොවෙයිද? ඒ කවුරුද? ගරු ඇමතිතුමාගේ සහෝදරයාගේ බෑණා නොවෙයිද ඒ? ඔය ඥාති මිත්‍ර සංග්‍රහයක් නොවෙයිද? සම් භාණ්ඩ සංස්ථාවේ ශාඛා සාප්පුවක් කොල්ලුපිටියේ විවෘත කරනු ලැබුවා. එතැනට පත් කරනු ලැබූ ඥුන්දරම්පිල්ලේ මහත්මයා ගරු ඇමතිතුමාගේ ලේලිය නොවෙයිද? තුනී ලැලි කර්මාන්තශාලාවේ සේවය කරන නිලක් කුලසේකර මහත්මයා කවුද? කර්මාන්ත අමාත්‍යාංශයේ කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ—ඉන්ඩස්ට්‍රියල් ඩෙවෙලොප්මන්ට් බෝඩ් එකේ—පුස්තකාලයාධිපතිනිය වශයෙන් අද ඉන්නේ කවුද? මිසිස් ගුණතිලක කියන්නේ කාටද? මගේ කල්පනාවේ හැටියට අද මුළු ලංකාවේම වැඩි පඩියක් ගන්න පුස්තකාලයාධිපතිනිය ගුණතිලක් මහත්මියයි. මේ තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවා තිබෙන්නේ අඩු පඩිය කටයි. අද ඇය රු. 1,550 ක් මාසික වැටුප් වශයෙන් ලබනවාලු. කොහොමද තත්ත්වය?

මහජන එක්සත් පෙරමුණෙන් ඉදිරිපත් කරනු ලැබ, පරාජයට පත් වූ අපේක්ෂකයන් ගැන කර තිබෙන්නේ මොනවාද? සුළු කර්මාන්ත සංවර්ධන මණ්ඩලයට ආර්. ඒ. කේ. පෙරේරා මහත්මයා පත් කර සිටිනවා. එම්. එස්. අබුබකර් මහත්මයා තවත් සංයුක්ත මණ්ඩලයක අධ්‍යක්ෂවරයකු හැටියට පත් කර සිටිනවා. එම්. එස්. බක්මීවැව මහත්මයාටත් එවැනි පත්වීමක් දී තිබෙනවා. එල්. එස්. පෙරේරා මහත්මයා, වැලිකල මහත්මයා සහ සෝමරත්න මහත්මයා ආදීන්ටත් එවැනි පත්වීම් දී තිබෙනවා නේද? ඔවැනි අය අපේ කර්මාන්ත ඇමතිතුමාගේ කර්මාන්ත ආයතනවල විශේෂ තැන් අරන් ඉන්න බව අපටත් කියන්නට පුළුවනි. අවිස්සාවේල්ල ඡන්ද දායක කොට්ඨාශයේ ඇති කරන්නට යන තුනී ලැලි කර්මාන්ත ශාලාවේ දැන් අලුත් ප්‍රතිපත්තියක් ඇති කරගෙන යනවා. අවිස්සාවේල්ල ඡන්දදායක කොට්ඨාශයේ හැදෙන තුනී ලැලි කර්මාන්ත ශාලාවේ වැඩ කටයුතු පිළිබඳ අළුත් ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබෙන බව පෙනෙනවා. මේ රටේ අනෙක් කර්මාන්ත ශාලා බිහි කරන අවස්ථාවලදී ඒවායේ සේවය කරන නිලධාරීන්ට වුවමනා කරන ගෙවල් එම සංස්ථා මගින්ම සාදාගෙන ගියා. එහෙත් එදා මෙම කර්මාන්ත ශාලාව සෑදීමට හොරණින් ලබා ගත් ඉඩම සුදුසු නැතෙයි කියා ඇමතිතුමාගේ කොට්ඨාශයටම එය ගෙනාවාට පසු එතුමාගේ ඉඩම් කිට්ටුවම ස්ථානයක අද තට්ටු ගෙවල් සාදන්නේ කවුරුන්ද යන වග රහසක් නොවෙයි. තුල්හිරියේ කර්මාන්ත ශාලාවට ලක්ෂ 10ක් වැය කර එවැනි ගොඩනැගිලි සාදන්නට පුළුවන් නම් අවිස්සාවේල්ලේ සාදන තුනී ලැලි කර්මාන්ත ශාලාවේ නිලධාරීන්ගේ පදිංචියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවශ්‍ය කරන තට්ටු ගෙවලුත් ඒ පිළිවෙළට නොසාදන්නේ මන්දැයි මා අහනවා. ඇමතිතුමාගේ ඉඩම්වල පුද්ගලික අංශය දියුණු කිරීමටද ඒවා දැන් වෙනත් පිළිවෙළකට සාදන්නේ කියා අපට අහන්නට සිදු වී තිබෙනවා.

පසුගිය රජය මගින් ගෙන ගිය කර්මාන්ත පිළිබඳ අඩිතාලම උඩයි අද යම් දියුණුවක් ඇති වී තිබෙන්නේ. අද දවසේ යම්කිසි දියුණුවක් කළායැයි මෙම රජයට කියන්නට පුළුවන්කම ලැබී තිබෙන්නේ එම තත්ත්වය නිසා බව මෙම ස්ථානයෙහිදී පමණක් නොව සෑම තැනකදීම අප නිර්භයව ප්‍රකාශ කරන්නට කැමතියි. අප ඇරඹූ වැඩ කටයුතුවල ඵල විපාක නැති නම් ප්‍රතිඵල ලැබී ගෙන එන්නේ අදයි. එදා අප අවසන් කර තිබුණු කර්මාන්ත ශාලා රාශියක් විවෘත කරන්නට අද මෙම රජයට පුළුවන්කම ලැබී තිබෙනවා. අප ඇරඹූ වැඩ කටයුතුවල ප්‍රතිඵලයයි අද මෙම රජය භුක්ති විඳින්නේ. මා මෙම අවස්ථාවේදී මීට වඩා විස්තර ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. කාරක සභා අවස්ථාවෙහිදී තවදුරටත් කරුණු ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. මා සඳහා වෙන්ව තිබෙන කාලය අවසාන වේ ගෙන යන නිසා ඉඩම් ඇමතිතුමා පිළිබඳව පමණක් වචන දෙකතුනක් ප්‍රකාශ කර මගේ කතාව අවසාන කරනවා.

ගරු කථානායකතුමනි, අපේ ඉඩම් ඇමතිතුමා මහවැලි ගඟ යෝජනා ක්‍රමය අනුව කලාවැව වැව් කණ්ඩිය උස්සන්නට මුල් ගලක් තබන අවස්ථාවේදී එම උත්සවයට අප නොගියායැයි මහ ලොකුවට දෝෂාරෝපණය කර තිබුණු බව පත්‍රවලින් දකින්නට ලැබුණා. අප දෝෂාරෝපණය කළේ මහවැලිගඟ හැරවීමේ යෝජනා ක්‍රමයට නොවෙයි. වියලි කලාපයක් වූ රජ රටට, උතුරු මධ්‍යම පළාතට, උතුරට එම ගංගාව හරවා ඉන් ප්‍රයෝජනයක් ලබා දෙන්නට පුළුවන්කම තිබෙනවා නම් අප ඊට විරුද්ධ වන්නේ නැහැ. එම ගංගාව කුමන අන්දමකට සකස් කළයුතුද යන්න ගැන පවා මතභේද තිබෙනවා. අකුරැස්සේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ) ගෙන ආ යෝජනාව පිළිබඳව ගරු අගමැතිතුමා කළ කථාව මා ඊයේ පෙරේදා කියෙව්වා. මා මෙම කරුණු ඉදිරිපත් කරන්නේ රංදෙනිගල ව්‍යාපාරය හොඳද, ඒ ඇල්ලෙන් මේ ඇල්ලට දමන එක හොඳද යන ප්‍රශ්නය ගැන නොවෙයි. අප එම ව්‍යාපාරයට විරුඬ වන්නේ නැහැ. අපි මෙම ව්‍යාපාරයට සම්පූර්ණ සහයෝගය දෙනවා. එහෙත් මේ ඉඩම් ඇමතිතුමා අතින් එම වැඩ පිළිවෙළ ඉටු වේදෝ යන සැකයයි අපට තිබෙන්නේ. 1956 දී එතුමාම සිහිනයක් දුටුවාලු, මනම්පිටිය පාලම සම්බන්ධව. එම සිහිනයේ ප්‍රතිඵලයක් වශයෙන් එදා 1958 දී අමෙරිකන් ආණ්ඩුවේ යූ.එස්.ඕ.එම්. ආයතනයත් සමග ගිවිසුමක් අත්සන් කර තිබෙනවා. 1961 දී එම අයගේ වාර්තාව ඉදිරිපත් කළායින් පසු නැවත වරක් එක්සත් ජාතීන්ගේ ආයතනයත් සමග වැඩ පිළිවෙළක් ආරම්භ කොට තිබෙනවා. ඒ පිළිබඳව වාර්තාවක් බෙදාහැර තිබෙනවා. පළමුවන පියවර 1970 සිට 1976 වන තෙක් බව එහි පෙනෙනවා.

එහි මෙසේද සඳහන් වෙනවා:

"*Phase* I—It is recommended that the 1st phase should consist of construction in two steps:—

STEP I, 1970-76

The Polgolla Unit with one barrel of tunnel, Moragahakanda Unit, the Polgolla-Kala Oya Trans-basin canal and irrigation systems H, D1, D2, and G."

ඒ කියන්නේ ඔය පළමුවැනි පියවරයි. ඔය පළමුවැනි පියවර 1976 තෙක් අවසාන කරන්න බැරුව තිබියදී ඊයේ පෙරේදා ගොස් කලාවැව උඩ ගලක් තබා රජයට මහජනතාව රවටන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා අනාගතයේදී කලාවැව ආසනයට ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන අපෙක්ෂක මහත්මයා ඉදිරියේ තබා ගෙන කරන රැස්වීමක් නිසා එම වැඩපිළිවෙල සාර්ථක වැඩපිළිවෙලක් නොවන බව අපට පැහැදිලි වුණ බව මේ අවස්ථාවේදී කෙලින්ම ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. ඒ නිසායි අපි මේ තමුන්නාන්සේලා කරන බොරුව මේ විධියට විවේචනය කරන්නෙ. ඊට කලින් දවසේදී අප විසින් පවත්වන ලද රැස්වීමකදී මම මෙන්න මේ පත්‍රය ඉදිරිපත් කරමින් මේ විධියට කිව්වා. මෙන්න බලන්න රජයට ආධාර කරන "ලංකාදීප" පත්‍රයේ තිබෙනවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]

මේ විධියේ ප්‍රවෘත්තියක්. මේ ප්‍රවෘත්තිය බොරු නම් ඇයි ඇමතිතුමාට ඒ බව කියන්න බැරි? 1969 ජූනි මස 5 වෙනි බ්‍රහස්පතින්දා "ලංකාදීප" පත්‍රයේ මේ විධියට තිබෙනවා. "මහවැලි ගඟ උතුරට හැර වීම නවතී." ඒ රැස්වීමට මේ පත්‍රය ගෙන ගොස් මා කියෙව්වා. එය අපේ රැස්වීමට විශේෂ ලක්ෂණයක් වුණා. අපේ රැස්වීමට ලේක් හවුස් පත්‍ර නියෝජිත මහත්මයට එන්න වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජීප් එකක් දී තිබෙනවා. රජයේ ජීප් එක කිනුයි ඒ වාර්තාකාර මහතා අපේ රැස්වීමට පැමිණියේ. කලාවැව මුල් ගල තැබීමට කලින් දවසෙයි අපි මේ රැස්වීම පැවැත්වූයේ. අපි කියන ලද දේවලට පිළිතුරු ලබා ගැනීමේ අදහසිනුයි අපි සිටියේ. මේ "ලංකාදීප" පත්‍රයේ මෙන්න මේ විධියේ ප්‍රවෘත්තියක් තිබෙනවා. මේ ප්‍රවෘත්තිය බොරුවක්ද? එහෙම නම් ඇයි ඇමතිතුමාට එය කියන්න බැරි? මෙය බොරුවක්ද ඇත්තක්ද කියා ඇමතිතුමා කියන්න ඕනෑ. ඒ නිසා අපි කියන්නේ කවදාවත් ඔය ඇමතිතුමා ඉන්න තෙක් ඔය වැඩපිළිවෙල ක්‍රියාත්මක නොවන බවයි.

ගරු කථානායකතුමනි, 1956 සිට 1969 අද වන තෙක්ම තවමත් ක්‍රියාත්මක පියවරවල් ගෙන නැත්නම් අපි කොහොමද බලාපොරොත්තු ඇති කරගන්නේ? රජ රට වාසීන් හෝ, උතුරු ප්‍රදේශයේ සිටින ද්‍රවිඩ සහෝදරයින් හෝ කලාවැව ආසනයේ සිටින මහජනතාව හෝ ඔය මුල් ගල් තැබීමෙන් රවටන්න පුළුවන්ද කියන ප්‍රශ්නයයි අපි මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්නෙ.

අද හුරුළුවැව ගැන කොහොමද කියා බලමු. පසුගිය මාස් කන්නයේදී වැඩ කිරීමට අවශ්‍ය තරම් ප්‍රමාණයකින් වතුර පිරුනේ කලාවැව පමණයි. නාලන්දා ඔයේ බැම්ම නිසා කලාවැව පිරුණා. අනික් එකම වැවක්වත් ඒ මාස් කන්නයේදී වැඩ කිරීමට පුළුවන් වන විධියට වතුරෙන් පිරුණේ නැහැ. ඔවැනි තත්ත්වයක් තිබියදී කලාවැවට ගොස් මුල් ගලක් තබා තමුන්නාන්සේලා කරන්න හදන්නෙ මොකක්ද? නමුත් මා අද ඇමතිතුමාගෙන් අහන්න කැමතියි, කලාවැවට ගොස් මුල් ගල් තබා නොයෙක් අන්දමේ ප්‍රකාශයන් කරන අවස්ථාවේදී හුරුළුවැව ගැන කල්පනා වුණේ නැද්ද කියා. හුරුළුවැව ප්‍රදේශයේ ජනතාව ඇමතිතුමාට නොයෙක් අවස්ථාවලදී මේ ගැන මතක් කර තිබෙනවා. හුරුළුවැව බැන්දාට පසුව එකම එක දවසක් පමණයි එම වැව පිරුණේ. 1957 දී ඒ වැව පිරුණ ගමන්ම වැව කැඩී ගියා. එම ජලාශයට උඩින් වැව් දෙකක් තිබෙනවා. සීගිරිය ළඟ එක් වැවක් තිබෙනවා. හබරන ළඟ තවත් වැවක් තිබෙනවා. ඒ වැව් දෙකම කැලෑවට යන්න හැර තිබෙනවා. එම වැව් දෙක සම්පූර්ණ කළොත් හුරුළුවැවේ වතුර ප්‍රශ්නය මගහැරෙනවාය කියා එහි ගම්වැසියන් විසින් සියක් වාරයක් ඇමතිතුමාට කියා ඇති.

මේ මහවැලි ගඟ ව්‍යාපාරයත් ප්‍රෝඩාවක්ය කියා අප කියන්නේ ඇයි? ඇමතිතුමාම නියෝජනය කරන මැදිරිගිරියේ අද බෙත්මකටයි වතුර දෙන්නෙ. ඒ කියන්නේ අඹන් ගඟ අද යම් ප්‍රදේශයකට ගලා බසිනවා නම් මුහුදට යන වතුර ටික හැර ඉතිරි වතුර සම්පූර්ණයෙන්ම ගලා යන්නේ පොලොන්නරුව දිස්ත්‍රික්කවලටයි. වාරිමාර්ග ඇමතිවරයා වශයෙන් දහතුන් අවුරුද්දක් තිස්සේ වැඩ කරන නමුත් තමාගේම ඡන්ද කොට්ඨාශය ළඟින් යන ඒ ජල මාර්ගය තමාගේම කොට්ඨාශයේ තමාගේම ඡන්ද දායකයින් වන ඒ ගොවිතැන් කරන මහ ජනතාවගේ ප්‍රශ්න විසඳෙන ආකාරයට ප්‍රයෝජනයට ගැනීමට මේ ඇමතිවරයා අසමර්ථ වූවා නම් මහවැලි ගඟ හරවා උතුර මැද පළාත—රජ රට—කවදා පෝෂණය කරයිද යන ප්‍රශ්නය මා මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. ගරු අගමැතිතුමා හමු වන්නට තව කීප දිනකින් නියෝජිත පිරිසක් එනවා. ගරු අගමැතිතුමා ඉතාම කරුණාවෙන් ඒ සඳහා අපට දිනයක් දී තිබෙනවා. දිනය 7 වනදායි. ඔය ට්‍රැක් ඊ යායේ උදවිය කලින් පදිංචි කරවා සිටියේ පොලොන්නරුවේ මාදුරුඔයෙයි. පොල් වගාවටය කියා අවුරුදු හයක් තිස්සේ ඔය උදවිය මාදුරුඔය පදිංචි කරවා සිටියා. ඒ ව්‍යාපාරය අසාර්ථක වූ නිසා ඇත් පදවියේ ට්‍රැක් ඊ යායට ගෙනැවිත් තිබෙනවා. එසේ පදිංචි කරවාත් අවුරුදු හයක් ගත වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. නමුත් තවම වතුර නැහැ. දැන් අවසාන වශයෙන් ගොවි හමුදාව ඇළ කපා ගෙන යනවා. මා එකක් කියන්නට සතුටුයි. යම් ව්‍යාපාරයක් පටන් ගන්නවා නම් යම් වැඩ පිළිවෙළක් අනුගමනය කර ගෙන යනවා නම් ඒ ව්‍යාපාරයේ හෝ වැඩ පිළිවෙළේ සාර්ථකත්වයක් ඇති වන තුරුම, ඒවාට ගෙන ගොස් පදිංචි කරවන ජනතාවගේ ප්‍රශ්න විසඳෙන තුරුම, ක්‍රියා කිරීම අවශ්‍යයි. එසේ නැතිව අතනින් ටිකක් මෙතැනින් ටිකක් තවත් තැනකින් තවත් ටිකක් කිරීමෙන් වැඩක් නැහැ. එම නිසා ඔය ඇමතිතුමා ගෙන යන වැඩ පිළිවෙළවල් ගැන අපට නම් කිසිම බලාපොරොත්තුවක් තබන්නට බැහැ. ඔය ඇමතිතුමා ඔය පදවියේ සිටින තෙක් කවදාවත් මහවැලි ගඟ උතුරට හැර වීමේ ව්‍යාපාරය සාර්ථක කර ගන්නට පුළුවන් වේවිය කියා අප සිතන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ගම්බද සුළු වැව් අමුණු දියුණු කිරීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. උතුරු මැද පළාතේ දැන් නියඟයක් තිබෙනවා. ජනවාරි මාසයේ සිට ඒ ප්‍රදේශයට වර්ෂාව ලැබුණේ නැහැ. ඒ ප්‍රදේශයේ වැව් අමුණු කොපමණ විශාල ගණනක් බඳින්නට තිබෙනවාද? දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවෙන් අපි ලැයිස්තු අනුමත කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවට යවනවා. නමුත් ඒවා කවදාවත් බැඳෙන්නේ නැහැ. අද වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නව වැඩ පිළිවෙළක් තිබෙනවා. ඉස්සර නම් ටෙන්ඩර් ප්‍රසිද්ධ කර කොන්ත්‍රාත් දීමේ වැඩ පිළිවෙළක් තිබුණා. අද ඒ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අහෝසි කර තිබෙනවා. අද ඒ වැඩ චේම්බර් ඕෆ් කොමර්ස් කියන ආයතනයට දෙනවා. ඒ ආයතනය මොකක්ද කරන්නෙ? ආයතනයේ කාර්යාලය කොළඹ තිබෙනවා. ලැයිස්තුව ඒ ආයතනයට යවනවා. ඊටපසු ඒ අය සතුටු උදවියට, ඔය විරක්ටර් එහෙම තිබෙන උදවියට ඒ වැව් අමුණු බැඳීම පවරනවා. මුදලින් සියයට 11 ක් ඒ ආයතනය තබා ගන්නවා. මේ විධියට කිසිම වැඩක් කෙරෙන්නේ නැහැ. කවුරු හරි ඒ කාර්යාලයට ගිහින් වැඩක් ඉල්ලුවාම වැඩක් භාර දෙනවා. සියයට 11 ක් වාණිජ මණ්ඩලය තබා ගන්නවා. ඊයේ පෙරේදා වර්ෂාව ටිකක් ලැබුණා. නමුත් ලැබුණු ප්‍රයෝජනය කුමක්ද? අපේ කොට්ඨාශවල වැඩ කරන්නට අසතුටු නම් අනික් කොට්ඨාශවල වැඩවත් කරන්න. අනික් කොට්ඨාශවල තත්ත්වයත් ඒකයි. උතුරු මැද පළාතේ අද එවැනි තත්ත්වයක් තිබෙනවා. මේ වැඩ වෙළඳ මණ්ඩලයට පැවරුවාම ඒ අය පෞද්ගලික අංශයේ තවත් නොයෙකුත් උදවියට මේ වැඩ භාර දෙනවා. ටෙන්ඩර් ප්‍රසිද්ධ කිරීමක් නැහැ.

සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. சி. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

කොන්ත්‍රාත්කරුවන් කොහොමටවත් කළේ නැහැ.

මෛත්‍රීපාල සේනානායක මයා.
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

කොන්ත්‍රාත්කරුවන්ට දුන් කාලයේ පස් කපා කරන්නට පුළුවන් වැඩ කෙරුණු තත්ත්වයක් තිබුණා. නමුත් අද ඒ ටිකවත් කෙරෙන්නේ නැහැ. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවෙන් අනුමත කළ වැව් අමුණු රාශියක් තිබෙනවා. ඒ වැඩ එකක්වත් කෙරෙන්නේ නැහැ. විශාල ලැයිස්තුවක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට යවා තිබෙනවා. මේවා ගැන ඇසුවාම තව ටික දිනකින් වැඩේ කෙරේවිය කියනවා. ඔක්තෝබර් මැද හරියේදී කෙරේවිය කියනවා. ඊළඟට වර්ෂාව පටන් ගත්තාම ඒ වැඩේ කරන්නට පුළුවන් තත්ත්වයක් ඇති වන්නට තවත් අවුරුදු ගණනාවක් ගත වෙනවා. අද ඒ වැව් අමුණුවල තත්ත්වය ඔකයි. පදවිය ප්‍රදේශයේ ඉඩම් දීම සම්බන්ධයෙන් අද විශේෂ වැඩ පිළිවෙළක් පවතිනවා. මිනිසුන්ට ඉඩම් ලබා දීම සඳහා එහි විශේෂ ඉඩම් නිලධාරියකු සිටිනවා. ඔහු ජිනදාස මුදලාලි හෙවත් "බොස් ජිනදාස" නමින් හැඳින්වෙනවා. ඔහු ලැයිස්තු හදාගෙන, ඇමතිතුමා හමුවීමට ඇවිත් ඉඩම් ලබා දෙන බව කියමින් මිනිසුන්ගෙන් සල්ලි ගැනීමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මෛත්‍රීපාල සේනානායක මයා.]
වැඩ පිළි වෙළක් අද පදවිය ප්‍රදේශයේ පවතිනවා. මේ පිළිබඳ ලියුම් මා ළඟ තිබෙනවා. යම් කෙනකුට ඉඩමක් ලබා ගන්නට වුවමනා නම් බොස් ජිනදාස මහත්මයට මුදලක් දුන්නොත් ඉඩම ලබා ගන්නට පුළුවනි. පදවිය ව්‍යාපාරයේ අද පවතින තත්ත්වය ඒකයි.

මට නියමිත වේලාවෙන් තව මිනිත්තු කීපයයි ඉතිරිව තිබෙන්නේ. අධ්‍යාපන ඇමතිතුමා මෙහි නැතත්, ගරු අගමැති තුමාගේ සැලකිල්ලට භාජන වීම සඳහා මීළඟට මා අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළිබඳ ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා. පසු ගිය දෙසැම්බර් මාසයේදී පැවැත්වුණු අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේ ප්‍රතිඵල සමහර විභාගාපේක්ෂකයන්ට දන්වා නැහැ. විභාගය පැවැත්වුණු අවස්ථා වේදී විභාග ශාලාව අසල පොඩි කලබලයක් ඇති වූ නිසා, විභාගයට පෙනී සිටි ළමයින්ට වැඩ බලන විභාග කොමසාරිස් මෙවැනි ලියුමක් යවා තිබෙනවා.

අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය) විභාගය 1968 දෙසැම්බර්

1969 මාර්තු මස පවත්වන ලද ඉහත සඳහන් විභාගයට ඉදිරිපත් වූ ඔබ විභාග ශාලාව අසල පැවැත්වූ පංතියකට සහභාගී වී විභාගශාලාධිපතිටද ඔහුගේ සහායකයින්ටද අනෙකුත් විභාගාපේක්ෂක යන්ටද බාධාවක් අවහිරයක් වන පරිද්දෙන් ක්‍රියා කිරීමෙන් විභාග නීති උල්ලංඝනය කොට ඇත.

විභාගාපේක්ෂකයන්ගෙන් මේ ගැන නිදහසට කරුණු අසා තිබෙනවා. ඒ අය නිදහසට කරුණු ඉදිරිපත් කළා. "අපෙන් එවැනි දෙයක් සිදු වුණේ නැහැ. ඒ ගැන විභාගයක් කරන්න"යි ඔවුන් කියා තිබෙනවා. එහෙත් ඒ අයට විභාගයේ ප්‍රතිඵල ලැබුණේ නැහැ. විභාග කොමසාරිස්තුමා ගෙන් ඒ අයට ලැබී තිබෙන්නේ ඉහත දැක්වුණු අන්දමේ ලියවිල්ලක් පමණයි. ප්‍රශ්නයක් තිබුණා නම්, කලකෝලාහල යක් ඇති වුණා නම් ඒ ගැන නිසි විධියට ක්‍රියා කිරීම ගැන අප මේ අවස්ථාවේදී කාටවත් දෝෂාරෝපණය කරන්නේ නැහැ. එහෙත්, අධ්‍යාපනයක් ලැබූ කෙනකු ඔහුගේ අනාගත ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා අවසාන විභාගයට පෙනී සිටියාට පසු එහි ප්‍රතිඵල ඔහුට නොදී සඟවාගෙන සිටීම ලොකු වරදක් බවයි මා මේ ගරු සභාවට මතක් කරන්නේ. මේ ගැන විශේෂයෙන් සොයා බලන ලෙස ගරු අග මැතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. මේ ළමයින් හතර පස් දෙනාගේ අනාගත දියුණුවට මෙයින් බාධාවක් ඇති වන්නට ඉඩ තිබෙනවා.

කාරක සභා අවස්ථාවේදී මා මීට වඩා දීර්ඝ වශයෙන් කරුණු ඉදිරිපත් කරන්න අදහස් කරන හෙයින් මේ අවස්ථාවේදී මීට වඩා කථා කරන්නේ නැහැ. පසුගිය අවුරුදු හතරහමාර තුළ දී මේ රජය ධනපතීන්ට පමණක් නොයෙක් සහනයන් ලබා දෙමින් පොදු මහජනතාව රජයෙන් බලා පොරොත්තු වුණු සහනයක් කිසිවක් නොසලකා ක්‍රියා කළ නිසා, ළඟදීම මහජනතාවට ලැබෙන අවස්ථාවෙන් ඔවුන් රජයට නිසි පිළිතුරු දෙන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

පූ. භා. 11

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)

ගරු කථානායකතුමනි, පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයේ හිටපු ඇමති වරයකුගේ කථාවෙන් පසුව මේ අයවැය විවාදයට සහභාගී වීමට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වන බව පළමුවෙන් ප්‍රකාශ කරනවා. ලංකාවට නිදහස ලැබීමෙන් පසු පළමුවෙනි වරට මේ රජය පස්වෙනි රාජ්‍ය වර්ෂයත් ගත කරමින්, එකම මුදල් ඇමතිවරයකු යටතේ පස්වෙනි වර ටත් අයවැය යෝජනා ඉදිරිපත් කිරීම අප කාටත් ඉතාම සතුටු විය හැකි අවස්ථාවක් බව කිය යුතුයි. මේ විවාදය ආරම්භ කිරීමේදී කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) මේ විධියටම ගරු මුදල් ඇමතිතුමාට ප්‍රශංසා කරන්නට පටන්ගෙන ඇන්තිමේදී ඒ ප්‍රශංසාව විහිළුවක් හැටියට හරවමිනුයි, එතුමාගේ කථාව නිම කළේ. ගරු මුදල් ඇමතිතුමා පස් අවුරුද්දක්ම මේ විධියට අයවැය ඉදිරිපත් කළාය, ඒ ගැන සන්තෝෂ වෙනවාය කියමින් පසුගිය අවුරුදු පහ ඇතුළත සිදු වූ රජයේ යම් යම් අඩුපාඩුකම් ගැන පෙන්වා දෙමින් ඒ අතිනුත් මුදල් ඇමතිතුමා වාතිා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිහිටුවා තිබෙනවා යයි ප්‍රකාශ කළා. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාටත් විරුද්ධ පාර්ශ්වයෙ අයවැය විවාදයට සහ භාගි වූ ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු ටත් මගේ කථාවේදී හැකි තරම් දුරට පිළි තුරු දීමට මා වියත්න කරනවා.

කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමාත්, දොම්පේ ගරු මන්ත්‍රීතුමාත් (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) මේ විවාද යේදී කථා කළේ 1965 ට පෙර ඉතිහාසය ටිකක් අමතක කරලයි. වර්ෂ 1960 සිට වර්ෂ 1964 තෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව පිහිටුවූ වැදගත් චාතීවක් උන්නැහේලාට අමතක වුණා. අවුරුදු 4½ ක් ඇතුළත මුදල් ඇමතිවරුන් පස් දෙනෙකු ඒ රජයේ හිටියා පමණක් නොවෙයි, එකම මුදල් ඇමතිවරයෙකුටවත් වර්ෂයක් නිම කර ගන්නට පුළුවන් වුණේ නැහැ. පළමුවෙන්ම මුදල් ඇමතිවරයා වශ යෙන් සිටි දොම්පේ ගරු මන්ත්‍රීතුමා හාල් සලාකයෙන් සේරු ½ ක් කපන්නට ගොස් එය ඉටු කර ගන්නට බැරි වී මුදල් ඇමතිකමෙන් අස් වී තණකොළ හිටුවන් නට යනවා යයි කියමින් යන්ට ගියා. පසු ගිය සතියේදී මේ විවාදයට සහභාගි වූ එතුමා, මේ රජය හාල් සලාකය සේරුව කින් කපා හැරියේ ලෝකයේ හාල් හිඟ යක් ඇති වී හාල් ලබා ගැනීම අපහසු වූ නිසා නොවේය, රජය මේ පියවර ගත්තේ රට ස්වයංපෝෂිත කිරීම පිණිස ගොවීන්ට ධෛර්‍ය දීම සඳහාය, තමා එදා හාල් සලා කය සේරු ½ කින් අඩු කිරීමට අදහස් කළේත් රට ස්වයංපෝෂිත කිරීමේ පරමාර්ථය මුල් කරගෙනයයි ප්‍රකාශ කරමින් අවංකව ඒ තත්ත්වය විස්තර නොකරන්නේ මන්දැයි ප්‍රශ්න කළා. ගරු කථානායකතුමනි, මේ ක්‍රියා දෙක අතර වෙනසක් තිබෙනවා. උන්නැහේ එදා හාල් සේරු භාගයක් කපන්නට තීරණය කළාට ඒ වෙනුවට ජනතාවට කිසිම සහනයක් දීමට යෝජනාවක් ඉදිරිපත් කළේ නැහැ. ඇත්ත වශයෙන්ම 1966 දී ලෝකයේ උද්ගත වුණු හාල් හිඟය නිසාත්, හාල් මිළ කලින් පැවති මිළ මෙන් 2½කින් වැඩි වූ නිසාත් මේ රජය හාල් සලාකය සේරුව කින් කපා හැරියා පමණක් නොවෙයි, අනික් පැත්තෙන් ඒ වෙනුවට ජනතාවට යම් යම් පහසුකම් සැලසූ බවත් මතක් කරන්නට ඕනෑ. එනම්, නොමිලයේ හාල් සලාකය බෙදා දීමයි. දොම්පේ ගරු මන්ත්‍රී තුමා (එෆ් ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) එදා එම තීරණය ගත්තේ නැහැ. අන්න ඒ නිසයි, එතුමාට ඇමතිකමෙන් අස් වී තණකොළ සිටුවන්නට යන්න සිදු වුණේ. මේවා, මුන්නැහේලාට මතක නැහැ.

ඇත්තවශයෙන්ම 1960 සිට 1965 දක්වා කාලය තුළදී ආර්ථික අතින් අපේ රටේ ජනතාව මොන තත්ත්වයක සිටියාද, මොන තරම් කරදර වින්දාද, මහජනතාවට එදිනෙදා අවශ්‍ය ද්‍රව්‍ය කඩවලින් මිලදී ලබා ගන්නට තිබුණාද කියා අපේ සිත් යොමු කර බැලිය යුතුව තිබෙනවා. අප කාටත් ඊයේ කළ දේ අද අමතක වී නැහැ. එය අපේ ස්වභාවයක්. නමුත් අපේ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නැගිට කථා කළේ 1969-70 අයවැය යෝජ නාවන් කිසිම කමකට නැති විධියටයි. එපමණක් නොවෙයි පසුගිය කාල පරිච්ඡේ දය තුළ මහජනතාවට කිසිම දෙයක් මේ ආණ්ඩුවෙන් කර නැති විධියටයි. ඒ කෙසේ වෙතත් උන්නැහේලාගේ කෙරුවාවන් ගැනත් අපි ටිකක් හිත යොමු කර බලමු.

ගරු කථානායකතුමනි, 1964 වන විට කඩයක කරෝල කෑල්ලක් ගන්න තිබුණේ නැහැ. මට මතකයි කොලොන් නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) චාරිකාවේ යනකොට කඩමණ්ඩිවල උන්නැහේට පෙනෙන්න කරවල කටු එල්ලා තිබුණු බව. රෙදි කෑල්ලක් ගන්න කඩවල තිබුණේ නැහැ; චෝච් බැටරි කෑල්ලක් ගන්න තිබුණේ නැහැ. උදළු තලයක් ගන්න තිබුණේ නැහැ. උදළු තල යක් මිලදී ගන්න නම් ග්‍රාම සේවක මහතා ගෙන් සහතිකයක් ලබාගත යුතු තත්ත්ව යක් තිබුණා. ඔය තත්ත්වය වෙනස් කරන්න කිසිසේත් බැරි වුණා. එන්ට එන්ටම තත්ත්වය උග්‍ර වී ගමේ ගොඩේ තිබුණු සුළු වෙළඳසැල් නැති වී ගියා පමණක් නොවෙයි, ද්‍රව්‍ය මිලදී ගැනීමට නැතිව ජනතාව අප්‍රමාණ දුක් වින්දා. එදා තිබුණු මේ තත්ත්වය ඒ අයට දැන් මතක නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

මෙම තත්ත්වයෙහි වෙනසක් ඇති කර ගැනීමේ අදහසින් තමයි, අවසානයේදී එවකට සිටි ගරු අගමැතිණිය, නුවරඑළියේදී ඇති වුණු සාකච්ඡාවකින් පසුව, මුළු ආසියාවම පිළිගත්තාය කියන, බහු ආර්ථික ආචාර්යතුමාට මුදල් ඇමතිකම භාර දුන්නෙ. උන්නැහේ අවුත් මුලින්ම ගත් පියවර මොකක්ද? උන්නැහේ වැදගත් පියවරක් ගත්තා. අවුරුදු තිහක පමණ කාලයක් තිස්සේ මේ රටේ ජනතාවට සමාජවාදය ගැන විශාල දේශන පැවැත්වූ මෙම පුද්ගලයා, අප රට ජනතාවට රාවරමක් දී, ජනතාවගේ අදහස් නිදහස් ලෙස ප්‍රකාශ කරන්න තිබෙන පුවත්පත්වලට මුකවාඩම් බැන්දට පස්සෙ රට පාලනය කර ගෙන යන්නට පුළුවන්වේය කියා කල්පනා කළා. ඒ අන්දමට උන්නැහෙ ගහපු කටුව තමයි, එම රජයට වැදුණු අන්තිම පහර. රජයත් පෙරළුණා; උන්නැහෙත් කපෝතියි. 1964 දී ආණ්ඩුව පෙරළුණාට පසුව උන්නැහේලාගේ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් අපේ භෝජන ශාලාවේදී මට කී දෙයක් මතකයි. "අනේ මන්ත්‍රීතුමා අපට හරි වැඩේනෙ වුණේ; කුමාරිහාමි නිවාඩු ගන්න නුවරඑළි ගිහින් ඇවිත් අපට වෙච්ච වැඩේ හැටි; ආණ්ඩුවත් ඉවර වුණා" කියා එදා ඒ මන්ත්‍රීතුමා මට කීවා. එදා ඒ අන්දමට ක්‍රියා කළ මේ උදවිය අප මොන වැඩක් කර තිබෙනවාදැයි අපෙන් ඇත් ප්‍රශ්න කරනවා.

ගරු කථානායකතුමනි, එදා මෙන් නොව අද මේ රටේ පොදු ජනතාව ආර්ථික වශයෙන්ද විශාල දියුණුවක් ලබා තිබෙන බව, ඉතාම ආඩම්බරයෙන්, එමෙන්ම කිසිම සැකයක් නැතුව අවධාරණයෙන් ප්‍රකාශ කරන්න පුළුවනි. කවුරු මොනවා කීවත් අපට ඒක පෙනෙනවා. මධ්‍යම බැංකුවේ වාර්තා බලන්නට අපට වුවමනාවක් නැහැ. වෙන කාගේවත් වාර්තා බලන්නට අපට වුවමනාවක් නැහැ. ගමට ගියාම ඒක අපට පෙනෙනවා. එදා හිස්ව තිබුණු ගමේ කඩවල අද ලක්ෂ ගණන් වටිනා බඩු වහළ ළඟට යන තෙක් ගොඩ ගසා තිබෙනවා. ඒවා ගොඩගසා තිබෙන්නේ පෙනුමට නොවෙයි; ඒ බඩු ගන්නට මහජනතාව අතේ මුදල් තිබෙන නිසයි. එදා ඒ කඩ තිබුණේ හිස්වයි. ආර්ථික අතින් එදාත්, අදත් අතර තිබෙන වෙනස ගැන අපි කල්පනා කර බලමු.

ගරු කථානායකතුමනි, දොම්පේ ගරු මන්ත්‍රීතුමාගේ (එෆ්. ආර්. ඩයස්. බණ්ඩාරනායක මයා.) කථාවේදී එතුමා ප්‍රකාශ කළා, ගොවි කර්මාන්තය දියුණු කිරීම සඳහා මේ රජය ගොවියාට කිසිම සහනයක් දුන්නේ නැත කියා. මා හිතන හැටියට උන්නැහේ ඒ විධියට ප්‍රකාශ කළේ ඒ විධියට කල්පනා කරන නිසා නොවෙයි. ඒ ප්‍රකාශය පත්‍ර මාර්ගයෙන් ජනතාව අතරට පත් කර යම්කිසි වාසියක් ලබා ගැනීමටයි. මේ කාල සීමා දෙකේ වෙනස පෙන්වා දීමට මේ අවස්ථාවේදී මා බලාපොරොත්තු වෙනවා. 1964 වන විට වී බුසලක සහතික මිල රුපියල් 12 යි. ඒ සහතික මිල ඇති කළේත් 1956 ට පෙර තිබුණු එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවයි. ඒ කාරණය අප පසෙකින් තබමු. සහතික මිල රු. 12 වුණත් එදා ගොවියාට තමාගේ වී ටික ඒ මිලට විකුණා ගැනීමට පුළුවන් වුණේ නැහැ. හේතුව කුමක්ද? එදා ගොවියාට ලැබුණු ණය සහනය අක්කරයකට රු. 175 යි. සමුපකාර සමිති දුර්වල තත්ත්වයක තිබුණු නිසා ඒ රු. 175 වත් ලබා ගැනීමට ඔහුට අවස්ථාවක් තිබුණේ නැහැ. ඒ කරණකොටගෙන එදා ගොවියාට, තමාගේ ගොවි කර්මාන්තය සඳහා අහල පහළ මුදලාලිගෙන් ණය ලබා ගැනීමට සිදු වුණා. ඒ ණය ලබා ගත්තේ පොලියටයි. පොලය කුමක්ද? කුඹුර ගොවි තැන් කර ගැනීමට ණය දුන්නොත් ගොයම් කැපුවාට පසු වී බුසල රු. 7 බැගින් නැත්නම් 8 බැගින් මුදලාලිට විකුණන්නට ඕනෑය කියන කොන්දේසියයි. ඒ අනුව ගොයම් කැපුවා ම වී ටික මුදලාලිට දුන්නා. රජයේ ණය ලබා ගත් ගොවියාට වුණත් ඉක්මණින් මුදල් ලබා ගැනීම සඳහා වී බුසල රු. 8 බැගින් හෝ 9 බැගින් මුදලාලිට විකුණන්නට සිදු වුණා. එසේ සිදු වුණේ සමුපකාර සමිතියට වී දුන් විට මුදල් ලැබුණේ මාස එකහමාරක් හෝ දෙකක් පසු වී නිසයි. ඔය කාරණා දෙක නිසා එදා සහතික මිල රු. 12 වුණත් සාමාන්‍යයෙන් ගොවියාට ලැබුණේ බුසලකට රු. 8 බැගිනුයි. මේක සත්‍යයක්. මේක මෙසේ නොවේය කියා කාටවත් කියන්නට බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කථානායකතුමනි, මා සියයට අනූනවයක් ගොවීන් සිටින ප්‍රදේශයක් නියෝජනය කරන පුද්ගලයෙක්. ඒ නිසා මා එය හොඳ හැටි දන්නවා. 1966 දී අප මේ ක්‍රමය වෙනස් කළා. වෙනස් කර රටේ ආර්ථික තත්ත්වය අනුව ගොවියාට ණය දීමට—අක්කරයකට රු. 225 බැගින් ණය දීමට—තීරණය කළා. එපමණක් නොවෙයි. ඔහුට අවශ්‍ය පෝර ටික දෙන්නට ක්‍රියා කළා. ගොවියාට අවශ්‍ය උපදෙස් දී ඒ ගොවි ජනතාව අතර ලොකු උද්‍යෝගයක් ඇති කළා. ඒ නිසා ගොවියා පෙරට වඩා විශාල උනන්දුවක් ඇතිව කුඹුරට බැස වැඩ කරන්නට පටන් ගත්තා. එපමණකුත් නොවෙයි. තමන්ගේ වී සමුපකාරයට දුන් විට, බුසලට රු. 12 බැගින් නොව 14 බැගින් ඒ අවස්ථාවේ දීම ගොවියාට දිය යුතුය යන ප්‍රතිපත්තිය අප අනුගමනය කළා. ඒ නිසා අද ගොවියාට තමන්ගේ වී ටික සමුපකාරයට දුන් විගසම මුදල් ලබා ගැනීමට පුළුවන්කම තිබෙනවා. එය කලින් තිබුණාට වඩා වැඩි සහනයක්. මේ කරුණු දන්නේ නැද්ද කියා ගරු දොම්පේ මන්ත්‍රීතුමාගෙන් (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) මා අහනවා. එතුමා ඕවා දන්නේ නැත්නම් එතුමා මෝඩයෙක්ය කියා ප්‍රකාශ කරන්න මා කැමතියි.

ගරු කථානායකතුමනි, අපට මෙහි දී දේශපාලන ප්‍රශ්නයක් වුවමනා නැහැ. අවංකව වටපිට බලමු. ගොවි කර්මාන්තයේ දියුණුවක් ඇති වී තිබෙනවාය කියන්නට විරුද්ධ පාර්ශ්වයේ එක මන්ත්‍රීවරයෙකුටවත් ශක්තියක් තිබුණේ නැහැ. එහෙත් පුළුවන් නම් ගමේ ගොඩේ මහ ජනතාව ඉදිරියට ගොස් වේදිකාවක නැගී ඔය ප්‍රකාශය කරන්නය කියා මා කියනවා. හැබැයි එහෙම කියන්න නම් ඔය එක් කෙනකුටවත් ශක්තියක් නැහැ. එය අපි දන්නවා. එදා සාමාන්‍යයෙන් අක්කරයකින් වී බුසල් 40 ක් ගත් පුද්ගලයා අද අක්කරයකින් වී බුසල් 80 ක් ගන්නවා. කෘෂිකර්ම නිලධාරීන් අස්වැන්න මනින හැටි ගරු කැස්බෑවේ මන්ත්‍රීතුමා (සෝමවීර චන්ද්‍රසිරි මයා.) කීවේ විහිළුවක ස්වරූපයෙන්. අඩි 10×10 කොටසකද කොහේදෝ ප්‍රමාණයක් අරගෙන ඇට ගණිනවාය කිව්වා. හොඳයි ඒ ක්‍රමය හොඳ නැත්නම් අස්වැන්න තක්සේරු කරන්නට හොඳ වෙන ක්‍රමයක් කියන්න බැරිද? එහෙත් තක්සේරු කිරීමේ ඔය ක්‍රමයට මේ රටේ ගොවීන් කවුරුවත් විරුද්ධ නැහැ. කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා ගොවි රජේක් කර, ඔළුවට හිස් වැස්මක් දමා ගොවියා බූරුවෙක් කරනවාය කියා. හැබැයි මහියංගනය පැත්තට ගොස් ඔය කථාව කිව්වා නම් උන්නැහේ ආපසු එන්නේ නැහැ. කැස්බෑව දිහාවේ කසිප්පු ටිකක් ගහලා ඔය විදියට කෑගැහැව්වාට මහියංගනයට ගොස් කිව්වා නම් ආපසු එන්නේ නැහැ. එය මේ රටේ ගොවියාට කළ අගෞරවයක්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
I do not think you should say that.

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)
He was saying worse things than that, Sir. I was referring to his speech.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
You were speaking about his taking pot arrack. I think you should withdraw your remark about pot arrack.

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)
I withdraw that. Make it arrack at least!

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
I would request hon. Members not to attribute motives or make insinuations against any Member.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සෙනෙවිරත්න මයා.
(திரு. செனெவிரத்ன)
(Mr. Seneviratne)
I withdraw my remark, Sir.

එහෙත් ගරු කථානායකතුමනි, මා එකක් කියන්නට කැමතියි. එදා ගරු කැස්බෑවේ මන්ත්‍රීතුමා මෙහි දී කථා කරන අවස්ථාවේ තමුන්නාන්සේ සිටියේ නැහැ. ගරු අගමැතිතුමා විරුද්ධ පක්ෂයේ නායිකාව ගැන කොහේදීදෝ යම්කිසි ප්‍රකාශයක් කළාය කියා ඒ ගැන පාවිච්චි කළ වචන කියෙව්වොත් ලැජ්ජා හිතෙනවා. එවැනි දෙයක් ඒ අවස්ථාවේදී ගරු අගමැතිතුමා කීවේ නැත කියා වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (පර්සි සමරවීර මයා.) කියද්දියි එතුමා ඒ වචන පාවිච්චි කළේ. එතුමා පාවිච්චි කළේ මේ ගරු සභාවේ පාවිච්චි කළ යුතු වචන නොවෙයි. හැන්සාඩ් වාර්තාවෙන් ඒවා කියෙව්වොත් ලැජ්ජා හිතෙනවා. ගරු අගමැතිතුමා නින්දිත තුච්ඡ කැත පහත් විධියටයි ඒ කථාව කළේ කියා කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. ගරු අගමැතිතුමා ඒ අවස්ථාවේ මෙහි සිටියේ නැහැ. එහෙත් මා කියන්නට කැමතියි ගරු කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා වගේ නින්දිත තුච්ඡ කැත පහත් පුද්ගලයෙක් මේ රටේ ජනතාවගෙන් කොටසකට වැරදිලා මේ ස්ථානයට එවා තිබීම කණගාටුවට කරුණක්ය කියා. කැස්බෑවේ ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මෙතන නැහැ. එහෙත් එතුමා වැනි අය කල්පනා කරන්නට ඕනෑ වුවමනා නම් අවස්ථානුකූලව උන්නැහේලා දන්නා දේවල් දන්නා තවත් අය ආණ්ඩු පක්ෂය පැත්තේත් සිටිනවාය කියන එක. මේ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් අතර කොහේවත් ඉන්නවාද කියා මා දන්නේ නැහැ, කලා මණ්ඩල මැහුම් ශාලා වැනි ආයතන පිහිටුවා ගෙන ඒවා ගණිකා මඩම්වලට හරවා ගෙන සිටින අය. එවැනි කවුරුවත් ආණ්ඩු පක්ෂයේ නැහැ. මතුවටත් ඇති නොවේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

So far as our relations with other countries are concerned, the Hon. Prime Minister has emphasized the fact that our policy is one of non-alignment ; that is, we refuse to be a party to any armed group, which is essentially for purposes of war, not for keeping peace. I think, during the last four and a half years this Government has consistently pursued this policy. Our relations with the socialist countries have been good. Our relations with the capitalist countries have been good. We have succeeded in keeping those good relations. Even though there are differences between the Soviet Union and the People's Republic of China, our relations with both those countries are good.

So far as aid, technical assistance and other matters are concerned, we are getting them from the socialist countries as well as from the capitalist countries. A good many of our projects have been completed because of the assistance we received —technical assistance as well as the lines of credit extended to us—from the socialist countries and we are getting aid in various forms from the capitalist countries too. So, a mixed economy has to depend on them.

Our position in the Indian Ocean is a very important one. Our trade relations with the East African region, the Persian Gulf region and the other Eastern regions have developed. Recent missions which have visited these countries in order to find prospects for trade and economic relations, have come back with very promising reports. That is the record of four and a half years of a stable Government : amity between communities and economic expansion.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

Even in the cultural field, I think, in spite of various difficulties we have had with students, university authorities and others, Ceylon has made better progress than even more advanced countries. Even in those countries there is student unrest. Our country, which is a developing country, finds it difficult to procure the necessary resources sometimes to meet immediately some of the problems that crop up.

So, the problems in the field of education including university education, the question of the unemployed graduates, of the educated unemployed—all these are problems that need solutions. And I think that the National Government will find solutions for them.

I do not propose to say anything more except that the Budget proposals of the Hon. Minister of Finance are trying in a difficult situation to solve the problems of a developing country. During the last four and a half years we have succeeded in expanding our economy, and it is only by increased production and by expanding the economy that all these problems that crop up can be solved.

අ. භා. 3.21

එස්. ඩී. බණ්ඩාරනායක මයා. (ගම්පහ)
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)
(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු කථානායකතුමනි, මේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවේ පස්වෙනි අවුරුද්දේ අයවැයයි. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අටවා තිබෙන මේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව රටටත් ජනතාවටත් හෙණ ගැහිල ගියත් පාර්ලිමේන්තුව තුළින් බලය අල්ලා ගැනීම ඔවුන්ගේ පරමාර්ථයයි. [බාධා කිරීමක්] ලබන අවුරුද්දේ මැතිවරණයක් ඇති බවක් කියාගෙන ඔවුන් මේ සූදානම් වීමේ අයවැයක් ඉදිරිපත් කරන අතර, ඇමෙරිකන් හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී කොම්පැණිකාරයනුත් ඉන්දියාවේ බිර්ලා වැනි කොම්පැණිකාරයිනුත් මේ රටට ගෙන්වාගෙන දිරාපත් වී යන මේ ධනේශ්වර ක්‍රමයට මොන ආකාරයේ හෝ මුක්කුවක් ගැසීමටයි ඔවුන් අදහස් කරන්නේ. වෙනෙකක් තබා එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කරන මේ අවධියේ දී එක පැත්තකට අධිරාජ්‍යවාදීන් සහ ඔවුන්ට ගැතිකම් කරන මේ රටේ ප්‍රතිගාමී ධනපති පන්තියත්, අනික් පැත්තට මේ රටේ බහුතර ජනතාවත් බෙදෙන ආකාරයට පැහැදිලි ඉරක් ඇඳීමට ඔවුන් අදහස් කරනවා. මේ රටේ කුඩා කර්මාන්ත හිමියන්, සුළු වෙළෙන්දන් වැනි උදවිය සම්පූර්ණයෙන්ම අහෝසි කර විශාල විදේශීය කර්මාන්ත හිමියන් ඒ වෙනුවට යොදා මේ රටේ අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයේ පවතින ආර්ථික බැමි නව නවත් තද කර ශක්තිමත් කර, ඔවුන් අදහස් කරන්නේ ලබන 1970 මැතිවරණයේදී ඔවුන්ට පාලන බලය දිනා ගන්නට බැරි වුණොත්, නැවත වරක් මේ සම්ප්‍රදාය අනුව මේ පාර්ලිමේන්තු සෙල්ලම අනුව, ඊළඟ අවුරුදු 5 දීවත් බලය අල්ලා ගැනීමටයි. ඔවුන් දැන් තියාම පියවර ගන්නේ එවැනි කටයුත්තකට බව අපි මතක් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, ගරු ඩඩ්ලි සේනානායක අගමැතිතුමා 1956 දී මෙන්ම ලබන මැතිවරණයට පසුවත් දේශපාලන බිමෙන් අයින් වෙන්න ලැහැස්ති වෙනවාය කියන දූසමාන ආරංචියක් තිබෙනවා. කෙසේ වුණත් මේ අවුරුදු 21 ක ඊනියා නිදහසකට පසු, මේ රටේ ආර්ථික තත්ත්වය ගැන අපි ටිකක් කල්පනා කර බලමු. එදා, මීට අවුරුදු 128 කට පෙර, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී මංකොල්ලකාරයින් විසින් 1841 අංක 9 දරන මුඩුබිම් ආඥපනත අනුව අක්කරය ශත 25 ට, 50 ට මංකොල්ල කා ගත් මේ රටේ දුප්පත් ගොවීන්ගේ ඉඩම් තවමත් තිබෙන්නේ ඒ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අතේ යි. ඔවුන් මේ රටේ තේ වතුවලින් දිනපතා තේ රාත්තල් දස ලක්ෂයක් ත්‍රිකුණාමලය වරායෙන් පිට කරනවා. මේ රටේ ජනතාවගෙන් ඔවුන් තේ රාත්තලක් මිළ දී ගන්නේ රු. 2.40 කට කිව්වු මිළකටයි. රාත්තලක් රු. 2.40 කට කිව්වු මිළකට ලබා ගන්න මොවුන් ඒවා එංගලන්තයට පටවා එංගලන්තයේදී ඊට අප්‍රිකාවේ, ඉන්දියාවේ සහ මැද පෙරදිග

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රටවල බාල තේ සමග මිශ්‍ර කර, ඒ මිශ්‍ර තේ ලංකා තේ හැටියට රාත්තල රු. 32 ට, 33 ට යුරෝපා රටවල විකුණනවා. මේ ආකාරයේ මංකොල්ලයක් ඔවුන් අවුරුදු ගණනාවක් තිස්සේ ගෙන ගොස් තිබෙනවා. පසුගිය අවුරුදු 21 තුළ පැවති කිසිම ආණ්ඩුවකට මේ සම්ප්‍රදාය අනුව බැරි වී තිබෙනවා, අධිරාජ්‍යවාදීන්ගේ ග්‍රහණයේ තිබෙන මේ සූරාකෑමෙන් මේ රට බේරා ගන්න.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආරම්භයේදී, එනම් 1951 දී, විදේශීය වතු ගැන එම පක්ෂ ප්‍රකාශනයේ සඳහන් වී තිබුණේ මේ ආකාරයටයි. "විශාල වැවිලි කර්මාන්ත ඇතුළුව සියලුම අත්‍යාවශ්‍යක කාර්මික ව්‍යාපාර ගමනාගමනය හා බඩු එහා මෙහා ගෙනයාමේ ව්‍යාපාර යන මේවා ජාතික වස්තූන් බවට පමුණුවා රජයේ ව්‍යාපාර මෙන් ගෙන යා යුතුයි" [(එ) කොටස 12 වන පිටුව. 1951 ශ්‍රී. ල. නි. ප. ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශණය හා ව්‍යවස්ථා.] ඒ වාගේම 1956 මාර්තු 10 වනදා නිකුත් කළ, දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ නායකත්වයෙන් යුත් මහජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි මෙසේ සඳහන් වෙනවා. "විදේශිකයන් සන්තකව පවත්නා වතු ජාතික සන්තක කරනු ලැබේ." [5 වන පිටුව, 19 වැනි ප්‍රකාශනය, මහජන එක්සත් පෙරමුණ]

ගරු කථානායකතුමනි, දිවංගත බණ්ඩාරනායක මැතිතුමාට පුළුවන් වුණා, 1956 මහා මැතිවරණයේදී, එක්සත් ජාතික පක්ෂය ආසන අටට බස්සන්න. නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පුළුවන් වුණේ නැහැ, අධිරාජ්‍යවාදීන්ගේ බැමි අහෝසි කරන්න, පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව. එම නිසාම නැවත වරක් එක්සත් ජාතික පක්ෂයට මේ රටේ බලයට එන්නට පුළුවන් වුණාය කියා මතක් කරන්න සතුටුයි. නිදහස ලැබී අවුරුදු විස්සකට වැඩි කාලයක් ගත වී ඇතත් විදේශිකයන් සතුව තිබුණු බැංකු තවමත් විදේශික කොම්පැණි අතේ මයි. ගිය මාසයේදී මෙම විදේශික කොම්පැණිකාරයන්ට මෙම ආණ්ඩුව දනනමස්කාර කළා. ඒ කියන්නෙ, ගිය අවුරුද්දේදී විදේශික කොම්පැණිකාරයන් ඉපයූ ලාභ රන් පවුම් කෝටි පහළොවක ප්‍රමාණයක්, විදේශ හිමිකම් සහතික පත්‍ර ක්‍රමයට යටත් කරන්නේ නැතුව, ගෙන යන්න ඉඩ දී තිබෙනවා.

ගරු කථානායකතුමනි, අධිරාජ්‍යවාදීන්ගේ ගසා කෑම නිසා අපේ මූලික අපනයන කෘෂිකාර්මික ද්‍රව්‍යයන් වන තේ, රබර් සහ පොල් මිල ලෝක වෙළඳ පොළේ ක්‍රම ක්‍රමයෙන් පහත වැටී ගෙන යනවා. ඒ වාගේම පිටරටින් ගෙන්වන පාරිභෝගික භාණ්ඩවල මිල ක්‍රම ක්‍රමයෙන් වැඩි වේගෙන යනවා. 1967 දී මෙරටින් ගෙන්වනු ලැබූ හා මෙරටින් පිටරට යවනු ලැබූ භාණ්ඩවල වෙළඳ පරතරය එසේ නැතිනම් හිඟය රුපියල් කෝටි විසි අට හමාරක් වන බව සඳහන් වනවා. එම වෙළඳ පරතරය පියවා ගත්තේ පිටරටින් ගෙන්වන භාණ්ඩවලට සියයට දහයක තීරු බද්දක් පැනවීමෙන්. ඒ බරත් දුප්පත් ජනතාව පිට පැටෙව්වා. මෙම ආර්ථික ක්‍රමය පවතින තුරු මොන ආණ්ඩුව බලයට පත් වුණත්, මෙම සම්ප්‍රදාය අනුව පොල් කට්ට අරගෙන අධිරාජ්‍යවාදී රට වලට හිඟමනේ යන්නටයි සිදු වන්නේ.

තමුන්නාන්සේලා විදේශ ආධාර ගැන කථා කරනවා. නමුත් පසුගිය අවුරුදු විසි එක තිස්සේ මේ ආකාරයට විදේශවලින් ණය ලබාගෙන අපේ රට උකස් කර තිබෙනවා, රුපියල් කෝටි 640 කට. කෝටි 32 ක් පමණ පොලී වශයෙන් අවුරුද්දකට ගෙවනවා. වෙන එකක් තබා අලුතෙන් ණය මුදල් ලබා ගෙන එම මුදලින් පොලී ගෙවීමේ ක්‍රමයකුයි සකස් කර ගෙන තිබෙන්නේ. ගරු කථානායකතුමනි, භාණ්ඩාගාරයෙන් ළඟදී විශ්‍රාම ගිය ලේකම් මහත්මයෙක්, දේශප්‍රේමී මහත්මයෙක් ප්‍රකාශ කළ පරිදි, මේ ආකාරයට තව අවුරුදු දහයක් පවත්වා ගෙන ගිය හොත් රට උකස් කර තිබෙන මුදල් ගෙවීම සඳහා රජයේ සේවකයන්ගේ, වැඩ කරන ජනතාවගේ ආදායමෙන් සියයට අනූවක් මාස්පතා කපන්න සිද්ධ වේවි. එම නිසා, පසුගිය අවුරුදු විසි එකක පමණ කාලය තුළදී, මෙම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව, මේ රටත්, ජනතාවත් සම්පූර්ණයෙන්ම උකස් කර තිබෙනවා. වෙන එකක් තබා මෙම එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

එදිනෙදා වුවමනාවන්ට අවශ්‍ය පිටි, කර වල, මිරිස් ආදි පාරිභෝගික භාණ්ඩ පවා ලබා ගන්නේ ණයට, පසුගිය කාලය තුළ දී රුපියල් ලක්ෂ හතලිස් හතරක කරවල ඒ අන්දමට ලබා ගෙන තිබෙනවා. මේ ආකාරයට භාණ්ඩ මිලදී ගැනීම සඳහා ගත් ණය ගෙවා අවසන් වන්නේ 2018 දීයි.

ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. டீ. செல்டன் ஜயசிங்க—கைத்தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

විකාර කථා කරනවා.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.

(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)

(Mr. S. D. Bandaranayake)

මේ ආණ්ඩුව අද ජනතාවට කෑමට දෙන ආහාරවලට අනාගත පරම්පරාවට වන්දි ගෙවන්න සිද්ධ වී තිබෙනවා. ඔන්න තමුන්නාන්සේලා කරන දේවල්. මේ ආණ්ඩු ක්‍රමය යටතේ මේ ධනේශ්වර පාර්ලිමේන්තු ක්‍රම ව්‍යවස්ථාවන් යටතේ මෙවැනි හිඟන තත්ත්වයකටයි රටේ ජනතාවට මුහුණ දීමට සිදු වන්නෙ. මේ ආණ්ඩු සම්ප්‍රදාය අනුව නොයෙක් නොයෙක් ආණ්ඩු බලයට එනවා. තමුන්නාන්සේලාට වුවමනා කරන්නේ රටට ජාතියට හෙන ගැහිල ගියත් කමක් නැහැ, කාගේ හෝ බෙල්ල කපා රටේ බලය අල්ලා ගැනීමයි. මේවා ගැන කියන විට තමුන්නාන්සේලා ටිකක් කලබල වෙනවා. මේවා ගැන කතා කරනවාට කැමති නැහැ.

ගරු කථානායකතුමනි, මේ ඊනියා නිදහස අපට ලැබී දැන් අවුරුදු 20 කටත් වැඩියි. ඔය කාලය ඇතුළතදී අතරමං වුණ තරුණයින් 20 ලක්ෂයක් පමණ සිටිනවා. ඔවුන්ට රක්ෂාවල් නැහැ. රක්ෂාවල් නැතිව අතරමං වුණ උපාධිධාරීන් 15,000 පමණ සිටිනවා. පාඨශාලා ශිෂ්‍යයින් ලක්ෂ 32ක් පමණ සිටිනවා. මේ ආණ්ඩු ක්‍රම සම්ප්‍රදාය යටතේ ඒ ශිෂ්‍යයින්ට අනාගතයක් නැහැ. දුප්පත් ගොවීන් 50 ලක්ෂයක් පමණ සිටිනවා. ඔවුන්ට ගොවිතැන් කිරීමට බිම් අඟලක් වත් නැහැ. ඔවුන් සතු ඉඩ කඩම් සියල්ල ධනේශ්වර පංක්තියට විකුණා නැත්නම් උකස් කර අවසානයි. මේ වැඩි වී තිබෙන ජීවන වියදම නිසා ඒවා සියල්ල විකිණී අවසානයි. සම්පූර්ණයෙන්ම අතරමං වුණ අද ගොවීන් 92,000ක් පමණ ඉන්නවා. ඒ වගේම අහස උඩට නැග තිබෙන ජීවන වියදම නිසා වැඩ කරන ජනතාව හතර අතට ණය වී සිටිනවා. රජයේ සංඛ්‍යා ලේඛන අනුව ළමා රෝහල්වල ළමයින් 3 දෙනෙකුගෙන් දෙන්නෙක්ම මන්ද පෝෂණයෙන් මිය යන බව සඳහන් වෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, මොන හවුලක් බලයේ සිටියත් මේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව යටතේ දුප්පතා ක්‍රම ක්‍රමයෙන් තවත් දුප්පත් වෙනවා. පොහොසතා ක්‍රම ක්‍රමයෙන් තවත් පොහොසත් වෙනවා.

එදා රුපියලක් ගෙන ගොස් මිලදී ගත් බඩු ටික ගන්න අද රුපියල් 7ක් 8 ක් පමණ ගෙවන්නට සිදු වී තිබෙනවා. දුප්පත් ජනතාවට අද එවැනි තත්ත්වයක ටයි මුහුණ දෙන්න සිදු වී තිබෙන්නෙ. ඇත්ත වශයෙන්ම අද රුපියලේ වටිනාකම ශත 20ක් පමණයි. මා දන්නවා ගම්පහ ප්‍රදේශයේ සිට දිනපතා වැඩට එන ජනතාව 15,000 ක් පමණ සිටිනවා. පෞද්ගලික අංශයේ හෝ රජයේ අංශයේ හෝ වැඩ කරන මේ උදවිය මාසයකට වරක් වැටුපක් ලබා ගත්තත් පළමුවැනි සතිය අවසාන වන විට ඒ මුදල් සියල්ල අවසාන වෙනවා. ජීවන වියදම ඉහළ ගොස් තිබෙන නිසා දෙවැනි සුමානයේ සිට ඔවුන්ට ජීවත් වෙන්න ක්‍රමයක් නැහැ. අවුරුදු 20ක නිස්සේ මේ අය වැඩ කරනවා. [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට හිනා වෙන්න පුළුවනි. තමුන්නාන්සේලා දැන් මේවාට හිනා වෙනවා. ලබන අවුරුද්ද වන විට මේවාට පිළිතුරු දෙන්නත් සිදු වේවි. මේ අවුරුදු 20ක් නිස්සේ මේ උදවිය වැඩ කළා. [බාධා කිරීම්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Interruptions must be intelligent and effective; mere shouting will not do. There is a time to interrupt and only intelligent interruptions will be allowed.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

ගරු කථානායකතුමනි, ඒ පාර්ලිමේන්තු සම්ප්‍රදායේ ලක්ෂණයක් තමයි. එය පුදුමයක් නොවෙයි.

මේ ආකාරයට මේ කම්කරුවන් අවුරුදු 20ක් තිස්සේ වැඩ කරනවා. නමුත් ඔවුන්ට මේතෙක් සෑහෙන ගෙයක් දොරක් සාදා ගැනීමට පුළුවන්කමක් ඇති වී නැහැ. ගමක සිටින ඕනෑම දුප්පත් ගොවියෙක් අර ගෙන බලන්න. සමහර විට ඔහුට කුඩා පොල් ඉඩම් කෑබැල්ලක් තිබෙන්න පුළුවනි. එහෙම නැත්නම් කුඩා කුරුඳු ඉඩම් කෑබැල්ලක් තිබෙන්න පුළුවනි. එහෙමත් නැතිනම් ගොවිතැන් කරන්න පුළුවන් කුඹුරු ලියැද්දක් දෙකක් තිබෙන්න පුළුවනි. ඊට වඩා දෙයක් නැහැ. ඒ වගේම ධීවර කාර්මිකයන්, වඩු වැඩ කරන අය මේසන් වැඩ කරන අය යකඩ වැඩ කරන අය රත්රන් බඩු සෑදීමේ යෙදී සිටින අය සිටිනවා. ඔය හැම කෙනෙක්ම අවුරුදු 20 ගණනක් තිස්සේ ඔය ආකාරයට වැඩ කළත් ඔවුනට ගෙයක් දොරක් සාදා ගැනීමට වත් හැකියාවක් ඇති වී නැහැ. මේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා යටතේ—පර සුද්දන් ඇති කළ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ක්‍රමය යටතේ—අද වැඩ කරන ජනතාවට එවැනි තත්ත්වයකුයි ලැබී තිබෙන්නෙ. ඒ වගේම අද ඇතැම් ගම්වල තිබෙන පොල් ගසකට අයිතිකරුවන් දෙතුන් දෙනෙක්ම සිටිනවා. මේ ආණ්ඩු ක්‍රමය යටතේ—මේ ධනේශ්වර පාර්ලිමේන්තු ක්‍රමය යටතේ—මේ රටේ සිටින ජනතාවගෙන් සියයට 95ක්ම අද මෙවැනි තත්ත්වයකටයි පත්ව සිටින්නෙ. ඉතින් ඒ අග නිශ්ශබ්දව ඉදගෙන කල්පනා කරනවා, මොකක්ද අපේ ඉරණම, මොකක්ද අපට සිදු වී තිබෙන කරුමය කියා. ඇත්ත වශයෙන්ම මෙය කරුමයක් නොවෙයි. ධනේශ්වර ක්‍රමයේ හැටි තමයි මේ. මේ කරුමය තමයි, 1917 දී ශ්‍රේෂ්ඨ ලෙනින් විසින් ආයුධ සන්නද්ධ විප්ලවයකින් රුසියාවෙන් විනාශ කර දැමුවේ. මේ කරුමය තමයි, ශ්‍රේෂ්ඨ සභාපති මාඕසේතුං විසින් 1949 ආයුධ සන්නද්ධ විප්ලවයක් අනුව චීනයෙන් අහෝසි කර දැමුවේ. අද චීනයේ දුප්පත් ගොවි ජනතාවට මහපොළොවේ නියම අයිතිකරුවන් වන්නට හැකි වී තිබෙනවා. අද එම රටේ කම්කරු පන්තියේ උදවිය පැක්ටරිවල හිමිකරුවන් වී සිටිනවා. එමෙන්ම බාල පරම්පරාවට රටේ අනාගතය හිමිවී තිබෙනවා. ඒ ආකාරයටයි මාක්ස් ලෙනින් වාදය හා මාඕ චින්තනය අනුව ප්‍රශ්න විසඳා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අද මේ රටේ හැම ගෙයක් දොරක් පාසාම තරුණයන් තුන් හතර දෙනෙක් කන්නට අඳින්නට නැතුව අතරමං වී සිටින බවයි පෙනෙන්නේ. ඔවුන්ගේ දෙමාපියන් ඔවුන්ට අධ්‍යාපනය ලබාදී තිබෙන්නේ තමන්ට අයත් ඉඩකඩම් කණකර පවා විකුණලායි; උකස් තියලායි. ඒ අන්දමට අධ්‍යාපනය ලබා ගත්තායින් පසුව ඔවුන්ට අතරමං වන්නට සිදු වී තිබෙනවා. දිනෙන් දින වැඩි වී තිබෙන ජීවන වියදම හේතුකොටගෙන ඔවුන්ගේ දෙමපියන්ට පුළුවන්කමක් ඇත්තේ නැහැ. අද මේ තරුණයන්ට වුවමනා කරන අන්දමට ආහාර පානාදිය හෝ ඇඳුම් පැළඳුම් හෝ සපයන්නට. අද රටේ ජනතාව ජීවත්වන්නේ ඔවැනි තත්ත්වයකිනුයි. මෙම පාර්ලිමේන්තු සම්ප්‍රදායයට අනුව ඔවුන් අද මෙවැනි තත්ත්වයකට ඇදවැටී සිටිනවා.

තමුන්නාන්සේලා පුරසාරම් දොඩනවා වගා ව්‍යාපාරය පිළිබඳව. ඒක සම්පූර්ණ ප්‍රෝඩාවක් බවයි කියන්නට තිබෙන්නේ. අද දුප්පත් ගොවියාට සිදු වී තිබෙන්නේ තමන්ට අයත් ඉඩම් කෑබෙල්ල සම්පූර්ණයෙන්ම ධනේශ්වර පන්තියට උකස් තියා, එසේ නැතිනම් විකුණා දමා, තමන්ට අයත්ව තිබුණු එම ඉඩම්වල ධනේශ්වර පන්තිය යටතේ ඉතා සුළු දවස් පඩියකට කුලීකරුවන් වශයෙන් වැඩ කරන්නටයි. [බාධා කිරීමක්] මේ අන්දමටයි ගරු කථානායකතුමනි, අද වැඩ කටයුතු කෙරෙන්නේ. රජයේ වාර්තාවලට අනුව, විශාල කොළනිවල ජීවත්වන දුප්පත් ගොවි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

ජනතාවගෙන් තුනෙන් දෙකක්ම ජීවත් වන බව පෙනෙන්නේ හිඟන්නන් වශයෙනුයි. ඊයේ පෙරේදා පිට කරන ලද වාර්තා වලට අනුව එසේ කියන්නට පුළුවනි. තමුන්නාන්සේලා ගොවි රජවරුන් පත් කරනවා. කවදාවත් කුඹුරකට බැස නැති කවදාවත් උදැල්ලක් නාල්ලපු අයයි ගොවි රජවරුන් වශයෙන් පත් කරන බව පෙනෙන්නේ.

තමුන්නාන්සේලා අක්කර දහස් ගණනින් කැළෑව විශාල කොම්පැනිකාරයන්ට නැතිනම් ධනේශ්වර පන්තියට බෙදා දුන්නායින් පසු ඔවුන් ඒවාට කරන්නේ කුමක්ද? අවුරුද්දකට ලක්ෂ 10ක ශුද්ධ ලාභයක් කොම්පැනිකාරයකුට තිබෙනවා නම් ඔහු මොකද කරන්නේ? තමුන්නාන් සේලාගෙන් අක්කර 1,000ක කැළෑව ලබා ගෙන ලක්ෂ 10 ම ඒ සඳහා වැය කරනවා යැයි පෙන්වනවා. එහෙත් ඇත්තවශයෙන් ම ඔහු වියදම් කරන්නේ 50,000 යි. ඉතිරි ලක්ෂ නවය හමාරම ඔහු තමන්ගේ සාක්කුවට දමා ගන්නවා. ආහාර වගා ව්‍යාපාරය මුවාවෙන් කොම්පැනිකාරයන් නැතිනම් ධනේශ්වර පන්තියේ උදවිය ගෙනියන්නේ ඔවැනි ප්‍රෝඩාවකුයි. අද ආහාර වගාව සම්බන්ධයෙන් ගෙනයන්නේ ඔය අන්දමේ ක්‍රියා මාර්ගයි.

අද මේ ආණ්ඩුව යටතේ කඳුකර ප්‍රදේශ වල අල වගාව සම්පූර්ණයෙන්ම අඩ පණ වෙලා. රෝග සහිත බීජ අර්තාපල් ගෙන්වා බෙදා හරිනවා. එම නිසා අර්තාපල් වගාව අඩ පණ වී තිබෙනවා.

පසු ගිය කාල සීමාව තුළ යක්වල ලෝහ භාණ්ඩ සංසථාවේ උදළු රුපියල් ලක්ෂ 55 ක පමණම එකතු වී තිබෙනවා. මේ ආණ්ඩුව ධනේශ්වර පන්තියට නැතිනම් කොම්පැනිකාරයන්ට පිටරටින් උදළු ගෙන්වන්නට ඉඩ දී තිබෙනවා. උදළු විකුණන්නට බැරි නිසා ඊයේ පෙරේදා කම්කරුවන් 400 කට පමණ රක්ෂාව දෙන්නට බැරුව ඔවුන් අස් කර දමා තිබෙනවා. රාජ්‍ය ඇමතිතුමා කිව්වා, ඒ ගැන පරීක්ෂා කර බලන්නට කොමිටියක් පත් කරන්නට ලෑස්ති බව. පරීක්ෂණ පවත්වන්නට කොමිටියක් පත් කර වැඩක් නැහැ. පිටරටින් උදළු ගෙන්වනවා නම් එම බලය කොම්පැනිකාරයන්ට නොදී ලෝහ භාණ්ඩ සංසථාවට දෙන්න. පුද්ගලික කොම්පැනිකාරයන්ට පවරා තිබෙන බලතල ලෝහ භාණ්ඩ සංසථාවට පවරන්න. කොමිටි පත් කර වැඩක් නැහැ. කර්මාන්ත ප්‍රතිපත්තිය ක්‍රියාවට යෙදෙන්නේ ඔය ආකාරයටයි.

දේශීය ධනපති පන්තියට නොදෙන ආධාර විදේශීය කොම්පැනිකාරයන්ට—ඉන්දියාවේ බිර්ලලාට—දෙන්න ලෑස්තියි. බිර්ලලා ගැන කතා කරන විට කිය යුත්තක් තිබෙනවා. කඳුකර ප්‍රදේශයෙහි සිටින ඉන්දියානු කම්කරු සහෝදරයන්ට මේ රටේ ඇතැම් ප්‍රතිගාමී ධනපතියන් දොස් කියනවා. ඒ ගැන කතා කරන විට මේ රටේ නැති ඩී. එම්. කේ. එකක් ගැන මතක් කර පුරසාරම් දොඩනවා. ඇත්ත වශයෙන්ම බිර්ලලා ගැන ඒ උදවියට පෙනෙන්නේ නැහැ. ඔවුන් මේ රටට ගෙන්වීමෙන් ඇති වන්නේ කොයි තරම් භයානක තත්ත්වයක්ද?

මේ ළඟදී එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවෙන්—FEECs නොහොත් වි.වි.හි.ස. මිල වැඩි කිරීමේ ක්‍රමයට අනුව—රුපියලේ වටිනාකම තුන්වන වරටත් පහත දමා තිබෙනවා. මේ ආර්ථික පරිහාණියේ බර තමුන්නාන්සේලා ජනගහනයෙන් සියයට 95ක් වන දුප්පතාගේ කර පිට පැටෙව්වා. රජයේ සේවකයින්ට රුපියල් දහයක පහළොවක සහනයක් දෙන්නට දැන් තමුන්නාන්සේලා ලෑස්ති වෙනවා. අඩු වශයෙන් නුපුහුණු කම්කරුවකුගේ දිනක වැටුප රුපියල් 6.50 ක් කරන ලෙසත් පුහුණු කම්කරුවකුගේ දිනක වැටුප රුපියල් 9.60ක් කරන ලෙසත් ලංකා කම්කරු සමිති සම්මේලනය ඉල්ලීමක් කර තිබෙනවා; යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. මා ඒ යෝජනාව ඉදිරිපත් කරනවා. ඒවාගේම සමස්ත ලංකා ගොවි සම්මේලනය වී බුසලකට ගෙවන සහතික මිළ වැඩි කරන්නය කියා ඉල්ලීමකුත් කර තිබෙනවා. මා ඒ යෝජනාවත් ඉදිරිපත් කරනවා. අවුරුදු විස්සකට ඉහත දී අපට ඊනියා නිදහසක් ලැබුණා. අවුරුදු පහෙන් පහට පාර්ලිමේන්තුවට නියෝජිතයන් පත් වෙනවා; අළුත් ආණ්ඩු ඇති වෙනවා. නමුත් එන්ට එන්ටම රට ප්‍රපාතයටයි වැටෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1947 පෙබරවාරි 4 වැනිදා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් මේ රටට ඊනියා නිදහස අටවාපු අවස්ථාවේදී දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා කළ ප්‍රකාශයක් මා මතක් කරන්නට සතුටුයි. මේ රටේ ජනතාවට ආර්ථික නිදහස ලැබෙන තුරු මේ දේශපාලන නිදහසින් වැඩක් නැත යන ප්‍රකාශය එතුමා කළා. ඒ අනුව එතුමා 1951 සැප්තැම්බර් මාසයේ 29 වන දින එක්සත් ජාතික පක්ෂයෙන් අස් වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගත්තා. ඇත්ත වශයෙන්ම මේ රටේ ජනතාව ඉදිරිපිට තිබෙන්නේ අධිරාජ්‍ය විරෝධි සටන බව අප පිළිගත යුතුයි. මේ පාර්ලිමේන්තුව ප්‍රෝඩාවක්; මිරිඟුවක්; සම්පූර්ණයෙන්ම කථා සාප්පුවක්; නාඩගම් මඩුවක්. මේ ඇමතිවරු හරියට රූකඩ වගෙයි.

ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)
(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

Mr. Speaker, can the hon. Member make those remarks? Is he in Order?

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Hon. Member for Gampaha, please respect Parliament. I have told you before too that if you come here and insult Parliament I cannot preside over this Assembly.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

අප කියන්නේ මේක මිරිඟුවක් බවයි.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

You can say that outside.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

පාර්ලිමේන්තුව තුළින් මේ රටේ ජනතාවට අපි ඒක අවබෝධ කරවා දෙන්නට ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

I have told you more than once that you must not speak disrespectfully of Parliament. Please withdraw those remarks and go on with your speech. This is the Budget Debate.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

අප කියන්නේ මේ පාර්ලිමේන්තුව මිරිඟුවක් බවයි; ප්‍රෝඩාවක් බවයි. අධිරාජ්‍යවාදීන් අටවා තිබෙන ප්‍රෝඩාවක් [බාධා කිරීම්] මේ ඇමතිවරුන් පිටුපසින් සිට ගෙන නූල් අදින්නේ කොහෙන්ද? නිව් යෝර්ක් නගරයෙන්; ලන්ඩන් නගරයෙන්. එසේ නැත්නම් නව දිල්ලියෙන්. ඇමතිවරුන්ට ස්ථිර වශයෙන් කිසිම බලයක් නැහැ. ඒකයි අප පැහැදිලි කරන්නෙ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Those remarks are not relevant to this discussion. If you are not going to obey me I will have to ask you to sit down.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

ඊළඟට මා වෙනත් ප්‍රශ්නයක් ගැන කථා කරනවා. ඉන්දියාවේ මෑතදී ඇති වූ සිද්ධීන් ගැන මා විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මතක් කරන්නට සතුටුයි. ඉන්දිරා ගාන්ධි අගමැතිවරිය බැංකු ජනසතු කරන්නට පනතක් ඉදිරිපත් කළා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඊට විරුද්ධව පියවරක් ගත්තා. බෙන්ගාලයේ සංශෝධනවාදීන්ගේ වාමාංශික එක්සත් පෙරමුණේ ආණ්ඩුවක් තිබුණා. පාර්ලිමේන්තු සැසිවාරයකදී පොලීසියෙන් තුන් දහසක් ජෝති බාසු කියන නායකයකුටත් මන්ත්‍රීවරුන්ටත්, ඇමතිවරුන්ටත් පහර දී පාර්ලිමේන්තුවේ පුටු මේස සම්පූර්ණයෙන්ම පොඩි පට්ටම් කර තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

You can be sure that that will not happen in Ceylon.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

තමුන්නාන්සෙගෙ කාලයත් ඉවරයි නොවැ මේ අවුරුද්දෙ. අප සියළු දෙනා ගේම කාලය අවසාන වෙනවා. ජනතාව වෙතැනට ඇවිත් මොන මොන දේවල් කරයිද කියා අපට කියන්නට බැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Can we hear some thing about the Budget ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

ලෝකයේ ජීවතුන් අතර සිටින ශ්‍රේෂ්ඨතම මාර්ක්ස්-ලෙනින් වාදියා වන මාවෝ සේතුං සහෝදරයා මතක් කර දී තිබෙන්නේ මෙසේය. "කාගෙ අතේද තුවක්කුව තිබෙන්නේ ඔහුගෙ අතේයි බලය තිබෙන්නේත් !" තවදුරටත් එතුමා "දේශපාලන බලය වැඩෙන්නේ තුවක්කුවේ කඳ තුලිනි" යන සත්‍ය පැහැදිලි කර දී තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මේක හොඳ පාඩමක්. [බාධා කිරීමක්] ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඔවුන්ගේ දේශපාලන ඉතිහාසයේ අද එක්තරා වැදගත් මංසන්ධියකට පැමිණ සිටිනවා. ජනතාවගේ දුක්ඛිත තත්ත්වයට මුහුණ දී පැහැදිලි වැද ගත් පියවරක් ගැනීමට ඔවුනට සිදු වී තිබෙනවා.

වික්‍රමසිංහ-කෙනමන් සංශෝධනවාදී කල්ලියත්, ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රතිසංස්කරණ වාදී කල්ලියත්, 1956 දී පැවැති බණ්ඩාරනායක රජය අධිරාජ්‍ය විරෝධි ආණ්ඩුවක් බව පිළිගත්තේ නැහැ. එම නිසා ඔවුන් එදා ඒ රජයට සම්පූර්ණයෙන්ම සහයෝගය දුන්නේ නැහැ. අද මොකද සිදුවී තිබෙන්නේ ? විලියම් සිංඤෝ, ආරියවංශ, වික්‍රම, ආදිපොල, පැන්ටිස් ආදී වූ දහස් ගණනකගේ වැඩ තහනම් වී රක්ෂා නැතිව සිටිනවා. නැවත වරක් ඒ අයට රක්ෂා දීමට 1970 වනතුරු ඉන්නයයි සංශෝධනවාදීන් සහ ප්‍රතිසංස්කරණවාදීන් කියන්නේ. ඒ අය වැඩ වර්ජනය කෙළේ නැවත වරක් රක්ෂා ලබා ගැනීමේ බලාපොරොත්තුවක් ඇතිව නොවෙයි. මේ රටේ විමුක්ති සටන උදෙසා ඔවුන් සටන් කළා. විප්ලව කාරීයයි කියා ගන්නා ලංකා සමසමාජ පක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනකු 1964 දී එක්සත් ජාතික පක්ෂයට සහයෝගය දී සිරිමා බණ්ඩාරනායක රජය පරාජයට පත් කලා. අද සංශෝධන වාදීනුත් ප්‍රතිසංස්කරන වාදීනුත් පාර්ලිමේන්තු මාවත පිළිගෙන තිබෙනවා. මාක්ස් ලෙනින්වාදය සහ විප්ලවය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කොට සෝවියට් සංශෝධනවාදී සාමකාමී සහජීවන යයි කියා ගන්නා ප්‍රතිපත්තිය අද ඔවුන් පිළිගෙන තිබෙනවා.

1960 මාර්තු මාසයේදී පිලිප් ගුණවර්ධන මහත්මයාට මොකද වුණේ ? ආසන සිය ගණනකට අපේක්ෂකයන් ඉදිරිපත් කළත් පණස් ගණනකගේ ඇපත් නැති වුණා. පණස් ගණනක් පරාජය වුණා, දෙන්නෙක් තුන්දෙනෙක් පාර්ලිමේන්තුවට ආවා. අන්තිමට ඔහු පවා පාර්ලිමේන්තු සෙල්ලම තුළින් එක්සත් ජාතික පක්ෂයට තුරුළු වීමෙන් කෙළවර වුණා. [බාධා කිරීම්] වියට්නාමයේ විමුක්තිකාමී ජනතාව විප්ලවයෙන් ජය ගත්තා. යුද්ධයේදී ඇමෙරිකන් අධිරාජ්‍යවාදීන් පරාජය කළා. එහෙත් ඡන්දයේදී විප්ලවකාරී කොටස් පරාජයට පත් වී ප්‍රතිගාමීන් ජය ගත්තා. එම නිසා මේ බංකොලොත් පාර්ලිමේන්තු ක්‍රමය ගැන ලංකා කොමියුනිස්ට් පක්ෂයේ කිසිම විශ්වාසයක් නැහැ. අප කියන්නෙ නව අවුරුදු 100 ක් තිස්සේ ජනතාව මේ විධියට කතිර ගැසුවත් මොන හවුලක් බලයට ආවත් පාර්ලිමේන්තුව තුලින් මේ රටේ ජනතාවගේ විමුක්තිය ලබාගන්නට බැරි බවයි. මේ පාර්ලිමේන්තුව තුළින් නිර්ධන පංති ආඥාදායකත්වයක් ඇති වන්නේ නැහැ. මොන හවුලක් ආවත් මේ තුළින් ඇති වන්නේ ධනපති ආඥාදායකත්වයක්. ලෝක ඉතිහාසයේ කිසිම රටක් පාර්ලිමේන්තුව ඔස්සේ සමාජවාදය කරා ගිහින් නෑ. පර සුද්දන් අපට ගෙනත් දුන් මේ ක්‍රමය ගැන අපගේ කිසිම විශ්වාසයක් නැහැ. එම නිසා පාර්ලිමේන්තුව නමැති වොලිබෝල් ක්‍රීඩා පිටියේ එක්සත් ජාතික පක්ෂයට කවදාවත් අපේ සහයෝගය දෙන්නේ නැහැ. එදා රුසියාවේ සාර් පාලන කාලයේදී, ලෙනින් සහෝදරයාගේ කාලයේදී, පාර්ලිමේන්තුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුළ කොමියුනිස්ට් පක්‍ෂයේ මන්ත්‍රීවරු එක් කෙනෙකු දෙන්නෙකු සිටියේ පාර්ලිමේන්තුව හොර ගුහාවක් බව රට වැසියාට පෙන්නුම් කිරීම සඳහායි. විප්ලව කාරී ක්‍රියා මාර්ගය දියත් කිරීමට පාර්ලිමේන්තුව වේදිකාවක් කර ගැනීම සඳහායි. ලංකා කොමියුනිස්ට් පක්‍ෂයේ නියෝජිතයා වශයෙන් මම මේ පාර්ලිමේන්තුව තුළ ගෙන යන්නේ ඒ ක්‍රියා මාර්ගයයි.

එම නිසා අවසාන වශයෙන් මා කියා සිටින්නේ, මේ රටේ සිංහල හෝ වේවා, මුස්ලිම් හෝ වේවා, ද්‍රවිඩ හෝ වේවා, දුප්පත් ගොවි කම්කරුවන් හෝ වේවා. තරුණයන් ශිෂ්‍යයන් හෝ වේවා උගතුන් බුද්ධිමතුන් හෝ වේවා, අධිරාජ්‍ය විරෝධි, යූ. එන්. පී. විරෝධි, පෙඩරල් විරෝධි, රදළ විරෝධි සියලුම ජනතා කොටස් එක් වී, එදා වාරියපොල හිමි, කුඩහපොල හිමි, කැප්පෙටිපොල, පුරංඅප්පු, ගොංගාලේ ගොඩ බංඩා වැනි අය පෙන්නුම් කල මාවතේ ගොස් තුවක්කු රැගෙන අධිරාජ්‍ය වාදීන් මේ රටින් පන්නා දමා මාක්ස් ලෙනින් වාදය මාඕ චින්තනය අනුව කොමියුනිස්ට් ආණ්ඩුවක් මේ රටේ පිහිටුවන තුරු ජනතාවට විමුක්තිය ලබා ගන්නට බැරි බවයි.

අ. භා. 3.51

පී. බී. ඒ. වීරකෝන් මයා. (වත්තේගම)
(*திரு. பீ. பி. எ. வீரக்கோன்—வத்தேகம*)
(Mr. P. B. A. Weerakoon—Wattegama)

ගරු කථානායකතුමනි, ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මයා.) දුප්පතාගේ නිදහස ගැන, ගොවි ජනතාවගේ නිදහස ගැන හුඟක් කථා කළා. එහෙත් එතුමා කීවා, එතුමා බලයට එන්නට අදහස් කරන්නේ විප්ලවයකින් බව; දුප්පතාගේ ලේ වගුරා, දුප්පතා මරා බව. ඡන්ද බලය නැති කර තුවක්කුවේ බලයෙන් ආණ්ඩු බලය ලබා ගන්නා බව කියමින් එතුමා කෑගැසුවා. ආණ්ඩු ක්‍රමය වෙනස් කිරීම අවශ්‍ය බව එතුමා කියනවා. ආණ්ඩු ක්‍රමය මේ රටට ගැළපෙන විධියට වෙනස් කිරීම අවශ්‍ය බව අපත් කියනවා. ඒ සඳහා මේ රජයෙන් කොමිටියක් පත් කර තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ සහයෝගය නොලැබෙන නිසයි, ඒ කටයුත්ත කල් යන්නේ. මේ ආණ්ඩු ක්‍රමය මේ රටට සුදුසු නැත කියමින් කෑගසන අයගේ සහයෝගය කෝ? ගම්පහ මන්ත්‍රීතුමා වගේම විරුද්ධ පාර්ශ්වයේ අනික් අයත් මේ ගරු සභාවේදීත්, එලෙසම මේ ගරු සභාවෙන් පිට සෑම වේදිකාවකදීත් කෑගසා කියන්නේ තමන් දුප්පතාගේ මිත්‍රයන් බවයි; දුප්පතාගේ යහපත සඳහා වැඩ කරන්නට එන අය බවයි. එහෙත් බලයේ සිටින කාලයේදී විරුද්ධ පාර්ශ්වය දුප්පතා වෙනුවෙන් කළ එක වැඩක්වත් තිබෙනවා නම් එය පෙන්නුම් කරන ලෙස මා ඉල්ලා සිටින්නට කමතියි. මොන ගොවි ජනපදයද ඒ අය ඇති කළේ? එක ගොවි ජනපදයක්වත් ඇති කළා නම් ඒක තියෙන්නේ කොහේද කියා මා අහන්නට කමතියි. ඒ අය එක පාරක්වත් හැදුවද? එක පාලමක්වත් හැදුවද? කෘෂිකර්මය දියුණු කළාද? නිදහස් අධ්‍යාපනය දුන්නද? නිදහස් බෙහෙත් ශාලා ඇති කළාද? මධ්‍යම විද්‍යාල ඇති කළාද? ඔය එකක්වත් ඒ අය කළේ නැහැ. එසේ කරන්නෙ නැතිව කෑගහනවා, අපි තමයි, කෙරුම් කාරයෝ; අපි තමයි දුප්පතාට වැඩ කරන මිනිස්සු කියා. ඒ අය පිං පඩි දෙන්නටවත් මාර්ගය යෙදුවද? මේ පක්ෂයේ නායකයන් බලයට පත් වුණාට පසුවයි, ඒ කටයුත්තත් කළේ.

තමන් බලයට පත් වුණොත් මේ රට ආණ්ඩු කරන්නේ තුවක්කුවේ බලයෙන් බව ගම්පහ ගරු මන්ත්‍රීතුමා දැන් ප්‍රකාශ කළා. එසේනම් නිදහස කෝ කියා මා ප්‍රශ්න කරන්නට සතුටුයි. තුවක්කුවේ බලයෙන් ආණ්ඩු කරනවා නම් මහජනයාගේ නිදහස කෝ? ඒකට උත්තරයක් නැහැ. උත්තරයක් දෙන්න බැහැ. නායකයන් කීප දෙනකු අතේ පමණක් බලය තබා ගෙන අනික් අය සදාකාලිකවම වහලුන් වශයෙන් තබා ගැනීමේ ක්‍රමයයි, එතුමාට වුවමනා කර තිබෙන්නේ. [බාධාකිරීමක්] ඒකාධිපති රටවල මොකද වෙන්නෙ? මාඕ සේතුං මොකද කරන්නෙ? චෙකොස්ලෝවෙකියාවේ මොකද කළේ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(*திரு. எஸ். டீ. பண்டாரநாயக்க*)
(Mr. S. D. Bandaranayake)

ඒක වික්‍රමසිංහ කල්ලියෙන් අහන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීරකෝන් මයා.
(திரு. வீரக்கோன்)
(Mr. Weerakoon)

අපි අහන්නෙ දෙපක්ෂයෙන්ම. තමන්ගේ රටේ ජනතාවට පමණක් නොව අල්ලපු රටේ ජනතාවටත් නිදහසේ ජීවත් වන්නට හෝ නිදහසේ කල්පනා කරන්නට හෝ නිදහසේ අදහස් ප්‍රකාශ කරන්නට හෝ ඉඩ දෙන්නෙ නැති පක්ෂයක් ගැනයි, ගම්පහ ගරු මන්ත්‍රීතුමා ආඩම්බරයෙන් කථා කරන්නේ.

ගම්පහ ගරු මන්ත්‍රීතුමා බණ්ඩාරනායක අගමැතිතුමාගේ ගුණ කිවා. එහෙත් බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේදී ගම්පහ මන්ත්‍රීතුමා එතුමාට පයින් ගහලා අනික් පැත්තට ගියා. අන්තිමේදී, කණගාටුයි කියන්නට, 1960 මැතිවරණයේදී ගම්පහ ගරු මන්ත්‍රීතුමා වෙනුවෙන් මටත් පොඩි බොරුවක් කියන්නට සිදු වුණා. ගම්පහ ගරු මන්ත්‍රීතුමා ගරු බණ්ඩාරනායක අගමැතිතුමාගේ පක්ෂයෙන් අස් වුණේ බණ්ඩාරනායක අගමැතිතුමාගේ සතුරන් අස් කරන්නට ගොස් ඒ වැඩය කර ගන්නට බැරි වුණු නිසා බව මා කියා සිටියා. ඒවා ගැන වැඩිපුර විස්තර කරන්නට වුවමනාවක් නැහැ. දැන් මා කථා කරන්නට යන්නේ අපේ රජයෙන් ඉදිරිපත් කර තිබෙන අයවැය ලේඛනයට විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කී යම් යම් දේවල් සම්බන්ධවයි.

ගරු කථානායකතුමනි, මේ රජයේ වගා ව්‍යාපාරය නිෂ්ඵල වුණාය, එයින් කිසිවක් සිදු වුණේ නැත කියා කියන්නට යෙදුණා. එහෙත් වගා ව්‍යාපාරය නිෂ්ඵල වුණාය කියන එක බොරුවක් බව මට කලින් කථා කළ කර්මාන්ත හා ධීවර ඇමතිතුමාත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් හුඟදෙනෙකුත් ඔප්පු කළා. ඇස් ඇති, යන්තම්වත් පෙනෙන ඕනෑම කෙනෙක් රටේ තොටේ ඇවිද්දොත් මේ රජයෙන් කර තිබෙන වාඩ මොනවාද යන්න බලාගන්නට පුළුවන්. මේ රටේ කෘෂිකර්මය සම්බන්ධව දියුණුවක් ඇති වී තිබෙන බව ඕනෑම කෙනෙකුට පෙනී යනවා ඇති. ඒ නිසා ඒ ගැන වැඩිපුර යමක් කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 4.30 p.m. On resumption the Hon. Deputy Chairman of Committees will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 4.30ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.

Sitting accordingly suspended till 4.30 P.M. and then resumed, MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *in the Chair.*

වීරකෝන් මයා.
(திரு. வீரக்கோன்)
(Mr. Weerakoon)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කථා කරමින් සිටියේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන්ගේ විවේචන සම්බන්ධවයි. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කියන්නේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව, නැත්නම් දනට තිබෙන ආණ්ඩුව, වැඩ කරන්නේ ධනපති පන්තියටය කියලයි. එය වේදිකාවේත් කියන දෙයක්. මේ ගරු සභාවේදීත් තම තමන්ගේ කථාවලින් හඟවන්නට නැත් කළේ මේ ආණ්ඩුව දුප්පතාගේ හතුරා වශයෙනුයි. එහෙත් මේ අවස්ථාවේදී මා සඳහන් කරන්නට ඕනෑ කරුණු කීපයක් තිබෙනවා. හාල් සේරුව නිකම් දෙන්නෙත් මේ ආණ්ඩුවයි. රජයේ සේවකයින්ට වැඩි පඩි දෙන්නෙත් මේ ආණ්ඩුවයි. පසුගිය ආණ්ඩුව පැවති කාලයේදී—ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සම සමාජ හා කොමියුනිස්ට් පක්ෂත් එක් වූ අවස්ථාවේදී—වෘත්තීය සමිති මාර්ගයෙන් රජයේ සේවකයින් විසින් ඉල්ලීම් 21 ක් ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේදී එවකට මුදල් ඇමති වශයෙන් සිටි යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කියා හිටියා. "රට සංවර්ධනය වුණාම ඉල්ලීම් දෙන්නට පුළුවන්; එතෙක් පටි තද කරගෙන වැඩ කරන්න" කියා. එහෙනම් මේ ආණ්ඩුවට රජයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේවකයින්ට වැඩි පඩි දෙන්නට පුළුවන් වුණේ කොහොමද? රටේ සංවර්ධනයක් ඇති වුණේ නැත්නම් දෙන්නේ කොහොමද? එමෙන්ම මේ රජය පොරොන්දු ඉටු කරන රජයක් බව මා කියන්නට ඕනෑ. මේ රජය මහජනයා මුළා කර වචනවලින් ඔවුන් සතුටු කර හිස් අතින් පිටත් කරන ආණ්ඩුවක් නොවෙයි. මේ ආණ්ඩුව මහ ජනතාව වෙනුවෙන් කරන්නට තිබෙන වැඩ කටයුතු යුක්තිසහගත අන්දමින් ඉටු කරන ආණ්ඩුවක්.

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කියා සිටි තවත් කරුණක් තමයි මේ රජය ධන පතීන්ට ඉඩම් දෙනවාය කියන එක. මැද වච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) මෙයට සතියකට පමණ කලින් අනුරාධපුරය ප්‍රදේශයේ විශාල ඝෝෂාවක් කර තිබුණා ධනපතීන්ට ඉඩම් දුන්නාය කියා. එමෙන්ම අදත් එතුමාගේ කථාවේදී කියා හිටියා ධන පතීන්ට අක්කර විශාල සංඛ්‍යාවක් දී තිබෙනවාය කියා. ගරු නියෝජ්‍ය සභාපති තුමනි, හදිසි අවස්ථාවකදී මේ රජයට ඔය වැඩේ කරන්නට සිදු වුණා. රටේ ආහාර හිඟයකුත් ආර්ථික පරිහානියකුත් ඇති වූ අවස්ථාවක එයින් රට බේරා ගැනීම සඳහා ධනවත් අයගේ මුදල් ඒ සඳහා යොද වන්නට සිදු වුණා. දුප්පත් කෙනෙකුට අක්කර දෙකක් දුන්නට වෙළඳ පොළට එවන්නට තරම් නිෂ්පාදනයක් කරන්නට ඒ අයට අමාරුයි. විශාල වශයෙන් ගොවි තැන් කරන්නට නම් මුදල් තිබෙන්නට ඕනෑ. වී වගාවට හෝ එළවලු වගාවට හෝ වෙනත් ධාන්‍ය වගාවකට හෝ සතුන් ඇති කිරීමට හෝ විශාල මුදලක් යොදවන්නට ඕනෑ. එය කරන්නට පුළුවන් ධනවත් අයටයි. එමෙන්ම එය කරන්නෙත් රටේ ප්‍රයෝජනය පිණිසයි. අනික් අතට ඒ ඉඩම් ඒ අයට දී තිබෙන්නේ බද්දකටයි. කාල යක් ගිය විට ඒ ඉඩම් මහජනයාගේ ප්‍රයෝජනයට ලබා ගත හැකි වන අන්දම ටයි ඒවා දී තිබෙන්නේ. වගාවක් සාර්ථක අන්දමින් කරන්නට කෘෂිකර්මය ගැන දැනුමක් ඇති විශේෂඥයින් හා පාලනය ගැන දන්නා අයත්, අවශ්‍ය උපකරණ ආදි යත් ලබා ගැනීමට පුළුවන්කම තිබෙන්නේ ධනපති පක්ෂයටයි. එවැන්නක් සාර්ථක අන්දමින් කරන්නට පුළුවන්කම තිබෙන් නේ ඒ අයට නිසා එය ජාතිය වෙනුවෙන් කළ හොඳ වැඩක් බව මා කියන්නට කැමතියි.

එසේ දුන් හුඟක් ඉඩම් වවා නැත කියා අද "සන්" පත්තරයේ තිබුණා. මට පෙනෙන හැටියට එසේ වවා නැත්තේ මධ්‍යම පන්තියේ අය බව මතක් කරන්නට කැමතියි. ඒ අයට අවශ්‍ය තරම් මුදල් නැහැ. ඒ නිසා උපකරණ ආදිය ගන්නට පුළුවන්කමක් නැහැ. අන්න ඒ නිසයි, ඒ ඉඩම් වවන්නේ නැතිව අත්හැරදමා තිබෙන්නේ. මුදල් තියෙන අය ඒ ඉඩම් වගා කිරීමෙන් රටටත් මහජනයාටත් ප්‍රයෝජනවත් වන අන්දමින් ක්‍රියා කොට තිබෙනවා. ඒ නිසා විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කියන කථාවේ ඇත්තක් නැහැ. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මහජනයා රැවටීම සඳහා වේදිකා මත නැඟී, "ධනපතියන්ට මේ මේ තරම් පහසුකම් සලසා තිබෙනවා; මේ මේ තරම් ඉඩම් දී තිබෙනවා" යනුවෙන් ප්‍රකාශ කරනවා. ඒවා මහජනයා මුළා කිරීම සඳහා කරන විවේචන පමණයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීරිගම මන්ත්‍රීවරිය (ඔබේසේකර මිය.) හොඳ කථාවක් කරන ගමන් මේ රජය පාරවල් ගැන සැලකිල්ලක් දක්වා නැතැයිද ප්‍රකාශ කළා. එහෙත් එහි ඇත්තක් නැහැ. මේ ආණ්ඩුව රට කරවීම භාර ගන්න විට පාරවල් සෑදීම සඳහා අවශ්‍ය "රෝලර්" තිබුණේ නැහැ; තාර තිබුණේ නැහැ; උපකරණ තිබුණේ නැහැ. ඇත්තෙන්ම පසුගිය අවුරුදු හතරහමාර ඇතුළත එක් ආසනයකට රුපියල් ලක්ෂ 10ක් තරම් වූ මුදලක් මේ රජය වැය කර තිබෙනවා. ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව හා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව කළ වැඩවලට අමතරව උඩරට ගැමි පුනරුත්ථාපන අංශයෙන් රුපියල් ලක්ෂ 34 කට වැඩියෙන් උඩරට ප්‍රදේශයේ පාරවල් සඳහා වියදම් කර තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නියෝජනය කරන කොට්ඨාශවල වැඩ කර නැතැයි චෝදනාවක් තිබෙනවා. ඒ චෝදනාවේද සත්‍යයක් නැහැ. වත්තේගම කොට්ඨාශයේ පාරවල් සෑදීම සඳහා උඩරට ගැමි පුනරුත්ථාපන අංශයෙන් වියදම් කර තිබෙන මුදලට වැඩි මුදලක් මිනිපේ කොට්ඨාශයට වියදම් කර තිබෙනවා. ඒ වාගේම වත්තේගම කොට්ඨාශය සඳහා වියදම් කරන ලද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරකෝන් මයා.]

මුදලට වැඩි මුදලක් තෙල්දෙණිය කොට්ඨාශයට වියදම් කර තිබෙනවා. ඒ නිසා විරුඬ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් ඒ කරන්නේ අසත්‍ය ප්‍රකාශ බව මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැනට සෙනෙට් සභාපතිවරයා වශයෙන් සිටින ඒ. රත්නායක මහත්මයා පසුගිය ආණ්ඩු කාලයේදී වත්තේගම කොට්ඨාශය නියෝජනය කළා. ඒ වාගේම ඒ කාලයේ එතුමා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙක්. ඉතින් සිදු වුණේ මොකක්ද? ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුව එකම ශතයක්වත් ඒ කාලයේදී ඒ කොට්ඨාශය සඳහා වියදම් කර නැහැ. මා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට ගිය අවස්ථාවේදී, කොතැනින් පටන් ගත යුතු දැයි තේරුම් ගැනීම සඳහා පොත්පත් බැලුවා. එවිට ඒ කාලය වෙනුවෙන් එක ශතයක්වත් වියදම් කර තිබුණු බවක් මට පෙනුණේ නැහැ. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් නියෝජනය කළ කොට්ඨාශවලට එදා සැලකුවේ ඒ විධියටයි. එහෙත් මේ ආණ්ඩුව පක්ෂ භේදයෙන් තොරව සාධාරණ අන්දමට ඒ කට යුතු කරනවා. මේ ආණ්ඩුව බලයට පත් වුණායින් පසු ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවෙනුත්, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවෙනුත්, උඩරට ගැමි පුනරුත්ථාපන අංශයෙනුත් වත්තේගම කොට්ඨාශය සඳහා රුපියල් ලක්ෂ 15 ක පමණ මුදලක් වියදම් කර තිබෙනවා. තවද, පළාත් පාලන අංශයෙන්ද නොයෙකුත් ආධාර ලබාගෙන තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩු කාලයේදී ඒ ඒ කොට්ඨාශවල පරවල් දියුණු කිරීම සඳහා ක්‍රියා කර නැතැයි කියතොත් එය බොරුවක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුම්රිය දෙපාර්තමේන්තුවේ තත්ත්වය ගැන තමුන්නාන්සේ දන්නවා. මෙම ආණ්ඩුව බලයට පැමිණියායින් පසු අලුත් දුම්රිය එන්ජින් ගෙන්වා වැඩ කරගෙන යන්නට පටන් ගත්තා. පසුගිය කාලයේ සිටි ඇමතිවරුන්ගේ අදක්ෂතාව නිසයි, අද මේ ආණ්ඩුවට මේ තරම් මහන්සි වන්නට සිදු වී තිබෙන්නේ. ඒ කාලයේදී මොළයක් ඇතිව දක්ෂ ලෙස වැඩ කරගෙන ගියා නම්, මේ වන විට රට හුඟක් දියුණු වන්නට තිබුණා. ඇත්තෙන්ම පසුගිය ආණ්ඩුව පවතිද්දී මේ රටේ පාරවල තත්ත්වය ඉතාමත්ම අසතුටුදායකව පැවතුණා. මෝටර් රථයක් ධාවනය කර වන්නට පවා අපහසු තත්ත්වයකටයි මහා මාර්ග පත්ව තිබුණේ. ඇත්තෙන්ම එදා තිබුණු තත්ත්වය ගැන කල්පනා කරන විට අද මහා මාර්ගවල තත්ත්වය සියයට සියයක්ම හොඳ බව කියන්නට පුළුවනි. ප්‍රසිද්ධ වැඩ පිළිබඳ ඇමතිතුමා පාරවල් සම්බන්ධ සෑහෙන දියුණුවක් ඇති කර තිබෙනවා.

ඊළඟට අධ්‍යාපනය ගැනත් යමක් කියන්නට කැමතියි. අධ්‍යාපනය සම්බන්ධයෙන් මේ ආණ්ඩුව ක්‍රියා කරන ආකාරය නුසුදුසුයයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කියනවා. අනාගතයේදී අපේ දරුවන් පාඨශාලා හැර යන විට ඔවුන්ට රක්ෂා ලැබෙන ආකාරයට අධ්‍යාපන ක්‍රමය සකස් කළ යුතුයයිද, රටට ගැළපෙන ආකාරයට සංවර්ධනයට සුදුසු වන ආකාරයට අධ්‍යාපන ක්‍රමය සකස් කළ යුතුයයිද අප කියා සිටියා. එහෙම කෙරෙන්නෙ නත්තේ ඇයිදැයි අපෙන් අහනවා. අප එය දැනටමත් කරගෙන යන බව තමුන්නාන්සේල ම දන්නවා. අධ්‍යාපන ක්‍රමය එක දවසින් වෙනස් කරන්නට බැහැ. යම්කිසි ක්‍රමයක් අනුව මෙතෙක් අධ්‍යාපනය ලබාගෙන ආ අය ඒ විධියටම යන්නට ඕනෑ. රටේ වුවමනාවන්ට ගැල පෙන ලෙස අප විසින් සකස් කර ඇති අධ්‍යාපන ක්‍රමයේ ප්‍රතිඵල ලැබෙන්නට අවුරුදු 10 ක් 15 ක් ගත වෙනවා. තමුන්නාන්සේලා අධ්‍යාපනය නිසි මඟට යොමු නොකිරීම නිසා තමයි, උපාධිධරයන් අනාථ වී සිටින්නේ.

පර්සි වික්‍රමසිංහ මයා. (කඹුරුපිටිය)

(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ—கம்புறுப் பிட்டிய)

(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

ඒ කාලයේ තමුන්නාන්සේත් ගුරුවරයෙක්.

වීරකෝන් මයා.

(திரு. வீரக்கோன்)

(Mr. Weerakoon)

මා ගුරු වෘත්තියෙන් ඉවත් වී දැනටමත් අවුරුදු 15 ක් පමණ වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
ඒ කාලයේ පාර්ලිමේන්තු ලේකම් ?

වීරකෝන් මයා.
(திரு. வீரக்கோன்)
(Mr. Weerakoon)
ඔව්. ඒ කාලයේ තමයි එවකට අධ්‍යාපන ඇමති ධුරය දරූ දහනායක මහතාගේ විශේෂ උනන්දුව නිසා විද්‍යා අධ්‍යාපනය දීම සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් ගෙන ගියේ. තමුන්නාන්සේලාගේ කාලයේ අධ්‍යාපනයේ දියුණුවට කිසිම දෙයක් වුණේ නැතැයි මා කියන්නේ නැහැ. එහෙත් අධ්‍යාපනය පිළිබඳ විප්ලවයක් ඇති වුණේ මේ කාලයේදීයි. කවුරු කළත් අධ්‍යාපන ක්‍රමය එක වරම වෙනස් කරන්නට පුළුවන් කමක් නැහැ. එය වෙනස් කළ යුත්තේ ක්‍රමානුකූලව ටිකෙන් ටිකයි. ඒ අනුව දැන් වෙනස් කරගෙන යනවා. මෙරට සංවර්ධනය සඳහා අවශ්‍ය කාර්මික ශිල්ප ඥානය ලබා දීම සඳහා රුපියල් ලක්ෂ ගණනක් වියදම් කොට දැනටමත් කටුබැද්දේ කාර්මික විද්‍යාලයක් පවත්වාගෙන යන අතර, තවත් එවැනි කාර්මික විද්‍යාලයක් ඇති කිරීමට කටයුතු කරගෙන යනවා. රජයට ගත් පල්ලෙකැලේ වත්තෙනුත් අක්කර 100 ක් වෙන් කර තිබෙනවා. "Comprehensive Trade School" නමැති ආයතනයක් පිහිටුවා ඒ ඒ රැකියාවන් සඳහා තරුණයන්ට පුහුණුවක් ලබා දීමට. එසේම වැඩ කිරීමේ වටිනාකම පිළිබඳ අවබෝධයකුත් රජය මගින් ළමයින්ට ලබා දෙනවා.

රටක සංවර්ධනය සඳහා, සමාජයක පැවැත්ම සඳහා විනය අත්‍යවශ්‍ය බව අප හැමෝම පිළිගන්නවා. විනය පිරිහීම නිසා තමයි, අද අපරාධ වැඩි වී තිබෙන්නේ. එම නිසා අපරාධ අඩු කිරීමේ පියවරක් වශයෙන් විනය පවත්වාගෙන යාමට සෑම දේශපාලන පක්ෂයක්ම උනන්දු වෙන්න ඕනෑ. විනය ගරුක පරපුරක් ඇති කිරීමත්, අධ්‍යාපනයේ එක පරමාර්ථයක්. මෙරට අධ්‍යාපනය නිසි පරිදි හැඩගැස්වීම එක දේශපාලන පක්ෂයකට පමණක් අයිති කටයුත්තක් නොවෙයි. ඇත්ත වශයෙන්ම දේශපාලනඥයන් අධ්‍යාපනයට ඇඟිලි ගැසීම නුවණට හුරු දෙයක් නොවන බව ... ගුරුවරුන් කියා තිබෙනවා. අධ්‍යාපන විශේෂඥයන්ගේ ගුරුහරුකම්, අවවාද අනුශාසනා අනුවයි, අපේ අධ්‍යාපන ක්‍රමය සකස් කළ යුත්තේ. මේ රජය වැඩ කරගෙන යන්නේ ඒ අනුවයි. මා කලිනුත් සඳහන් කළා වාගේ, එහි ප්‍රතිඵල අවුරුද්දකින් දෙකකින් ලබන්නට පුළුවන්කමක් නැහැ.

අප රැකිරක්ෂා ප්‍රශ්නය විසඳා නැති බවටත් චෝදනා නැඟුණා. ඒ උග්‍ර ප්‍රශ්නය විසඳීම සඳහාත් අප නිසි පියවරගෙන තිබෙනවා, නිසි මාර්ග සලසා තිබෙනවා. පසුගිය රජය ස.තො.ස. සේවකයන් අස් කොට ඒ වෙනුවට වෙනත් අය පත් කළ පරිදි ක්‍රියා කිරීමෙන් ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. එහෙම නම් එයින් ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. අපි අලුත් මාර්ග යොදන්න ඕනෑ. මොනවාද ඒ අලුත් මාර්ග ? එකක් කෘෂිකර්මයයි. කෘෂිකර්මය ගැන අපි පුළුල්ව කල්පනා කරන්න ඕනෑ. මේ රටට ධනය ලබාගන්නට පුළුවන් වන්නේ මහ පොළොවෙනුයි. එසේ නම් වී ගොවිතැන, පලතුරු වැවීම, ධාන්‍ය, බෝග ආදිය වගා කිරීම ආදියෙන් මහපොළොවෙන් ගත යුතු ප්‍රයෝජනය අපි ලබාගන්න ඕනෑ. අපට සතුන් ඇති කරන්න පුළුවන්. මේ රටේ ඒ සඳහා බොහෝම ඉඩකඩ තිබෙනවා. බලන්න, අද මේ රටට පිටරටින් මස් සඳහා සතුන් ගෙන්වන්නට සිද්ධ වී තිබෙනවා. මස් රාත්තලක් අද කීයක් වෙනවද ? ජීවන වියදම ඉහළ නගිනවලු. එය නැවැත්වීම සඳහා අප විසින් කළ යුත්තේ මේ රටේම නිෂ්පාදනය වැඩි කිරීමයි. මේ රටේ නිෂ්පාදනය වැඩි නොකර එය කරන්නට බැරි බව තමුන්නාන්සේලා සියලු දෙනාම පිළිගන්නවා ඇති. යම් කිසි රටක බඩු නිපැදවීම අඩුනම් ඒවායේ මිළ ඉහළයි. බඩු වැඩිය තිබෙනවා නම් මිළ අඩුයි. ඒ අනුව අපේ කිරි පිටි මේ රටේම නිෂ්පාදනය කරගන්න ඕනෑ. අපට වුවමනා කරන මස් මේ රටේම නිෂ්පාදනය කරගන්න ඕනෑ. අපට ඕනෑ කරන බිත්තර ටික මේ රටේම නිෂ්පාදනය කරගන්න ඕනෑ. පලතුරු, වී, ආදී අනිකුත් දේවලුත් මේ රටේම නිෂ්පාදනය කරගන්න ඕනෑ. එතකොට අපේ ධනය මේ රටේම නවතිනවා. අනික් අතින් මේ රටේ ජනතාවගේ රැකීරක්ෂා ප්‍රශ්නයත් විසඳෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරකෝන් මයා.]

අලුත් කර්මාන්ත ව්‍යාපාර ගැන අපේ ගරු කර්මාන්ත ඇමතිතුමා කියා සිටියා. එතුමාගේ වැඩපිළිවෙළ අනුව බොහෝ දෙනකුට රැකී රක්ෂා ලබාගන්නට පුළුවන් වෙනවා ඇති. අද අපේ ළමයින් බොහෝ දෙනකුට සිද්ධ වී තිබෙන්නේ නිකම් එස්. එස්. සී. පාස් කර වෘත්තියක් පිළිබඳව කිසිම පුහුණුවක් නැතුව සිටීමටයි. ඒ නිසා ඒ ළමයින් වෘත්තීන්වලට පුහුණු කරන මධ්‍යස්ථාන ඇති කරන්න ඕනෑ. ඇති කර ඔවුන්ට නිසි පුහුණුවක් ලබා දිය යුතුයි. ඒ පක්ෂය ආණ්ඩු කළත්, මේ පක්ෂය ආණ්ඩු කළත්, එසේ පුහුණුවක් දුන්නොත් තමයි මේ රටටත් තමන්ටත් තම ජාතියටත් ප්‍රයෝජනවත් සේවයක් සලස්වාගන්නට පුළුවන් වන්නේ. ඒ අනුවයි අපේ කටයුතු සකස් විය යුත්තේ. කල්පනා රහිතව වැඩ කර තිබෙන වාය කියා මා කියන්නෙ නැහැ. නමුත් ඒ පක්ෂයට වැඩ කරන්න දුන්නෙ නැත්තේ ඔය සාරි පොටේ එල්ලී සිටින මාක්ස්වාදීන් බව මා කියන්න කැමතියි. මාක්ස්වාදීන් කවදාවත් රටක බලය ඡන්දයෙන් අල්ලා ගෙන නැහැ. රුසියාවේ හෝ වෙන මොනම රටකවත් බලය මහජන ඡන්දයෙන් අල්ලා ගෙන නැහැ. එසේ නම් බලය අල්ලාගෙන ඇත්තේ කොහොමද? යම් කිසි දූර්වල ආණ්ඩුවකට මුක්කු ගසා ඊට පසු ඒ ආණ්ඩු පක්ෂය නැති කර දැමීමෙනුයි. ඒ නිසා කැලණියේ ගරු මන්ත්‍රීතුමාට (ආර්. එස්. පෙරේරා මයා.) මම කියන්න කැමතියි ටිකක් ප්‍රවේසම් වෙන්නය කියා.

ආර්. එස්. පෙරේරා මයා. (කැලණිය)
(திரு. ஆர். எஸ். பெரேரா—களனி)
(Mr. R. S. Perera—Kelaniya)
ඔව්, ඔව්, මම පරිස්සම් වෙන්නම්.

වීරකෝන් මයා.
(திரு. வீரக்கோன்)
(Mr. Weerakoon)

ඒ අය වැඩ කරන්නේ මහජන යහපතට නොවෙයි. මුක්කු ගසා බලය අල්ලා ගන්නට පස්සෙ, "අපි බලය අල්ලා ගන්නට යන්නෙ ඔයගොල්ලන්ට බලය දෙන්න නොවෙයි. අපටම බලය ලබා ගන්න" යි කියා දනුත් රහසෙ කියන වාලු. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මා බැගෑපත්ව කියන්න කැමතියි, මේ රාජ අපරාධය මේ රටට සිද්ධ වෙන්න ඉඩ නොදීමට වග බලාගන්නය කියා.

කාලවේලා ඉක්මගොස් තිබෙන නිසා මා තවදුරටත් ඔබතුමාගේ කාලය ගන්නට බලා පොරොත්තු වෙන්නෙ නැහැ. මා අවසාන වශයෙන් ඇමති මණ්ඩලයට තවත් වැදගත් කරුණක් මතක් කරන්න කැමතියි. අපේ ප්‍රදේශය වන කඳුකර ප්‍රදේශයේ—උඩ රට කීව්වොත් සමහර අය අකැමති නිසා කඳුකර ප්‍රදේශයේ—රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට තමුන්නාන්සේලා නොයෙක් නොයෙක් අංශ ඇති කරගෙන යනවා. එහෙත් අපට පෙනී ගොස් තිබෙනවා, යම් යම් ස්ථානවල අයුතු ලෙස වැඩ කටයුතු සිද්ධ වන බව. ඒ මොනවාද? ඒ ප්‍රදේශයේ අයට රක්ෂා දෙනවා වෙනුවට, එතැන වැඩ කරන නිලධාරි මහත්වරුන්ගේ සේවකයන් කැඳවා විත්, ඒ අයට ඒ සියලුම රැකීරක්ෂා ලබා දෙන බව. කඳුකර ප්‍රදේශයේ අයට කොළඹ ප්‍රදේශයට පැමිණ රැකීරක්ෂා ලබාගන්නට බැහැ. ඒ අය ආරක්ෂා වන පරිදිත්, රැකීරක්ෂා නැති ප්‍රශ්නය විසඳෙන පරිදිත්, යම් යම් ආයතන ඇති කර, සියල්ලක්ම යුක්තිසහගතව කිරීමට රැකීරක්ෂා කාර්යාල මගින් ගන්නැයි ඇමති මණ්ඩලයෙන් මා ඉල්ලනවා. ආසන ගැන බලන්නට වුවමනාවක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයය, එක්සත් ජාතික පක්ෂයය යනාදී වශයෙන් කල්පනා නොකර ඒ ඒ ප්‍රදේශවලින් ඒ ඒ ප්‍රදේශ තුළ තිබෙන ආයතනවලට පුද්ගලයන් බඳවා ගත යුතුයයි කියන්නට කැමතියි. මා එසේ කියන්නේ ඇයි? කඳුකර ප්‍රදේශයේ උදවියට මෙහාට ඇවිත් නම් රක්ෂාවල් ලබා ගැනීම අමාරුයි.

උපාධිධාරීන් ගැනත් වචනයක් කියන්නට ඕනෑ. කඳුකර ප්‍රදේශයේ අයට රැකීරක්ෂා ලබා ගැනීම අමාරුයි. උසස් තැන්වල ඉන්න අය වැඩි දෙනා මෙහේ උදවියයි. කඳුකරයේ උදවියට මේ අය සමග දැන ඇඳුනුම්කම් නැහැ. වෙනත් අයගේ "වයර් පුලිං" නැත්නම් බලපෑම් තිබෙන නිසා ඒ අයට රක්ෂා නොලැබී යනවා. මෙපමණ කාලයක් දුක් විඳපු, පීඩාවලට ගොදුරු වූ, එදා බලයේ සිටි බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව සටන් බිමට වැද දිවි පිදූ, අය ගැනත් ඇමති මණ්ඩලය ටිකක් කල්පනා කළොත් හොඳ බව කියන්නට කැමතියි. කඳුකර ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික තත්ත්වය ගැන අපට හොඳ දැනුමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙනවා. ඒ අයගෙ වතු ගියා ; ඉඩම් ගියා. මුඩුබිම් පනත වැනි පනත් නිසා වෙනත් අයිතිවාසිකම් පවා නැතිව ගියා. අධ්‍යාපන පහසුකමුත් නැති කර දැම්මා. ඒ නිසා කඳුකර ජනතාව අද දුක්ඛිත තත්ත්ව යකට පත්වී සිටිනවා. මධ්‍ය මහා විද්‍යාලව ලට ගොස් ඉගෙනීම ලබන දරුවන්ගේ යහ පත උදෙසා ඒ උදවියගෙන් ස්වල්ප දෙනෙකුටවත් ආණ්ඩුවේ නිලතල දීම යුතු කමක් බව මතක් කරන්නට කැමතියි. තමන්ට කිසිම බල පුළුවන්කාරකමක් නැති නිසා ආණ්ඩුවේ නිලයක් ලබා ගන් නට බැරිය යන හැඟීමක් අද ඒ අය තුළ පවතිනවා. ඒ අයගේ පවුල්වලින් ආ ස්ථිර ලේකම්වරුන් නැහැ ; ලොකු දොස්තර මහතුන් නැහැ. කුරුඳුවත්තේ ඉන්න අය වාගේ බලකාරයන්ට නම් මේවා ලබා ගන්නට මාර්ග ඇති වෙනවා. එවැනි හැඟීමක් කඳුකර උදවිය තුළ ඇති නොවන ආකාරයට ක්‍රියා කරන්නට පුළු වන් වැඩ පිළිවෙළක් ඇති කරන මෙන් කාරුණාවෙන් සහ ආදරයෙන් ඇමති මණ් ඩලයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව ඉවර කරනවා.

අ. භා. 4.53

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජාතික ආණ්ඩුවේ අවසාන අයවැය ලේඛනය වන පස්වන අයවැය ලේඛනය සම්බන්ධයෙන් ශක්ති ප්‍රමාණයෙන් සැහෙන විමසිල්ලක් මට ලැබෙන කාලය තුළ කිරීමට මා බලා පොරොත්තු වෙනවා. ඊට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. මේ අවසථාවේ මගේ ප්‍රීතිය පළ කිරීමට විශේෂ කාරණ යක් තිබෙනවා. ඒ ගැන සඳහන් කරන් නට හැකි වීම ගැන මා වඩාත් සන්තෝෂ වෙනවා. ආසියාවේ නව පිටුවක් පුරමින් ඉන්දියාවේ ඊයේ ඇති වූ සිද්ධිය—ඉන්දියා මහා රාජ්‍යයේ ධනපති කල්ලිය, සිනඩිකේට් කාර ප්‍රතිගාමී කල්ලිය සමග ඉන්දිරා ගාන්ධි මැතිනිය ගෙන ගිය සටනේ ජය ග්‍රහණය—සමාජවාදි සටනක් ගෙන යන අපට බලවත් සන්තෝෂයට කරුණක් බව මගේ කථාවේ මුලින්ම ප්‍රකාශ කරන්නට කැමතියි.

අරයා මෙහෙම කිව්වාය, මෙයා මෙහෙම කිව්වාය, ඒ නිසා ඊට පිළිතුරු වශයෙන් මා මෙසේ කියනවාය යනාදි වශයෙන් මට ලැබෙන සුළු කාලය තුළදී කියන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මගේ කථාවේදී එවැනි කියමන් හැකි පමණින් අඩු කරන්නටයි මා කල්පනා කරන්නේ.

මේ ආණ්ඩුව දැනට ගෙන යන මූලික ව්‍යාපාරය මහජනයා මුළාකිරීම පිණිස ගෙන යන වගාව පිළිබඳ ප්‍රචාරයයි. වගාව සම්බන් ධව ගහන බෙරය ඇත්තද නැත්තද යන්න පිළිබඳ විසර්ජනයක් කරන්නටයි මා විශේෂයෙන් බලාපොරොත්තු වන්නේ. ඒ විසඳීම කිරීමෙන් පසු මා බලාපො රොත්තු වන්නේ තවත් වැදගත් දෙයක් කරන්නටයි. මා හිතන හැටියටවත්, මේ රටේ මහජනයා හිතන හැටියටවත්, කියන හැටියටවත් නොව මේ රජයට විස්තර වාර්තා ආදිය සපයන දෙපාර්තමේන්තුවල, විශේෂයෙන් ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාවල ඒ ඒ පිටුවල පෙන්වන පරස්පර විරෝධි ප්‍රකාශයන් ගැන පෙන්වා දෙන්නටයි මා බලාපොරොත්තු වන්නේ. ඒවා බලන විට පැහැදිලිවම පෙනී යන්නේ අපට මේ ආණ්ඩුව කියන තත්ත්වය මේ රටේ නැති බවයි. ඒ බව නිලධාරීන්ගේ ප්‍රකාශ අනුව හොඳ හැටි පෙනී යනවා. ශ්‍රී ලංකා මහා බැංකුවේ ප්‍රකාශ කියවා බලමු. 1968 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ 14 වන පිටුවේ 4 වන ඡේදයේ මෙසේ සඳහන් වෙනවා :

> "......උසස් ගණයේ කෘෂිකාර්මික යෙදවුම් මිල පිළිබඳ දිරි ගැන්වීම් සහ ආයතනික ණයවල ස්වරූප යෙන් ගොවියා බෙයඞිමත් කිරීමෙන් නිමැයුමෙහි කැපී පෙනෙන වැඩිවීමක් ඇති විනි......"

ඒ කියන්නේ ගොවියාට ආධාර කිරීම උඩ කෘෂිකර්මයේ දියුණුවක් ඇති වුණාය යන් නයි. එහි 15 වන පිටුවේ තවත් තැනෙක මෙසේ සඳහන් වෙනවා :

> "......ග්‍රාමීය පෙදෙස්වල වෙළෙඳ බැංකු ශාඛාවන්හි ඉතිරි කිරීම් තැන්පතුද රුපි. දශ ලක්ෂ 13.1 කින් වැඩි වී ඇත. සහල් නිෂ්පාදනයෙහි සහ අතිරේක බෝගයන්හි ස්වයංපෝෂිතතාවයක් සාක්ෂාත් කර ගැනීමට ගොවියාට ආධාර කිරීම සඳහා ග්‍රාමීය අංශය වෙත සැපැයෙන ණය ප්‍රමාණය වැඩි කළ යුතුය..."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එස්. පෙරේරා මයා.]

එම ප්‍රතිපත්තිය බොහොම හොඳයි. ඒ අනුව තමුන්නාන්සේ ක්‍රියා කර නැති බව මෙම වාර්තාවේ අනිකුත් තැන්වලින් මා ඔප්පු කරන්නට කැමතියි. කෘෂිකර්ම ඇමති තුමාත් මුදල් ඇමතිතුමාත් අගමැතිතුමාත් නිතරම කියනවා, තම රජයේ ශක්ති ප්‍රමාණයෙන් සැහෙන දුරට කලින් රජයට වඩා ගොවියාට ආධාර උපකාර ලබා දුන් හෙයින් වගා ව්‍යාපාරය සාර්ථක වුණු බව. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ 145 වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

1968 යල කන්නයෙහි වී වගා ණය

1968 වර්ෂයෙහි යල කන්නයෙහි අනුමත කළ හා ප්‍රයෝජනයට ගත් ණය ප්‍රමාණය 67/68 වර්ෂයෙහි මහ කන්නයට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය. 1968 යල කන්නයෙහි වගා කරන ලද ඉඩම් ප්‍රමාණය, 1967/68 මහ කන්නයෙහි දී වගා කරන ලද ඉඩම් ප්‍රමාණයෙන් අඩකට මදකින් වැඩි වුවත් අනුමත කළ සහ ප්‍රයෝජනයට ගන්නා ලද ණය මුදල් ප්‍රමාණය 1967/68 මහ කන්නයේ දී යොදා ගත් ප්‍රමාණයෙන් 1/5 ට වඩා අඩු විය.

අවුරුද්දක් ගානේ වැඩියෙන් ණය දී තිබෙන බව පෙනෙන්නේ කොහෙන්ද? 1967-68 වර්ෂයෙහි යම් ප්‍රමාණයක් අනුමත කර තිබුණා නම් ඒ ප්‍රමාණයට අඩු ප්‍රමාණයක්ලු, 1968 දී ණයට ගෙන තිබෙන්නේ. එයින්ම පෙනෙනවා ගොවියාට කරනවාය කියන ආධාර උපකාර පිළිබඳ තත්ත්වය.

ගරු මුදල් ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි 1968 වර්ෂය සඳහා නිකුත් කර තිබෙන වාර්තාවෙනුයි, මා කියවන්නේ. මේවා මට වුවමනා හැටියට කියවනවා නොවෙයි. එහි 148 වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"......... 68/69 මහ කන්නයේදී අක්කරයකට දුන් ණය මුදලෙහි වැඩිවීමක් ඇති වුවද, එම කන්නයේදී නිකුත් කළ මුළු ණය මුදල 67/68 මහ කන්නයේදීට වඩා අඩු වී තිබේ. ...."

එයින්ම පෙනෙනවා, 1968-69 මහ කන්නයේදී ගොවියාට දුන් ණය ප්‍රමාණය 1967/68 මහ කන්නයේදී දුන් ණය ප්‍රමාණයට වඩා අඩු බව. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"......... 1968 දෙසැම්බර් අගදී අනුමත කළ රුපියල් දශ ලක්ෂ 51.4 න් රුපියල් දශ ලක්ෂ 36.3 ක් ප්‍රයෝජනයට ගන්නා ලදි. මින් පෙනී යනුයේ, මෙවර මහ කන්නයේදී ණය සේවා ලැබූ වර්ග ප්‍රමාණය 67/68 මහ කන්නයේ ප්‍රමාණයෙන් සියයට 70 ක් පමණ වන බවය. ...."

දැන් උණු උණුවේම වාගේ වත්තේගම ගරු මන්ත්‍රීතුමා (වීරකෝන් මයා.) කීවා ගොවි ව්‍යාපාර විශාල වශයෙන් දියුණු වී තිබෙන බව. ඒවාගේම එතුමා ඒ පිළිබඳව යම් යම් තර්ක පවා ගෙනහැර පෑවා. මා සන්තෝෂ වෙනවා ඒ ගැන. එහෙත් මෙම වාර්තාවෙන්ම පෙනීයනවා, 1967, 1968, 1969 යන වර්ෂවලදී ක්‍රමක්‍රමයෙන් අඩුවෙන් ණය දී තිබෙන බව.

සිරිසේන මයා.
(திரு. சிறிசேன)
(Mr. Sirisena)

දියුණු වෙන්න දියුණු වෙන්න ණය ගන්නවා අඩුයි.

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

අගමැතිතුමාගේ කතාවකින්ම දියුණුව කෙසේදැයි මා පෙන්වන්නම්. වත්තේගම ගරු මන්ත්‍රීතුමා (වීරකෝන් මයා.) දැන් කිව්වා, ඕනෑම භාණ්ඩයක නිෂ්පාදනය වැඩි වෙන විට මිල අඩුවෙන්න ඕනෑය කියා. තමුන්නාන්සේලාගේ වාර්තාවලින්ම කියනවා, වී නිෂ්පාදනය සියයට 41කින් වැඩි වුණාය කියා. එහෙම නම් ඒ ගරු මන්ත්‍රීතුමාගේ තර්කය අනුව වී නිෂ්පාදනය වැඩි වෙනවාත් සමගම හාල්වල මිල බහින්න ඕනෑ. මා ඒ තර්කය පිළිගන්නවා.

ජෝර්ජ් කොතලාවල මයා. (බණ්ඩාරගම)
(திரு. ஜோர்ஜ் கொத்தலாவல—பண்டாரகம)
(Mr. George Kotelawala—Bandaragama)

දැන් බැහැල.

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

ඔලුව බිම තබාගෙන කකුල් දෙක උඩ තබා ගෙන බැලුවොත් පෙනේවි, මිල බැහැලයි කියා. දැන් දවස් දෙක තුනකට කලින් මා පත්‍රයක දුටුවා, ගලිගමුව මන්ත්‍රීතුමා කියා තිබෙනවා—එතුමා ඒ වකවානුවේ කොහේ ජීවත් වුණාද කියා මා දන්නේ නැහැ—අපේ ආණ්ඩු කාලයේ හාල් සේරුවක මිල රුපියල් 1.60 ය, දැන් හාල් සේරුවක මිල රු. 1.20 ය කියා. පසුගිය ආණ්ඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කාලයේ හාල් සේරුවක මිල ශත 75 ට 80 ට වඩා ඉහළ නොගිය බව එතුමා දැන ගන්න ඕනෑ. හාල් සේරුවේ මිල රු. 1.25 සිට 1.60 දක්වා ඉහළ නැග තිබෙන්නේ දැනුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වත්තේගම ගරු මන්ත්‍රීතුමාගේ තර්කය අනුව මා ප්‍රශ්න කරන්නේ හාල් මිල අඩු වුණේ නැත්තෙ ඇයිද කියායි. මේ දක්වා හාල් මිල අඩු වී නැහැ. හේතුව කුමක්ද? හාල් නිෂ්පාදනය වැඩි වුණා නම්, වෙළඳ පොලට එන හාල් ප්‍රමාණය වැඩි වුණා නම්, හාල් වල මිල අඩුවෙන්න ඕනෑ. නමුත් මෙතෙක් අඩුවීමක් වෙලා නැහැ.

රුපියලේ මිල අඩු කළා. ඒ ගැන විරුද්ධ පක්ෂය තර්ක කරන අවස්ථාවේදී මොකක්ද තමුන්නාන්සේලා කිව්වෙ? හාල් සේරු දෙකෙන් එකක් කපා ඇති අවස්ථාවේදී රුපියලේ මිල සියයට 20 කින් අඩු කළ විට හාල් සේරුවේ මිල තවත් ඉහළ යන බව විරුද්ධ පක්ෂය කිව්වා. එවිට තමුන්නාන්සේලා කිව්වේ මොකක්ද? ටික දවසකින් එය නැවතත් අඩු වේවිය; මිල පහළ යාවිය කිව්වා. මිල පහළ බැස්සද? අල බහිනවා වගේ මිලත් බැස්සද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට මේවායින් පෙනී යන්නේ මොකක් ද? වී නිෂ්පාදනය මේ තරම් ප්‍රමාණයකින් වැඩි වී තිබෙනවාය කියා රටට පෙන්වූවත් ඇත්ත වශයෙන්ම එවැනි දෙයක් වී නැති බවයි. එහෙම දෙයක් සිදු වී තිබෙනවා නම්, හාල් මිල බහින්න ඕනෑ. නමුත් මිල අඩු වීමක් ඇති වී නැහැ.

ඒ වගේම තවත් තර්කයක් ඉදිරිපත් කර තිබෙනවා. සමහර ගරු මන්ත්‍රීවරුන්, ආණ්ඩු පක්ෂයේ කථිකයින්, වේදිකාවල දීත් මේ තර්කය සනාථ කරන්න උත්සාහ කර තිබෙනවා. එනම් මහජනයා අතරේ මුදල් වැඩිලු. ඒ නිසයිලු හාල්වල මිල වැඩි වී තිබෙන්නෙ. අවශ්‍යකම වැඩි වී තිබෙනවාලු. මහජනයාට ඒවා ගන්න මුදල් තිබෙනවාලු. ඒ මිලට මහජනයාට ඒවා ගන්න අමාරුවක් නැතිලු. එය බොහොම ලක්ෂණ තර්කයක් තමයි. මේ බැංකු වාර්තාවේම මෙන්න මේ විධියට තිබෙනවා:

"සහල් කෙරෙහි වූ ඉල්ලුම, සාධකයන් දෙකක් විසින් යටපත් කරන ලදී."

ඒ කියන්නේ සහල් ඕනෑකම—හොඳ සිංහලෙන් කියනවා නම් බත් ඕනෑකම—සාධකයන් දෙකක් විසින් යටපත් කර තිබෙනවාලු.

"සලාකය කැපීම නිසා නොමිලයේ ලබා ගැනීමට හැකි වූයේ සීමාසහිත ප්‍රමාණයක් පමණක් වීම එකකි. අනෙක වූයේ මිල ඉහළ යාම හේතු කොට ගෙන පහළ ආදායම් ලබන පාරිභෝගික පංතිවල සහල් පාරිභෝජනය අඩු වීමය."

මේ සභාවේ පිටුපස ආසනවල සිටින ගරු මන්ත්‍රීවරුන් මේවා කියවා බලනවා නම් හොඳයි. මේ තරම් හිත කකියවන විධියේ දේවල් මේ නිලධාරි මහත්වරුන් විසින් ලියා තිබෙනවා.

"...මිල ඉහළ යාම හේතු කොටගෙන පහළ ආදායම් ලබන පාරිභෝගික පංතිවල සහල් පාරිභෝජනය අඩු වීමය."

තමුන්නාන්සේලා කියනවා, මේ රට ස්වයංපෝෂිත වෙලාලු. සුඛිත මුදිත වෙලාලු. ගරු අධ්‍යාපන ඇමතිතුමා එක්තරා තැනකදී කියා තිබෙනවා, විජය රජුගෙන් පසු මේ රට මේ තරම් සුඛිත මුදිත වුණ කාලයක් තවත් නැත කියා. මේ පැරකුම් යුගය තරම් රට සුඛිත මුදිත වුණ කාලයක් තවත් නැතිලු. නමුත් මේ යුගයේම සිටින නිලධාරීන් කියන්නෙ කොහොමද? මිල ඉහළ යාම හේතු කොට ගෙන අඩු ආදායම් ලබන දුප්පත් මහජනතාවගේ හාල් පාරිභෝජනය අඩු වුණාලු. ඒ කියන්නේ බත් කෑම අඩු වුණාලු. නමුත් තමුන්නාන්සේලා කියනවා, මේ රටට ලොකු සේවයක් කළාය, රට දියුණු කළාය කියා. තමුන්නාන්සේලා කියනවා, දළ නිෂ්පාදිතය වැඩිය කියා. දළ නිෂ්පාදනය වැඩි වෙන ඕනෑම රටක ජීවන තත්ත්වය ඉහළ යන්නට ඕනෑ. දළ නිෂ්පාදනය වැඩි වෙන විට මිනිසුන්ගේ එදිනෙදා ජීවන තත්ත්වය උසස් වෙන්න ඕනෑ; අමාරුකම්වලින් මිදෙන්න ඕනෑ. දළ ජාතික නිෂ්පාදිතය වැඩි වූවා නම්, තමුන්නාන්සේලා කියන විධියට අනෙකුත් වුවමනා කරන ද්‍රව්‍යවල නිෂ්පාදනය වැඩි වූවා නම්, ආහාර නිෂ්පාදනය වැඩි වූවා නම් එහි ප්‍රතිඵල පෙනෙන්නට ඕනෑ. එහි ප්‍රතිඵල වෙළඳ පොළෙන් පාරිභෝගිකයාට දැනෙන්නට ඕනෑ. සහනයක් ලැබෙන්නට ඕනෑ. මිල අඩු වෙන්නට ඕනෑ. වී නිෂ්පාදනය වැඩි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වී තිබෙනවා නම් ඇයි මිල අඩුවෙන්නෙ නැත්තෙ? පුළුවන් නම් ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. එමනිසා මේක ඇත්ත වශයෙන්ම වී නිෂ්පාදනයක් නොවෙයි. බොරු නිෂ්පාදනයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ සමහර උදවිය ගුවන් විදුලියෙන් වී නිෂ්පාදනය කරන්නට උත්සාහ දරනවා. සමහර උදවිය ශාරීරික ආබාධයක් නැත්නම් මානසික ආබාධයක් නිසාදෝ පැළෑටි ගලවන්නටය කියා කොට ගවුම් ඇඳි තරුණියන් කුඹුරුවලට බස්වා පිටුපසින් ගොස් ඡායා රූප ගන්නවා. ඕවායින් වී නිෂ්පාදනය වැඩි වන්නේ නැහැ. ඕවායින් වී නිෂ්පාදනය වැඩි කරන්නට පුළුවන්කමක් නැහැ. මේ රටේ වී නිෂ්පාදනය තනිකරම තමුන්නාන්සේලා පමණක් කළ දෙයක් හැටියට පෙන්වන්නට තමුන්නාන්සේලා උත්සාහ කරනවා. මේ වාර්තාවෙන් මා තවත් කාරණයක් පෙන්වා දෙන්නට සතුටුයි:

"සලාක ක්‍රමය යටතේ දෙනු ලැබූ දේශීය සහල් ප්‍රමාණය ටොන් 2,38,159 සිට 1968 වන විට 2,10,000 දක්වා එනම් සියයට 12 කින් අඩු **වී ගියේ ය.**"

1967 වර්ෂයේදී ටොන් 2,38,159ක් සලාක ක්‍රමය යටතේ මේ රටේ පාරිභෝගිකයන්ට බෙදාදීම සඳහා රජය විසින් මිළදී ගත්තා නම් 1968 වර්ෂයේදී ඊට වඩා වැඩි ප්‍රමාණයක් ගන්නට ඕනෑ. වී නිෂ්පාදනය වැඩි කළාය කියා තමුන්නාන්සේලා විශාල ප්‍රචාරයක් ගෙන ගියේ 1968 වර්ෂයේදී යි, නමුත් 1968 වර්ෂයේදී සලාක ක්‍රමයට බෙදාදීම සඳහා තමුන්නාන්සේලා අරන් තිබෙන්නේ ටොන් 2,10,000යි. ඒ කියන්නේ 1968 වර්ෂයේදී ඊට එපිට වර්ෂයට වඩා සිංහල හාල් ටොන් 28,159ක් අඩුව ගෙන තිබෙන බවයි. ඒ සඳහා එම අවුරුද්දේ වියදම් කර තිබෙන්නේ රුපියල් තුන් කෝටියක් පමණ අඩුවෙනුයි. එහෙම නම් කෝ නිෂ්පාදනය?

පිටරටින් හාල් ගෙන්වීම අඩු කරන්නවත්, විදේශය විනිමය ඉතිරි කර ගැනීමවත් වී නිෂ්පාදනය වැඩි කරනවාය කියා තමුන්නාන්සේලාත් තමුන්නාන්සේලාගේ නායකතුමාත් කිව්වා. ප්‍රතිපත්තිය ඒක නම් බොහොම හොඳයි. එහෙම නම් 1967 ට වඩා 1968 දී වගාව දියුණු වූවා නම් රජය විසින් කළයුතුව තිබුණේ සලාක ක්‍රමයට බෙදා දීම සඳහා සහල් පුළුවන් තරම් වැඩි ප්‍රමාණයක් මිළ දී ගැනීමයි. නමුත් 1968 දී ටොන් 28,159ක් අඩුවෙන් අරන් තිබෙනවා. ඒ මක් නිසාද කියා මා ප්‍රශ්න කරනවා. තමුන්නාන්සේලා කරන්නේ බොරුවක් බව ඒකෙන් පැහැදිලි වෙනවා.

පරාක්‍රමබාහු රජතුමා දිවංගත වූවාට පසු මේ රටේ වී වගාව නතර වුණාය, 1965 තමුන්නාන්සේලා බලයට පත් වූවාට පසු යළිත් වී වගාව ආරම්භ කළාය කියා පෙන්වන්නට තමුන්නාන්සේලා උත්සාහ කරනවා. 1965 මැතිවරණයෙන් පසු නැවත වරක් පරාක්‍රමබාහු කෙනෙක් ඉපදී නැවත වරක් කුඹුරු ගොවිතැන පටන් ගෙන තිබෙනවාය යන හැඟීමක් දෙන්නට තමුන්නාන්සේලා උත්සාහ කරනවා. පරාක්‍රමබාහු රජ්ජුරුවන් ගෙයි මගෙයි වෙනස මොකක්ද කියා අග මැතිතුමා අහනවාලු. නමුත් මේ රටේ වී නිෂ්පාදනය ඇත්ත වශයෙන්ම ක්‍රමයෙන් දියුණු වූ සැටි මා මහ බැංකුවේ වාර්තාවෙන් පෙන්වා දෙන්නම්.

තමුන්නාන්සේලා කියන හැටියට මේ රටේ වෙන කවුරුවත් වැපිරුවේ නැහැ. වගාව දියුණු කළේ නැහැ. වගාව දියුණු වූයේ කෙසේද යන්න මහා බැංකුවේ වාර්තාවෙන් මා පෙන්වා දෙන්නම්. 29 වන පිට බලන්න. 1960 සිට 1968 දක්වා නිෂ්පාදිත වී බුසල් දස ලක්ෂවලින් මෙහි දක්වා තිබෙනවා. 1960 දී නිෂ්පාදිත වී බුසල් ප්‍රමාණය දස ලක්ෂ 43.1 යි. 1961 දී දස ලක්ෂ 43.2 යි. 1962 දී දස ලක්ෂ 48.1 යි. 1963 දී දස ලක්ෂ 49.2 යි. 1964 දී දස ලක්ෂ 50.5 යි. මේ තත්ත්වයට වී නිෂ්පාදනය වැඩි කළාට අපි නම් කෑගැසුවේ නැහැ. එහෙත්, ඒ කාලයේදී අප්පුහාමිලා ට්‍රැක්ටර් දහස් ගණන් ගෙන්නුවේ නැහැ. ධනපතීන්ට අක්කර දහස් ගණන් දුන්නේ නැහැ. තමුන්නාන්සේලා වගේ ලෝකේ හෙල්ලුවේ නැහැ. දස ලක්ෂ 43 සිට 50 දක්වා වී වගාව දියුණු කර තිබෙනවා. එහෙත් තමුන්නාන්සේලා රටට පෙන්නන්න උත්සාහ දරන්නේ, මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රජය හැර වෙන කිසිම රජයක් කවදාවත් මේ රටේ වී වගාව දියුණු කර නැති බවයි. තමුන්නාන්සේලා වෙනත් විධියකට ගණන් හදා දස ලක්ෂ 19 කින් වැඩි වුණු බව පෙන්වන නමුත් වැඩි වී තිබෙන්නේ දස ලක්ෂ 14 යි. වී වගාවේ දියුණුව අද ඊයේ ඇති වූ එකක් නොව 1960 දී පමණ සිටම පැවැතුණු එකක් බව සංඛ්‍යා ලේඛන වලින් පැහැදිලිව පෙනී යනවා. තමුන්නාන්සේලා කියන තරමට මේ රජය යටතේ වී වගාව දියුණු වී නැති බව පෙන්වීමට මම ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාවෙන් නිදර්ශනයක් පෙන්වන්නම්. වාර්තාවේ 247 වන පිටුවෙහි මෙසේ සඳහන් වෙනවා :

"රුපියල් මිලෙහි මෙම වැඩිවීමට බොහෝ සෙයින්ම හේතු වූයේ ලංකා රුපියල අවප්‍රමාණ කිරීමය. සමාලෝචනයට භාජනව ඇති වර්ෂය තුළ දී ආනයනය කළ පිටි පරිමාව පහත වැටීමට හේතු වූයේ ඉකුත් වසරේදී රැස්කර ගත් විශාල තොග පැවතීම නිසාය. තවද 1967 දී ආනයනය කළ පරිමාව විශේෂ වශයෙන්ම වැඩි වීමය."

මේ රටට ගෙන්වන පිටි ප්‍රමාණය අඩු කිරීමෙන් සැහෙන මුදලක් ඉතිරි කර ගන්නට පුළුවන් වන බව ගරු මුදල් ඇමතිතුමා පැහැදිලිවම ප්‍රකාශ කර තිබෙනවා. එහෙත්, ලංකා ඉතිහාසයේ කිසිම දවසක මේ රටට නොගෙන්වූ තරම් පිටි ප්‍රමාණයක් 1967 දී ගෙන්වා තිබෙන බව මේ වාර්තාවෙන් පැහැදිලි වෙනවා. 1968 දී ගෙන්වූ පිටි ප්‍රමාණය ස්වල්පයක් අඩු වී තිබෙන්නේ රටට පිටි අවශ්‍ය නොවුණු නිසා නොව ඊට ඉහත වර්ෂයේදී ගෙන්වන ලද පිටි තොගයක් මෙහි තිබුණු නිසායි.

1967 නොවැම්බර් මාසයේ සිට පිටි සහ සීනිවල විකුණුම් මිල ශත 5 කින් වැඩි කර තිබීම මේ ලාභයන් ඉහළ යාමේ ප්‍රධාන හේතුව විය.

සහල්වලින් රට ස්වයංපෝෂිත වෙන්න ඔන්න මෙන්න කියා තිබෙනවාය යන අදහසක් ජනතාවට දෙන තමුන්නාන්සේලාගේ රජය යටතේ තත්ත්වය මේකයි.

"එමෙන්ම ටොන් 37,709 කින් හෙවත් සියයට 9.6 කින් පිටි පරිභෝජනය වැඩි විය."

මේ කාගේ රාජ්‍යය යටතේද? නවීන පරාක්‍රමබාහුගේ රාජ්‍ය යටතේ. සලාක ක්‍රමය අනුව හාල් සේරු දෙකක් දුන් කාලයේදීත් පිටි මේ රටට ගෙනවුත් සාධාරණ මිළකට විකුණනු ලැබුවා. ඒ කාලයේදී පිටි විකිණීමෙන් ලැබූ සම්පූර්ණ ලාභය රුපියල් ලක්ෂ 5 යි. 1967-68 දී පමණක් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේ මේ රටේ මිනිසුන් කොයි තරම් පිටිවලින් පමණක් ජීවත් වුණාද කියතොත් ඒ කාලය තුළ පිටි විකිණීමෙන් ලැබූ ලාභය රුපියල් 5 කෝටි 74 ලක්ෂයයි. අපේ ඉතිහාසයෙහි නම සඳහන් පරාක්‍රමබාහු රජතුමා නම් තම රටේ ජනතාවට හොඳ සිංහල කුරුටු හාලේ බත් දෙවේල නොව තුන් වේලම වපුරන නොවපුරන කාටත් දුන් වීරයෙක්. එහෙත් මේ නවීන පරාක්‍රමබාහු නිකම්ම පාන් පිටි පරාක්‍රමබාහු කෙනකු බව මේ සංඛ්‍යා ලේඛනවලින් පැහැදිලි වෙනවා නේද? මේ රටේ ජනතාව අද ජීවත් වන්නේ තමුන්නාන්සේලා බොරුවට මවා පාන වී වගාවෙන් නොවන බව පිටි වෙළෙඳාමෙන් ලැබූ ලක්ෂ 5 ලාභය ලක්ෂ 574 දක්වා වැඩි වී තිබීමෙන්ම පෙනෙනවා නේද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජීවන වියදම නැඟීම පිළිබඳ ප්‍රශ්නය ගැන කථා කරමින් ආණ්ඩු පක්ෂය නිතරම කියන්නේ "අපි පඩි වැඩි කළා" කියායි. කොච්චර පඩි වැඩි කළාද, ඒ ප්‍රමාණය ඇද්ද? ඒ එක ප්‍රශ්නයක්. අනික් ප්‍රශ්නය, මේ රටේ මුළු ජාතියම පඩි ලබන උදවියද? රජයේ සේවකයන් සිටින්නේ ලක්ෂ කීයද? පෞද්ගලික අංශයේ සේවකයන් කී ලක්ෂයද? පඩි ලබන සේවකයන්ගේ සංඛ්‍යාව මුළු ජනගහනයෙන් සියයට 10 කට වඩා නැහැ. ජනගහනයෙන් සියයට 90 ක් පඩි නොලබන උදවියයි. මේ මුළු ජාතියම තමුන්නාන්සේලා යටතේ සේවය කර පඩි ලබන උදවියද? පඩි නොලබන ගැමි ජනතාවට ජීවන වියදම් බරෙන් නිදහස්වීම සඳහා තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් දුන් සහනයන් මොනවාද? මොකවත් නැහැ. "පඩි වැඩි කිරීම" කියන වචනවලින් පමණක් ජාතියට සේවයක් කළාය කියා ඔප්පු කරන්නට පුළුවන්කමක් නැහැ. පඩි වැඩි කළ යුතු බව මා පිළිගන්නවා. එහෙත් ජීවන වියදම වැඩි වූ ප්‍රමාණයට සරිලන අන්දමින් තමුන්නාන්සේලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එස්. පෙරේරා මයා.]

පඩි වැඩි කළාද කියා කල්පනා කරන්නට ඕනෑ. 1966 සිට 1969 දක්වා ජීවන වියදම් වැඩි වුණු හැටි පසුව පෙන්වා දෙන්නට මා බලාපොරොත්තු වෙනවා.

තවත් බොහොම උද්යෝගයෙන් තමුන්නාන්සේලා ඉදිරිපත් කරන වැදගත් තර්කයක් තමයි, 1968 දළ ජාතික නිෂ්පාදනය 8.3 කින් වැඩි වුණා කියන කාරණය. එහෙත් මුදල් ඇමතිතුමාගේ කථාවෙන් ඉතා හොඳින් පැහැදිලි වෙනවා, 1969 ඉදිරි කාලපරිච්ඡේදය අඳුරු යුගයක් වන බව. 1969 අගෝස්තු 2 වන සෙනසුරාදා ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ අයවැය කථාවේ මේ විධියට සඳහන් වෙනවා:

"ECONOMIC PROSPECTS FOR 1969
NATIONAL PRODUCT

Mr. Speaker, the emerging trends for 1969 seem to indicate a growth in national product in real terms in the region of 6 per cent. While the production of export crops is likely to show a somewhat better performance, production of domestic crops is expected to rise at a somewhat lower rate."

අපනයන කරන වැවිලි නිෂ්පාදනවල තත්ත්වය තරමක් දුරට දියුණුවන අතර "domestic crops" මේ රටේ පාවිච්චියට ගන්නා ආහාර වැනි නිපදවීම්වල දියුණුව—සිදුවෙන්නෙ "somewhat lower rate" තරමක් අඩුවෙන්ය කියා මුදල් ඇමතිතුමාම ඉඟියක් කරනවා.

තව දුරටත් මෙහෙම කියනවා:

"The higher rate of growth in manufacturing and construction in 1968 was brought about by a greater utilization of existing capacities."

1968 වර්ෂයේදී කර්මාන්තවල නිෂ්පාදනය ඉතාම උසස් අංග සම්පූර්ණත්වයට ගෙනා බව කියා, තව දුරටත් මෙහෙම කියනවා:

"In view of the high rate of utilization of capacity in 1968, it would seem likely that an equally high rate of increase can be sustained in a second year."—[OFFICIAL REPORT, 2nd August 1969; Vol. 86, c. 47.]

අන්න එතැනින් හොරේ පෙනෙනවා. 1968 වර්ෂයේදී මේ රට කර්මාන්ත නිෂ්පාදනය අතින් අංග සම්පූර්ණත්වයට පත් කළාය, නමුත් 1969 න් ඉදිරියට ඒ තත්ත්වය ආරක්ෂා කර ගන්නට බැරිය, කියා මුදල් ඇමතිතුමා කියනවා නම්, තමුන්නාන්සේලා මවා පාන දීප්තිමත් කාල පරිච්ඡේදය කවදා ඇති වෙයිද? බැරි වන හේතු අපි කියන්නම්, කර්මාන්තකරුවකු හැටියට මටත් තරමක දැනුමක් තිබෙනවා. 1968 වර්ෂයේ කාර්මික සංවර්ධනය අතින් රට සම්පූර්ණත්වයට පත් වුණාය, නමුත් 1969 දී එය ආරක්ෂා කරගෙන තවත් ඉදිරියට යන්න බැරිකමක් තිබෙනවාය කියා මුදල් ඇමතිතුමා කියනවා නම්, ඊට හේතු මම කියන්නම්. ප්‍රධාන වශයෙන්ම හේතුව හැටියට දක්වන්නට පුළුවන් විවිහිස ක්‍රමයයි. සියයට 44 කින් පටන් ගත් විවිහිස ක්‍රමය සියයට 55 දක්වා වැඩි කළා. සියයට 3 ක්ව තිබුණු නිෂ්පාදන බද්ද සියයට 5 දක්වාත්, ඊට පසු සියයට 10 දක්වාත් වැඩි කළ අතර, තවත් සමහර අංශවල සියයට 20 සිට සියයට 25 දක්වාත් වැඩි කළා. එසේ කරන අතර, බැංකු ණය පහසුකම් නොලැබී යන තැනටත් පියවර ගත්තා. මේ රටේ කර්මාන්ත දියුණුවක් ඇති කිරීමට රජයට අවශ්‍ය නම් කර්මාන්තකරුවන්ට බැංකු ණය පහසුකම් සලසන්නට ඕනෑ. එසේ ණය ලැබෙනවා වෙනුවට, විවිහිස ක්‍රමය යටතේ බඩු ගෙන්වීමේ නිදහසක මුවාවෙන් අනික් පැත්තෙන් බැංකුවලට "ක්‍රෙඩිට් ස්ක්වීස්" එකක් දැම්මා. වෙනදා වාගේ ණය දෙන්න එපා, ණය හිර කර ගන්නටය කීවා. එපමණක් නොවෙයි, තමුන්නාන්සේලා මොනවා කීවත්, මේ රටේ අපනයන නොකෙරන ආහාර ද්‍රව්‍යවල දියුණුව වැඩි වන්නේ නැති බව මුදල් ඇමතිතුමාගේ කථාවෙන්ම පෙනී යනවා. ඒ වාගේම දේශීය කර්මාන්ත නිෂ්පාදනයෙහි දියුණුවක් ඇති වන්නේ නැති බව කියනවා. ඒ අන්දමට කියන විට කොහොමද බලාපොරොත්තුවක් ඇති කර ගන්නේ?

රැකී රක්ෂා ප්‍රශ්නය ගැන කථා කරන විට නොයෙකුත් විධියේ පොරොන්දු දෙනවා මේ ආණ්ඩුව ලැයිස්තු හදනවා. අතුරු මැතිවරණයක් ඇති වන විට, පළාත් පාලන මැතිවරණයක් ඇති වන විට මහජනතාව මුළාකිරීමට පුරුද්දක් වශයෙන් එවැනි දේවල් කරනවා. 1969 පෙබරවාරි මාසය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වන විට 1968 වාගේ කර්මාන්ත දියුණුවක් ඉදිරියට ඇති වන්නේ නැති බව ඇමතිතුමාගේ කථාවෙන් පෙන්වා දී තිබෙනවා නම්, අපනයන නොකරන ද්‍රව්‍යවල එතරම් දියුණුවක් ඇති වන්නේ නැතැයි කියනවා නම් මෙරට රැකී රක්ෂා ප්‍රශ්නය කොයි පිළිවෙළකටද විසඳන්නේ කියා ප්‍රශ්න කරන්න කැමතියි. ගරු කථානායකතුමනි, දළ ජාතික නිෂ්පාදනය වැඩි වී තිබෙනවා යයි උදම් අනනවා. එසේ වැඩි වී තිබෙනවා නම්, ජීවන වියදම අඩුවන්න ඕනෑ. රැකී රක්ෂා ප්‍රශ්නය විසඳන්න ඕනෑ. මහජනතාව එදිනෙදා මුහුණ පාන අමාරුකම්වලින් මිදෙන්න ඕනෑ. නමුත් එයින් එකක්වත් සිදු වී නැහැ. මා කලින් සඳහන් කළ පරිදි, ලියා පදිංචි වී ඇති රැකී රක්ෂා නොමැති අයගේ සංඛ්‍යාව 2 ලක්ෂ 84 දාහ ඉක්මවා ගොස් තිබෙනවා. විශේෂඥයන් කියන අන්දමට රක්ෂා නොමැති තරුණ තරුණියන් හත් අට ලක්ෂයක් සිටිනවා. අනාගත දියුණුවේ ලක්ෂණ ඔය විධියයයි මුදල් ඇමතිතුමා කියනවා නම්, මේ ප්‍රශ්නය විසඳන්නේ කවදාද?

මට පෙර කථා කළ වත්තේගම මන්ත්‍රීතුමා (වීරකෝන් මයා.) උපාධිධාරීන් ගැන බොහොම ලැදියාවකින් කථා කළා. 1968 දී දෙස්තරවරුන් 368 දෙනෙකු සමත් වී පිට වී තිබෙනවා. දන්ත වෛද්‍යවරු වශයෙන් 17 දෙනෙකු සමත් වී තිබෙනවා. ඉංජිනේරුවන් වශයෙන්—බී. එස්. සී. උපාධිය—101 දෙනෙකු සමත් වී පිට වී තිබෙනවා. විද්‍යා අංශයෙන්—සාමාන්‍ය බී. එස්. සී. උපාධිය—135 දෙනෙකු පිට වී ඇති අතර විශේෂ බී. එස්. සී. උපාධි ලබා 54 දෙනෙකු පිට වී ගොස් තිබෙනවා. පශු වෛද්‍යවරුන් වශයෙන් 13 දෙනෙකු සමත් වී පිටව ගොස් තිබෙන අතර කෘෂිකාර්මික අංශයෙන් 22 සමත් වී තිබෙනවා. කලා අංශයෙන් බී. ඒ. සාමාන්‍ය උපාධිය, 3,553 දෙනෙකු ලබා ඇති අතර, විශේෂ උපාධිය 208 දෙනෙකු ලබා පිට වී ගොස් තිබෙනවා. ඒ අතරම වෙළඳ අංශයෙන් 22 දෙනෙකුද, නීති අංශයෙන් 14 දෙනෙකුද, අවශේෂ වශයෙන් 44 දෙනෙකුද සමත් වී පිටව ගොස් තිබෙනවා. ඒ 1968 අවුරුද්දේදීයි. ඔය කණ්ඩායමත් අර දහ හතර දහක් වන උපාධිධාරීන්ගේ සංඛ්‍යාවට එකතු වෙනවා. ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා වෛද්‍ය සංගමයේදී පසුගියදා ප්‍රකාශ කර තිබෙනවා, දොස්තරවරුන් වශයෙන් සමත් වී පිටවන අයට රක්ෂා දෙන්න බැරිකම ගැන. එවැනි තත්ත්වයකුත් තිබෙනවා නම්, රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීම ගැන ජනයක් තිබෙනවායයි ගරු මුදල් ඇමතිතුමාම කියනවා නම්, ඒ බවට ඉඟියක් කරනවා නම් රැකී රක්ෂා ප්‍රශ්නය විසඳීම ගැන ජනතාව බලාපොරොත්තුවක් තබන්නේ කොහොමදැයි ප්‍රශ්න කරන්න සිදු වී තිබෙනවා.

ගරු කථානායකතුමනි, වගාව පුදුමාකාර ලෙස දියුණු වනවායයි ආණ්ඩු පක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් කියන අතර 1972 වන්නට පෙර සහල් අතින් ස්වයංපෝෂණය වනවායයි කියනවා. ඒ අතරම කර්මාන්ත ඇමතිතුමා උදය වරුවේදී ප්‍රකාශ කර තිබෙනවා, වැඩි කල් යන්නට පෙර සහල් ටිකක් වත් පිටරට පටවන්න පුළුවන් වෙනවාය කියා. එතුමාට මතක් කරන්න කැමතියි, වෙල්වැටිතුරෙන් දැනටත් සහල් ඉන්දියාවට පටවන බව. සහල් නිපදවීම ගැන එතුමා එහෙම කියන අතර දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) 1969 අප්‍රේල් මස 26 වනදා ඒ සම්බන්ධයෙන් බොහොම ලස්සන කථාවක් කියා තිබෙනවා. "නමුත් නාන්සේලා වවනවාය කියනවා. අප නොවෙද වවන ප්‍රදේශවලින් එන මන්ත්‍රීවරුන්? එහෙම නම් වැවිලි දකින්න ඕනෑ අප නේද, ගොවියන් ඒවායින් ප්‍රයෝජන ලබන බව පෙනෙන්න ඕනෑ අපට නොවෙද? ඒ උදවිය සමග නොවෙද අප ජීවත්වන්නේ. අපේ සීගිරිය වටේ ඇති කෝරළේ 1964 දී දවසකට විකුණුනේ පාන් රාත්තල් 20 යි, නැත්නම් 22 යි, එහෙත් අද පාන් රාත්තල් 1,200 ක් නැතිව ඒ කෝරළේ අයට ජීවත් වන්නට බැහැ" කියා එතුමා ප්‍රකාශ කර තිබෙනවා. එයට අපේ ගරු අගමැතිතුමා ඉංග්‍රීසියෙන් දී ඇති පිළිතුර පුදුමාකාරයි. මෙන්න එතුමා දී ඇති පිළිතුර.

ගරු අගමැතිතුමා මෙහෙම කියනවා:

"The hon. Member for Dambulla commented on the availability of goods. As an example, he said that where only twenty-two loaves of bread had been bought, now a thousand loaves are being bought. Did he not give the show away by that remark? I would invite him to make that speech all over the country.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එස්. පෙරේරා මයා.]

As a matter of fact, I would like to ask him, Where did the money come from to buy the thousand loaves instead of the twenty-two? He will realize, if he looks a little further, that there is a tremendous transfer of income to the rural areas. It is true that prices are higher, but the people are buying. That is the main point. The people have the money to buy."—[OFFICIAL REPORT, 27th April 1969; Vol. 84, c. 999.]

අරුම පුදුම ප්‍රකාශයක්. පළමු වැනි වතාවට මේ රටේ අගමැතිකම ලැබූ කෙනකු මේ විධියට ප්‍රකාශයක් කළා නම් අපට මේක තේරුම් ගන්නට පුළුවන්. කෘෂිකර්මය ගැන අවබෝධයක් ඇති, මීට කලින් ආණ්ඩුවල කෘෂිකර්ම ඇමති හැටියට සිටි එතුමා ගොවි ජනතාව ජීවත් වන ආකාරය පිළිබඳව දැනීමක් ඇති කෙනකු හැටියට මේ විධියේ ප්‍රකාශයක් කිරීම ගැන මා කණගාටු වෙනවා. එතුමා ගොවිතැන පිළිබඳව පමණක් නොව ගොවියා ජීවත් වන සැටි පිළිබඳවත් හරියට දැන ගන්නට ඕනෑ. දඹුල්ලේ මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) කීවේ අද තිබෙන තත්ත්වය අනුව මිනිසුන්ට බත් කන්න නැත, ඔවුන් කන්නේ පාන්ය, ඒ කාලයේ බත් තිබුණු නිසා පාන් කෑවේ නැත, ඒ කාලයේ ඒ ප්‍රදේශයේ දවසකට විකුණුනේ පාන් රාත්තල් 20 ය, 22 ය; අද පාන් රාත්තල් 1,200 ක් පමණ විකිණෙනවාය කියායි. මාත් කිව්වේ ඒක තමයි කියා අගමැතිතුමා කියනවා. තමුන්නාන්සේ මේක මේ සභාව ඇතුළේ කියන්නා වාගේම එළියෙත් කියන්නය කියා අගමැතිතුමා ඒ මන්ත්‍රීතුමාට කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අගමැතිතුමාගේ තර්කය මේකයි. ගොවීන්ට දැන් සල්ලි තියෙනවා. සල්ලි තියෙන්නේ ආදායම වැඩි වූ නිසයි. ආදායම වැඩි වන්නට නම් අස්වැන්න වැඩි වන්නට ඕනෑ.—කරල පැහෙන්නට ඕනෑ. කරල පැහුණාම අවුකොටු වීවලින් පිරෙනවා. අගමැතිතුමා කියන විධියට ගෙදර වී පිරුනම ඒ ගොවීන් කන්නෙ පාන්. කුඹුරට වතුර නැතිව ඉඩෝරයට අහු වෙලා පුරන් වුණාම—වී නැති වුනාම—ඔවුන් කන්නෙ බත්. පුදුම තර්කයක්. හිටපු කෘෂිකර්ම ඇමතිවරයෙක් මේ විධියට කියන්නෙ. මේ රටේ ප්‍රධාන පුරවැසියා හැටියට ජීවත්වන අගමැතිතුමා මෙහෙම කියනවා නම්—මේ රට සරු සාර කිරීමට මුළු ශක්තියම යොදවනවාය කියන අගමැතිතුමා මෙහෙම කියනවා නම්, සල්ලි වැඩි නිසා මේ මිනිසුන් කන්නේ පාන්ය කියනවා නම්—ඒ කීම ඉතිහාසයේ ලියවෙන්නට ඕනෑ. මේ රටේ ගොවියාට වී හොඳට තියෙනවා නම් ඔහු සිංහල ක්‍රමයට දෙවේල නොවෙයි, තුන් වේලම කන්නේ බත්. සිංහල රටේ සිරිත ඒකයි. අගමැතිතුමා කියන විධියට නම් ගෙදර වී පිරුනම මිනිහා බේකරියට යනවා. කුඹුර වේලිලා. මිනිහා බත් කනවා. කව්රු කොහෙන් දෙන බත්ද දන්නෙ නැහැ. අපේ තර්කවලට ජන නායකයන් උත්තර දෙන්නෙ මේ විධියටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජීවන අංකය ගැනත් මා වචනයක් කියන්නට කැමතියි. ඒ ප්‍රශ්නය ගැන මේ ආණ්ඩුව හැම අවස්ථාවකදීම කියන්නේ පඩි වැඩි කළා, පඩි වැඩි කළා කියන එකයි. ඒ ගැන මා සෑහෙන විස්තරයක් කළා. මේ අය මැතිවරණයට කලින් ජීවන අංකය ගැන කී දේවල් මේ ගරු සභාවේ මීට පෙර කථා කළ මන්ත්‍රීවරුනුත් මතක් කරන්නට ඇති. මැතිවරණයට පෙර ජීවන අංකය 112.2 ට තියෙන විට තිබුනේ මහා යුද්ධයක්. මැතිවරණයේදී මේ අය පාවිච්චි කළ ලොකුම ආයුධය තමයි, ජීවන වියදම අහස උසට නැගලාය, මේ රටේ මහජනයාට ජීවත් වන්නට පුළුවන්කමක් නැත කියන ප්‍රකාශය. ඒ නිසා අපට ඡන්දය දෙන්නය, මේ තත්ත්වයෙන් අප මහජනයා බේරා ගන්නවාය කියන අදහසයි, ඒ අය ඉදිරිපත් කළේ.

කාල පරිච්ඡේද 3 ක් ගැන අපි බලමු. 1956 දී ජීවන අංකය 100.2 යි. 1960 වන විට ජීවන අංකය 103.5 ට නැග්ගා. ඊ ළඟ පරිච්ඡේදය 1960 සිට 1964 දක්වා. 1960 දී 103.5 ට තිබුණු ජීවන අංකය 1964 වන විට 112.2 ට නැග්ගා. එතැනදී තමයි කිව්වේ, ජීවන වියදම අහස උසට නැගලා තියෙනවාය, මේක බස්සන්නට අපට බලය දෙන්නය, උඩුපියලි තත්ත්වයට බස්සනවාය කියා. මහජනයා මේ කථාව විශ්වාස කර තමුන්නාන්සේලා බලයට පත් කළා. තමුන්නාන්සේලා එදා කී වචන අදත් ඈහෙනවා, ඈහෙනවා වගේ ඇති මේ මන්ත්‍රීවරුන්ට. එවකට තිබුණු ආණ්ඩුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙරලීම පිණිස ජීවන අංකය ප්‍රධාන ආයුධය කර ගෙනයි සටන් කළේ. ජීවන අංකය අහස උසට නැඟලාය කියා රොකට් ඇදලා පෙන්නුවා. එහෙත් 1964 න් පසුව ජීවන අංකය ඉහළ ගියේ කොහොමද? 1964 දී 112.2 ට තිබුණු ජීවන අංකය 1965 දී 112.5 යි; 1966 දී 112.3 යි; 1967 දී 114.8යි; 1968 දී 121.5යි; 1968 අගෝස්තුවල 115.2යි ඔය අ. දී වශයෙන් ගොස් 1969 මාර්තු වන විට 127.8 යි. එහෙත් ගිය මාස යට කලින් මාසයේ 130.4 යි. ගිය මාසයේ 129.4 යි. ඔයින් පැහැදිලිව පෙනෙනවා නේද මහජනයාට දුන් පොරොන්දු ඉටු වී තිබෙනවාද කියන එක. තමුන්නාන්සේලා දුන් පොරොන්දු අනුව ක්‍රියා කර තිබෙනවාද කියා තමුන්නාන්සේලාම හිතට එකඟව කල්පනා කර බලන්න. තමන්ම හිතන්නට ඕනෑ.

වවා තිබෙනවා; බඩු මුට්ටු ආදිය තිබෙනවා; මහජනයා සුඛිත මුදිතව ජීවත් වෙනවා කියා කටින් කීවාට මහජනයා අතර ජීවත්වන අපට එහි සත්‍යය පෙනෙනවා. තමුන්නාන්සේලාටත් එය පෙනෙනවා. ඒ නිසා හිතට විරුද්ධව කථා කරන්නට එපාය කියා ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට මා ආයාචනයක් කරනවා. අද ජීවන අංකය ගණන් ගැනීමත් සම්පූර්ණයෙන්ම බොරුවක්ය කියා මා කියනවා. හාල් සේරුවක් නිකම් දෙනවාය කියා හාල් සඳහා අමතරව යන වියදම ජීවන අංකයට ගණන් ගන්නේ නැහැ. රටේ මහජනතාව එය දන්නේ නැහැ. එහෙත් මහජනතාවට ඔප්පු කරන්නට හදන්නේ ජීවන අංකය හදන්නේ ඒවාත් ගණන් අරගෙන හැටියටයි. අමතර හාල් සඳහා පාරිභෝගිකයාට යන වියදම් ගණන් ගන්නේ නැතිවයි ජීවන අංකය හදන්නේ. එයත් ඇතිව හැදුවොත් 130.4 නොවෙයි, ජීවන අංකය 140 ටත් නගින්නට පුළුවන්. එදා සත 80 ට තිබුණු හාල් සේරුව දැන් 1.25 ත් 1.50ත් අතර ගණනකට නැග තිබෙනවා.

එපමණක් නොවෙයි. මා සංඛ්‍යා ලේඛන වගයක් ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේලාගේ රජය යටතේ මේ රටේ පාරිභෝගිකයාටවූ අසහනයත්, අද ඇති වී තිබෙන අමාරුකමක් කියන්නට කෙනෙක් නැතිව, කරන්නට දෙයක් නැතිව, විඳින දුක ගැන තමුන්නාන්සේලා සිංහලයන් හැටියට පැහැදිලිව කල්පනා කර බලන්න. 1964 දෙසැම්බර් එක ඡේදයකුත් 1969 ජූලි අනික් ඡේදයක් වශයෙන් ඡේද දෙකක් අනුව සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කිරීමටයි මා අදහස් කරන්නේ. 1964 දෙසැම්බර්වල පාන් රාත්තලක් ශත 23යි; 1969 ජූලි වල සත 35 යි. වැඩි වූ ප්‍රමාණය සියයට 40 යි. 1964 දෙසැම්බර්වල හාල් සේරුවක් සත 80 යි; 1969 ජූලිවල 1.25යි. වැඩි වූ ප්‍රමාණය සියයට 56 යි. මේ සංඛ්‍යා ලේඛන මා හැදූ ඒවා නොවෙයි. මේවා තමුන්නාන්සේලාගේ රජය යටතේ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සකස් කළ ඒවා බව මා මතක් කරන්නට කැමතියි. සාමාන්‍ය වෙළඳ පොළේ මිල නම් මීට වඩා වැඩියි. වෙළඳ දෙපාතර්මේන්තුවෙන් බඩු අරගෙන ජීවත් වන අය සිටින්නේ ඉතාම ටික දෙනයි. සියයට 97 ක්ම විවෘත වෙළඳ පොළෙන් බඩු අරගෙන ජීවත් වන අයයි. එය පැත්තකින් තිබුණාවේ. මෙන්න ආණ්ඩුවේ මිල ගණන් අනුව වැඩිවීම :

	1964 දෙසැම්බර්වල මිල	1969 ජූලිවල මිල	වැඩිවීම සියයට
	රු. ශ.	රු. ශ.	
හාල්මැස්සෝ	0 90	2 10	122
තෝර කරවල	1 55	2 00	29
කට්ට කරවල	1 25	1 60	28
බල කරවල	0 90	1 60	77
අඟුළුවා කරවල	1 10	1 40	27
ඉස්සෝ	0 90	2 00	122

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එස්. පෙරේරා මයා.]

එපමණක් නොවෙයි. අර්තාපල් රාත්තලක් එදා සත 23 යි; අද විවෘත වෙළඳ පොළේ 1.20 යි; වෙළඳ දෙපාර්තමේන්තුවේ සත 80 යි; වැඩිවීම සියයට 247 යි. එදා වියළි මිරිස් රාත්තලක් 2.34 යි; විවෘත වෙළඳ පොළේ රුපියල් 3 යි; වෙළඳ දෙපාර්තමේන්තුවේ 2.70 යි; වැඩිවීම සියයට 101 යි. එදා කොත්තමල්ලි රාත්තලක් සත 48 යි; අද 84 යි; වැඩිවීම් සියයට 75 යි. එදා සියඹලා රාත්තල සත 48 යි; අද සාමාන්‍ය විවෘත වෙළඳ පොළේ 2.40 යි; වෙළඳ දෙපාර්තමේන්තුවේ 2.15 යි; වැඩිවීම සියයට 139 යි. එදා කහ රාත්තල සත 92 යි; අද විවෘත වෙළඳ පොළේ 3.25 යි. අමු හිංගලෙන් කියනවා නම් අපේ අම්ම මුත්ත කාලයේවත් ඔය ගණන් අහලා තිබෙනවාද? කහ රාත්තල 3.25 යි; වෙළඳ දෙපාර්තමේන්තුවේ 2.40 යි; වැඩිවීම සියයට 160 යි. එදා මුං ඇට සත 44 යි; අද 58 යි; වැඩිවීම සියයට 31 යි. එදා බාර්ලි සත 36 යි; අද 50; වැඩිවීම සියයට 38 යි. එදා සීනි රාත්තලක් ශත 60 යි; අද ශත 72 යි. වැඩිවීම සියයට 7.4 යි. එදා පිටි රාත්තලක් ශත 23 යි; අද ශත 33 යි. වැඩිවීම සියයට 43 යි. එදා කොහොඹ සබන් කැල්ලක් ශත 45 යි; අද ශත 75 යි. වැඩිවීම සියයට 66 යි. එදා සුවේන්ද්‍රා සබන් කැල්ලක් ශත 55 යි; අද ශත 75 යි. වැඩිවීම සියයට 36 යි. එදා කිරි ටින් එකක් ශත 85 යි; අද පැරකුම් යුගයේ පැරකුම් කිරි ටින් එකක් රු. 1.25 යි. වැඩිවීම සියයට 47 යි. එදා නෙස්ටෝ මෝල්ට් ටින් එකක් රු. 2.60 යි. අද රු. 5.10 යි. වැඩිවීම සියයට 105 යි. එදා ලයිෆ්බෝයි සබන් කැල්ලක් ශත 38 යි; අද ශත 55 යි. වැඩිවීම සියයට 44 යි. එදා සන්ලයිට් කැල්ලක් ශත 32 යි; අද ශත 44 යි. වැඩිවීම සියට 37 යි. එදා රෙක්සෝනා කැල්ලක් ශත 45 යි; අද ශත 66 යි. වැඩිවීම සියයට 45 යි. එදා මාමයිට් අවුන්ස 4 රේ බෝතලයක් රු. 2.10 යි; අද රු. 3.75 යි. වැඩිවීම සියයට 78 යි. එදා ලක්ෂපාන බැටරි කැල්ලක් ශත 36 යි; ගොවියාට වැඩ කරනවා යයි කියන මේ ආණ්ඩුව ගොවියාගේ මිත්‍රයා වූ බැටරි කැල්ලක මිළ ශත 60 දක්වා වැඩි කර තිබෙනවා. වැඩිවීම සියයට 66 යි. එදා තෝර පරිප්පු රාත්තලක් ශත 52 යි. අද ශත 62 යි. වැඩිවීම සියයට 19 යි. එදා කඩල රාත්තලක් ශත 40 යි; අද ශත 61 යි. වැඩිවීම් සියයට 52 යි. එදා ගම්මිරිස් රාත්තලක් රු. 1.40 යි. අද රු. 2.20 යි. වැඩිවීම සියයට 57 යි. එදා සව් රාත්තලක් ශත 28 යි; අද ආණ්ඩුවේ මිල ශත 50 යි. සාමාන්‍ය වෙළඳපොළේ මිළ ශත 78 යි. වැඩිවීම සියයට 78 යි. ඔන්න සව් භාග්‍යය! සව් බාගයක් දී "කැඳ බීපියව්" යනුවෙන් කියන්නට බැරි නෑ. එදා උළුහාල් ශත 45 යි; අද රුපියලයි. වැඩිවීම සියයට 122 යි. එදා එක්සර්සයිස් පොතක් ශත 29 යි; අද ශත 40 යි. වැඩිවීම සියයට 37 යි. එදා පෙට්‍රෝමැක්ස් එකක් රු. 85 යි; අද රු. 127 යි. වැඩිවීම සියයට 50 යි. එදා බයිසිකලයක් රු. 260 යි. අද රු. 395 යි. වැඩිවීම සියයට 47 යි. ඔන්න මේ ආණ්ඩුව මහජනයාට මෙතෙක් කල් දී තිබෙන සහන!

ගරු කර්මාන්ත ඇමතිතුමා අද බොහොම ලොකු විශ්වාසයක් ඇතිව කථා කළා. එතුමා හිටපු වාමාංශිකයෙක්. හාල් පිටරට පටවන්නට තරම් පුළුවන් වන දීප්තිමත් කාලයක් අනාගතයේදී උදා වන බව එතුමා ප්‍රකාශ කළා. මේ අතර ෆිලිප්ස් රේඩියෝ සෙට් එකක් ගැනත් එතුමා කිවා. ඔව්, ෆිලිප්ස් රේඩියෝ සෙට් එක ගැනත්, ෆිලිප් දේශපාලන සෙට් එක ගැනත් මේ රටේ මහජනතාව හොඳ හැටි දන්නවා. එතුමා හිතට එකඟව කථා නොකිරීම ගැන තමයි, අපේ හිතට අමාරුව.

කඳුළු එන සිද්ධීන් දෙකක් මම ඉදිරිපත් කරන්නම්. මා පසුගියදා අපේ හිටපු ඇමතිවරුන් කිප දෙනකුත් සමඟ එක්තරා ප්‍රදේශයකට ගියා. නිදා ගැනීම සඳහා එදා එක්තරා තැනකට ගිය අවසථාවේදී එක් තරුණයකු කඳුළු පෙරමින් හිටපු ඇමතිවරයකුට කථා කළා. ඔහු කඳුළු පෙරමින් කථා කරන්නට පටන් ගත් නිසා මා ඒ කථාවට සහභාගි වුණේ නැහැ. සිද්ධිය මොකක්දැයි පසුව මා ඒ හිටපු ඇමතිතුමාගෙන් ඇසුවා. මෙන්න කථාව: ඔහු එතුමාගේ නෑයෙක් නොවෙයි. කොට්ඨාශයේ කෙනෙක්. තාත්තා නැහැ. ඉන්නේ අම්මයි, සහෝදරියනුයි, ඔහුයි පමණයි. පේරාදෙණි විශ්ව විද්‍යාලයේ ඉගෙන ගෙන දේශපලන විද්‍යාව, ආර්ථික විද්‍යාව යන විෂයයන්ගෙන් උසස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අඬමින් සමඟ වී සිටින කෙනෙක්. ඔහුට සුදුසු රක්ෂාවක් සොයා ගන්නට පුළුවන් වී නැහැ. මේ සුබිත මුදිත රාජ්‍යයේ, පැරකුම් යුගයක් උදා වී ඇති රාජ්‍යයේ, මේ උගත් තරුණයා එක්තරා රජයේ නිලධරයකුගේ බංගලාවේ කුස්සියේ වැඩ කරනවා. "ඔබ අසවල් තත්ත්වයේ කෙනකු බව මේ නිලධරයා දන්නවාද?" යනුවෙන් හිටපු ඇමතිතුමා ප්‍රශ්න කළ විට "නෑ, මගේ තත්ත්වය කිව්වොත් මට වළං හෝදලාවත් ජීවත් වන්නට ලැබෙන්නේ නෑ" යනුවෙන් ඒ තරුණයා කියා තිබෙනවා. පසුගිය මහා මැතිවරණ කාලයේදී එක්සත් ජාතික පක්ෂය මහජනයා මුළා කර මේ රටේ පාලනය භාර ගත්තේ මෙවැනි තත්ත්වයක් බිහි කරන්නද?

කුරුණෑගලට කිට්ටු මාවතගම ප්‍රදේශයේ කථාවක් පැවැත්වීම සඳහා මා ගිය අවසථාවේදීත් කණගාටුදායක ප්‍රවෘත්තියක් අසන්නට ලැබුණා. කිළිටි සරොම් බැනියම් ඇඳගත්, රැවුල වවාගත් තරුණයෙක් පැමිණ ඒ රැස්වීමේදී හරබර කථාවක් කළා. ඒ කථාව නිසාම ඔහුගේ තොරතුරු දැනගන්නට මට වුවමනා වුණා. ඒ තරුණයාගෙන් තොරතුරු අහද්දී ඔහු කීවා, ඒවා කියන්න ගියොත් අප දෙන්නාටම අඬෙන්න පුළුවන් කියා. ඇඬුවත් නැතත් ඒ කථාව දැන ගන්න ඕනෑ යයි මා කීවා. ඔහුගේ පවුලේ සහෝදරියන් 10 දෙනයි. ඔහු විතරයි එකම සහෝදරයා. තාත්තා අද ගොවියෙක්. දුප්පත් නමුත් දක්ෂකම නිසා ඔහු විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයෙන් සමත් වුණා. තාත්තා ගොවිතැනට පාවිච්චි කරන මී හරක් බානත්, සහෝදරියන්ගේ —රන් අබරණ නැහැ—කණකර රිදී අබරණත් විකුණා, හරිහැටි බඩට නොකා, ගෙදර උදවියගේ කණගාටුදායක තත්ත්වය දන්නා නිසාම අනෙක් ශිෂ්‍යයන්ගෙන් වෙන්වී හුදකලාව බොහොම අරපරෙස්සමෙනුයි, ඔහු අධ්‍යාපන කටයුතු පවා කරගෙන ගියේ. ඔහු උපාධි පරීක්ෂණයෙන් සමත් වී ගෙදර ආවා. ඒ කාලයේ පැවතුණ සිරිමා බණ්ඩාරනායක රජයෙන් හැම උපාධිධරයකුටම රක්ෂා ලැබුණු නිසා, උපාධිය ලැබුණාට පසු පවුලේ දුක් කරදර කම්කටොළු නැති කරගෙන හොඳින් ජීවත් වන්නට පුළුවන්කම ලැබේ යයි ඔහු තුළ ලොකු බලාපොරොත්තුවක් තිබුණා. එහෙත් ඔහු විශ්ව විද්‍යාලයෙන් එළියට එන විට පැරකුම් රජය බිහි වෙලා. ඒ නිසාම අද දක්වාත් ඔහුට රක්ෂාවක් නැහැ. පවුලේ උදවියගේ දුක්බර මුහුණු බල බලා නිකම් ඉන්නට බැරි නිසා මාවතගම ටවුමේ බුලත් විට් විකුණායි, ඔහු යම්තමින් පණ නළ රැක ගන්නේ.

අද රට වැටී ඇති කණගාටුදායක තත්ත්වය පිළිබිඹු කරනා නිදර්ශනයක් තමයි, ඒ. යමෙක් ඒ ඇත්ත තත්ත්වයට පිටුපා කථා කරනවා නම් ඇත්ත වශයෙන්ම ඔහු ජනතා ද්‍රෝහියෙක්. මෙසේ රැකීරක්ෂා නැතිව නැවෙන උගත් තරුණ තරුණියන් තුළ ඇති අසහනය අසීමිතයි. සමාජයේ අද කෙරෙන දූෂණකම්, මං පැහැරීම්, කසිප්පු පෙරීම් වැනි දේවලට හුඟාක් දුරට මේ අසහනය බල පානවා. තරුණ තරුණියන්ගේ ඒ අසහනය මඟ හැරීම සඳහා නිසි වැඩ පිළිවෙලක් සකස් කළා නම් අද රට මේ තත්ත්වයට වැටෙන්නේ නැහැ. වර්තමාන රජය එවැනි වැඩ පිළිවෙලක් ඇති කරන්නේ නැහැ. එවැනි වැඩ පිළිවෙලක් ඇති කිරීමට ඔවුන්ට ශක්තියක් ඇත්තේත් නැහැ.

වර්ෂයක් පාසා "ණය වැය" ලේඛන ඉදිරිපත් කරමින් ණයට ගෙන කෑම ඒ තරම් දක්ෂකමකැයි හිතන්න එපා. මේ රජය පසුගිය අවුරුදු 4½ තුළ පිටරටවලට ණය වී තිබෙන මුදල 2052 වන තුරුම ගෙවන්නට සිදු වී තිබෙනවා. 2052 වන තුරු අගමැතිතුමා ජීවත් වන්නේත් නැහැ; සිරිමා බණ්ඩාරනායක මැතිණිය ජීවත් වන්නේත් නැහැ. මේ ණය මුදල ගෙවා නිම කරන්නට තව අවුරුදු 83ක් යන නිසා, මෙහි සිටින කිසිම මන්ත්‍රීවරයෙක් මේ ණය මුදල ගෙවා නිම වන තුරු ජීවත් වන්නේ නැහැ. අපේ අනාගත පරම්පරාව පිට පටවා ඇති ණය බර ඉතා අධිකයි. අපේ දරුවන්ගේ දරුවන්ට පමණක් නොව සමහර විට ඔවුන්ගේ දරුවන්ටත් මේ ණය ගෙවන්නට සිදු වේවි. එයත් දක්ෂකමක්ද? ද්‍රව්‍යාධාර යනුවෙන් වියළි මිරිස් ටිකක්, කරවල ටිකක්, රෙදි පිළි ටිකක් ණයට අරගෙන අනාගත පරපුර උකසට තබා මේ රටට හානියක් කරන්නේ ඇයි දැයි මා අහනවා. රට සුබිත මුදිත කරනවාය කියන්නේ මේක්ටද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එස්. පෙරේරා මයා.]

මෝඩ තකතිරු ආණ්ඩුවක අදූරදර්ශී ක්‍රියා කලාපය නිසා, අනුන්ගේ පව් ගෙවන්නට ඉදිරි පරපුරකට සිදු වෙනවා ඇති. මේ අය වැය ලේඛනයෙනුත් කෝටි අටක නවයක පමණ හිඟයක් තිබෙනවාලු. තත්ත්වය හැමෝම දන්නා නිසා ඒ ගණන් හොයන්නටවත් කියන්නටවත් මා වෙහෙසෙන්නේ නැහැ. කෝටි ගණනින් තවදුරටත් පිටරට වලට ණය වෙන්නයි, මේ රජය උත්සාහ කරන්නේ. ප්‍රශ්න විසඳන්නේ මෙහෙමද ?

අරක මෙච්චරයි, මේක මෙච්චරයි කිය නවා නොවෙයි. මේ රට සුඛිත මුදිත කරන බවට පොරොන්දු දෙමින් අද මේ රට හෙළා ඇති ප්‍රපාතය ගැන කල්පනා කර බලන්න. අද බඩු මිළ ගෙන විග්‍රහ කර බලන්න. 1960, 1961, 1962 යන අවුරුදුවල—අපේ කාලයේ—" නෙස්ටෝමෝල්ට් " ටින් එකක් රුපියල් 2.15 කට ගන්නට පුළුවන් කම තිබුණා. ගැමි ජනතාවගේ අද තත්ත්වය මොකක්ද ? ගැමි ජනතාව ළඟින් ඇසුරු කරන අපට ඔවුන්ගේ ජීවන තත්ත්වය පිළිබඳ හොඳ අවබෝධයක් තිබෙනවා. සාමාන්‍ය කම්කරුවකුට දවසකට ලැබෙන්නේ රුපියල් 5.00 ක පමණ පඩියක්. ඔහුත්, භාර්යාවත් ඇරුණාම තවත් හපා කන කටවල් තුනකුත්, කිරි බොන කටකුත් තිබෙනවා යයි හිතමු. අපේ කාලයේ නම් " නෙස්ටෝමෝල්ට් " ටින් එකක් රුපියල් 2.15 කට ගත්තාම, ඉතිරි වන රුපියල් 2.85 න් අනෙක් අයට එදාට වුව මනා කරන දේවල් ගන්නට පුළුවන්කම තිබුණා. එහෙත් අද තත්ත්වය ඊට හාත් පසින් වෙනස්. අද හැම දේකම මිළ බොහොම ඉහළ නැඟලා. කාගේ හෝ වත්තක අගල් කැපීමට, ගස් කප්පාදු කිරීමට හෝ වෙනත් කුලී වැඩක් කිරීමට ආයුධ ටිකත් අරගෙන ගෙයින් දොට්ට බහින සැමියාට, " අද සවස දෙකෙන් පස්සේ බබාට දෙන්න පිටි නැහැ ; සවස එන විට පිටි ටින් එකකුත් අරගෙන එන්න " කියා භාර්යාවක් කීවොත් ඇති වන තත්ත්වය මොකක්ද ? බබාට " නෙස්ටෝමෝල්ට් " ටින් එකක් ගන්නත් ඕනෑ. දරු දුක ඇති පියා උදේ සිට සවස වන තුරු කුලී වැඩ කොට රුපියල් පහක් හම්බ කරගෙන කඩ මණ්ඩියට ගියාම ඔහු මුහුණ පාන්නේ ඉතාමත් බැරෑරුම් ප්‍රශ්නයකටයි. කිරි පිටි ටින් එකක් ගන්නවාද, ගෙදරට කන්න ගන්නවාද ? කිරි ගත්තොත් ගෙදර කන්න නැහැ ; මහ දෙන්නත් දරුවන් තුන් දෙනත් යන පස් දෙනකුට කන්න නැහැ. කන්න ගත්තොත් කිරි ගන්න විධියක් නැහැ. අද තත්ත්වය ඕකයි. ඒ ගැන නොවේද ඔය තමුන්නාන්සේලා වර්ණනා කරන්නෙ ? එදා කිරි පිටි ටින් එකක් 2.15 ට ගත්තා නම් අනික් ආහාර ගැනීම පිණිස තව 2.85 ක් ඉතුරුයි. හාල් සේරුවක් ශත 80 යි. රුපියලක් වැය කළ විට හුණ්ඩු 5 ක් ගන්න පුළුවනි. එතකොට හාල්වලට රුපියලකුත් අනිකුත් කුළුබඩු එළවලු සඳහා ශත 80 කුත් වියදම් කළ පසු දරුවන් කිරි බී අනික් 5 දෙනාත් රාත්‍රී ආහාරය අරගෙන පසුවදා උදේ වේල සඳහාත් තව කියක්වත් ඉතුරු වෙනවා. එහෙත් අද ? පසුගිය මාසෙ වන තුරු 4.90 යි. කඩේ මුදලාලිට දොස් කියන්න බැහැ. මේ කළු කඩ මිල නොවෙයි. ආණ්ඩුවෙ නියම මිලයි. ඉතින් 4.90 ට නෙස්ටොමෝල්ට් ටින් එකක් ගත්තට පස්සෙ පසු ගිය මාසය වන තුරු නම් ඉතුරු වුණේ ශත 10 යි. එතකොට අනික් අය මොනවද කන්නෙ ? මේවා වැඩි කළ මිනිසුන්ගේ ඇට කන්න ඕනෑ. වෙන කන්න දෙයක් නැහැ. මා මේ වේගයෙන් කියා සිටින්නේ අද මහජනතාවට සිදු වී තිබෙන දුක ගැනයි. අද යන්න නෙස්ටොමෝල්ට් ටින් එකක් ගන්න. අද එහි මිල රුපියල් 5.15 යි. ගරු මන්ත්‍රීතුමන්ලා කරුණා කර ටිකක් හිතා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බලන්න අද නෙස්ටොමෝල්ට් වින් එකක් ගැනීම පිණිස තව ශත 15 ක් ණයට ගන්න ඕනෑ නොවේද කියා. ඔකයි අද මේ රටට සිදු වී තිබෙන දේ.

තමුන්නාන්සේලා කියනවා, රටට සේවය කළාය කියා. විජය කාලෙට පස්සෙ මේ රටේ කන්න අදින්න සුලභ රාජ්‍යයක් බිහි වී තිබෙනවාලු. මට නම් තේරෙන්නෙ නැහැ, ඒ කොහොම බිහි වූ රාජ්‍යයක්ද කියා. අමුඩ ගසාගෙන ආ සමහර උදවියත් ඉන්නවා. එදා අමුඩෙ ගහන්නත් රෙදි යාර 6 ක් තිබුණා. අද රෙදි යාර දෙකයි. 6ක් මදිය කියා අමුඩ ගැසූ ඇමතිවරුන් අද දෙන්නෙ දෙකයි. උඩ වහගත්තොත් යට එළියෙ. යට වහගත්තොත් උඩ එළියෙ. එදා අපි යාර හයක් දුන්නා. අද දෙන්නෙ යාර දෙකයි. රෙදිපිලි සුලභලු.

ඊළඟට තමුන්නාන්සේලා වේදිකාවලදී මැතිණියට කිව්වා, මේ මෝඩ ගෑණිට රට ආණ්ඩු කරන්න බැහැ කියා. මේ තමුන්නාන්සේලා කී වචනවලින්මයි මා කියන්නෙ. මහජනයා ඩඩ්ලි සේනානායක මැතිතුමා කෙරෙහි විශ්වාසය තැබුවා. අපි ඒ ගැන මහජනයාට දොස් කියන්නෙ නැහැ. වැදගත් මහත්මයෙක්ය කියා වැදගත් දේශපාලන පක්ෂයක්ය කියා මහජනයා විශ්වාසය තිබ්බා. ඒක ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයක් එහෙත් ඒ විශ්වාසයට පයින් ගසා ක්‍රියා කිරීම ගැන මේ වර මහජනයා උත්තර දේවියයි අපි බලාපොරොත්තු වෙනවා. අපේ ජයග්‍රහණය ගැන අපි කියනවා නොවෙයි. මහජනයා විශ්වාසය තබා තිබෙන හැටි පෙනී යාවි.

හොඳයි අපි බලමු, රට ආණ්ඩු කරන්න බැරිය කී ඒ මෝඩ ගෑණිගෙ—මම ඒ වචන ඔයි ආවිච්චි කරන්නෙ—ආණ්ඩු කාලෙ තත්ත්වය ගැන. 1964 වර්ෂයේදී ලංගමයේ ශුද්ධ ලාභය රුපියල් එක් කෝටි තිස් ලක්ෂයයි. මේ පණ්ඩිතයො ආවාට පස්සෙ ශුද්ධ පාඩුව 56 ලක්ෂයයි. හරියට අර මොන වෙද මහත්තයද දීපු තිපල් කසාය වාගේයි. ලෙඩා මළා, බඩ සුද්ධ වුණා. පාඩු වත් සුද්ධ කරලයි කියන්නෙ. සුද්ධ පාඩුව 56 ලක්ෂයයි. 1964 දී එක් කෝටි තිස් ලක්ෂයක් ලාභයි. පණ්ඩිතයො ගත්තා, මෝඩ මැතිණිට බැහැ කියලා. මම කනගාටු වෙනවා ඒ වචන අනුකරණය කරන්න සිදු වීම ගැන.

ඊළඟට වරාය ගැන බලමු. එය මගේ යාළුව හිටිය තැන. එහි සුද්ධ පාඩුව එක් කෝටි හතළිස් පන් ලක්ෂයයි. නැව් කීයක් ගිලලද මම දන්නෙ නැහැ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙ නොහොත් පැට්රෝල් සංස්ථාවෙ 1964 වර්ෂයේදී ලාභය තුන් කෝටි දොළොස් ලක්ෂයයි. මේ සංඛ්‍යා ලේඛන තමුන්නාන්සේලා බලන්න. හිතට එකඟව කල්පනා කර මේ සංඛ්‍යා ලේඛන දෙස බලන්න. මෝඩ මැතිණිගෙ කාලෙ ලක්ෂ 312 ක සුද්ධ ලාභයක් තිබෙනවා. මේ පණ්ඩිතයො ආවාට පස්සෙ ඒක ලක්ෂ 46 කට බැස්සා. 1968 වර්ෂයේදී සුද්ධ ලාභය ලක්ෂ 46 යි. මම අහනවා මේ පාඩුව ඇති වුණේ කොහොමද කියා. මේ ආණ්ඩුව ඇති වුණාට පසු රථ වාහන දහස් ගණනක් මේ රටට ගෙන්වා තිබෙනවා. කාර් ගෙන්වීම තහනම් කර තිබෙනවාය කියනවා. එහෙත් මේ ආණ්ඩුව පටන් ගන්න විට මේ රටේ තිබුණේ 4 ශ්‍රී හයදාස් ගණනක් පමණයි; දැන් ඒ ගණන 5 ශ්‍රී පන්දාස් ගණනක් වෙලා තිබෙනවා. මේවා කොහෙන්ද ආවේ? අලුතින් ගෙන්වන ලද රථ වාහන ගණන දහදාහකට කිට්ටු වෙනවා. කලින් තිබුණු ගණනට අමතරව කීයක් ගෙන්වා තිබෙනවාදැයි කල්පනා කර බලන්න. පෙට්රෝලියම් සංයුක්ත මණ්ඩලයට දැන් නිධානයක් ලැබුණා වගේ නේද? ඒ කොයි හැටි වෙතත් ඇති වී තිබෙන නියම තත්ත්වය කුමක්ද? ඒ කාලේ ලැබුණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එස්. පෙරේරා මයා.]

ලාභය රුපියල් තුන්කෝටි දොළොස් ලක්ෂ යයි. රථ වාහන ගණන දසදහස් ගණනකින් වැඩි වී තිබියදීත් පසුගිය අවුරුද්දේ ලාභය රුපියල් ලක්ෂ හතළිස් හයකට බැස්සා. ඔන්න තත්ත්වය. මේ ආණ්ඩුව මෙවැනි තත්ත්වයක් ඇති වීමට හේතුව පැහැදිලි කර දෙන්නට ඕනෑ. මේවා පුදුම දේවල්. තවත් පුදුම දේවල් තිබෙනවා.

මේ ආණ්ඩුව බලයට එන්නට ඉස්සර මේ රටට දුන් පොරොන්දු මොනවාද? ඒ පොරොන්දු හරියාකාර ඉෂ්ට කර තිබෙනවා ද? ඒවා කියන්නට මට වෙලාවක් තිබෙනවාදැයි දන්නේ නැහැ. තවත් ස්වල්පයක් නමුත් සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින් පෙන්වා දෙන්නට ඕනෑ.

කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

තවත් මිනිත්තු පහක් දෙන්නම්.

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

බොහොම ස්තුතියි. ඒ මිනිත්තු පහේදී පුළුවන් තරම් කරුණු ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

මේ ආණ්ඩුව වගා කළාය කියනවා. හුඟක් වී වගා කළාය කියනවා. අපේ කාලයේ වී වගාවට යට වූ අක්කර ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් මේ ආණ්ඩුව පැවති කාලයේදී වී වගාවට යට වී තිබෙන බව මම ඔප්පු කරන්නම්.

ජෝර්ජ් කොතලාවල මයා.
(திரு. ஜோர்ஜ் கொத்தலாவல)
(Mr. George Kotelawala)

අපි වගාව වැඩි කළා.

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)

නැහැ. පගාව වැඩි කළා. [බාධා කිරීම්] මම කියනවා ඒක සොයා බලන්නෙයි කියලා.

මේ ආණ්ඩුව පැවති කාලය තුළ වගා කරන ලද වී අක්කර ගණන අඩු වුණා. එතකොට, කෘෂිකර්ම අමාත්‍යාංශයටත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවටත් අයින් කරන ලද සල්ලිවලට මොනවා වුණාදැයි ප්‍රශ්න කරන්නට වටිනවා. වගා කරන ලද අක්කර ගණන අඩු වුණා නම්, ඒ සඳහා වෙන් කරන ලද මුදලට මොනවා වුණාදැයි සොයා බලන්නට ඕනෑ. ඉඩම් හා වාරිමාර්ග අංශයට 1966-67 වර්ෂයේදී රු. 17,30,00,000 ක් අයින් කර තිබුණා. 1967-68 වර්ෂයේදී රු. 24,50,00,000 ක් අයින් කර තිබුණා. 1968-69 වර්ෂයේදී රු. 25,21,00,000 ක් අයින් කළා. කෘෂිකර්මය සඳහා 1966-67 වර්ෂයේදී රු. 7,38,00,000 ක් අයින් කර තිබුණා. 1967-68 වර්ෂයේ දී රු. 8,73,00,000 ක් වෙන් කර තිබුණා. 1968-69 වර්ෂයේදී රු. 10,28,00,000 ක් වෙන් කළා. එහෙත් කරන ලද වගාව එහෙමයි. මේ කාලයේදී හාල් මිල බැස්සේ නැහැ. නිෂ්පාදන වැඩි වෙලා තියෙනවාය කියනවා. මොනවද දන්නෙ නැහැ වැඩි වෙලා තියෙන නිෂ්පාදන. වගා වැඩි වුණා නම්, නිෂ්පාදන වැඩි වුණා නම්, මිල අඩු වෙන්නට ඕනෑ. එම නිසා හොඳින් කල්පනා කරනවා නම්, ගත වූ අවුරුදු හතරහමාර තුළ තරම් අසහනයකින් මේ රටේ මහජනයා ජීවත් වූ කාලයක් මේ රටේ මෙතෙක් ඇති වුණේ නැහැ කියන්නට පුළුවනි. හිතට එකඟව කථා කරනවා නම් ඒ ආකාරයට කථා කරනවා ඇති.

ගොවීන්ට වැඩ කරනවාය කියන මේ ආණ්ඩු කාලයේ තරම් අන්තිමට බැහැලා ජනතාව දුක් විඳින කාලයක් මෙතෙක් ඇති වුණේ නැහැ. ගොවියා ජාතික ආණ්ඩුවත්, රටත් බේරා ගත්තාය යනුවෙන් ගරු අගමැතිතුමා කියනවා. එහෙම නම් ඇයි ගොවියාට දෙන ණය මුදල සඳහා අද මේ තරම් පොලියක් ගන්නේ? එදා ගත්තේ අවුරුද්දකට සියේට හයක පොලියක් පමණයි; අද එය සියේට නවයක් වෙලා තියෙනවා. වෙලාවට ණය මුදල ආපසු නුදුන්නොත් පොලිය සියේට දොළහක් වෙනවා. එදා කටු කම්බි හොණ්ඩරයක් රු. 52.00 ක්ව තිබුණා. අද රු. 85.00 යි. නිකවැරටිය අතුරු මැතිවරණයේදී නිහින්නට හැඳුවා. කිඹුලා උදැල්ලක් එදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රු. 7.50 ක් වුණොම ඒ ගණන බොහොම වැඩියි කියලා ලොකුවට කෑගැහැව්වා. ගිය මාසයට එහා මාසයේදී පදවියේදී මට දැන ගන්නට ලැබුණු හැටියට අද ඒ ප්‍රදේශයේ උදැල්ලක් රු. 35 යි. ගොවියාට සහනයක් කළායයි මේ ආණ්ඩුව කියනවා.

ගොවියාට විශේෂ සහනයක් දුන් පිරිසක් හැටියට කියාපාන මේ ආණ්ඩුව වී බුසලක් රු. 14 බැගින් ගොවියාගෙන් ගන්නවාය කියනවා. රු. 14 බැගින් වී බුසලකට ගෙවන්නේ අර කප්පාදු කළ රුපියල් වලින් නොවෙයිද? ඔය කප්පාදු කළ රුපියලේ නියම අගය කොතෙක්ද? එදා තිබුණු රුපියලේ හැටියට නම් රුපියල් දහහතර ඇත්තෙන්ම රු. 11.60 ක් පමණයි. මේ උදවිය මොන විශ්ව විද්‍යාලවල ඉගෙන ගත් උදවියදැයි මා දන්නේ නැහැ.

ගරු මන්ත්‍රිවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
එහෙනම් පගාව ගත්තාය කියන්නෙ.

ආර්. එස්. පෙරේරා මයා.
(திரு. ஆர். எஸ். பெரேரா)
(Mr. R. S. Perera)
ඒක කොයි කවුරුත් වැඩි කර ගත්තාය කියනවා. සමහර විට අවස්ථාව එන විට ඒවා එළියට ඒවි.

තමුන්නාන්සේලා ගොවියාට දුන් සහනය කුමක්ද? කුඹුර පාළු වුණොත් එහෙම අරුම පුදුම තත්ත්වයකටයි ගොවියාට මුහුණ දෙන්නට සිදු වන්නේ. කුඹුර පාළු වුණොත් ණය ගෙවන්න බැහැ. ණය නොගෙව්වොත් ගෙදර කන්න නැහැ. ඩඩ්ලි සේනානායක අගමැතිතුමා පොත් ටික ගෙන ගිහිල්ලා. ඔන්න ඔකයි අද තිබෙන තත්ත්වය. මෙන්න මෙම තත්ත්වය පැහැදිලිවත් සිතට එකගවත් තේරුම් ගන්නවා නම් අද මේ රටේ මහජනතාව විඳින්නාවූ අසහනදායක තත්ත්වය පිළිබඳව අප ඉදිරිපත් කරන මෙම කරුණු කුමන දේශපාලන පක්ෂයකට අයිති කුමන පැත්තක සිටින කෙනෙක් වුවත් පිළිගන්නවා ඇති.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු හතර හමාරක් තිස්සේම මහජනයා පත් වුණේ දුකින් දුකටයි. වත්තේගම ගරු මන්ත්‍රීතුමා ඇසුවා තමුන්නාන්සේලාගේ කාලයේ ස්කෝලයක් හැදුවාද, මහා විද්‍යාලයක් හැදුවාද, පාරක් හැදුවාද, කියා. පාරවල් පිළිබඳව මා කියන්නම්. මා එතුමාට කියනවා ඒ ඒ වසම්වල ඇස්තමේන්තු කියවා බලන ලෙස. මොන ආණ්ඩුවක් ආවත් පාරවල නඩත්තුව පිණිස ඒ ඒ පාරේ වර්ගය අනුව මුදල් වෙන් කර වැඩ කරන බව බණ්ඩාරනායක ආණ්ඩුවේ පාර්ලිමේන්තුවරයකු වශයෙන් පවා කටයුතු කළ එතුමා නොදන්නා එක ගැන මා කනගාටු වෙනවා. සෑම වැය ශීර්ෂයකින්ම රජයේ වැඩ දෙපාර්තමේන්තුව මගින් වර්ග කළ අන්දමට පාරවල නඩත්තුව සඳහා සැතපුම් ගණනට මුදල් අයින් කරනවා. එහෙත් අපි කෙරුවේ නැතැයි කියනවා. ස්කෝල ගැන කියන්නට කැමතියි. අපේ යුගයේ පමණ ස්කෝල සෑදූ යුගයක් තිබුණේ නැහැ. තමුන්නාන්සේත් කොහේ ඉගෙන ගත්තාදැයි කියන්නට මා දන්නේ නැහැ. මේ අන්දමට මහජනයාට දුක් විඳින්නට සිදු වී තිබෙන කාලයක්, මුළු පරාක්‍රමබාහු යුගයටම නිග්‍රහ ගෙන දෙන කාලයක්, කවදාවත් උදා වුණේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේ ඉන්දියාවේ ප්‍රතිගාමී සින්ඩිකේට් කාරයන් අයින් කළා වාගේ ලංකාවේ ප්‍රතිගාමී සින්ඩිකේට් කාරයන්වත් අයින් කිරීමේ කාලය නුදුරු අනාගතයේදී උදා වේවායි ප්‍රාර්ථනය කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 5.57

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Mr. Deputy Speaker will now take the chair.

අනතුරුව කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *took the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. එම්. ටී. බණ්ඩාර මයා. (වාරියපොළ)
(திரு. டீ. எம். ரீ. பண்டார—வாரியப்பொல)
(Mr. D. M. T. Bandara—Wariyapola)

කැළණියේ ගරු මන්ත්‍රීතුමාගේ (ආර්. එස්. පෙරේරා මයා.) කතාවෙන් ගොවි කර්මාන්තය පිළිබඳව විශාල විවේචනයක් කෙරුණා. එතුමා කර්මාන්ත ව්‍යාපාරිකයකු බව අප දන්නවා. ගම්බද ගොවි ජනතාව පිළිබඳව හරියාකාර කරුණු නොදැනයි එතුමා කරුණු ඉදිරිපත් කළේ. වී නිෂ්පාදනය පිළිබඳ දියුණුවක් තිබෙනවා නම් සහල් මිල අඩු නොවන්නේ මන්දැයි එතුමා අහනවා. පාන් අලෙවිය වැඩි වීම ගැනත් කිව්වා. දඹුල්ලේ පාන් රාත්තල් 2,000 ක් විකුණුනායයි එතුමා ප්‍රකාශ කළා. [බාධාකිරීමක්] එතුමා යන්න යනවා. මා මෙම අවස්ථාවේදී සඳහන් කරන්නට කැමතියි, ගම්බද ගොවි ජනතාවගේ පරිසරය හා ජීවන තත්ත්වය ගැන නගරබද මන්ත්‍රීවරුන් එතරම් කරුණු නොදන්නා බව. අපේ ප්‍රදේශවල ගොවි ජනතාව ඉස්සර වාගේ නොවෙයි, ඉතා උනන්දුවෙන් අද ගොවිතැන් කරනවා. සහල් මිල පහළ යන කාලයක් මේ රටේ තිබෙන බව ඒ ගරු මන්ත්‍රීතුමා නොදන්නවා වන්නට ඇති. මහ කන්නයේ අස්වනු කපා ගත්තායින් පසු ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් වන විට වී වල මිල අඩු වෙනවා. නැවතත් යල් කන්නයේදී ගොවිතැන් කරන්නේ ස්වල්ප වශයෙනුයි. එම නිසා ඒ කාලයේදී සාමාන්‍ය මිල වැඩිවීමක් ඇති වුවත් යළිත් මහ කන්නයේ ගොවිතැන් සාර්ථක වන විට මිල අඩු වෙනවා. නිෂ්පාදනය ඇති වන විට—විශෙෂයෙන් මහ කන්නයේදී—වී මිල පහල බසින බවයි මෙයින් පෙනෙන්නේ. එහෙත් ගරු මන්ත්‍රීතුමා කිව්වා, ජීවන වියදම ඉහළ යන බව. ගොවියා අමුඩය ගසාගෙන මහන්සි වෙලා තමන්ගේ ගොවිතැන් සශ්‍රීක කර අස්වනු කපා ගත්තායින් පසු තුට්ටුවට දෙකට වී විකුණන්නට ලෑස්ති නැහැ. ගොවියා නිතරම උනන්දු වන්නේ වැඩිම මිලකට තමන්ගේ වී ටික විකුණා ගන්නටයි.

පාන් මිල පිළිබඳව යමක් කියන්නට මා කැමතියි. තමන්ගේ වී නිෂ්පාදනය අටුවේ තබාගෙන ගොවියා පාන් කන බව එතුමා කිව්වා. වී, තිබෙනවා. නමුත් අපේ ජනතාව තුන් වේලටම බත් කන්නේ නැහැ. මුදල් වැඩියෙන් ලබා ගන්නට වුවමනා නිසා තුන් වේලටම බත් කන්නෙ නැහැ. වී බුසලකට රජයෙන් දෙන්නේ රුපියල් 14ක් වුණත් අපේ ප්‍රදේශවල වී බුසල රුපියල් 18 කට පමණ විකුණන්න පුළුවනි. ගොවියන් අද රජයට වැඩියෙන් වී දෙන්නේ නැහැ. වගා ණය ගෙවීමට පමණක්, පොහොර ණය ගෙවීමට පමණක් වී දෙනවා. ඉතිරි වී ඒ අය ළඟ තබා ගන්නවා. මාස් කන්නය ඉවර වී මාස ගණනක්ම තමන් ළඟ වී තබා ගන්නවා. රටේ වී නිෂ්පාදනය අඩු වන තෙක් වී තමන් ළඟ තබා ගන්නවා. යල් කන්නය පටන් ගන්න කිට්ටු වෙන විට වී මිල ඉහළ යන බව ඒ අය දන්නවා. අද රජයත් සමග පුද්ගලික මෝල් හිමියන් තරඟයක යෙදී සිටිනවා. රජය වී බුසලක් රුපියල් 14 කට ගන්න සූදානම් වන විට පෞද්ගලික මෝල් හිමියන් වී බුසලකට රුපියල් 16ක්, 17ක්, 18ක් ගෙවන්න සූදනම්. සම්බ වී බුසලක මිල රුපියල් 24 දක්වා ඉහළ යනවා.

කැළණියේ ගරු මන්ත්‍රීතුමා වී නිෂ්පාදනය ගැන කිසිවක් දන්නේ නැහැ. එතුමා දන්නේ කර්මාන්ත ගැන පමණයි. එතුමා කර්මාන්ත ගැන ලොකු විග්‍රහයක් කළා. වී නිෂ්පාදනයේදී අක්කරයට වුවමනා ජල අක්කර ප්‍රමාණයවත් දන්නේ නැතිවයි එතුමා කතා කරන්නෙ. වාරිමාර්ග දෙපාර්තමේන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුවෙන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් වගාව සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කර තිබෙනවාලු, නමුත් වගා කර තිබෙන අක්කර ප්‍රමාණය වැඩි වී නැතිලු. වගාව සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කර තිබෙන බව ඇත්ත. මා කියන්න කැමතියි, 1965 ට කලින් සුළු වැව් එකක්වත් ප්‍රතිසංස්කරණය කර තිබුණේ නැති බව. ගම්බද ගොවි ජනතාවගේ දියුණුව සඳහා පසුගිය ආණ්ඩුව කටයුතු කළේ නැහැ. නාගරබද අයගේ, කම්කරුවන්ගේ වර්ජන ව්‍යාපාර ගෙන යන අයගේ පඩි වැඩි කිරීමට නැත්නම්, නගරබද අයගේ දියුණුව සඳහායි පසුගිය ආණ්ඩුව කටයුතු කළේ. පසුගිය රජය ක්‍රියා කළේ ඒ ආකාරයටයි. ඒ වගේම මේ රටේ ආර්ථික දියුණුව සඳහා ඒ රජයෙන් කිසිම දෙයක් කළේ නැහැ. එදා ගොවියා ණයෙන් මිරිකිලා සිටියා. තමන්ගේ කුඹුරුවලට වතුර ලබා ගත නොහැකිව, වාරිමාර්ග ක්‍රම ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා, තමන්ගේ කුඹුරු පාලුවට යවමින් ගොවිතැන් කිරීමට ක්‍රමයක් නැතිව ණය ගැතිවී සිටියා. ගම්බද ජනතාව හැම විටම ණය ගැතිකමිනුයි ජීවත් වුණේ. ඒ වගේම ඔවුන් වෙනත් වෙනත් දූෂණ කටයුතුවල යෙදුනා. හරක් හොරකම් කළා. කසිප්පු පෙරීම්, වයින් වර්ග බීම යනාදී නොයෙකුත් දේවලට ඒ අය පෙළඹී සිටිය නමුත් අද වගා කරන ගොවියාට වැඩියෙන් මුදල් ලැබෙනවා. අද මිරිස් රාත්තලක මිල රු. 3.80 යි කියා කියන්න යෙදුනා. ගොවියා අමුඩ ගසා ගෙන උදේ සිට සවස් වන තෙක් වැඩ කරනවා. උදේට සවසට වතුර දමමිනුයි තමන්ගේ ගොවිතැන් කටයුතු දියුණු කරගන්නෙ. ඒ විධියට මහන්සියෙන් වගා කරන ලංකාවේම මිරිසුයි අද වෙළඳ පොලේ තිබෙන්නෙ. හාල් පොත්වලට දෙන මිරිස් අවුන්ස ගණන පමණයි පිටරටින් ගෙන්වන මිරිස්වලට තිබෙන්නෙ. ඒ මිරිස් නම් රාතත්ලක් රු. 1.30ක් පමණ වෙනවා. අනික් සෑම මිරිස් තොගයක්ම ලංකාවේ නිපදවන මිරිසුයි. ඒවා තමයි රාත්තල රුපියල් 3.80 බැගින් විකුණන්නෙ. ඉතා මහන්සියෙන් වගා කරන මිරිස් රාත්තලක් ශත 50කට නැත්නම් 25කට දෙන්නද තමුන්නාන්සේලා කියන්නෙ? නිකම් ඉඳ ගෙන තුට්ටු දෙකට මේවා කන්නද බලා ගෙන ඉන්නෙ? ලංකාවේ මිරිස් රාත්තල රු. 15 තෙක් ඉහළ යන්න ඕනැ. වී බුසලක් රුපියල් 30 තෙක් ඉහළ යන්න ඕනැ. මේ රටේ වගා කරන මිනිසාට දියුණු විය හැකි වන්නේ එවිටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගම්බද ජනතාව ඉතාමත් දුක්ඛිත ජීවිතය කුයි එදා ගත කළේ. අද මම අභියෝග කරනවා, අපේ පළාතට ගොස් බලන්න, අපේ ගම්වැසියන් වගා කරන හැටි කොහොමද කියා. මැතිවරණයට ඉදිරිපත් වුණ විට ඡන්ද ලබා ගැනීමේ අදහසින් මන්ත්‍රීවරුන් මෙතැන කතා කරනවා. ඊළඟට තවත් කියන්න යෙදුනා, එක් උපාධිධාරියෙකු රක්ෂාවක් නැතිව වලං හෝදනවාය කියා. තවත් උපාධිධාරියෙක් මාවතගම කඩ මණ්ඩියේ බුලත්විට විකුණනවාලු. මමත් කුරුණෑගල, වාරිය පොළයි ඉන්නෙ. මා නම් දැක්කේ නැහැ, උපාධිධාරියෙකු බුලත් විට විකුණනවා. මා ආරාධනා කරනවා, ඒ දෙන්නා මා ළඟට එවන්නය කියා, ඒ අය මා ගොවි හමුදාවට බඳවා ගෙන ගොවි භටයින් වශයෙන් කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්නම්. වලං හෝදන්න වුවමනා නැහැ. මහජනතවා මුලා කරන්න, ඒ අයගේ ආදරය අනුකම්පාව ලබා ගැනීම සඳහා මේ ගරු සභාව වේදිකාවක් වශයෙන් සලකා ගෙන කතා කරනවා.

ඒ වගේම ඒ මන්ත්‍රීතුමා පෙන්නා දුන්නා, මහ කන්නයට වඩා යල් කන්නයේ ගත් ණය ප්‍රමාණය අඩුය කියා. මහ බැංකුවේ වාර්තාව අනුව ගොවි ජනතාව යල් කන්නයේදී ගත් ණය ප්‍රමාණය අඩුලු. යල් කන්නයේ ණය වශයෙන් ලබා ගෙන තිබෙන්නේ මහ කන්නයේ ලබා ගත් ණය ප්‍රමාණයෙන් පහෙන් එකක් පමණලු. ගොවිතැන් කරන්නට දන්න මන්ත්‍රීවරයෙක් ඕනැ මේවා ගැන කතා කරන්න. යල් කන්නයේ ගොවිතැන් කරන කුඹුරු ප්‍රමාණය අඩුයි. මගේ ආසනයේ සියයට 20 කට 25 කට වඩා යල් කන්නයේදී වැඩ කරන්නෙ නැහැ. යල් කන්නයේදී ගොවිතැන් අසාර්ථකයි. නියම විධියට වර්ෂාව ලැබෙන්නෙ නැහැ. වුවමනා ප්‍රමාණයට වතුර ලැබෙන්නෙ නැහැ. නියම කාලයට වැහි ලැබෙන්නෙ නැහැ. ඒ බව ගරු මන්ත්‍රීවරයා නොදැනයි කතා කළේ. ඇත්ත වශයෙන් යල් කන්නයේදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. ඊ. බණ්ඩාර මයා.]

ණය ගන්නේ බොහොම ස්වල්පයයි. යල් කන්නයට වැඩ කරන්නේ බොහොම ස්වල්ප දෙනයි. ඒ නිසා ගොවිතැන ගැන කිසිම දෙයක් නොදැන, කොයි විධියටද වැඩ කරන්නේ කියාවත් නොදැන මේ විධියට කතා කරන්නේ මහජනතාවගේ නැත්නම් ගොවි ජනතාවගේ ඡන්දය ලබා ගැනීමේ අදහසිනුයි. එදා වාගේ අද ගම්බද ජනතාව මුළා කරන්නට ලැබෙන්නේ නැහැ.

ඊළඟට බඩු මිළ ගැන සංඛ්‍යා ලේඛනයක් ඉදිරිපත් කළා. 1956 සිට තිබුණ මිළ ගණන් එතුමා ඉදිරිපත් නොකළේ ඇයි ? සංසන්දනය කරනවා නම් 1956 සිට 1965 දක්වාත් 1965 සිට අද දක්වාත් තිබෙන මිළ ගණන් සංසන්දනය කරන්නට ඕනෑ. එදා 1956 කාලයේදී බයිසිකලයක් රුපියල් 110 යි, 115 යි. අද බයිසිකලයක් රුපියල් 280ක් පමණ වෙනවා. මේ සමහර උදවිය කථා කරන්නේ ආණ්ඩුව කියන ඕනෑම මිළකට පිටරටින් බඩු බාහිරාදිය එවනවාය යන හැඟීමක් ඇති වන විධියටයි. මේ රටට අවශ්‍ය අමු ද්‍රව්‍ය ගෙන්වන විටත් වෙනත් අවශ්‍ය බඩු බාහිරාදිය ගෙන්වන විටත් ඒ රටවල් ඉල්ලන මිළ ගණන් අප ගෙවන්නට ඕනෑ. කැළණියේ ගරු මන්ත්‍රීතුමාට ඒ කාරණය අමතක වී තිබෙනවා. එංගලන්තයෙන්, ඇමෙරිකාවෙන් නැත්නම් ඉන්දියාවෙන් අප රුපියල් විසි පහකට බයිසිකලයක් ඉල්ලුවාය කියමු. එවයිද ඒ ගණනට බයිසිකලයක් ? නැහැ. එම නිසා මෙවායින් මහජනතාව මුළා කරන්නට බැහැ. එතුමන්ලා 1956 සිට 1965 දක්වා මේ රටේ දියුණුවට මොනවාද කළේ ? ණය ගැනත් කථා කළා. හිඟ අයවැය ලේඛන ගැනත් කථා කළා. මේ රටේ හිඟ අයවැය ලේඛන ඉදිරිපත් කළේ 1956 න් පසුවයි. එතුමන්ලාත් 1965 දක්වා පිටරටවලින් ණය ලබා ගත්තා. ඒ ණය ලබා ගෙන එතුමන්ලා මේ රටේ දියුණුවට කුමක් කළාද කියා මා ප්‍රශ්න කරනවා. ඒ ණයවලින් 1965 දක්වා මේ රටේ දියුණුවට කිසිම දෙයක් කර නැහැ. ඒ ණය එදිනෙදා ආහාරයට සහ වෙනත් අවශ්‍යතාවන්ට වියදම් කළාය, රටේ සංවර්ධනයට වියදම් නොකළාය කියා මහා බැංකුවේ වාර්තාවල සඳහන් වෙනවා. නමුත් මේ රජය සංවර්ධන යෝජනා ක්‍රම විශාල සංඛ්‍යාවක් ආරම්භ කර තිබෙනවා. ඒවා සම්පූර්ණ කරන්නට බලාපොරොත්තු වෙනවා. ඇඳුරු ඔය වම් ඉවුර එක යෝජනා ක්‍රමයක්. ඒකට රුපියල් එක් කෝටි අසූ ලක්ෂයක් වැය වෙනවා. එම යෝජනා ක්‍රමය මගින් වාරියපොල, නිකවැරටිය, බිංගිරිය දක්වා ජල සම්පාදනය කරන්නට පුළුවනි. ඒවාගේම මහවැලි ගඟ යෝජනා ක්‍රමය තවත් එකක්. ණය වී හෝ මෙවැනි විශාල සංවර්ධන ව්‍යාපාරවලින් රට දියුණු කිරීම අපේ බලාපොරොත්තුවයි. 1965වන තෙක් තමුන්නාන්සේලාත් පිටරටවලින් ණය ආධාර ලබා ගත්තා. නමුත් රටේ සංවර්ධනය සඳහා ඒවායින් කිසිවක් කර නැහැ. මගේ කොට්ඨාශයේ එක වැවක්වත් බැඳ තිබුණේ නැහැ. ගොවියා සම්පූර්ණයෙන්ම අන්ධකාරයේ ගෙන ගොස් තිබුණා. නමුත් දැන් මේ රටේ යම්කිසි සංවර්ධනයක් ඇති වී තිබෙනවා.

කැළණියේ ගරු මන්ත්‍රීතුමා සහල් මිළ ගැනත් කථා කළා. සහල්වලින් රට ස්වයං පෝෂිත වී පිටරටින් එක හාල් ඇටයක්වත් නොගෙන්වූදාට තමයි හාල් මිළ බහින්නෙ. වී විකුණා ගන්නට බැරිව ගොවීන් අතර තරඟයක් ඇති වූ දාට හාල් මිළ බසීවි. මිරිස් විකුණා ගන්නට බැරිව ගොවීන් අතර තරඟයක් ඇතිවූ දාට මිරිස් මිළ බසීවි. එතෙක් මිළ අඩු වන්නේ නැහැ. මේ අවස්ථාවේදී යම් විධියකින් මිළ අඩු වුණොත් ගොවියාගේ උනන්දුවත් අඩු වෙනවා. මේ රටේ නිෂ්පාදනය කරන ධාන්‍ය වර්ග, සහල් පිටරටින් ගෙන්වා අඩු මිළකට දුන්නොත් මේ රටේ ගොවියා පිරිහෙනවා. ඔහුගේ උනන්දුව හීන වෙනවා. ගොවිතැන අසාර්ථක වෙනවා. ගොවියා දිළින්දකු වෙනවා. හරියාකාරව කරුණු නොදැන එතුමා තවත් බොහෝ දේවල් ප්‍රකාශ කළා.

ජීවන අංකය බොහොම ඉහළ ගොස් තිබෙන බවත් එතුමා සඳහන් කළා. ජීවන තත්ත්වය දියුණු වන විට ජීවන අංකය ඉහළ යෑම පුදුමයට කාරණයක් නොවෙයි. අප දන්නා හැටියට ආසියාවේ කාර්මික අතින් සහ කෘෂිකර්මය අතින් දියුණුම රට ජපානයයි. යුද්ධයෙන් පසු ජපානය කොයි තරම් දියුණු වූවාද යන්න කවුරුත් දන්නා කාරණයක්. ජපානයේ ලංකා තානාපති කාර්යාලයේ මගේ මිත්‍රයකු සිටිනවා. රුපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යල් 25ක් නැතිව එහෙ එක වේලක් කන්නට බැරි බව මට දැනගන්නට ලැබී තිබෙනවා. ඒවාගේම ජීවන අංකය පහත හෙළීම රජයට කරන්නට පුළුවන් දෙයක් නොවෙයි. ජීවන අංකය පහත හෙළිය හැක්කේ මහජනතාවටයි. අපටත් අවුරුදු තිස් පහක, හතළිහක, හතළිස් දෙකක අත්දැකීම් තිබෙනවා. හැමකෙනකුම පාගේ දෙවේලක් කන්න පටන් ගත්තේ හාල් සේරු දෙකක් දෙන්න වුණාට පසුයි. අපේ ගම්වල අය ඉස්සර උදේට කන්නේ බතල, මඤ්ඤොක්කා වැනි අල වර්ගයක්. බොහෝ දෙනකු දවල්ටත් රෑටත් දෙකටම සම වෙන්න සවසට ආහාර වේලක් ගන්නවා. නගරවල ජීවත් වන ධනපතින් ඒවා දන්නෙ නැහැ. ගම්බද බොහෝ දෙනකු පුළුවන්කමක් තිබුණත් පාවහන් පළඳින්නේ නැහැ. ළමයින් ඉස්කෝලෙට යන්නෙ පයින්. ශත 15 ක් අතට ලැබුණත් එය වියදම් නොකර හැතැප්ම පයින්ම ඉස්කෝලෙට යනවා. ඒ වාගේම අප ඉස්සර ඉස්කෝලය ඇරී ගෙදර ආවාට පසු ගොවිතැන් කටයුතුවල හෝ ඉදල් මුසුන් බැඳීම වැනි හස්ත කර්මාන්තවල හෝ යෙදෙනවා. අප එක කමිසයක් මාසයක් පමණ කල් අඳිනවා. අප වියදම් කෙළේ බොහෝම අඩුවෙන්. ඒ නිසා ඒ කාලයේදී ජීවන වියදම ඉතාම පහළයි. එහෙත් දැන් කොයි ළමයද ඉස්කෝලෙට පයින් යන්නේ ? හැම මහා විද්‍යාලයකටම බස් එකක් ඕනෑ. අද කවුද ලෙඩෙකු රෝහලකට ගෙන යන්න කරත්තයක් ගන්නේ ? හැම දෙනාම කාරෙකක් ඒ සඳහා ගන්නවා. අද කවුද පයින් ගමන් බිමන් යන්නේ ? නිදහස ලැබෙන්නට පෙරත් නිදහස ලැබුණාට ටික කලක් යන තුරුත් අප බොහොම අර පරෙස්සමින් ජීවත් වුණා. පිටරට භාණ්ඩ පාවිච්චි වුණේ බොහොම අඩුවෙන්. එදා කිසිම කෙනෙකු හුම්තෙල් උදුන් පාවිච්චි කෙළේ නැහැ. ඒ නිසා ජීවන වියදම අඩුයි.

රටක ජීවන වියදම අඩු කරන්න පුළුවන්කම තිබෙන්නේ රජයට නොව මහජනතාවටයි. ජනතාව වැඩි වැඩියෙන් භාණ්ඩ පරිහරණය කරන්නට කරන්නට ජීවන වියදම ඉහළ යනවා. හිටි හැටියේම එය අඩු කරන්න පුළුවන්කමක් මුදල් ඇමතිතුමාට නැහැ. එතුමා ගෝගියා පාෂා කෙනෙක් නොවෙයි.

මේ රටට නිදහස ලැබීමෙන් පසු පැවති කිසිම රජයකට අයවැය කථා 3ක් වත් පවත්වන්නට බැරි වූ නමුත් හත්කෝරළයේ වන්නියෙන් පැමිණි ගරු මුදල් ඇමතිතුමා 5 වන අයවැය කථාවත් පැවැත්වීම ගැන අප එතුමාට ප්‍රශංසා කරනවා. ගම්බද ජනතාව දැන් ඉස්සරට වඩා දියුණු තත්ත්වයකින් ජීවත් වන බව මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කළ යුතුයි. යල මහ දෙක වැඩ කර ගැනීම සඳහා ගම්බද ගොවි ජනතාවට නියම වේලාවට ජලය ලැබෙනවා නම් වී අස්වැන්න දෙගුණ තෙගුණ කරන්නට පුළුවන්කම තිබෙනවා. විශාල වශයෙන් කැලෑ කපා හෙළිපෙහෙළි කිරීම නිසා කලට වේලාවට වර්ෂාව ලැබෙන්නේ නැහැ. එහෙත් මේ රජය යටතේ ක්‍රියාත්මක වෙගන යන විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම සම්පූර්ණ වුනායින් පසු මේ රටේ ගොවි ජනතාවට විශාල සෙතක් සිදු වෙනවා ඇති. එපමණක් නොව, ඒ වන විට මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නයත් හුඟක් දුරට විසදෙනවා ඇති. අද සමහරුන් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීමට අදහස් කරන්නේ සියලු දෙනාට ශිෂ්‍ය ගුරු පත්වීම් හා උපාධිධාරී ගුරු පත්වීම් දීමෙනුයි. මේ ප්‍රශ්නය කවදාවත් ඒ විධියට විසඳන්නට බැහැ. මේ අවුරුද්දේ උපාධිධාරීන් 14,000 කට ගුරු පත්වීම් දුන්නත් ලබන අවුරුද්දේ උපාධි ලබා පිට වන 16,000 කට මොකද කරන්නේ ? අද රැකීරක්ෂා ප්‍රශ්නය උග්‍ර වී තිබීම මේ රජයේ වරදක් නොවෙයි. 1956 සිට 1965 දක්වා වැඩි වුණු ජනගහනයට සැසඳෙන අන්දමේ රැකීරක්ෂා සැපයීමේ වැඩ පිළිවෙළක් ඇති නොකිරීමත් ආහාර ප්‍රශ්නය විසඳීමට නියම විධියේ සැලැස්මක් ඇති නොකිරීමත් නිසා මේ ප්‍රශ්න ක්‍රමයෙන් උග්‍ර වුණා. එය මේ රජයේ වරදක් නොවෙයි. 1965 ට පෙර අවුරුදු 9 ක් තිස්සේ එකතු වුණු පිරිසත් සමගයි අද රැකීරක්ෂා නැති දෙලක්ෂ ගණනක් දෙනා සිටින්නේ. මා මුලින් කිව්ව වගේ ඇඳුරු ඔය සංවර්ධන යෝජනා ක්‍රමය මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය වැනි ව්‍යාපාරවල වැඩ කටයුතු සම්පූර්ණ වුණායින් පසු මේ රටේ රැකීරක්ෂා ප්‍රශ්නය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. එම්. ටී. බණ්ඩාර මයා.]

විසඳෙනවා ඇති. කිහිප දෙනෙකු තෝරා ඔවුන්ට ශිෂ්‍ය ගුරු පත්වීම් දීමෙන්වත්, උපාධිධරයන් කිහිප දෙනෙකුට ගුරු පත්වීම් දීමෙන්වත් තවත කිහිප දෙනෙකුට කොන්දොස්තර තනතුරු දීමෙන්වත් මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. ඒ සියලු දෙනාටම ගුරුකම, ලිපිකාරකම, කොන්දොස්තරකම වැනි රැකීරක්ෂා සපයන්නට නම් ගෙයක් පාසා ඉස්කෝල හා කච්චේරි පිහිටුවන අතර ලංකා ගමනාගමන මණ්ඩලයට අඩු වශයෙන් තවත් බස් දෙතුන් ලක්ෂයකුත් ගන්නට ඕනෑ. පසුගිය ආණ්ඩුව රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නට බලාපොරොත්තුවුනේ ඒ විධියටයි. අපේ ආණ්ඩුව බලාපොරොත්තු වෙන්නේ නියම විධියට කෘෂිකාර්මික යෝජනා ක්‍රම ඇති කර ඒ මගින් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නටයි.

අවසාන වශයෙන් මට වචන සවල්පයක් කථා කිරීමට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුති කරමින්, පස්වෙනි අය වැය ලේඛනය ඉදිරිපත් කිරීම ගැන ගරු මුදල් ඇමතිතුමාට දීර්ඝායු ප්‍රාර්ථනා කරමින් මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනවා.

අ. භා. 6.17

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරියපොල ගරු මන්ත්‍රීතුමාගේ (ඩී. එම්. ටී. බණ්ඩාර මයා.) කථාවට සවන් දෙන විට මට කල්පනාවක් පහළ වුණා, අපේ අගමැතිතුමාට ස්තුති කරන්නට ඕනෑ කියා. මොකක් ගැනද? වාරියපොල ගරු මන්ත්‍රීතුමා වෙනුවට යාපහුවේ ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිතුමා වශයෙන් පත් කිරීම ගැනයි. මිරිස් රාත්තල රු. 3 දක්වා වැඩි කිරීම ගැන අපි මුදල් ඇමතිතුමාට දොස් කියනවා. එහෙත් වාරියපොල ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමතිතුමා වුනා නම් එතුමා කියන හැටියට රු. 15 දක්වා මිරිස් මිළ වැඩි වෙනවා.

ඩී. එම්. ටී. බණ්ඩාර මයා.

(திரு. டீ. எம். ரீ. பண்டார)

(Mr. D. M. T. Bandara)

මම කිව්වේ වැඩි කළා නම් ගොවියාට හොඳ බවයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

ඒ නිසා වාරියපොල ගරු මන්ත්‍රීතුමාට ඒ පදවිය පිරිනොනමා යාපහුවේ ගරු මන්ත්‍රීතුමාට ඒ පදවිය පිරිනැමීම ගැන ගරු අගමැතිතුමාට මා කෘතඥ වෙනවා.

ඇත් දින ගණනකට පෙර මේ විවාදයට සහභාගි වුණු රාජ්‍ය ඇමතිතුමා කියා සිටියා, ඒ දක්වා කෙරුණු කථාවලින් නානා දේවල් පිළිබඳව සඳහන් වුනේවී නමුත් අයවැය ලේඛනය පිළිබඳව යමක් සඳහන් වුණේ නැහැ කියා. ඒ අන්දමට කලින් කථා කළ කථිකයන් සම්බන්ධයෙන් ඒ ඇමතිවරයා එක්තරා චෝදනාවක් කළා. අද කෙරුණු කථාවලට සවන් දුන් මට පෙනී ගියා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු අයවැය ලේඛනය ගැන කථා නොකර වෙනත් දේවල් ගැන කථා කළ බව.

අපේ ගරු කර්මාන්ත ඇමතිතුමාගේ කථාවේ කෙළවරේදී එතුමා මේ පැත්තේ සිටින සමාජවාදීන්ට යම්කිසි උපදෙස් වගයක් දෙන්නට තැත් කළා. ඒ අයවැය ලේඛනය ගැන නොවෙයි. මේ පැත්තේ සිටින සමාජවාදීන් රදල පවුලකින් පැමිණ සිටින රදළ නායිකාවක් වටා රොක් වී සිටියත්, කවදාවත් එතුමිය සමාජවාදය කරා අපව රැගෙන යන්නෙ නැහැ කියා එතුමා අනාවැකියක් පළ කළා. සමාජවාදීන් විරුද්ධ පාර්ශ්වයේ නායිකාවගෙන් ඈත් කිරීමට එයින් එතුමා තැත් කළ බවයි අපට හැඟී යන්නේ. ඈත් කිරීමට හිතා ගෙන අපට උපදෙස් දුන්නා. අපට කර්මාන්ත ඇමතිවරයා ඒ විධියේ උපදෙසක් දෙනවත් සමඟම ඊට පසු ආණ්ඩු පක්ෂයෙන් කථා කළ චත්තේගම ගරු මන්ත්‍රීතුමා (වීරකෝන් මයා.) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට උපදෙස් දෙන්නට පටන් ගත්තා. මාක්ස්වාදීන් වන අප වගේ මිනිසුන් සමඟ එකතු නොවන ලෙස. මෙය කලින් කල්පනා කර අප අතර අසමගියක් ඇති කිරීමට දුන්න උපදෙස් කිහිපයක් බව මට කල්පනා වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මගේ කථාවේදී හැකි තරම් දුරට අයවැය ලේඛනයේ සඳහන් කරුණු ගැන කථා කරන්නට මා උත්සාහ කරන අතර,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යම් යම් අවස්ථාවල නොයෙක් දේවල් කිහිපයක් ගැනත් සඳහන් කරන්නට සිදු වන බව මා කලින්ම මතක් කරනවා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

විරුද්ධ පාර්ශ්වයේ කවුරුන්වත් නැහැ නෙ !

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

අප අයවැය ලේඛනය ගැන සාකච්ඡා කරන නිසා වෙනත් කවුරුන් නොසිටියත් ගරු මුදල් ඇමතිතුමා සිටීම ප්‍රමාණවත් යයි මා කල්පනා කරනවා. ගරු කර්මාන්ත ඇමතිතුමා කථාකරනවිට විරුද්ධ පාර්ශ්වයෙන් මා පමණක් සිටීම ප්‍රමාණවත් නැතැයි එතුමා දොස් කීවත් මා එසේ දෙස් නගන්නේ නැහැ. මෙම අයවැය විවාදයේ දී ගරු මුදල් ඇමතිතුමා මගේ කථාවට සවන් දෙනවා නම් මට එයින් තෘප්තියට පැමිණිය හැකි බව සඳහන් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙකු ගරු මුදල් ඇමතිතුමාට ප්‍රශංසා කරන්න යෙදුණා පස්වන වරටත් අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම ගැන. එය එසේ නම් අපට පැහැදිලියි, එතුමාම අයවැය ලේඛන හතරක් මීන් පෙර ගරු සභාව ඉදිරියේ තබා ඇති බව. එහෙනම් කලින් ඉදිරිපත් කරන ලද අය වැය ලේඛන හතර ගැනත් යමක් සඳහන් නොකර මෙම අයවැය ලේඛනය ගැන පමණක් අපට කථා කරන්න බැහැ. ඒ වාගේම පසුගිය අවුරුදු හතර හමාරක කාල පරිච්ඡේදය තුළදී වර්තමාන ඊනියා ජාතික ආණ්ඩුව කර ඇති වැඩ කටයුතු ගැනත් සඳහන් කරන්න සිද්ධ වෙනවා. ගරු කථානායකතුමනි, අපේ මුදල් ඇමතිතුමා පළමු වන අයවැය ලේඛනය ඉදිරිපත් කරන ගමන් කීවා, ඉන් පෙර තිබුණු ආණ්ඩුවල වැරදි ක්‍රියා නිසා අපට ආර්ථික අර්බුදයකට මුහුණ පාන්න සිදු වුණාය කියා. වුවමනා නැති අන්දමට මුදල් වියදම් කර, මුදල් කාබාසිනියා කර දමා තිබෙනවාය, එම නිසා ආර්ථික අර්බුදයකට රට මුහුණ පාන්න වුණායයි තවදුරටත් එතුමාගේ කථාවේදී සඳහන් කළා. එසේ වුණත් අපේ වෙළඳ ගිණුම්—terms of trade—අපට අවාසි වන අන්දමට සකස් වී තිබීමෙන් එබඳු ආර්ථික අර්බුදයක් ඇති වී තිබුණාය කියා ඒ අවදියේදී අපේ මුදල් ඇමතිතුමාට පෙනී නොයාම ගැන එක් අතකින් මා පුදුමයට පත් වන්නේ නැහැ. මා එසේ පුදුමයට පත් නොවන්නේ පසුගිය මැතිවරණ අවස්ථාවේදී එවකට පැවති සභාග ආණ්ඩුවට විරුද්ධව එක්සත් ජාතික පක්ෂය නොයෙකුත් විධියේ ප්‍රචාරයන් ගෙන ගිය නිසයි. එවකට තිබුණු ආණ්ඩුව මුදල් නාස්ති කරනවාය, රට බංකොලොත් කරනවාය, බඩු මිල පහත හෙළන්න ක්‍රියා කරන්නේ නැත ඔන්න ඔය විධියේ චෝදනා ඉදිරිපත් කර තමයි මහජනතාවගෙන් බලය ලබා ගත්තේ. බලයට පත් වුණාට පසුවද, ඇත්ත තත්ත්වය සොයා බැලීමට උත්සාහ නොකර, කලින් තිබුණු ආණ්ඩුවලට මැතිවරණ කාලයේදී දොස් නැගු පිළිවෙළටම, දොස් නැගීමයි කළේ. එම නිසා ඇති වී තිබෙන මුදල් අර්බුදයට ගරු ඇමතිතුමා මුහුණ දෙන විට ඊට නියම හේතුව කුමක්ද කියා සොයා බලන්නවත් එතුමාට කල්පනා වුණේ නැහැ. ඒ වෙනුවට මුදල් නැත, දවස් හතරකට සෑහෙන පමණ සහල් ගන්නවත් මුදල් තිබුණේ නැත, මුදල් නාස්ති කර දැමීම නිසා එබඳු අමාරු තත්ත්වයක් ඇති වී තිබෙනවාය කියා එතුමා ප්‍රකාශ කරන්න යෙදුණා. කොටින්ම එයට වඩා දුර කල්පනා කිරීමත් අනවශ්‍යයයි කියා වර්තමාන ආණ්ඩුව කල්පනා කළා. මන්ද? එබඳු සෑම ප්‍රශ්නයක්ම විසඳීමට තමන් අතේ තුරුම්පුවක් තිබෙනවායයි කල්පනා කළා. ඒ තුරුම්පුව, බටහිර අධිරාජ්‍යවාදී රටවලින් ලැබෙන්න යන ආධාරයි.

ඇත්ත වශයෙන් අපේ සියලුම ප්‍රශ්න බටහිර අධිරාජ්‍යවාදී රටවලින් ලැබෙන ආධාරවලින් විසඳන්න පුළුවන් වෙනවා යයි ලොකු බලාපොරොත්තුවක් මුදල් ඇමතිතුමා තුළ තිබුණා. එම විශ්වාසය සනාථ කිරීම සඳහා, අයවැය විවාදයටත් පෙර පෙට්රල් සමාගම්වලට අසාධාරණ වන්දියක් ගෙව්වා. එසේ කිරීමෙන් ඇමෙරිකානුවන් තෘප්තියට පමුණුවන්න, නවතා දමා තිබූ ඇමෙරිකානු ආධාර ලබා ගන්න, ඒ මාර්ගයෙන් අපේ සියළුම ප්‍රශ්න විසඳා ගන්න පුළුවන් වෙනවායයි කල්පනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

කළා. එම නිසාම තමයි, පළමුවන අය-වැය කථාවේදී, අපේ රට මුහුණ පා ඇති ප්‍රධාන ප්‍රශ්නය වන වෙළඳ ගිණුම් අවාසි අතට හැරීම පිළිබඳ ප්‍රශ්නය ගැන වචනයක්වත් සඳහන් නොකර ඒ වෙනුවට, මුදල් අර්බුදයට හේතුව ඉන් පෙර තිබුණු ආණ්ඩුව කළ වැරදි නිසා යයි සඳහන් කරන්න යෙදුණේ. 1965-66 අය වැය ලේඛනය ඉවරයි. මුදල් අර්බුදයට එකම හේතුව පෙර පැවති ආණ්ඩු කළ වැරදි. දැන් 1966-67 අය වැය ලේඛනය ආවා. ඒ අය වැය ලේඛන කථාවෙදිත් කියනවා, අර කථාවම. මින් පෙර පැවති ආණ්ඩු කළ වැරදි නිසා මුදල් අර්බුදයක් ඇති වී තියෙනවාය කියනවා. එහෙත් ඒ වාරයේදී ප්‍රථම වරට සැබෑ ප්‍රශ්නය ගැන සඳහන් කරන්නට සිදු වුණා ; ඇති වී තිබෙන ලොකු අමාරුව කුමක්ද යන්න සඳහන් කරන්නට සිදු වුණා. අපේ අපනයන භාණ්ඩවල මිල බැස ගෙන බැසගෙන යනවාය, ආනයන භාණ්ඩ වල මිල වැඩි වේගන වැඩි වේගන යනවාය, ඒ නිසා විදේශ ගනුදෙනු පියවීමේදී අපට ලොකු අමාරුවකට මුහුණ පාන්නට සිදු වෙනවාය කියා ප්‍රථම වරට පිළිගන්නට සිදු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවමත් මේ ප්‍රශ්නය විසඳන්නට බලා පොරොත්තු වන්නේ වටහිර අධිරාජ්‍යවාදී රටවලින් විශාල වශයෙන් ආධාර ලබාගැනී මෙනුයි. මුදල් අමාරුකම් තිබෙනවාය කිව්වත්, ඒ තරම් අමාරුවක් තියෙනවාය කියන්නෙ නැහැ. මේ ආණ්ඩුව ආරම්භයේ දී සිටම බලාපොරොත්තු වුණේ අධිරාජ්‍ය වාදීන්ගෙන් ආධාර ලබාගෙන මුදල් අර්බුදය විසඳීමටයි. ගරු මුදල් ඇමතිතුමා ඒ කාලයේදීම ලෝක බැංකුවේ ඉල්ලීම් කීපයක් ඉටු කිරීමට සූදානම් වූ බව ඒ අය වැය ලේඛන කථාවෙදි පෙනුනා. අප නම් ඒ කාලයේදිම, මේ ගරු මුදල් ඇමතිතුමා ලෝක බැංකුවට ලියූ ලියවිල්ලකුත් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ ලියවිල්ලේ කියා තිබුණේ හාල් සේරුව ශත 25 ට දීම සඳහා ආණ්ඩුව දෙන ආධාර මුදල දිගටම දෙන්නට බැරිය යනුවෙන් ලෝක බැංකුව දෙන උපදේශය අප පිළිගන්නවාය, එහෙත් දේශපාලන හේතූන් නිසා ඒක එක පාරටම නවත්වන්නට බැරිය, අනාගත යේදී මේ ප්‍රශ්නයට මුහුණ [illegible]

යන්නයි. එහෙත් එදා පටන්ම එක දෙයක් කරන්නට ඒ ලියමනෙන් ලෝක බැංකුවට පොරොන්දු වුණා. අධ්‍යාපනය, සෞඛ්‍යය වැනි සමාජ සේවා අංශයන්ට කරන වියදම වැඩි නොකර ඒවා සීමා කළ යුතුය කියන ප්‍රතිපත්තිය අප පිළිගන්නවාය කියා එහි සඳහන් කර තිබුණා. ඒ නිසා මුල් කාල යේ සිටම මේ ආණ්ඩුව තුළ, විදේශ රටවලින් විශාල වශයෙන් ලැබෙන මුදල් ආධාර මාර්ගයෙන් ප්‍රශ්න විසඳීමේත්, ලෝක බැංකුවේ උපදෙස් උඩ ක්‍රියා කිරීමේත් බලාපොරොත්තුවක් තිබුණු බව පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා. ඒ අනුව තමයි, කලින් කී විධියට අසාධාරණ වන්දි මුදලක් විදේශීය තෙල් කොම්පැණි වලට ගෙව්වේ. මෙහි තැන්පත් කරන මුදල් පිළිබඳව සහතික දීමේ ගිවිසුමක් ප්‍රථමයෙන්ම ඇමෙරිකාවත් සමග අත්සන් කරන්නට යෙදුණා. පසුව බටහිර ජර්මනිය සමගත් එවැනි ගිවිසුමක් අත්සන් කළා.

සභාග ආණ්ඩු කාලයේදී ලාභ මුදල් පිට රට යැවීම නවත්වා තිබුනා. එහෙත් මේ රජය ක්‍රම ක්‍රමයෙන් එයට ඉඩ දී දැන් ලාභ මුදල් සම්පූර්ණයෙන්ම පිටරට යැවීමට ඉඩ සලසා දී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක තමයි 1966-67 අය-වැය ලේඛන කාලයේ තිබුණු තත්ත්වය. ඒ අනුව 1966 දෙසැම්බර් 15 වන විට මේ රටේ මහජනතාවට පළමු වැනි පහර ගැහුවා. එනම් සලාකයට දුන් හාල් සේරු දෙකෙන් එකක් කැපුවා. ඒ නිසා මහජනයාගේ ප්‍රධාන ආහාරය වන හාල් පිළිබඳව මහජනතාවට යන වියදම එක වරටම දෙතුන් ගුණයකින් වැඩි කළා. එක හාල් සේරුවක් නම් නොමිලේ ලැබුණා. එහෙත් දෙවැනි හාල් සේරුව 1.25 ක් පමණ වුණා. ඒ නිසා මහජන තාවට තමන්ගේ මූලික ආහාරය පිණිස දරන්නට වූ වියදම දෙතුන් ගුණයකින් වැඩි වුණා. මේ ප්‍රශ්නය පිළිබඳව එකක් මතක් කරන්නට කැමතියි. මේ කාරණය මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්නට මා අදහස් කරන්නේ මහජන යාට එයින් පහරක් වැදුණු නිසා පමණක් නොවෙයි, එක්තරා හේතුවක් නිසයි: එදා කැපූ ඒ හාල් සේරුව නැවත දෙන්නය කියන විට අද ආණ්ඩුවේ නායකයින්ගෙන් අපට අහන්නට ලැබෙන්නේ කුමක්ද? [illegible] නැවත දුන්නොත් එයින් වගා ව්‍යාපා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රයට බාධාවක් වේය කියන එකයි. වගා ව්‍යාපාරය දියුණු කිරීමට ගොවියාට ධෛර්ය දෙන්නට නම් හාල් කැපීම අවශ්‍යයි. ඒ නිසා ගොවියාට ඒ ධෛර්යය දෙන්නට මේ පියවර ගත යුතුව තිබුණා යයි කියනවා. තවමත් මේ රට ස්වයම්පෝෂිත නැති නිසා අපට වුමනා කරන වී සම්පූර්ණ ප්‍රමාණය අපට වගා කරන්නට බැරි නිසා දෙවැනි හාල් සේරුව දෙන්නට බැරිය කියනවා. එහෙත් හාල් සේරුව කපන අවස්ථාවේ අපට කීවේ හාල් සේරුව කපන්නේ ලෝකයේ හාල් හිඟයක් තිබෙන නිසා මිළ දී ගන්නට නොහැකිකම නිසාය කියලයි. එදා ලෝකයෙන් හාල් ගන්නට පුළුවන්කම තිබුණා නම් ගන්නවා කියලයි කීවේ. වගා ව්‍යාපාරය දියුණු කරන්න හාල් කපනවාය කියා එදා කීවේ නැහැ. එහෙත් දැන් වගාව දියුණු නිසා කැපූ හාල් සේරුව ආපසු දෙන්නය කියන විට දැනුයි කියන්නේ වගාව දියුණු කරන්නට ඕනෑ නිසා එය ආපසු දෙන්නට බැරිය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හාල් කැපීම වී ගොවිතැන දියුණු කිරීමට කළ එකක් නොවෙයි. එය ලෝක බැංකුවේ නියමය අනුව ඔවුන්ගේ ආධාර මුදල් ලබා ගැනීමට ඔවුන්ට කීකරු වී ගත් පියවරක්ය කියා මා මතක් කරන්න කැමතියි. එහෙත් මේ රජය නියම ප්‍රශ්නයට නම් මුහුණ දී නැහැ. අද වන තුරුත් නියම ප්‍රශ්නයේ නියම ස්වභාවය තේරුම් ගෙන තිබනවාද කියාත් මට සැකයි. වෙළඳ ගිනුම අපේ අවාසියට හැරී තිබෙනවාය කියා අපි කියනවා. ලංකාවට පමණක් නොවෙයි නොදියුණු රටවල් සියල්ලටම ඒ පහර වැදී තිබෙනවා. නොදියුණු රටවල් නිෂ්පාදනය කරන අමු ද්‍රව්‍ය නැත්නම් මූලික භාණ්ඩවල මිළ පසුගිය අවුරුදු දහයක පහළොහක කාලය තුළ අනුක්‍රමයෙන් පහළ බැස තිබෙනවා. අනික් අතින් දියුණු කාර්මික රටවල නිෂ්පාදනය කරනු ලබන කාර්මික භාණ්ඩවල මිළ ඒ වගේම අනුක්‍රමයෙන් වැඩි වී තිබෙනවා. මෙය ඇති වී තිබෙන්නේ කොහොමද කියා සොයා බලන්නට උත්සාහ කර නැහැ. මෑත කාලයේදී අපේ රාජ්‍ය ඇමතිතුමා මේ ගැන උනන්දුවක් දක්වා ජාත්‍යන්තර සම්මේලන කීපයකට අපේ නියෝජිතයින් යවා මේ ප්‍රශ්නය පිළිබඳව ලෝකයේ ජන මතයක් ඇති කරන්නට උත්සාහ කර තිබෙන බව මා දන්නවා. එහෙත් ඒ සම්මේලනවලදීත් සිදු වී තිබෙන්නේ කුමක්ද? මූලික භාණ්ඩ නැත්නම් අමු ද්‍රව්‍යවල මිල ජාත්‍යන්තර වෙළඳ පොළේ වැඩි කිරීමට උත්සාහ කර තිබෙනවා. මෙය වැරදි දෙය කැයි මා කියන්නේ නැහැ. එහෙත් මෙය සාර්ථකව කරන්නට පුළුවන් දෙයකැයි යම් රජයක් විශ්වාස කරනවා නම් එය වැරදි මෝඩ අදහසක් බව මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. මක්නිසාද? අපට මෙය සිදු වී තිබෙන්නේ බොහොම පැහැදිලි හේතුවක් උඩයි.

ජාත්‍යන්තර වෙළඳ පොළේ මේ අමු ද්‍රව්‍යවල නැත්නම් මූලික ද්‍රව්‍යවල මිළ නියම කරනු ලබන්නේ ධනපති රටවල් විසිනුයි. එසේ මිළ නියම කිරීමේ ශක්තියක් ඒ රටවලට තිබෙනවා. පසුගිය අවුරුදු දහය, පහළොව ඇතුළත ඒ රටවල් මේ කටයුත්ත කරන්නට පටන් ගත්තා. එහෙම නම් පසුගිය අවුරුදු දහය, පහළොව තුළ ලෝකයේ ඇති වූ වෙනස මොකක්ද? යටත් විජිත වශයෙන් තිබුණු රටවල් ගණනාවකට දේශපාලන නිදහස ලැබුණා. රටවල් ගණනාවකට දේශපාලන බලය පවරන්නට යෙදුණා. ලංකාවේ අපට 1948 දී ඒ බලය ලැබුණා. ඉන්දියාවට නම් 1947 දී ඒ බලය ලැබුණා. ඒ දේශපාලන බලය ලැබූ රටවල් ඉන් පසුව කුමන ආකාරයකට ඒ බලය පාවිච්චි කළාද? අපේම අත්දැකීම ගැන කල්පනා කර බලමු. 1948 දී ලංකාවට දේශපාලන බලය ලැබුණායින් පසුව එය පාවිච්චි කෙළේ කොයි ආකාරයකටද? අභ්‍යන්තර වශයෙන් කාරණා කීපයක් කළා පමණක් නොව ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනු සම්බන්ධයෙන්ද යම් යම් කරුණු ක්‍රියාත්මක කළා. බ්‍රිතාන්‍ය කොම්පැනි විසින් විශේෂයෙන්ම ලංකාවේ තේ වතු සඳහා යෙදවූ මුදල්වලින් උපයන ලද ලාභය නිදහසේ එංගලන්තයට ගෙන යන්නට පුළුවන්කම තිබුණත් 1948න් පසුව එය ක්‍රමයෙන් සීමා කරන්නට ක්‍රියා කර තිබෙනවා. අපේ අපනයන බද්ද වැඩි කර තිබෙනවා. ආදායම් බදු වැඩි කර තිබෙනවා. අපට නිදහස ලැබෙන්නට මත්තෙන් ඒ බ්‍රිතාන්‍ය කොම්පැනිකාරයන්ට ලාභ මුදල් ආදිය එංගලන්තයට ගෙන යන්නට පුළුවන්කම තිබුණු නමුත් නිදහස ලැබුණාට පසුව ඔවුන්ට එසේ ගෙන යන්නට පුළුවන් වුණේ ඒ ලාභයෙන් කොටසක් පමණයි. අන්න ඒ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]
කාලයේ සිට තමයි, අප අපනයන කරන මූලික ද්‍රව්‍යවල මිළ අනුක්‍රමයෙන් පහළ බසින්නට පටන් ගත්තේ. ඒ අධිරාජ්‍යවාදී කොම්පැනිකාරයන් එදා ඒ යටත් විජිත වලින් ලබාගත් ලාභ මුදල් නිදහසේ තම රටවලට ගෙන ගියත්, පසුව එසේ ගෙන යන්නට නොහැකි වීම නිසා ඒ අලුත නිද හස ලැබූ රටවලට අවාසි වන අන්දමට වෙළඳ පොළ සකස් කිරීමට ඔවුන් ක්‍රියා කළා. ඔවුන් මුදල් බලය පාවිච්චි කර ඒ අලුත නිදහස ලැබූ රටවල අමුද්‍රව්‍යවල මිළ පහළ දමන්නට ක්‍රියා කළා.

ඔවුන්ට සිදු වූ පාඩුව වෙනත් ක්‍රමයකින් ලබා ගන්නටයි, මේ කටයුත්ත කෙළේ. ඒ නිසා ප්‍රශ්නය ඇතිවීමේ මූලික හේතුව කුමක්දැයි සොයා නොබලා කවදාවත් එය විසඳන්නට පුළුවන් වේතැයි සිතිය යුතු නැහැ. කෘෂිකර්මය දියුණු කිරීමෙන් මේ ප්‍රශ්නය විසඳිය යුතු යයි අපේ අගමැතිතුමා කල්පනා කරනවා. දැන් එතුමා එතැනට තල්ලු වී සිටිනවා. ආහාර වගා ව්‍යාපාරය දියුණු කිරී මෙන් විදේශ ගනුදෙනුවල තත්ත්වය රැක ගන්නට එතුමා කල්පනා කරනවා. ආහාර වගාව දියුණු කිරීම නරක වැඩකැයි මා කියන්නේ නැහැ. එහෙත් ඒ ව්‍යාපා රයේ මාර්ගයෙන් කවදාවත් මේ ප්‍රශ්නය විසඳන්නට බැහැ. මක්නිසාද? ආහාරත් අමු ද්‍රව්‍යයක්; මූලික ද්‍රව්‍යයක්. අපේ අප නයන අමු ද්‍රව්‍යවල මිළ බස්සන්නට පුළු වන්කම තිබෙනවා වාගේම, අපේ ආහාර ද්‍රව්‍යවලත් මිළ බස්සන්නට අප සමග ගනු දෙනු කරන දියුණු ධනපති රටවලට පුළු වන්කම තිබෙනවා. මේ මූලික ප්‍රශ්නයට හරියාකාර මුහුණ නොදී මේ ප්‍රශ්නවලට නියම විසඳුමක් හොයා ගන්නට අපට පුළුවන්කමක් නැහැ. ඒ මූලික ප්‍රශ්නයට නියම විධියට මුහුණ දෙන්නට නම් අපේ ආර්ථික ක්‍රමයෙහි ස්වරූපය වෙනස් කරන්නට ඕනෑ.

යුරෝපාදී රටවල ඇති කාර්මික දියුණුව ඉක්මනින් ලබා ගන්නට අපට පුළුවන්කමක් තිබෙනවා යයි මා කියන්නේ නැහැ. එහෙත් අපනයන අමු ද්‍රව්‍යවලට, එනම් කෘෂිකාර්මික නිෂ්පාදනවලට පමණක් බර දෙමින් අපේ ආර්ථික ක්‍රමය හැඩ ගස්වන්නෙ නැතිව අපේ ආර්ථික අංශ යට මිට වඩා තැනක් දුන්නොත් පමණයි, මේ ප්‍රශ්නයට නියම විසඳුමක් හොයා ගන්නට පුළුවන් වන්නේ.

ආහාර වගාවට මුල් තැන දෙන අතරම මින් පෙර කිසි කලක නොවූ විරූ අති විශාල නිෂ්පාදනයකුත් මේ රජය මගින් 1968 වර්ෂයේදී ඇති කර තිබෙනවායයි විශාල ප්‍රචාරයක් ගෙන යනවා. 1968 වර්ෂ යේදී අපේ දළ ජාතික නිෂ්පාදනය සියයට 8 කින් වැඩි වී තිබෙනවායයි මහ බැංකු වාර්තාවේ සඳහන් කර තිබෙනවා.

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)
සියයට 8.3 කින්.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
එහෙම නම් සියයට 8 කටත් වැඩි ප්‍රමා ණයකින් වැඩි වී තිබෙනවා? වෙනත් කවුරු හෝ යමක් කීවා නම් ඒ කියන පුද්ගලයා කෙරෙහි අප තුළ ඇති විශ්වා සය අනුව ඒ කීම පිළිගන්නට අපට පුළු වනි. එහෙත් වර්තමාන රජය මෙවැන් නක් කියන විට අප තුළ විශාල සැකයක් ඇති වෙනවා, මෙය බොරුවක්දෝ කියා. ඒ අනෙකක් නිසා නොව, මේ රජය ඒ තරම් බොරු කියා තිබෙන නිසයි. ඇත්ත නොකීවත් බොරු නොකියා කට පියාගෙන ඉන්න කෙනෙක් කියනවා නම් අපට යම්කිසි විශ්වාසයක් තබන්න පුළුවනි. එහෙත් මේ රජය මහ ජනතාවට අසත්‍ය දේවල් බොහොමයක්ම කියා තිබෙන බව කියන්නට සිදු වීම ගැන නියෝජ්‍ය කථානායකතුමනි මට සමා වන්න. නිකම් බොරු නොව අහු වන බොරු කියා තිබෙනවා. එම නිසා රජය අර විධියේ ප්‍රකාශයක් කරන විට අප තුළ සැකයක් ඇති වීම පුදුමයක් නොවෙයි.

තමුන්නාන්සේලා කල්පනා කරන්නට පුළුවනි, මේ රජය මහජනයාට කී බොරුව මොකක්ද කියා. එසේ බොරු කියා අහු වුණු තැනක් මම සඳහන් කරන්නම්. ටික කලකට ඉහත රජයේ සේවකයන්ගේ වැඩ වර්ජනයක් ඇති වුණු බව තමුන්නාන්සේලාට මතක ඇති. මුලින්ම මේ වැඩ වර්ජනයේ යෙදුණේ රජයේ ලිපිකරු මට්ටමේ උදවියයි. ඉන් පසු කම්කරුවනුත් එයට හවුල් වුණා. ඒ සටනට සහභාගි වූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කම්කරුවන් අතුරින් එක කොටසක්, රජයේ මුද්‍රණාලයේ කම්කරුවන්. වැඩ වර්ජනයේ යෙදෙමින් ඔවුන් එළියට ආ හැටියේම ලංකා ගුවන් විදුලි සේවයෙන් ප්‍රචාරය කළා, මුද්‍රණාලයේ යන්ත්‍රෝප කරණවලට රුපියල් ලක්ෂ ගණනක හානි කරමින් ඔවුන් ඒවා කඩා බිඳ දමා එළියට ආවාය කියා. එසේ ප්‍රචාරය කළේ වරක් දෙවරක් නොවෙයි. රජයේ අනුමැතිය ඇතිව, රජයේම ගුවන් විදුලි සංස්ථාවෙන් කරනු ප්‍රචාරයක් නිසා මෙය වගකීමෙන් තොර ප්‍රකාශයක් නොව සත්‍ය ප්‍රකාශයක් යයි මහජනයා සිතන්න ඇති. නමුත් මේක බොරුවක් බව මට දැනගන්න ලැබුණා. මට පමණක් නොවෙයි, අපේ විරුද්ධ පක්ෂයේ තවත් මන්ත්‍රීවරුන් කීප දෙනකුටම දැනගන්න ලැබුණා. එසේ දැනගත් නිසා අපි කිව්වා මේක බොරු වක්ය කියා. එහෙත් අපි එය බොරු යයි කිව්වම වැඩක් නැහැනෙ. ඒ මොකද? අපි විරුද්ධකමට කියන එකක් කියන්න පුළුවන්. ඒ නිසා මේ ගරු සභාවේදි අපට සිද්ධ වුණා රජයේ මුද්‍රණාලය භාරව සිටින රාජ්‍ය ඇමතිතුමාගෙන් යම් කිසි ප්‍රශ්න මාලාවක් ඇසීමට. ගරු හබරාදුව මන්ත්‍රීතුමාත් (ප්‍රින්ස් ගුණසේකර මයා.) මාත් ප්‍රශ්න මාලා දෙකක් ඉදිරිපත් කළා, හබරාදුව මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නවලට ගරු රාජ්‍ය ඇමතිතුමා පිළිතුරු දුන්නා. නමුත් අදි මදි කිරීම් සහිතවයි පිළිතුරු දුන්නෙ. මේ සම්බන්ධයෙන් රජයෙන් බොරුවක් කියා තිබෙනවාද, එහෙම නැත් නම් ගුවන් විදුලියෙන් බොරු ප්‍රචාරයක් කර තිබෙනවාද කියා අහන කොට ඒකට උත්තරයක් දුන්නෙ නැහැ. මගේ ප්‍රශ්න මාලාව ඇසුණේ ඊට දින තුන හතරකට පසුවයි. නමුත් මම නම් ඉඩ දුන්නෙ නැහැ, රාජ්‍ය ඇමතිතුමාට එහෙම බේරී පිළිතුරක් දෙන්න. මම එදා අවසාන වශයෙන් ඇසූ අතුරු ප්‍රශ්නයත්, එතුමා ඊට දුන් පිළිතුරත් කෙරෙහි මා මේ අවස්ථාවේදී නමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්න කැමතියි. මේ 1969 මාර්තු මාසෙ 7 වෙනිදා හැන්සාඩ් වාර්තාවෙ 2872 වෙනි තීරුවයි:

ලෙස්ලි ගුණවර්ධන මයා.

එසේ නම් ඒ කම්කරුවන් රජයේ මුද්‍රණාලයේ දේපළවලට ලක්ෂ ගණනක් පාඩු කළාය කියා ඒ කාලයේදී ගුවන් විදුලියෙන් කළ ප්‍රචාරය අසත්‍යයක් නොවේද?

ගරු ජේ. ආර්. ජයවර්ධන

එහෙම ප්‍රචාරයක් කළා නම් එය අසත්‍යයක්."—[නිල වාර්තාව, 1969 මාර්තු 7; 83 වන කාණ්ඩය, 2872 තීරුව]

ඒ වචනය ගරු රාජ්‍ය ඇමතිතුමාගේ මුඛයෙන් පිට කරවන්නට හැකි වීම ගැන මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා. කවුරුත් දන්නවා එවැනි ප්‍රචාරයක් කළ බව. ඒ කම්කරුවන් පිටතට එන අවස්ථාවේදී රුපියල් ලක්ෂ ගණනක් පාඩු කරගෙනය ආවෙ කියා කීප විටක්ම ගුවන් විදුලියෙන් ප්‍රචාරය කළා. අපි ප්‍රශ්න මාලා දෙකක් ඇසීමෙන් පසුවයි මේ වචනය එළියට ගන්නට පුළුවන් වුණේ, ඒ කළ ප්‍රචාරය බොරුවක්ය කියා. ඒ එක නිදර්ශනයක්. ඒ නිසා තමයි අපට මේ ලේඛන නමුන්නාන්සේලා දෙන විට ඒවා ඇත්තය කියා භාරගන්නට අමාරු වී තිබෙන්නෙ. නමුන්නාන්සේලා බොරු කියා තිබෙන නිසයි. ගුවන් විදුලියෙන් ප්‍රචාරය කරන නිලධාරීන්ට බොරු කියන්න පුළුවන් නම් ඇයි මහ බැංකුවේ නිලධාරීන්ට බොරු කියන්න බැරි? දෙගොල්ලන්ම රජයේ සේවකයෝ. දෙගොල්ලන්ම උසස්වීම් බලාපොරොත්තුව සිටින සේවකයෝ.

ඔය වියඩිට තව බොහෝම නිදර්ශන ඉදිරිපත් කරන්න පුළුවනි. මම තවත් එකක් කියන්නම්. කවුරුවත් නොවෙයි, අගමැතිතුමාම කී බොරුවක්. මේ ගරු සභාවේදීම කී බොරුවක්. ඒ මොකක්ද? නමුන්නාන්සේට මතක ඇති, මේ වර්ෂයේ පෙබරවාරි මාසයේ ජාතික නිදහස් දිනය සිහි කිරීමට යෙදුණේ මහනුවර බව. ඒ සඳහා ගිය හේවා භට කණ්ඩායම් කීපය කට පේරාදෙණියේ විශ්ව විද්‍යාලයේ නවාතැන් දීමට ගිය අවස්ථාවේදී එම භටයන් සහ ශිෂ්‍යයන් අතර යම් කිසි ඝට්ටණයක් ඇති වුණා. ඒ සම්බන්ධ වාර්තාවක් යුද්ධ හමුදා නිලධාරීන්ගෙන් අපේ අගමැතිතුමාට ලැබුණා. එතුමා ඒ වාර්තාව මේ ගරු සභාවේදී කිව්වා. ඒ වාර්තාවෙ හැටියට මුලින් පහර දුන් වැරදිකාරයන් වූයේ ශිෂ්‍යයනුයි. ඒකට මට කමක් නැහැ. මගේ ප්‍රශ්නය ඒක නොවෙයි. හේවායන් තුන් දෙනෙකුට ගැහැව්වලු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ගැහැව්වා පමණක් නොවෙයි, ඔවුන්ගේ වස්ත්‍ර ගලවා ඔවුන්ගේ ශරීරවලට මුත්‍රා කළාය කියන එකත් ඒ වාර්තාවෙන් එතුමා කියෙව්වා. මම එතුමාට වරදක් කියන්නෙ නැහැ. ඒ මොකද? ඒ වාර්තාව නිලධාරීන් විසින් එතුමාට දුන් වාර්තාවක්. ඒ වාර්තාව නොකිව්වය කියා අපේ අග මැතිතුමා කියන්නෙත් නැහැ. ඒ කට යුත්ත කෙළේ, ඒ විධියට හැසුරුණේ එක්තරා පක්ෂයක්, ඒ කියන්නේ පුරුෂ පක්ෂය පමණක් නොවේයයි තමාට දැනගන්නට ලැබී තිබෙනවායයි ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා. ගරු අග මැතිතුමා එවැනි ප්‍රකාශයක් කරන විට වග කීමෙන් තොරව එය නොකරනු ඇතැයි සිතූ නිසා අප ඒ අවස්ථාවේ නිශ්ශබ්දව සිටියා. එහෙත් එතුමා එදා කිව්වේ අමූලික බොරුවකැයි අපට ඊට පසු අවස්ථාවක දැනගන්නට ලැබුණා. එවැන්නක් සිදු වී නැතැයි අපට දැනගන්නට ලැබුණා.

ඉන් පසු පක්ෂ තුනේ ලේකම්වරුන් තුන් දෙනා ගරු අගමැතිතුමාට ලියමනක් යැව්වා. එක්කෝ සමාව ඉල්ලා ඒ වචනය අස් කර ගන්න; එසේ නැත්නම් ඒ බොරුව කී තැනැත්තාගේ නම ඉදිරිපත් කරන්නැයි ඒ ලියුම්වලින් කියා සිටියා. එහෙත් අද වන තුරු ගරු අගමැතිතුමා ඒ විධියේ බොරු වාර්තාවක් දුන් තැනැත්තාගේ නම ඉදිරිපත් කර නැහැ. එපමණක් නොව, අපේ රටේ ස්ත්‍රී පක්ෂ යට කරන ලද ඒ නින්දාසහගත වචනය තවම අස් කර ගෙනත් නැහැ. ඉතින්, අසත්‍ය දේවල් කියලා, කී දේ අසත්‍ය බව ඔප්පු වී තිබියදීත් ඒ වචනය අස් කර නොගෙන ඉන්නවා නම්, කරන්නට පුළු වන් දෙය කුමක්දැයි මා තමුන්නාන්සේ ගෙන් අහනවා.

ඒ විශ්ව විද්‍යාලයේ ප්‍රධානීන් කොමිටි යක් පත් කර තිබෙනවා. කොමිටිය මගින් ඒ සිද්ධිය ගැන පරීක්ෂා කර, විභාග කර තිබෙනවා. ඉන් පසු වාර්තාවකුත් පිට කර තිබෙනවා. ඒ වාර්තාවේ කියා තිබෙන්නේ මෙවැනි දෙයක් සිද්ධ වීමට කිසිම හේතු වක් නැති බවයි; එවැන්නක් සිදු වූ බවට කිසිම සාක්ෂියක් නැති බවයි. ඒ නිසා එවැනි සිද්ධියක් ඇති වුණායයි පිළිගන් නට බැහැ, යනුවෙන් කියා තිබෙනවා. ඉන් පසුවත් ගරු අගමැතිතුමා බලා ඉන් නේ ඇයි? එදා එතුමා අතින් වැරැද්දක් සිදු වුණාය, කියාපු දේ අසත්‍යයක් බව පසුව දැනගන්නට ලැබුණා, කියන්නට බැරිද? එහෙම නම් ඒ වාර්තාව දුන් තැනැත්තාගේ නම පිට කරන්න. නම පිට කර ඒ බව කියන්නේ නැත්නම්, බහින් නට තිබෙන එකම තීරණය හෙවත් නිග මනය, ඒක ගරු අගමැතිතුමා මවා ගත් කථාවක්ය යන්නයි. එහෙම කියන්නට සාමාන්‍යයෙන් අපි කැමති නැහැ. කැමති වුවත්, බහින්නට තිබෙන නිගමනය කුමක්දැයි මා තමුන්නාන්සේගෙන් අහ නවා. එතකොට, එහෙමත් දේවල් කිය නවා නම්, සියේට 8.3 ක වර්ධනයක් වෙලා තිබෙනවාය යනුවෙන් මහ බැංකුවේ නිල ධාරීන් කියන විට, ඒ කතාව ඒ තරම්න්ම පිළිගන්නට අපට පුළුවන්දැයි තමුන් නාන්සේගෙන් අහනවා. තමන්ගේ දේශ පාලන වාසියට අසත්‍ය දේවල් ප්‍රකාශ කිරීම සමහර විට දේශපාලනයේ නියුතු උදවියගේ සිරිතක් වෙන්නටත් පුළුවනි. වැරදි වුවත්, කෙරෙන දෙයක් වෙන්න වත් පුළුවනි. ඒ කොයි හැටි වෙතත් එය සත්‍යයක් හැටියට අපට නම් පිළිගන්නට අමාරුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට ඕනෑ, ජනවාරි 8 වැනිදා සිදු වූ වෙඩිතැබිල්ල ගැන. මා ඒ ප්‍රශ්නය ඉස්මතු කෙළේ සිද් ධිය වෙලා මාස තුන හතරක් ගත වුණාට පසුවයි. එදා වෙඩිතැබිල්ලට—තුවක්කු පාවිච්චි කිරීමට—අවශ්‍යතාවක් තිබුණාදැයි සොයා ගන්නට පවා පොඩි කොමිටියක් වත් පත් නොකෙළේ මන්දැයි ගරු අග මැතිතුමාගෙන් ඇහුවා. පත් නොකිරී මෙන් අපට බහින්නට තිබෙන එකම නිගමනය, ගරු අගමැතිතුමා ඒ වෙඩි තැබිල්ල අනුමත කරනවයා යන්නයි. මම සාමාන්‍යයෙන් කිසිම කෙනෙකුට විරුද්ධව, කල්පනා නොකර, කිසිම චෝදනාවක් එල්ල කරන මන්ත්‍රීවරයෙක් නොවෙයි. එහෙත් එදා ගරු අගමැතිතුමා ඉදිරියේම, ඒ චෝදනාව ගරු අගමැතිතුමා වෙත එල්ල කළා. ඊට පසු ගරු අගමැතිතුමා අපට නොකියා නමුත් යම්කිසි නිලධාරි යකු පත් කළ බව දැනගන්නට ලැබුණා. ඒ ගැන අපි සන්තෝෂ වුණා. මක්නිසාද, ඒ දක්වා නම් එහෙම දෙයක් සොයන් නට කොමිෂන් සභාවක් තබා කොමිටියක් වත්, පුද්ගලයෙකුවත්, පත් කර තිබුණේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. අන්තිමේදී ජී. වී. පී. සමරසිංහ මහත්මයා පත් කළා. පොලීසිය සම්බන්ධයෙන් සොයන්නට නොවෙයි පත් කෙළේ. සිද්ධිය ඇති වන්නට පෙර පොලීසියත් හමුදාවත් කළ යුතු දේවල් කර තිබුණාදැයි සොයා බලන්නට පත් කෙළේ. ඒ නිසා වෙඩිතැබිල්ල ගැනවත්, ස්වාමීන් වහන්සේලා ගැනවත්, කඳුළු ගෑස් ප්‍රහාරය ගැනවත් සොයා බලන්නට ජී. වී. පී. සමරසිංහ මහත්මයාට භාර දී තිබුණේ නැහැ. ඒ මහතාගේ වාර්තාවෙහි කුමක්ද කියා තිබුණේ? යම්කිසි පිරිසකට විසිරී යන්නට නියම කරන්න මත්තෙන් සිරිත් පරිදි කරන වැඩ පිළිවෙළක් තිබෙනවා. එනම් පොලීසියේ ශබ්ද විකාශන යන්ත්‍ර මගින් "විසිරී යන්න; එසේ නැති නම් විසුරුවා හරින්න අපි ප්‍රහාරක බලය යොදනවා" යන දැනුම්දීම කිරීමයි. ඒ මහතාගේ වාර්තාවෙහි කියා තිබුණේ ශබ්දවාහිනී යන්ත්‍ර මාර්ගයෙන් එසේ නොකියා මෙම වැඩේ කර තිබෙනවාය යන්නයි. එය විතරයි එහි කියා තිබුණේ. මා එතුමාට කෘතඥ වෙනවා, ඒකවත් ප්‍රකාශ කිරීම ගැන.

මගේ කතාවෙන් පසුව තමයි, ඒ පිළිබඳව වාර්තාවක් දෙන්නැයි ගරු අගමැතිතුමා නිලධාරියකු පත් කළාය කියන්නේ. ඒකයි මට ලැබුණු ආරංචිය. මෙනාවා ගැනද ඔහු වාර්තාවක් දිය යුත්තේ? පොලීසිය ක්‍රියා කළ ආකාරය ගැනයි. එනම්, කඳුළු ගෑස් ප්‍රහාරයත් බැටන් පොළු ප්‍රහාරයත් වෙඩිතැබිල්ලත් යන කාරණා ගැනයි. මට ආරංචියි, එම නිලධාරි මහතා ඒ ගැන විභාග කොට වාර්තාවක් සකස් කර අගමැතිතුමාට භාර දී තිබෙනවාය කියා. තවම එම වාර්තාවේ තිබෙන්නේ මොනවාදැයි හෙළි කර නැහැ. එම නිසා මා දැනගන්නට කැමතියි එම වාර්තාව ගැන. ලැබී තිබෙන ආරංචි අනුව ඔය විධියට වෙඩි තබන්නට පොලීසියට කිසිම වුවමනාවක් තිබුණේ නැතැයි එම වාර්තාවෙහි සඳහන් වී තිබෙන බව පෙනෙනවා. ඒක එහෙම නම් මා ගරු අගමැතිතුමාගෙන් එකක් අහන්නට කැමතියි. මාක්ස්වාදීන්ගෙන් බුද්ධාගම ආරක්ෂා කරන්නය කියා බලයට පත් වී සිටින තමුන්නාන්සේලා පොලීසිය මගින් බෞද්ධ භික්ෂු නමකට කරන ලද මෙම අපරාධය නිලධාරීන් පවා පිළිගෙන තිබියදී වසංකරගෙන සිටින්නේ මන්ද? කරුණා කර මේ අවස්ථාවේදීම අපට මේ ගැන පිළිතුරක් ලබා දෙනවා නම් අපි සන්තෝෂ වෙනවා. මෙවැනි තත්ත්වයක් පවතිද්දී එක අතකින් දේශපාලන වාසිය උඩ බොරු කියන විට අනික් අතින් කරුණු වසං කරගෙන තිබෙනවායයි අපට කල්පනා කරන්නට ඉඩ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1968දී සියයට 8.3 ක වර්ධනයක් ඇති වී තිබෙනවා යයි කිව්වා. ඔය නිලධාරීන් ටික එකතු වී කියන ඒවා අපි පිළිගන්නේ කොහොමද? ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය ගැන මට පෙර කතා කළ කැළණියේ ගරු මන්ත්‍රීවරයා (ආර්. එස්. පෙරේරා මයා.) විසින් කියන්න යෙදුණා. ජීවන අංකය වැඩි වී තිබෙන ආකාරය ගැන එතුමා පැහැදිලි කළා. ජීවන අංකය සකස් කර තිබෙන ආකාරය වැරදි බව එතුමා පෙන්නා දුන්නා. ඒ නිසා මා ඒ ගැන නැවත කියන්නෙ නැහැ. නමුත් මා මෙපමණයි කියන්නෙ. ජීවන අංකය වැඩි වීම පිළිබඳව මන්ත්‍රීවරුන් කීප දෙනෙක් කතා කරමින් දැන් කියන්නෙ, සංවර්ධනයක් කරන විට බඩු මිල ඉහළ නගින බවයි. ඒ නිසා එය බලාපොරොත්තු වෙන්න ඕනෑ දෙයක්ලු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර විට එය වෙන්න පුළුවනි. මා හරියට දන්නේ නැහැ. එය වෙන්න ඉඩ තිබෙනවා. නමුත් මා අසන්නේ මෙයයි. මහ මැතිවරණ කාලයේදී ඔය ටික මහජනයාට නොකිව්වෙ ඇයි? ඇයි බොරු කළේ? සිරිමා බණ්ඩාරනායක ආණ්ඩුවට දෙස් කියන විට මැතිවරණ ව්‍යාපාරය කරගෙන යන විට, තමුන්නාන්සේලා මොනවාද කිව්වෙ? "බඩු මිල මෙසේ නැග තිබෙනවාය, දුප්පතාට ජීවත් වෙන්න අමාරුය, අපේ තිබෙන අනුකම්පාව නිසයි අපි මේවා කියන්නෙ, දුපප්තාව බේරා ගන්න, බඩු මිල පහළ බස්සවන්න අපට බලය දෙන්න." ඔන්න ඔය විධියටයි තමුන්නාන්සේලා කිව්වෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංවර්ධනයක් ඇති කරන විට බඩු මිල ඉහළ යාම සිදු වෙනවාය කියා තමුන්නාන්සේලා කල්පනා කරනවා නම්, ඇයි ඒ කාලයේදී ඒ බව මහජනයාට නොකිව්වෙ? ඒ නිසා අපි කොහොමද තමුන්නාන්සේලාගේ කතා පිළිගන්නෙ? භයානක විධියට අහස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

උසට නොවෙයි, හද දක්වා උසට බඩු මිල ඉහළ ගොස් තිබෙනවා. ඒ තරම් විශාල වශයෙන් ඒ තරම් ඉහළට බඩු මිල ඉහළ නැඟීම අවශ්‍ය දෙයක්ය කියා තමුන්නාන්සේලා අද කිව්වත් අපි කොහොමද පිළිගන්නෙ? මැතිවරණ කාලයේදී තමුන්නාන්සේලා එවැනි දෙයක් කිව්වෙ නැහැ. එදා වෙනත් දෙයක් කියා අද මෙහෙම කියනවා. ඒ නිසා තමුන්නාන්සේලාගේ ඔය තර්කයට අපට එකඟ වෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දළ ජාතික නිෂ්පාදිතය පිළිබඳව ගණන් එකතු කර තිබෙන ආකාරය ගැන මා හිතන විධියට අනිද්දාට කතා කරන ගරු යටියන්තොට මන්ත්‍රීතුමා [ආචාර්ය එන්. එම්. පෙරේරා] කරුණු විස්තර කරාවි. ජීවන වියදම සකස් කර තිබෙන ආකාරය ගැනත්, එහි තිබෙන වැරදි, ගණන් එකතු කිරීමේදී කර තිබෙන වැරදි, සම්බන්ධයෙනුත් එතුමා පෙන්නා දේවි. ගණන් එකතු කර තිබෙන ආකාරය සම්පූර්ණයෙන්ම වැරදි බව එතුමා පැහැදිලි කර දේවි. සමහර විට ඒ මහ බැංකුවේ නිලධාරීන් උසස්වීම් බලාපොරොත්තුවෙන් බොරු ලේඛන ඉදිරිපත් කර තිබෙන බව යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කරුණු සහිතව තම කතාවේදී පෙන්නා දේවි. නමුත් මා මේ අවස්ථාවේ දී එක් දෙයක් කියන්න ඕනෑ. වර්තමාන රජය දළ ජාතික නිෂ්පාදිතය වැඩි කිරීම ඇත්ත වශයෙන්ම විශාල අරමුණක් හැටියට ගෙන කොයි ආකාරයෙන් හෝ ඉටු කළ යුතු අරමුණක් හැටියට ගෙන කටයුතු කරනවා. නමුත් අපට ඒ කරුණ ඒ විධියට පිළිගන්න බැහැ. මන්ද? ඊට වඩා හුඟක් වැදගත් කරුණක් වන මේ රටේ තිබෙන ආර්ථික ක්‍රමය—යටත් විජිත ක්‍රමයකට හැඩ ගැසී තිබෙන ආර්ථික ක්‍රමය—සකස් කරන්න ඕනෑ. අද තිබෙන ආර්ථික ක්‍රමය නම් තේ, රබර්, පොල් යන මූලික ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ආර්ථික ක්‍රමයකුයි. ඒ නිසා තමයි ඒ අධිරාජ්‍යවාදී බලවත් ධනපති රටවල්වලට ඔවුන්ගේ මුදල් බලය පාවිච්චි කරමින් ජාත්‍යන්තර වෙළඳ පොලේ මේ ද්‍රව්‍යවල මිළ බලහත්කාරයෙන් පහළ බැස්සවීමට පුළුවන්කම ලැබී තිබෙන්නෙ. අපි මේ විධියට කෘෂිකර්ම ද්‍රව්‍යයන් කෙරෙහි විශ්වාසය තබාගෙන මේ අන්දමේ ආර්ථික ක්‍රමයක් මේ රටේ ගෙන යන තාක් අපේ දළ ජාතික නිෂ්පාදිතය කොයි තරම් වැඩි කළත්, එයින් ප්‍රතිඵලයක් ලැබෙන්නෙ නැහැ. ඇයි? ඊට වඩා වැඩියෙන් අපේ නිෂ්පාදන ද්‍රව්‍යවල මිල බහින තත්ත්වයක් තිබෙන නිසයි. අද සිදු වී තිබෙන්නේ එය නොවේද?

1955 සිට 1965 දක්වා වර්ෂ 10 ඇතුළත අපේ තේවල නිෂ්පාදනය සියයට 26කින් වැඩි වී තිබෙනවා. නමුත් අපේ ඒ තේ පිටරට යවා විකිණීමෙන් ලැබෙන ආදාය මෙහි වෙනසක් ඇතිවී නැහැ. ඒ ප්‍රමාණය මයි අදත් ලැබෙන්නෙ. මිළ පහත බැස්සා. මිළ බැස්ස නිසා නිෂ්පාදනය වැඩි කළාට අපට ප්‍රයෝජනයක් ලැබුණේ නැහැ. තේ පිළිබඳව 1955 තිබුණු තත්ත්වයමයි 1965ත් තිබෙන්නෙ. 1968 දී දළ ජාතික නිෂ්පාදිතය සියයට 8 කින් වැඩි වී තිබෙනවාය කියා ආණ්ඩුව අපට කියනවා. නමුත් අදත් ඒ ප්‍රශ්නය තිබෙනවා. දළ ජාතික නිෂ්පාදිතය වැඩි වුණාට ප්‍රශ්නය විසඳුණාද? නැහැ. ප්‍රශ්නය විසඳනවා තබා ඒ කිට්ටු වෙන්වත් නොයන බව අපට පෙනෙනවා. මක්නිසාද? මේ නිෂ්පාදනය වැඩි වී තිබෙන්නේ මිළ බැස යන ද්‍රව්‍යයන් පිළිබඳවයි. එමනිසා නොදියුණු කුඩා රටක් වන අපේ රටේ දියුණුව මේවායින් මනින්නට ගියොත් අප අමාරුවේ වැටෙනවා. එම නිසා දළ ජාතික නිෂ්පාදිතය වැඩි කිරීම ප්‍රධාන අරමුණ හැටියට තබා ගෙන වැඩ කරන්නට යෑම මෝඩකමක් බව මා කියන්නට සතුටුයි. නිෂ්පාදනය වැඩි කරනවාත් සමගම මූලික අරමුණ විය යුත්තේ අපේ ආර්ථික ක්‍රමය මීට වඩා සුදුසු ආකාරයට වෙනස් කිරීම හෝ හැඩගැස්වීමයි. ඒ කාරණය අප සිතේ තබාගන්නට ඕනෑ. අවුරුදු පහකින් දහයකින් ඒ අරමුණ ඉෂ්ට කර ගන්නට වැඩ පිළිවෙළක් නැත්නම් දළ ජාතික නිෂ්පාදිතය වැඩි කිරීම පමණක් අපේ අරමුණ කරගෙන වැඩ කරගෙන යනවා නම් කවදාවත් අපට මේ මුදල් අර්බුදයෙන් ගොඩ එන්නට නුපුළුවන් වන බව මා ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය අවුරුදු හතර හමාරක කාලය තුළ අය වැය ලේඛන හතරකට පහකට මුහුණදී මේ ආණ්ඩුව වැඩ කරගෙන යන ආකාරය දෙස බලන විට අපට එක් කාරණයක් පැහැදිලිවම පෙනෙනවා. මේ ආණ්ඩුව කිසිම දෙයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර නැත කියා අප කියන්නේ නැහැ. සංවර්ධනයක් නැත්නම් දියුණුවක් ඇති කරන්නට එක්තරා කාලයකදී එක්සත්ව යම් උත්සාහයක යෙදී තිබෙනවා. නමුත් ඒ උත්සාහය කර තිබෙන්නේ කුමන මාවතක් ඔස්සේද යන ප්‍රශ්නය ගැන මේ අවස්ථාවේදී කල්පනා කර බැලිය යුතුයි. ඒ ප්‍රශ්නය මගෙන් ඇසුවොත් ලාංකික ධනපතියන්ගේ මාර්ගයෙන් මේ ආණ්ඩුව සංවර්ධනයක් ඇති කරන්නට උත්සාහයක් ගෙන තිබෙනවාය කියා මා උත්තර දෙනවා. මේ ආණ්ඩුව ඒ මාවතේ ගමන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විශේෂයෙන්ම කරුණු තුනකට මුහුණදෙන්නට සිද්ධ වී තිබෙනවා.

ලාංකික ධනපතියන්ට ඔබින මාවතේ යාමෙන් පළමුකොටම සිද්ධ වී තිබෙන්නේ කුමක්ද? මේ රටේ යම් මුදල් අර්බුදයක් තිබුණාද ඒ මුදල් අර්බුදයේ බර සම්පූර්ණයෙන්ම සාමාන්‍ය මහජනතාව ගේ කරපිට පැටවුණා. මා මුලින් කීවාක් මෙන් මේ ආණ්ඩුව ලෝක බැංකුවේ අවවාද උඩ හාල් සලාකයෙන් සේරුවක් කැපුවා. එපමණක් නොවෙයි. ලෝක බැංකුවේ අවවාද උඩ සාමාන්‍ය ජනතාවට තවත් පහරවල් කිහිපයක් ගසන්නට යෙදුණා. 1967 නොවැම්බර් මාසයේදී රුපියලේ අගය අඩු කළා. එමනිසා බඩු මිළ ඉබේම විශාල ප්‍රමාණයකින් ඉහළ ගියා. ඊළඟට 1968 වර්ෂයේදී අර වි.වි.හි.ස. ක්‍රමය ඇති කළා. ඒ ක්‍රමය ආරම්භ කරනවාත් සමගම අපේ ආනයන භාණ්ඩ රාශියක මිළ කෙලින්ම සියයට 44 කින් වැඩි වුණා. ඒ මදිවාට 1969 මැද හරියේදී ඒ ප්‍රමාණය සියයට 55 දක්වා වැඩි කරන්නට යෙදුණා. මේ සෑම පියවරකින්ම සාමාන්‍ය ජනතාවට ඉවසන්නට බැරි තරම් පහරක් වැදුණු බව මා මතක් කරනවා. ජනතාවගේ කර පිට බර පැටවීමත් සමගම, ලාංකික ධනපති මාවත ඔස්සේ රට සංවර්ධනය කිරීම සඳහා මේ රජය අනුගමනය කරන ක්‍රියා මාර්ගයේ දෙවන ලක්ෂණය වූයේ ධනපති කොටස් වලට විශාල වශයෙන් සහන සැලසීමයි. ඒ සහන සැලසීමට ගරු මුදල් ඇමතිතුමා 5 වන අය වැය ලේඛනය ඉදිරිපත් කරන තුරු බලා සිටියේ නැහැ. පළමුවන අය වැය ලේඛනයෙන්ම ඒ සහන දීමට පටන් ගත්තා. 1965 අය වැය ලේඛනයෙන් බදු සහන රාශියක් මේ රජය දේශීය හා විදේශීය ධනපතීන්ට ලබා දුන්නා. රුපියල් කෝටි 7 ක පමණ සහනයක් ඒ විධියට දුන් බව අප පළමුවන අය වැය විවාදයේ දීම පෙන්වා දුන්නා. මා ගණන්වලට වැඩි දක්ෂයෙක් නොවෙයි. එකී විධියට අවුරුදු 5ක් ඇතුළත මේ රජයෙන් දේශීය හා විදේශීය ධනපතීන්ට ලැබෙන සහනයන් කොපමණ විශාලදැයි තමුන්නාන්සේලාට ගණන් බලා ගන්නට පුළුවනි.

වගා ව්‍යාපාරය සඳහා තරමක් දුරට ගොවීන්ට ධෛර්ය දුන් බව පිළිගන්නට මා සූදානම්. වී බුසලක මිළ රු.2 කින් වැඩි කිරීම වැනි මාර්ගවලින් ගොවීන්ට තරමක සහනයක් දී තිබෙනවා. එහෙත් ඒ අංශයෙනුත් ලොකුම ධෛර්ය දී තිබෙන්නේ ලංකාවේ ධනපතියන්ටයි. වගා කිරීම සඳහා යයි ඉඩම් අක්කර සිය දහස් ගණනක් ඔවුන්ට වෙන් කර දුන්නා. ඒ විතරක් නොවෙයි. ට්‍රැක්ටර්, මිනිමෝක් කාර් හා ජීප් රථ ගෙන්වීමට විශාල වශයෙන් විදේශ විනිමය ලබා දුන්නා. ඒ සමගම ඔවුන්ට බදු සහනත් දුන්නා. වගා කළ ඉඩම්වලින් පාඩු වුණු බව පෙන්වමින් තම වතුවලින් ලැබුණු ආදායමෙන් ගෙවූ ආදායම් බදු පවා අඩු කර ගන්නට සමහර ධනපති මහත්වරුන්ට මේ බදු සහන නිසා පුළුවන් වුණු බව මා දන්නවා. එපමණකුත් නොවෙයි, වගාව සඳහා ලැබුණු ඉඩම්වල ඇති වටිනා ගස් කපා විකුණා විශාල වශයෙන් ලාභ ලබන්නටත් ඔවුන්ට අවස්ථාව ලැබුණා. එය එසේ නොවේයයි කියන්න මුදල් ඇමතිතුමාට පුළුවන්කමක් නැහැ. කෘෂිකර්ම ඇමතිතුමාත් එය එසේ බව පිළිගන්නවා. ඒ තත්ත්වය නිසා, වගා කිරීමට දෙන ලද සමහර ඉඩම් අවලංගු කර තිබෙනවා.

රට දියුණු කිරීම සඳහා රජය විසින් ධනපතියන්ට යම්කිසි රුකුලක් දෙන විට ඔවුන් එයින් අයුතු ප්‍රයෝජන ලබමින් රට ගැන නොහිතා කටයුතු කිරීම ඉතා කණගාටුදායක කරුණක්. දැන් බොහෝ භාණ්ඩ පිටරටවලින් ගෙන්වීම නතර කර තිබෙන නිසා කර්මාන්ත අතින් පවා මේ රටේ ධනපතියන්ට හොඳ අවස්ථාවක් ලැබී තිබෙනවා. මෙරටට අවශ්‍ය භාණ්ඩ මේ රටේම නිෂ්පාදනය කොට ඕනෑම මිළකට විකුණා ගැනීමට ඔවුන්ට ඉඩකඩ තිබෙනවා. එහෙත් අපේ රටේ ධනපතීන් එයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]
ප්‍රයෝජන ගෙන කර්මාන්ත දියුණු කිරීමෙන් නිෂ්පාදනවල මිළ අඩු කිරීමේ උත්සාහයක් ගන්නේ නැහැ. ඒ වෙනුවට; භාණ්ඩ හිඟය ප්‍රයෝජනයට ගනිමින්, නිපද වන බඩු ඉතා අධික මිළට විකුණා විශාල ලාභ ලැබීමට ඔවුන් ඉදිරිපත් වෙනවා. මේ රජයත් ඒ භාණ්ඩවල මිළ සීමා කිරීමට කිසිම උත්සාහයක් දරන්නේ නැහැ. ගරු කර්මාන්ත ඇමතිතුමා "බ්‍යුරෝ ඔෆ් ස්ටෑන්ඩඩ්ස්" ගැන කතා කළත් තවම ඒවා කෙරී නැහැ. ධනපතීන් මාර්ගයෙන් රටක් දියුණු කරන්නට බැරියයි මා කියන්නේ නැහැ. සමහර රටවල් එසේ කර තිබෙනවා. එහෙත් අපේ රටේ නම් එය කෙරෙන්නේ නැහැ. ධනවාදීව හෝ වේවා, සමාජවාදීව හෝ වේවා රටක් දියුණු කරන්නට නම් ඒ සඳහා නිසි සැලැස්මක් ඇති කළ යුතුයි. එහෙත් මේ ආණ්ඩුව කිසිම සැලැස්මක් යොදා නැහැ. සැලසුම් තිබුණු ස්ථානවලත් ඒවා කඩාකප්පල් වන විධියට ක්‍රියා කර තිබෙනවා.

මේ අවස්ථාවේදි එක කාරණයක් මතක් කරන්නට ඕනෑ. සිරිමාවෝ බණ්ඩාර නායක මැතිනියගේ ආණ්ඩු කාලයේදී මම ඒ රජයේ හිටියෙ නැහැ. මා ඇමති ධුරයක් වැනි තනතුරක් දැරුවෙ නැහැ. එහෙත් ඒ රජයට මා සහාය දුන්නා. මා විශේෂ යෙන් කුකුළන් ඇති කිරීමේ ව්‍යාපාරය ගැන විශේෂ සැලකිල්ලක් දක්වලා—කුකුළන් මරා කෑම සඳහා, නැතිනම් මසට ඇති කිරීම සඳහා නොවෙයි; බිත්තර ලබා ගැනීම සඳහා ඇති කිරීමට—සමුපකාර ක්‍රම යට අපේ ගම්වල ඒ ව්‍යාපාරය කර හැරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කළා. ප්‍රථම යෙන්ම පානදුරයේ සමුපකාර තුන හතරක් ඒ විධියට හදාගෙන පසුව එය බණ්ඩාර ගම කොට්ඨාශයටත් දීර්ඝ කර ඒ ව්‍යාපාර යේ සාර්ථක භාවය කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ සැලසුම් සකස් කරන නිලධා රීන්ට ඔප්පු කිරීමෙන් පසු ඒ ව්‍යාපාරය පිළිගත්තා. පිළිගැනීමෙන් පසු සම්මේල නයක් පවත්වා සැලැස්මකුත් සකස් කළා. විශේෂයෙන් කෘෂිකර්ම දෙපාර්ත මේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන් පිරිසක් මේ ව්‍යාපාරයට පුහුණු කර, ප්‍රථම පියවරක් හැටියට හලාවත සිට කළුතර දක්වා වෙළඳ කට මේ විධියේ සමිති සියයක් පමණ පිහිටුවීමේ අදහසින් කටයුතු කරගෙන ගියා. පළමු වෙළඳයේ නම් තරමක් දුරට ඒ කටයුතු සිදු වුණා. සැලැස්මේ අඩුපාඩු තිබුණා. සමුපකාර ව්‍යවස්ථාවල අඩුපාඩු තිබුණු නමුත් ඒවා හරි ගස්සා ගන්නට ඉගෙන ගත්තා.

එහෙම කටයුතු කරගෙන යන අතර අළුත් රජය බලයට පත් වුණා. එවිට මේ රජය ඒ සැලැස්ම පැත්තකට දැම්මා. ඊට පසුව මේ ව්‍යාපාරය අපට දෙන්න කියා පුද්ගලයන් කිහිප දෙනෙකු කිසිම සැලැස් මක් නැතිව මේ ව්‍යාපාරයට බැස්සා. රජය ඔවුන්ට ඉඩ දුන්නා. ඔවුන්ට ඕනෑ තරම් "Parent stock" පැටව් බෝ කරන කිකිළියන් ගෙන්වා ගන්නට අවසර දුන්නා. එවිට ඒ වර්ගයේ කුකුළන් රටේ සුලභ වුණා වගේම බිත්තරත් සුලභ වුණා. ඒක කළාට වරදක් නැහැ. හැබැයි ඒ කුකු ළන්ට ආහාරත් වුවමනා කරනවා.

එතරම් විශාල වශයෙන් උසස් වර්ගයේ කිකිළියන් මේ රටට ගෙනැවිත් බෝ කර නවා නම් ඔවුන්ට නිකම්ම පොල්කුඩු දී බිත්තර දම්මවන්ට බැහැ; උසස් වර්ගයේ කෑම දෙන්නට ඕනෑ. එහෙම නම් "මේස්" සහ "fපිෂ් මීල්" යන කෑම වර්ග දෙක වුව මනා කරනවා. ඒ සත්ව ආහාර දෙවර්ගය අපි පිටරටින් ආනයනය කරන ආහාර වර්ග දෙකක්. එහෙත් විදේශ විනිමය නැත කියා ඒ ආහාර ගෙන්වීම වැඩි කළේ නැහැ; ගෙන්නුවේ පෙර ගෙනා ප්‍රමාණය මයි. සිද්ධ වුණේ මොකක්ද? පෙරට වඩා දෙතුන් ගුණයකින් බිත්තර සඳහා ඇණ වුම් ලැබුණු නමුත් කුකුළන්ට අවශ්‍ය ආහාර වන මේස් හා fපිෂ් මීල් නැති නිසා ඒවා සපයන්නට බැරි වුණා. පොල්කුඩු සහ පුන්නක්කු මිශ්‍ර ආහාර ඒ උසස් වර් ගයේ කුකුළන්ට දුන් නමුත් ඒ විධියේ කෑම දී ඔවුන්ගෙන් සෑහෙන ප්‍රමාණයක් බිත්තර ලබා ගන්නට බැරි වුණා. මේ තත් වය නිසා තාවකාලික වශයෙන් පාඩු වුණා. සමුපකාර අංශයටත්, පෞද්ගලික අංශය ටත් දෙකටම පාඩු වුණා. මම මේ කාරණය ඉදිරිපත් කළේ මේ රජය කිසිම සැලැස් මක් නැතුව ක්‍රියා කර තිබෙන බව පම ණක් නොවෙයි, කලින් යම්කිසි ප්‍රමාණ යක හෝ සැලැස්මක් තිබුණා නම් ඒවාත් කඩාකප්පල් වන ආකාරයට ක්‍රියා කර තිබෙන බවත් පෙන්වා දීමටයි. මේ විධියට සංවර්ධනයක් ඇති කරන්නට අමාරුයි කියන එක පුදුමයක් නොවෙයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රටේ යම් අංශයක සංවර්ධනයක් ඇති වී තිබෙනවා නම් එය ඇති වී තිබෙන්නේ මේ රජයේ ක්‍රියා නිසා නොව, මේ රජයේ ක්‍රියා නොතකා කටයුතු කිරීමෙන් යයි මට කියන්නට පුළුවන්. ඒකත් පුදුමයක් නොවෙයි. අපේ රට ධනවාදී මාර්ගයකින් සංවර්ධනය කරන්නට පුළුවන් ය කියා මා හිතන්නේ නැහැ. එයින් අදහස් කරන්නෙ, සෑහෙන කාලයක් යන තුරු අපේ රටේ සංවර්ධනය සඳහා සේවයක් කරන්න ධනපති පංක්තියට නොහැකිය කියා නොවෙයි. හැම දෙයම සමාජවාදී විධියට එක වරටම කරන්න බැහැ. නමුත් සමාජවාදී සැලැස්මක් යටතේ, සමාජවාදී ව්‍යාපාරයට බර වී වැඩ කරගෙන යන්නේ නැති නම් සංවර්ධනයක් ඇති කරන්න බැහැ. මන්ද? එය අපේ ධනපති පංක්තියේ ස්වභාවක් නිසයි. සමාවන්න, මෙබඳු ප්‍රකාශයක් කරනවාට; නමුත් නොකියා බැහැ. අපේ රටේ මිනිසුන්ගේ ස්වභාව ගැන කියන්න ඕනෑ.

අපේ රටේ ධනපතියන් රටේ සංවර්ධනයේ කොටස්කරුවන් හැටියට ක්‍රියා කරන පිරිසක් නොවෙයි. එය අද ඊයේ නොවෙයි, අපේ රටට නිදහස ලැබෙන්නටත් පෙර කාලවලදී සිට පෙනුණු දෙයක්. අප රටට නිදහස ලැබෙන්නට පෙර, නිදහස සඳහා සටන් කළා නොවෙයි, එම සටන සඳහා එක පියවරක්වත් අපේ ධනපති පංක්තියේ එකම දේශපාලන සංවිධානයකින්වත් අරගෙන තිබෙනවාදැයි ප්‍රශ්න කරන්න කැමතියි. ඇත්ත වශයෙන්ම කිසිම පියවරක් ගත්තේ නැහැ, පන්දම් ඇල්ලුවා විතරයි. දණ නමාගෙන, බඩගාගෙන වයිට් හෝල් මන්දිරයට ගිහින් අපට නිදහස දෙන්නටය කියා ඉල්ලුවා මිස ඒ සඳහා කිසිම අන්දමේ උත්සාහයක යෙදුණේ නැහැ. එයට හේතුවක් තිබෙනවා. අපේ රටේ සිටි ධනපතියන් එක්කෝ වෙළෙන්දෝ නැති නම් ධනපති වතුහිමියෝ. ඒ කොටස් දෙකම අධිරාජ්‍යවාදීන්ට යටත් වූ, අධිරාජ්‍යවාදීන්ගේ සුළු කොටස්කාරයන් වශයෙන් සල්ලි හම්බ කළ ධනපති කොටස්.

ඉන්දියාවේ මෙන් කාර්මික ධනපති පංක්තියක් අපේ රටේ තිබුණේ නැහැ. ඉන්දියාවේ ඉන්දියානු ජාතික සංගමය, අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව ජාතික නිදහස් සටනක් ගෙන ගියා, ධනපති පංක්තියේද ආධාරය ඇතිව. එසේ ආධාර කළේ අධිරාජ්‍යවාදී ධනපතියන් සමග හැප්පෙන්න පුළුවන් ධනපති පංක්තියක් ඒ රටේ තිබුණු නිසයි, කාර්මික ධනපති පංක්තියක් තිබුණු නිසයි. ලැන්කෂයර්හි මෝල් හිමියන් සමග තරඟ කරන්න පුළුවන් මෝල් හිමියන්, බොම්බේ, අහමඩාබාද්, යන නගරවල ඇති වුණු නිසයි, අධිරාජ්‍යවාදී ධනපතියන් සහ ඉන්දියානු ධනපතියන් අතර තරඟයක් ඇති වුණේ. අපේ රටේ ධනපතියන් හා අධිරාජ්‍යවාදී ධනපතියන් අතර එබඳු තරඟයක් ඇති වුණේ නැහැ. අපේ රටේ ධනපතියන් හැදුනෙත්, වැඩුනෙත් අධිරාජ්‍යවාදී ධනපතියන්ගේ ඒජන්තවරුන් හැටියටයි. එම නිසා තමයි, ජාතියේ නිදහස සඳහා අපේ ධනපතියන්වත් ඔවුන්ගේ සංවිධානවලටත් එකම පියවරක්වත් ගන්නට බැරි වුණේ.

අධිරාජ්‍යවාදී යුගයේදී සුළු පියවරක්වත් ඒ සඳහා ගත්තා නම් ගත්තේ කම්කරු පන්තිය වෙනුවෙන් කම්කරු පංක්තියේ නාමයෙන් කථා කළ ලංකා සමසමාජ පක්ෂය පමණක් බව කියන්නට සිදු වී තිබෙනවා. යුද්ද කාලයේදී තමුන්නාන්සේලා සිටියේ කොහේද, අප සිටියේ කොහේද, කියන කාරණා නැවත වරක් මතක් කර දීම අවශ්‍ය නැතැයි මා කල්පනා කරනවා. [බාධාකිරීමක්].

ඉන්දියානු ධනපතීන් තුළ ඒ සම්බන්ධයෙන් සුළු වශයෙන් හැඟීමක් තිබුණත් එවකට ලංකාවේ සිටි ධනපතීන් තුළ එබඳු හැඟීමක් තිබුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිරාජ්‍ය යුගයේදී එකම ප්‍රගතිශීලී පියවරක්වත් ඒ අයට ගන්න බැරි වුණා පමණක් නොවෙයි, අද දේශපාලන බලය ලැබුණාමත්, රට දියුණු කිරීමට යම්කිසි හැකියාවක් තමන්ගේ ආණ්ඩුවට ලැබුණාමත්, රට දියුණු කරනවා වෙනුවට මුදල් හම්බ කර රට කාබාසිනියා කර දැමීමටයි කටයුතු කරන්නේ. ඉඩම් වගා කරන්න ධනපතීන්ට දෙනවා. කරන්නෙ මොකක්ද? ලී දඬු කපාගෙන ගිහින් විකුණනවා, වගා කරන්නෙ නැහැ, පිටරටින් කාර්මික භාණ්ඩ ගෙන්වීම තහනම් කර ඒවා මෙහිම තනන්න අවසර දෙනවා. නමුත් උසස් තත්ත්වයේ භාණ්ඩ නිෂ්පාදනය කරනවාද? නැහැ. ඉතාමත්ම බාල වර්ගයේ භාණ්ඩ නිෂ්පාද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

නය කර අවුරුද්දෙන් දෙකෙන් රුපියල් කෝටි ගණන් ලාභ ලබන්න උත්සාහ කරනවා මිස කර්මාන්ත දියුණුවක් ඇති කිරීමට කිසිම උත්සාහයක් දරන්නේ නැහැ. එවැන්නක් කිරීමට උනන්දුවක් නැහැ, ශක්තියක් නැහැ.

අන්න ඒ නිසා තමයි ධනවාදී මාර්ගයෙන් මේ රට සංවර්ධනය කරන්න බොහොම අමාරුයයි අප කියන්නේ. ඒ කෙසේ වෙතත්, ධනපතියන්ට අපේ රටේ සංවර්ධනය කිරීමේ කාර්යයෙහිලා කිසිම තැනක් නැත කියා අප කියන්නෙ නැහැ ; අපේ පක්ෂය කියන්නෙත් නැහැ ; අපේ පෙරමුණ කියන්නෙත් නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමා ගරු සභාවෙ සිටින නිසා විශෙෂයෙන් ඒ කාරණය මතක් කර දෙන්න කැමතියි. ඇත්ත වශයෙන් ඒ අයටත් අප රටේ තැනක් තිබෙනවා. නමුත් අඩු වේගන යන තැනක් තිබෙන්නෙ. සමාජවාදී වැඩ පිළිවෙළටයි සැලකිය යුතු තැනක් දෙන්න ඕනැ කරන්නෙ. එය සමාජවාදී වැඩ පිළිවෙළක් හෝ වේවා, ජන සතු වැඩ පිළිවෙළක් හෝ වේවා, එබඳු සාමූහික වැඩ පිළිවෙළකට තමයි අප වැඩි තැනක් දිය යුතුව තිබෙන්නේ. එසේ නැතිව නියම විධියේ සංවර්ධනයක් කවදාවත් ඇති කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මා මේ ආණ්ඩුවට හුඟක් දොස් කිව්වා. එක පොඩි හොඳක් පමණක් කියන්නට තියෙනවා. පොඩ්ඩක් හෝ හොඳ කියනවාට අපේ පැත්තේ අය විරුද්ධ වන්නට පුළුවන් වුනත් ඒකට කරන්නට දෙයක් නැහැ. හොඳක් තියෙනවා නම් ඒ හොඳ අප පිළිගන්නට ඕනැ. මේ රජයේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව මට සුළු හොඳක් කියන්නට පුළුවන්. මේ රජයට බලාපොරොත්තු වුණු පිළිවෙළට මුදල් ආධාර ලැබුනේ නැහැ. එසේ ලැබුනා නම් මේ විධියට කරදර වන්නට වුවමනා නැහැ ; ආර්ථික ආර්බුදය ගැන කථා කරන්නට වුවමනා නැහැ ; ජනතාවගෙ කර උඩ මේ විධියට බර පටවන්නට වුවමනා නැහැ. බලාපොරොත්තු වුණු ආධාර—සමහරවිට ලැබිය යුතුව තිබුණු ආධාර—ලැබුනේ නැහැ. මේ රටේ තැන්පත් කරාවිය කියා බලාපොරොත්තු වූ මුදල්—ප්‍රාග් ධනය—බලාපොරොත්තු වූ ආකාරයට ලැබුනෙත් නැහැ. ඒක සිදු වුණේ මේ ආණ්ඩුවේ වරදක් නිසා නොවෙයි. ඒක අප සියළු දෙනාගේම වරදක්. මේ ලංකාවේ ලොකු අවාසනාවක් තියෙනවා. ඒ අවාසනාව නම් ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා තිබීමයි. මේ ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටා තිබෙන්නේ නැතිව පැසිපික් සාගරයේ පිහිටා තිබුනා නම් මේ ආධාර ලැබෙන්නට තිබුනා. මේක භයානක ප්‍රදේශයක්. එක පැත්තකින් ඉන්දියාව තියෙනවා. අනික් පැත්තෙන් බුරුමය තියෙනවා ; අග්නිදිග ආසියාවේ රටවල් තියෙනවා. අර පැත්තෙන් චීනය කඩාගෙන එන්නත් පුළුවන්. එසේ නම් මේ රටේ මුදල් තැන්පත් කරන මෝඩයන් කව්ද ? මේ යුගයේදී අධිරාජ්‍යවාදීන්ගේ මුදල් ලබා ගන්නට බෑ, අපේ රට වැරදි ස්ථානයේ පිහිටා තිබෙන නිසා. ඒක මේ රජයේ වරදක් නොවෙයි. මේ භයානක ස්ථානයේ පිහිටි ලංකාවට වුනත් ආධාර ලබා ගන්නට තිබුණා, මේ රජය කෙළින්ම—පැකිළීමක් නැතිව—මේ රටත් ඇමරිකානු අධිරාජ්‍යවාදීන්ගේ යුද කඳවුරට ඇතුළු කිරීමට කැමැත්ත ප්‍රකාශ කළා නම්. චීනයට විරුද්ධව හෝ වේවා, රුසියාවට විරුද්ධව හෝ වේවා ඇති වන්නට තිබෙන යුද්ධයක් සඳහා පරමාණු බෝම්බ තැන්පත් කරන ස්ථානයක් හැටියට ලංකාව පාවිච්චි කිරීමට ඉඩ දීමට අපේ අගමැතිතුමා සතුටු වුණා නම් ඒ ආධාර සියල්ලක්ම ලබා ගන්නට ඉඩ තිබුණා. හැබැයි එහෙම කළා නම් අපට එක භයක් තියෙනවා. කවදා හෝ පරමාණු යුද්ධයක් පටන් ගන්නවා නම්, රුසියානු කාරයන් අප සමග තිබෙන විශේෂ විරුද්ධකමක් නිසා නොව යුද්ධය දිනන්නට තිබෙන ආශාව නිසා යුද්ධය පටන් ගන්නවාත් සමගම ඔවුන්ගේ පරමාණු බෝම්බයක් ලංකාවට එව්වා නම්, ඒ බෝම්බය කොළඹට වැටුණා නම්, කොළඹ පමණක් නොව, මුළු බස්නාහිර ප්‍රදේශය පමණක් නොව, මුළු ලංකාවම, ඉන්දියානු සාගරයම මකබෑ වී යන්නට ඉඩ තිබෙනවා. එවැනි දේකට ඉඩ නොතැබීම ගැන අද වුනත් මේ රජයට අපේ කෘතඥතාවය පුද කරනවා.

එහෙත් දේශපාලන වශයෙන් අප ඒ විධියට පාවා දී නැති වුනත් ආර්ථික වශයෙන් මේ රජය අනුගමනය කරන ප්‍රතිපත්තිය අනුව ඇමෙරිකානු අධිරාජ්‍යවාදීන්ගේත්, ලෝක බැංකුවෙත් සුවච

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙහෙකරුවන් බවට අපව පත් කර තිබෙන බව කණගාටුවෙන් වුනත් ප්‍රකාශ කරන්නට සිදු වී තිබෙනවා. මේ රජය මෙතෙක් ගෙන තිබෙන සෑම පියවරක්ම ගෙන තිබෙන්නේ ලෝක බැංකුව කියන විධියටයි. එය යහපත් එකක් වන්නට පුළුවන්; අයහපත් එකක් වන්නට පුළුවන්. ඒක නොවෙයි, ප්‍රශ්නය. අරගෙන තිබෙන සෑම පියවරක්ම අරගෙන තිබෙන්නේ ලෝක බැංකුව කියන විධියටයි. එය යහපත්ද, අයහපත්ද යන්න වෙනම තර්ක කරන්නට පුළුවන්. ඒ මිනිසුන් කියන දේ තමයි, මේ රජය කර තිබෙන්නේ. එපමණක් නොවෙයි. ඒ මිනිසුන් නොකියන දේවලුත් මේ රජය කර තිබෙනවා. එසේ කර තිබෙන්නේ දේශපාලන අතින් නොවෙයි, ආර්ථික අතින්.

තෙල් පිරිසිදු කිරීමේ ආයතනය පිළිබඳව තමුන්නාන්සේලා ඇති කරගෙන තිබෙන කොන්ත්‍රාත්තුව පිළිබඳව අද උදේ මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) සඳහන් කළා. ඒ කොන්ත්‍රාත්තුවෙන් අප ෂෙල් කොම්පැනියට බැඳ තිබෙනවා. එය එසේ නොවෙයි නම් මේ අය වැය විවාදය කෙළවර වන්නට ප්‍රථම විශ්වාස කරන්නට පුළුවන් ආකාරයට කරුණු ඉදිරිපත් කරන්න. රුපියල් පනස් කෝටියක කොන්ත්‍රාත් එකක් ඇති කරගෙන තිබෙනවා. ඒ නිසා ඒ ෂෙල් කොම්පැනියේ ශාඛා තිබෙන අධිරාජ්‍යවාදී රටවලින් පමණක් අමු තෙල් ලබා ගන්ට අපට සිදු වී තිබෙනවා. ඒක එහෙම නොවෙයි නම් කරුණාකර අපට කියන්න. එහෙත් ඉදිරිපත් කර තිබෙන කරුණු අනුව අපට බහින්නට තිබෙන එකම නිගමනය කුමක්ද? තමුන්නාන්සේලා දේශපාලන වශයෙන් රට පාවාදී නැති වුනත් ආර්ථික වශයෙන් අඩියක් අඩියක් පාසා අධිරාජ්‍යවාදීන්ගේ වහල් බැම්මට අප ඇතුළත් කර තිබෙනවාය කියලයි අපට හිතන්නට තිබෙන්නේ. ඒ අතින් කල්පනා කරන විට වැඩි කලක් යන්නට පෙර මහ මැතිවරණයක් තබනවාය කියා අපේ අගමැතිතුමා ප්‍රකාශ කර තිබීම ගැන අපි සන්තෝෂ වෙනවා. අපි එසේ සන්තෝෂ වෙන්නේ මේ රටේ මහජනතාවට තමන්ගේ ආර්ථික නිදහස ආරක්ෂා කර ගනිමින් ජාතික නිදහසට ඇති විය හැකි අනතුරුවලින් මේ රට බේරා ගැනීමට අවස්ථාවක් ලැබෙන නිසයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වඩා දීර්ඝ ලෙස කථා කරන්නට යන්නේ නැහැ. මීළඟට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් කථා කර වේලාව 8 වන විට අපේ වැඩ කටයුතු අවසාන කරන්නට පුළුවන් වේය කියා මා කල්පනා කරනවා. එහෙත් තවත් එක කරුණක් ගැන පමණක් සඳහන් කරන්නට අවස්ථාව ලබා දෙන හැටියට මා ඉල්ලා සිටිනවා. එය මේ අයවැය ලේඛනයට අයිති එකක් නොවෙයි. එහෙත් එයත් කිය යුතු කරුණක්. මට පෙනෙන හැටියට අද අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අයුක්තියක් වෙගෙන යනවා. අපි හැමෝම අධ්‍යාපන ඇමතිතුමාට බණිනවා. ඒ එතුමා කරන වැරදි නිසා වෙන්න ඇති. හැම අතින්ම එතුමා පහර කා තිබෙනවා. පහර කන කෙනෙකුට පහර ගහන්න මා කැමති නැහැ. මා කැමති සටනකට ගොස් පරදින පැත්තට වී පහර කන්නයි. වැටී සිටින කෙනෙකුට පහර ගහන්නට මා කැමති නැහැ. එහෙත් කරන්නට දෙයක් නැහැ; එක කරුණක් පමණක් ඉදිරිපත් කරන්නට තිබෙනවා. එය මේ අයවැය ලේඛනයට සූදානම් වීමක් වශයෙන් ඇසූ ප්‍රශ්නයකට ලැබුණු පිළිතුරක ප්‍රතිඵලයක් වශයෙන් සඳහන් කරන්ට බලාපොරොත්තු වන එකක්. මා මෙයට සූදානම් වුනේ මාස 6 ක කාලයක සිටයි. ඒ ශිෂ්‍ය ගුරු පත්වීම් කරන ආකාරය ගැනයි.

ශිෂ්‍ය ගුරුවරුන් තෝරා ගැනීම සඳහා විභාගයක් තබා තිබෙනවා. විභාගයෙන් ඉහළ ලකුණු ලබන අයටයි තැන දෙන්නට ඕනෑ. එසේ නැතිව ඇමතිවරුන්ගෙන් ලියුම් අරගෙන ගියාට පත්වීම් දීම වැරදි බව අපි පිළිගන්නවා. මේ ශිෂ්‍ය ගුරු විභාගයේ ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු 200ක් දෙනවා. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 100 ක් දෙනවා. එය ලොකු අයුක්තියක්. මට මතක හැටියට සිවිල් සර්විස් විභාගයේදීත් ලිඛිත පරීක්ෂණයට ලකුණු 900 ක් දෙනවා; සම්මුඛ පරීක්ෂණයට දෙන්නේ ලකුණු 100 යි. "සිවිල් සර්විස්" විභාගයේ ලකුණු බලන මහත්වරුන්ට ඉඩ කඩ තිබුණේ ලකුණු සියයක අයුක්තියක් කරන්නට පමණයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல— கல்வி, கலாசார விவகார அமைச்சர்)
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

නැවත කියනවාද ?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ඔක්කොම නොවෙයි කොටසක් පමණක් කියන්නම්. ශිෂ්‍ය ගුරු පත්වීම් දෙන්නේ විභාගයක් පවත්වලයි. එසේ නැතිව ඇමතිවරුන්ගේ ලියුම්වලට පත්වීම් දෙන්නේ නැහැ. ඒ ගැන සන්තෝෂයි. මුළු විභාගයටම ලකුණු 300 ක් දෙනවා. ලිඛිත විභාගයට ලකුණු 200 යි. සම්මුඛ පරීක්ෂණයට 100 යි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ගිය අවුරුද්දේ සම්මුඛ පරීක්ෂණයට දුන්නේ ලකුණු 25යි. ඔය කියන්නේ ආදිකාලේ එකක් වෙන්න ඇති.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

1969 මැයි මාසය කියන්නේ ආදිකාලය නම්, අපි අමුතු යුගයක ජීවත්ව ඉන්න වාය කියන්න පුළුවන්.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු ගැන එහෙනම් මට වඩා ගරු මන්ත්‍රීතුමා දන්නවානේ. ගිය වර ශිෂ්‍ය ගුරු සම්මුඛ පරීක්ෂණයට දුන්නේ ලකුණු 25යි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

එහෙනම් ඇත්ත වශයෙන්ම අපේ අධ්‍යාපන ඇමතිතුමාගේ නායකත්වය යටතේ ගෙන යන දෙපාර්තමේන්තුව වෙන කිසිම දෙපාර්තමේන්තුවකටත් වඩා කඩිනමින් විටින් විට වෙනස් වන දෙපාර්තමේන්තුවක්.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

වෙනස් වන ලෝකයේ ඒවාත් වෙනස් වෙනවා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

විභාග නිතර නිතර තබන්නට සිදු වන්නේ ඒ නිසා වෙන්න ඇති. [බාධාකිරීමක්] මේ සම්බන්ධව මට ලැබී තිබෙන ලිපියකින් කොටසක් මම කියවන්නම්. ලියමන එවා තිබෙන්නේ 1969 මැයි මාසයේ. හැබැයි අහවල් දිනය කියා දිනය යොදා නැහැ. එය අමතක වීමෙන් වෙන්න ඇති.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

කවුද ඔය යලිමන එවා තිබෙන්නේ ?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ගාමිනී ජයසූරිය, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ උප ඇමති.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

කොයි කාලයේ එකක් ද ?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

1969 මැයි මාසයේ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

හොඳයි ඇතුල කියවන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
" හිතවත් මන්ත්‍රීතුමනි,

69.4.28 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ දී පිළිතුරු දෙන ලද අංක 20 දරන ප්‍රශ්නය

69.4.28 වැනි දින හැන්සාඩ් වාර්තාවේ 1231, 1232, සහ 1233 දරන තීරු කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

ශිෂ්‍ය ගුරු විභාගයේ දී ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 200 ක් වන අතර, සම්මුඛ පරීක්ෂණයට නියම කර ඇති ලකුණු ප්‍රමාණය 100 කි. එවිට මුළු ලකුණු ප්‍රමාණය 300කි. "

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ඔය කියන්නේ ඊට කලින් තිබුණු විභාගයක් ගැන. හැන්සාඩ් වාර්තාවේ මොනවා දෝ තීරු වගයක් දී තිබෙනවානේ. ඔය කියන්නේ කලින් අවුරුද්දක දේවල්. මා කියන්නේ ගිය අවුරුද්දේ තත්ත්වයයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
මේ අවුරුද්දේ මා ඇසූ ප්‍රශ්නයකට පසු ගිය අවුරුද්දේ ඒවා කියන්නට ඕනෑද ?

ගරු ඊරිගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
උත්තරය කලින් අවුරුද්දක් සම්බන්ධව වෙන්න පුළුවන්.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
වෙන්න බැහැනේ. 1969 එවා තිබෙන ලියමනක්. ඕනෑ නම් අසා තිබෙන ප්‍රශ්නය බලන්න පුළුවන්. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු කීයක් දෙනවාද කියන එකයි මේ ලියමනෙන් කියන්නේ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ප්‍රශ්නය කවදා ඇසුවාද කියා මා දන්නේ නැහැ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
ඕකට අපි කෝලාහල කරන්න ඕනෑ නැහැ. මා ප්‍රශ්නය ඇසුවාට පසුව සම්මුඛ පරීක්ෂණයට දෙන ලකුණු ගණන 100 සිට 25 දක්වා අඩු කර තිබෙනවාය කියා ගරු ඇමතිතුමා කියනවා නම් එය පිළිගෙන වාඩිවෙන්න මම සූදානම්.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
පසුගිය වර ශිෂ්‍ය ගුරු විභාගයේ සම්මුඛ පරීක්ෂණයට දුන් වැඩිම ලකුණු ගණන 25 යි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
ඒ වුණාට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මේ අවුරුද්දේ මැයි මාසයේ මට එවූ ලියමන අනුව ලකුණු ගණන ඊට වෙනස්.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
සමහර විට කොමියුනිස්ට් ලිපිකරුවකු ඕක සකස් කළාද කියන්න බෑ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)
තමුන්නාන්සේගේ පාර්ලිමේන්තු ලේකම්තුමා කොමියුනිස්ට්කාරයකු බව මා දන්නේ අදයි. එතුමා තමයි, මේ ලියමනට අත්සන් කර තිබෙන්නේ. කියවන්නේ නැතිව ලියුම් අත්සන් කරන්නේ නැහැ නොවැ ?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ඔක්කොම පයිල් බලන්නට එතුමාට වෙලාවක් තියෙනවයැ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

ලියමනක් අත්සන් කරන්නට මත්තෙන් එය කියවා බලන්නට ඕනෑ. එහෙම නැතුව අත්සන් කළොත් අමාරුවේ වැටෙන්නට පුළුවනි. කියවන්නේ නැතිව ලියුම් අත්සන් කරන ලෙස අධ්‍යාපන ඇමතිවරයා හැටියට තමුන්නාන්සේ පාඨශාලා ශිෂ්‍යයන්ට කියනවාද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඔය ලියමනේ ඔය උත්තරය ගරු මන්ත්‍රීතුමා දැන් කියන කාරණයට දුන් උත්තරයක් නොවන්නට පුළුවනි. ඕකේ කලින් හැන්සාඩ් වාර්තාවක තීරු අංක වගයක් ගැන සඳහන් වෙනවා. ඔය කියන්නේ කවදා හැන්සාඩ් වාර්තාවක් ගැනද?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේ 28 වැනිදා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

එදිනට පසුවයි, මේ වර පත්වීම් දී තිබෙන්නේ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

මා කලින් ප්‍රශ්නය ඇසූ නිසා මුලින් තිබුණු අසාධාරණකම් නැති කර සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ගණන 25 දක්වා අඩු කර තිබෙනවා නම් සතුටුයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

දැනගත් වේලාවේදී ඒවා සකස් කරනවා. තමුන්නාන්සේලාගේ පාලන කාලයේ තිබුණු අසාධාරණකම් දැන් නෑ.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

හැම දෙනාම පහර ගසන අධ්‍යාපන ඇමතිවරයාට පහර ගසන්නට කැමති නැති බව මා මුලින්ම කීවා. [බාධා කිරීමක්.]

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ගරු මන්ත්‍රීතුමා මට ඉඩ දෙනවා නම් මම කියන්නම්. 1969 අප්‍රේල් මාසයේ 28 වැනිදා ගරු මන්ත්‍රීතුමා අසා ඇති ප්‍රශ්නය මේකයි; මම එදින හැන්සාඩ් වාර්තාවෙන් කියවන්නම්:

"අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ශිෂ්‍ය ගුරුවරුන් පත් කර ගැනීම පිණිස විභාගයක් ගාලු දිස්ත්‍රික්කයේ පවත්වා ඔවුන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් 1966 අප්‍රේල් මාසයේදී පවත්වන ලද්දේද? (ආ) මෙම විභාගයේදී (i) ලිඛිත පරීක්ෂණයෙන් (ii) සම්මුඛ පරීක්ෂණයෙන්, (iii) මුළු විභාගයෙන්, කේ. ඩී. නාලිනී විජේනායක මෙනෙවිය ලබා ගත් ලකුණු ගණන කීයද? (ඉ) ත්‍රිපාල නෙවරප්පෙරුම මෙනෙවිය (i) ලිඛිත පරීක්ෂණයෙන්, (ii) සම්මුඛ පරීක්ෂණයෙන්, (iii) මුළු විභාගයෙන්, ලබා ගත් ලකුණු ගණන කීයද?"

ඒකට ජයසූරිය මහත්මයා මේ විධියට උත්තර දී තිබෙනවා:

"(අ) ඔව්; 1965 මාර්තු මාසයේදී ලිඛිත පරීක්ෂණය හා 1966 අප්‍රේල් මාසයේදී සම්මුඛ පරීක්ෂණය. (ආ) මෙවැනි තරග විභාගයක ලකුණු ඉදිරිපත් කිරීම විභාග නීති රීතිවලට අනුකූල නොවේ. එහෙත් විජේනායක මෙනෙවියට කිසිම අසාධාරණයක් සිදු වී නැත. (ඉ) ඉහත සඳහන් පරිදිය. නෙවරප්පෙරුම මෙනවිය "ඉංග්‍රීසි" ගණය යටතේ පත්වීමක් ලැබීමට සුදුසුකම් ලබා ඇත."

ඉතින් මේ කියන්නේ 1965 දී පවත්වන ලද විභාගයක් ගැන නොවැ? ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ඔය ලියමන ලියා තිබෙන්නේ අන්න ඒ විභාගය ගැනයි.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

කලින් තත්ත්වය එසේ වුණත් දැන් තත්ත්වය මෙසේ යයි කියන්නට ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට පුළුවන්කම තිබුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඔය ලියමන ලියා තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා විසින් අසන ලද මොකක් හෝ ප්‍රශ්නයකට පිළිතුරක් වශයෙන්.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

කෙසේ වුණත් මා නොමඟ යවන්නට මේ පිළිතුර එවා තිබෙනවා.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)
(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)
(Dr. N. M. Perera—Yatiyantota)

වැරදි අදහසක් ඇති කර තිබෙන්නේ ඇයි? නියම තත්ත්වය කියන්නට තිබුණා නේද?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

අසන ලද කිසියම් ප්‍රශ්නයකට පිළිතුරක් වශයෙනුයි, ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ඔය පිළිතුර ලියා තිබෙන්නේ. ප්‍රශ්නයට උත්තරයයි, ඔය ලියමනේ සඳහන් වන්නේ. ප්‍රශ්නය අසා තිබෙන්නේ 1965 විභාගයක් ගැන නම් පාර්ලිමේන්තු ලේකම් තුමා දී තිබෙන පිළිතුර හරි නොවේද?

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

කොහොම වුණත් ජයසූරිය මහත්මයා තව ටිකක් කල්පනා කර මා මුළාවේ නො වැටෙන ආකාරයට පිළිතුරු දුන්නා නම් හොඳයි. ලකුණු දෙන ක්‍රමය දැන් වෙනස් කර තිබෙනවා නම් මේ ප්‍රශ්නය මතු වන්නේ නැහැ. ලකුණු දෙන ක්‍රමය වෙනස් කර තිබෙනවා නම් ඒ ගැන සතුටුයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඔව්, දැන් ඒ ක්‍රමය වෙනස් කරලා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

එහෙම නම් මේ ගැන තව දුර යන්නට වුවමනා නැහැ. මට වුවමනා කරන්නේ සම්මුඛ පරීක්ෂණයට දෙන ලකුණු ප්‍රමාණය අඩු කරන්නටයි.

අ. භා. 7.38

පී. ජී. මුතුබණ්ඩා මයා. (ලග්ගල)
(திரு. பீ. ஜீ. முத்துபண்டா—லக்கல)
(Mr. P. G. Muthubanda—Laggala)

නියෝජ්‍ය කථානායකතුමනි, බලාපොරොත්තු රහිත අවස්ථාවක කථා කරන්නට මට අවස්ථාව ලබා දුන් ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා. 1948 නිදහස ලැබුණාට පසුව ඇති වුණු සෑම රජයකටම වඩා එඩිතර අන්දමින්, වන්නියෙන් පැමිණි වන්නිනායක මුදල් ඇමතිතුමා අයවැය ලේඛන 5 ක්ම ඉදිරිපත් කිරීම ගැන වන්නිය හා සමාන ගමකින් පැමිණි මන්ත්‍රීවරයකු වශයෙන් මා එතුමාට අවංක වම මගේ ස්තුතිය පිරිනමනවා.

පසුගිය අවුරුදු $4\frac{1}{2}$ තුළ මේ රජයෙන් කිසිම වැඩක් කෙරුණේ නැතැයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් නිතරම චෝදනා කරනවා. කොළඹ, මහනුවර, ගාල්ල වැනි දියුණු නගරවලට සමහර විට වැඩක් නොකෙරුණා වන්නට ඇති. එහෙත් ලග්ගල, දඹුල්ල, මිනිපේ, මහියංගනය, පොළොන්නරුව වැනි නොදියුණු කැලෑබද ප්‍රදේශවල නම් මේ රජය යටතේ විශාල විපර්යාසයක් සිදු වී ඇති බව කිසිම සැකයක් නැතිව කියන්නට පුළුවනි. පසුගිය අවුරුදු 4 1/2 තුළ ලග්ගල ඡන්ද දායක කොට්ඨාශයට පමණක් මේ රජයෙන් කෙරුණු වැඩවලින් ස්වල්පයක් කියන්නම්. මිනිපේ යෝජනා ක්‍රමය ඇරඹී සෑහෙන කලක් ගත වී තිබුණත් මිනිපෙට කිට්ටු පල්ලේවත්තටවත් වතුර ලබා ගන්නට පුළුවන් තත්ත්වයක් 1965 දී තිබුණේ නැහැ. එහෙත් 1965 න් පසු මේ රජය ගෙන ගිය සීඝ්‍ර වැඩ පිළිවෙළ නිසා මිනිපේ ඡන්දදායක කොට්ඨාශයේ සැතැපුම් 12 කට පමණ වතුර දී, ලග්ගල ඡන්ද දායක කොට්ඨාශයේත් සැතැපුම් 6 කට පමණ වතුර දෙන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. තව සැතැප්ම 8ක් ඇල කපා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුතුබණ්ඩා මයා.]

සම්පූර්ණයි. ලබන අප්‍රේල් මාසය වන විට ඒ හැතැප්ම 8 ඇතුළතත් ගොවීන්ට වතුර දීමට හැකිවන බව මට ඒ දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරීන්ගෙන් දැනගන්න ලැබුණා. මා එය ඉතාමත් අගේ කොට සලකනවා. මා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත් ඒ ඇමතිතුමාටත් ස්තුති කරනවා.

ඇත්ත වශයෙන්ම 1965 අවුරුද්දේ මගේ ඡන්ද කොට්ඨාශයේ විල්ගොමුව ව්‍යාපාරයේ සිටි ගොවීන් දෙදාහකගෙන් රජයට විකුණන්නට ලැබුණේ වී බුසල් දහදහක් පමණයි. එහෙත් මේ අවුරුද්දේ වී බුසල් 1,50,000 ක් රජයේ වී ගබඩාවලට විකුණන්නට ඉඩ ලැබුණ බව ආඩම්බර යෙන් මතක් කරනවා.

ඒවාගේම ඒ කොට්ඨාශයේ අධ්‍යාපනය ගැන සොයා බැලුවොත් වරක් 10, 11, 12 සහ 13 යන හතරේ පදිංචි අයගේ අධ්‍යාපනය සඳහා අංග සම්පූර්ණ පාසල් ගුරු නිවාස ආදිය සාදා තිබෙනවා. ඒ හැරුණු විට සෞඛ්‍ය අතින් බලන විට, ඉස්සර ලෙඩුන් ගෝනිවල දමාගෙන ඉතාමත් දුෂ්කර මාර්ග ඔස්සේ හැතැප්ම 15-20 උස්සාගෙන එන්න සිදු වී තිබුණ නමුත් අද තත්ත්වය එසේ නොවෙයි. ඉතාමත් අමාරුවෙනුයි ඒ මාර්ගවල ගමන් කිරීමට සිදු වී තිබෙන්නෙ. තැන් තැන් වල ලිස්සන මඩ ගොහොරුවලින් යුක්ත වූ නිසා කොටින් කිව්වොත් හැරම්පියක් නැතුව ගමන් කරන්නවත් පුළුවන්කමක් නැහැ. එහෙත් දැන් එසේ ලෙඩුන් උස්සාගෙන නාවාට මහියංගනය ආරෝග්‍යශාලාව වාගේ විශාල ආරෝග්‍ය ශාලාවක් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සාදාගෙන යනවා. 11 සහ 13 යන වරක් දෙකේ රජයේ දිස්පැන්සරි දෙකක් තනා ඊට අවශ්‍ය නිලධාරීන් ද පත් කර දැන් ඒ ගොවීන්ට බෙහෙත් හේත් ගැනීමට පහසුකම් සලස්වා තිබෙනවා. ඒ වාගේම තැපැල් කාර්යාල ඇති කර තැපැල් පහසුකම්ද සලස්වා තිබෙනවා.

ගමනාගමන පහසුකම් ගැන බලන විට කවදාවත් බස් එකක් නොදුටු ප්‍රදේශවල ජීවත් වූ පිරිස් සිටියා. එහෙත් අද සොයා බැලුවොත් බස් එකක් නොදුටු කෙනෙක් ලග්ගල ආසනයේ සොයාගන්න බැහැ. ඊට හේතුව මාර්ග පහසුකම් සැලසීම නිසා රජයේ වැඩ ඇමතිතුමාට මා අවංකව මගේ ස්තුතිය පිරිනමනවා.

ලග්ගල වැනි නොදියුණු කොට්ඨාශයක් ගැන බලන විට පසු ගිය අවුරුදු හතරාමාර ඇතුළත කෙරී ඇති වැඩ ප්‍රමාණය ඉන් ඉහත අවුරුදු 9 තුළම කෙරී ඇති වැඩ ප්‍රමාණයට සමාන කරන්න පුළුවන්. මේ කාල සීමාව ඇතුළත 20,000 ක් පමණ පදිංචි කර වන්නට පුළුවන් වැව් අමුණු පහසුකම් සැලසී තිබෙනවා. ඒ වාගේම දැන් මේ රජයෙන් ක්‍රම ක්‍රමයෙන් ඉතාමත් උනන්දුවෙන් වැඩ කටයුතු කරගෙන යනවා. එහෙත් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා අසන්නේ කුමක්ද? මට මතකයි මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) දිග කථාවක් කරමින් මේ තරම් වැව් සහ අමුණු තිබියදී ඒවා අලුත්වැඩියා නොකරන්නේ මන්දැයි ඇසූ බව. මුදල් ලැබෙන ලැබෙන හැටියට අපේ ආණ්ඩුව ඒවා හදවනවා ඇති. එතුමන්ලා බලයේ සිටි කාලයේ ඒවා නොකර අපෙන් අහන්නට බලා සිටියේ ඇයි? මට මේ වෙලාවේ තල් ගහෙයි ලබු වැලෙයි කථාව මතක් වෙනවා. තල් ගහ උඩට නැගපු ලබු වැල තල් ගහෙන් අහපු කථාව වැනි කථාවක් තමයි විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලත් අහන්නේ.

තල්ගහ වැඩෙන්නේ බොහොම සෙමින්. එහෙත් තල්ගහට හුඟක් ආයුෂ තිබෙනවා. සම්පූර්ණයෙන් වැඩෙන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තල්ගහට අවුරුදු ගණනාවක් ගත වෙන වා. තද සුළඟක් හැමුවත්, තද නියඟයක් ආවත් තල් ගහට අනතුරක් වන්නේ නැහැ. බාල නොවී එය වැඩෙනවා. තද සුළඟකට තල්ගහ නැමෙන්නෙත් නැහැ; කැඩෙන්නෙත් නැහැ. වර්ෂා සමයක ලබු ඇටයෙන් පැළයක් මතු වෙනවා. සුළු කාල යක් තුළ ඒ පැළය මතු වී, වැඩී, දිග වැලක් බවට පත් වෙනවා. තල්ගහ ළඟ ඇති වූ ලබුවැල ඉක්මනින් වැඩී තල්ගහ මුදුනටම නඟිනවා. ගහේ මුදුනත් වසා ගෙන වැඩෙන ලබුවැල මල් හැදී පල දර නවා. වේගයෙන් වැඩීමෙන් උඩඟු බවට පත් වන ලබුවැල, තල්ගහ අමතා "මොකද යාළුවේ උඹටත් මට වාගේ ඉක්මනින් වැඩෙන්නට බැරිදැ ?" යි අහනවා. එහෙත් සැහෙන සුළඟක් හැමුවාම, නැත්නම් සැහෙන නියඟයක් ඇති වුණාම ලබුවැල, ගෙඩිත් සමඟ කඩාගෙන බිමට ඇද වැටෙ නවා. තල් ගහ එහෙම නොවෙයි; ක්‍රම යෙන් වැඩී, කාලයක් තිස්සේ නොකඩවාම මිනිසාට ප්‍රයෝජන ලබා දෙමින් පවතිනවා. අන්න ඒකයි තල්ගහෙයි ලබුවැලෙයි කථාව. ලබුවැල තල්ගහට ආඩම්බරයෙන් කථා කරන්නා වාගේ තමයි විරුද්ධ පාර්ශ්වය ආණ්ඩුවට කථා කරන්නේත්.

ගොවිතැන දියුණු කිරීමට ගොවියාට ඉඩම් දී නැතැයි විරුද්ධ පාර්ශ්වයෙන් කියනවා අපට ඇහෙනවා. මිණිපේ ව්‍යාපා රය යටතේ පමණක් ලග්ගල ආසනයෙන් අවුරුදු පතා පවුල් 800 ක් බැගින් පසුගිය තුන් අවුරුද්ද තුළ පවුල් 2,400 ක් පදිංචි කර තිබෙනවා. දෙන ලද ඉඩම් ප්‍රමාණය දෙස බැලුවත්, ගොවියාට කර තිබෙන සැලකිල්ල ගැන කෙනකුට අවබෝධයක් ඇති කර ගන්නට පුළුවනි. එක් පවුලකට මඩින් අක්කර දෙක බැගින් දී තිබෙනවා. මෙසේ කර තිබියදීත් සමහර ගරු මන්ත්‍රී තුමන්ලා මේ ආණ්ඩුවෙන් අහනවා,

කොහෙද ඉඩම් දීලා තිබෙන්නේ ? යනු වෙන්. මගේ ආසනයේ පමණක් නොව දඹුල්ල, මින්නේරිය, පොළොන්නරුව, මහියංගනය, මොනරාගල ආදි හැම ආසන යකම පාහේ ගොවීන්ට රජයෙන් ඉඩම් බෙදා දී තිබෙන බව කියන්නට කැමතියි. යන්ට එන්ට මඟක් නැතිව, ඉන්ට හිටින්ට ගෙයක් දොරක් නැතිව, දුකසේ සිටි ගොවි පවුල් දහස් ගණනකට මේ ආණ්ඩුවෙන් ඉඩම් දී තිබෙනවා; වෙනත් අවශ්‍ය ආධාරත් දී තිබෙනවා. පවුල් දහස් ගණනකට සෙත සලසා තිබෙන බව ඒ ප්‍රදේශයට ගිහිල්ලා බැලුවොත් පෙනේවි. බලයේ සිටි කාලයේ තමන්ට කරන්නට බැරි වූ දේවල් මේ ආණ්ඩුවෙන් කරනවා දකින විට ඇස් රිදෙන නිසා වෙන්නට ඇති විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රී තුමන්ලා මේ ආකාරයට ආණ්ඩුව විවේච නය කරන්නේ.

මේ ආණ්ඩුවට විරුද්ධව විවේචන එල්ල කරන ඇතැම් මන්ත්‍රීන් දකින විට මට ගොළුවා බේත් බීපු කථාව මතක් වෙනවා. ගොළුවා බෙහෙත් බීලා නිකම් ඉන්නේ නැහැ; මොනවා හරි කියනවා. ගොළුවා මොනවා හරි කියන්නට උත්සාහ කළත් එය කාටද තේරෙන්නේ ? ගොළුවාට බෙහෙත්වල රසය කියන්නට බැහැ. උඩ බලාගෙන ඔළුව එහාට මෙහාට හරව හරවා, කට හරව හරවා, ගොළුවා බේත බොනවා. බේතේ රස කියන්නට උත්සාහ කළත් ළඟ ඉන්න අයට ඇහෙන්නේ හෝ හෝ ගාන හඬ පමණයි. කෙරෙන දේවල් ගැන සොයා බලා තේරුමක් ඇතිව කථා කර නවා නම් කමක් නැහැ. බොහොම ලොකු බඩු හිඟයක් තිබුණායයි කියනවා. මා එය පිළිගන්නවා. ලග්ගල පමණක් නොවෙයි, මාතලේ දිස්ත්‍රික්කයේ සැම කෙනෙක්ම වාගේ—දඹුල්ල වැනි ප්‍රදේශවල උදවිය පවා—යම් යම් බඩු මිට අවුරුදු පහකට පෙර ලබා ගන්නා ලද අන්දම ගැන මතක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මුතුබණ්ඩා මයා.]

වන විට මට ලජ්ජා හිතෙනවා. කරඬල පිකක් ගන්න වුණාම සැතැප්ම 50 ක් 60ක් මග ගෙවාගෙන සී.ඩබ්ලිව්.ඊ. එකට එන්නට වෙනවා. සමහර විට පාන්දර 5 පටන් හැන්දෑ වන තුරු එතන පෝලිමේ ඉන්නට සිදු වෙනවා. සමහර උදවියට හැන්දෑ වන තුරු සිටියත් කරවල කෑල්ලක් ලබා ගන්නට බැරි වෙන අවස්ථා තිබෙනවා. ඒ පළාත්වල උදවිය කරවල ගත්තේ එහෙමයි. ඒ උදවිය රෙදිපිළි මිල දී ගත්තෙත් ඔය ආකාරයෙන්මයි.

ඒ උදවියට එදා උදළු තලයක් ලබා ගැනීමේදී බොහොම කරදර විඳින්නට සිදු වුණා. පළමුව ග්‍රාම සේවකයාගෙන් ලිපියක් ලබා ගන්නට සිදු වෙනවා. ඒ සඳහා ග්‍රාම සේවකයා හමු වන්නට එක වතාවක් ගිහින් හරි යන්නේ නැහැ. පළමුවන වතාවේ සමහරවිට ඔහු කොහේ හරි ගිහින් සිටින්නට පුළුවනි. ඉතින් දෙවන වතාවේත් යනවා. එතකොටත් කියනවා ඔහු අසුවල් තැනට ගියාය කියා. ඉතින් ඔහු පසුපස යන්නට සිදු වෙනවා. එසේ ගොස් ඔහුගෙන් ලිපියක් ලබාගෙන සී. ඩබ්ලිව්. ඊ. එකට යන්නට සිදු වෙනවා. එතකොට කියනවා, "අද උදළු තල නැහැ; අසුවල් සුමානෙ අසුවල් දවසෙ වරෙන්" කියා. මෙසේ යන විට එම ගොවියාගේ කාලයෙන් දින හතරක් පහක්ම ඒ සඳහා වැය කරන්නට සිදු වෙනවා. ඒත් උදළු තලයක් නොලැබෙන අවස්ථා තිබෙනවා.

එදා ගම්බද ජනතාව සිමෙන්ති ලබා ගත්තේ කෙසේද? එදා සමිතිවලට වැඩ භාරදීමේ ක්‍රමයක් තිබුණා. එසේ යම් වැඩක් භාර දුන්නායින් පසු ඒ සඳහා අවශ්‍ය සිමෙන්ති ලබා ගැනීම පිණිස සමිතිවල නියෝජිතයන් ප්‍රථමයෙන්ම කළ යුත්තේ, මෙතන මේ තරම් කොන්ක්‍රීට් වැඩ තිබෙනවාය; මේ තරම් බැමි බඳින්නට තිබෙනවාය; ඒ සඳහා මේ තරම් සිමෙන්ති අවශ්‍ය කරනවායයි ඉංජිනේරුවාගෙන් සහතිකයක් ලබා ගැනීමයි. එම සහතිකය ලබාගෙන ග්‍රාම සේවකයා ළඟට යන්නට සිදු වෙනවා. මෙම වැඩය මේ උදවිය කරනවායයි ග්‍රාම සේවකයා ලවා අනුමත කරවා ගත යුතුයි. ඊළඟට කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරියා ළඟට යාමට සිදුවෙනවා. ඔහුත් එය අනුමත කළ යුතුව තිබෙනවා. ඊළඟට එම ලිපියත් රැගෙන සී. ඩබ්ලිව්. ඊ. එකට ඇවිත් බඩු ලබා ගන්නට සිදු වෙනවා. සුළුපටු දුරක් නොවෙයි සී. ඩබ්ලිව්. ඊ. එකට එන්නට වුවත් සැතපුම් 30, 40, 50, 60, 70 පමණ දුර ගෙවාගෙන එන්නට සිදු වෙනවා. එසේ ඇමිණ සී. ඩබ්ලිව්. ඊ. එකේ මැනේජර් මහතාට එම ලිපිය භාර දුන් පසු මොකද වන්නෙ? එම ඕඩරයේ සිමෙන්ති කොට්ට 100 ක් අවශ්‍ය බව සඳහන් විය හැකියි. සමහරවිට මුල් වරට ලැබෙන්නේ ඒවා ඕන් සිමෙන්ති කොට්ට 5 ක් පමණ විය හැකියි. තවත් කොටසක් දෙන්නට ඊළඟ සතියේ නැති නම් අනික් සතියේ එන්නට කියනවා. ඇත්ත වශයෙන්ම මෙම සිමෙන්ති ප්‍රමාණය ලබා ගන්නට සමහර විට විසි වතාවක් පමණ එම ස්ථානය කරා යාමට සිදු විය හැකියි. ඔය ආකාරයටයි එදා සිමෙන්ති ලබා ගත හැකි වූයේ.

ඒ කාලයේ බැටරි හිඟයක් පැවතුණු බව මතක ඇති. එවකට බැටරි පිළිබඳව දඹුල්ලේ එක්තරා ස්ථානයක් ලොකු ප්‍රසිද්ධියක් ලබා තිබුණා. මුළු මාතලේ දිස්ත්‍රික්කයටම දඹුල්ලේ පිහිටි එක්තරා මුස්ලිම් කඩයක විතරයි බැටරි තිබුණේ. හැබැයි, අළුත් බැටරි කෑල්ලක් ලබා ගන්නට වුවමනා නම් පරණ බැටරි කෑල්ලක් ගෙන යන්නට ඕනෑ. යම් කෙනෙක් පරණ බැටරි කෑල්ලක් ගෙන නොගියහොත් ඊට එහා පැත්තේ තිබෙන අල්ලපු කඩෙන් ශත 10ක් ගෙවා පරණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැටරි කෑල්ලක් ලබා ගත යුතුයි. එම පරණ බැටරි කෑල්ල ගෙන ආ විට අර මුදලාලිගෙන් අළුත් බැටරි කෑල්ලක් ලබා ගන්නට පුළුවනි. ඕකයි එදා පැවති තත්ත්වය. බයිසිකල් ටයර් පිළිබඳ තත්ත්වයත් ඒකයි. අළුත් ටයරයක් ලබා ගන්නට වුවමනා නම් පරණ ටයරයක් ගෙනැවිත් ඉදිරිපත් කළ යුතුයි. එසේ කළ විට අළුත් ටයරයක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ තත්ත්වය දෙස බලන විට ඔවැනි ප්‍රශ්න කිසිවක් නොමැති බව පෙනෙනවා. එහෙත් දැන් විරුද්ධ පාර්ශ්වයේ උදවිය කියන්නේ හාල් සේරුව කැපීම වැරදි බවයි. හොඳයි, විරුද්ධ පාර්ශ්වයේ උදවිය බලයට ආවොත් ඔය හාල් සේරු දෙකම නොමිලයේ දෙනවාදැයි මා අහනවා. එසේ කරනවායයි තමුන්නාන්සේලා පොරොන්දු වෙනවාද ? [බාධාකිරීමක්] එම නිසයි මා මුලින්ම කීවේ, නිකම් අර ගොළුවා බේත් බීවා වාගේ වුවමනා නැති වචන කීමෙන් වැළකී සිටින ලෙස.

අපේ ගරු මුදල් ඇමතිතුමා මේ වතාවේ පමණක් නොවෙයි, මීට පෙර හතර වතාවක්ම අයවැය වාර්තා ඉදිරිපත් කළා. එම අයවැය වාර්තා ක්‍රියාවේ යෙදීම නිසා රටට යහපතක් සිදු වී තිබෙන බව අප පිළිගන්නවා. පිටිසර පළාත්වලින් පැමිණ සිටින අප වැනි මන්ත්‍රීවරුන්ට ශක්තිය තිබෙනවා, නිර්භීතවම එම ප්‍රකාශය කරන්නට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා විනාඩි 15 ක්වත් කතා කරන්න බලා පොරොත්තු වන්නෙ නැහැ. හැම කෙනෙකුගේම අඩු පාඩුකම් තිබෙන බව ඇත්ත. අපේ මුදල් ඇමතිතුමාටත් ටිකක් අමතක වී තිබෙන කරුණක් සම්බන්ධයෙන් මා මතක් කරන්න කැමතියි. දැන් ලග්ගල කෝට්ඨාශයේ තිබෙන ඇලහැර ප්‍රදේශයේ විශාල වශයෙන් මැණික් ගරන බව තමුන්නාන්සේලා දන්නවා ඇති. විශාල වශයෙන් මැණික් හම්බ වෙනවා. නමුත් මැණික්වලින් රජයට යම්කිසි ආදායමක් ලබා ගැනීමේ වැඩ පිළිවෙලක් මෙහෙක් ඇරඹී නැති බව කණගාටුවෙන් සිහි කළ යුතුව තිබෙනවා. ඒ වගේම තවත් වරදක් කෙරී තිබෙන බවක් පෙනෙනවා. මැණික් ගැරීමේ ඉඩම් රජය විසින් වෙන්දේසියේ විකිණීමේ සිරිතක් මේ මෑතක් වන තෙක් පැවතුනා. නමුත් දැන් මාස ගණනක සිට මේ වෙන්දේසි ක්‍රමය සම්පූර්ණයෙන්ම නැවති තිබෙනවා. ඒ වෙන්දේසි ක්‍රමය නැවැත්වීමෙන් රජයට ලැබුණ ආදායමක් නැවතුණා. නමුත් මැණික් ගැරීම නම් හැම දාමත් කෙරෙනවා. ඒ නිසා මා මතක් කරන්න කැමතියි, මේ මැණික් ගැරීමේ ඉඩම් වෙන්දේසි කිරීමේ ක්‍රමය නැවත ඇති කරන්නය කියා.

මේ මැණික් ගැරීම නිසා දැනට ලොකු වාසියක් ලබන්නේ පොලිස් නිලධාරීනුයි. සමහර පොලිස් නිලධාරීන් මැණික් ගරන ස්ථානවලට ගොස් අමානුෂික අන්දමට ඒ මැණික් ගරන මිනිසුන්ට හිරිහැර කරනවා. මට දැන ගන්න ලැබුණා, දැන් දවස් දෙකකට පමණ උඩදීත් එක්තරා පොලිස් නිලධාරීන් කණ්ඩායමක් පතල් කපන ස්ථානයකට ගොස් මැෂින් දෙකක් අල්ලා ගෙන ඇවිත් තිබෙන බව. ඒ මැෂින් එකකට රුපියල් 1,000 බැගිනුත්, පතල් කැපීමට රුපියල් 200 කුත් දඩ ගසා තිබෙනවා. ඔන්න ඔය විධියට සම්පූර්ණ වාසිය ලබන්නේ පොලීසියයි. නඩුවක් ඇත්තෙත් නැහැ ; උසාවියට නඩුවක් ඉදිරිපත්කළෙත් නැහැ. අන්න ඒ විධියේ වැඩ මතුවට සිදු නොවෙන්න කටයුතු කරන්නය කියා මා මේ ජාතික රජයෙන් ඉල්ලා සිටිනවා. මෙතෙක් කතා කිරීමට අවකාශ ලබා දුන් ගරු නියෝජ්‍ය කථානායකතුමාට මගේ අවංක ස්තුතිය පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1969 අගෝස්තු 22 වන සිකුරාදා පවත්වනු ලැබේ.

அப்போது பி. ப. 8 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.

1969 ஒகஸ்ட் 22, வெள்ளிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

It being 8 P.M., Business was interrupted, and the Debate stood adjourned.

Debate to be resumed on Friday, 22nd August 1969.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

I move,

"That the House do now adjourn."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල් තැබීම

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.3 ට, 1969 අගෝස්තු 17 වන දින සභා සම්මතිය අනුව, 1969 අගෝස්තු 22 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.

அதன்படி பி. ப. 8.3 மணிக்கு, சபை அதனது 1969 ஒகஸ்ட் 17 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1969 ஒகஸ்ட் 22, வெள்ளிக்கிழமை மு. ப. 10 மணி வரை ஒத்திவைக்கப்பெற்றது.

Adjourned accordingly at 8.3 P.M., until 10 A.M. on Friday, 22nd August 1969, pursuant to the Resolution of the House of 17th August 1969.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

WRITTEN ANSWERS TO QUESTIONS

මුහුදු යාත්‍රා එන්ජින්

கடல் எஞ்சின்கள்

MARINE ENGINES

81/69

කේ. තුරෙයිරත්නම් මයා. (පේදුරු තුඩුව)

(திரு. கே. துரைரத்னம்—பருத்தித்துறை)

(Mr. K. Thurairatnam—Point Pedro)

කර්මාන්ත හා ධීවර කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මුහුදු යාත්‍රා සඳහා ලංකාවට ආනයනය කරනු ලැබෙන පිට මෝටර එන්ජින් හා ඇතුළු මෝටර එන්ජින් මොනවාද? (ආ) වර්ගය අනුවත් අශ්වබල ප්‍රමාණය අනුවත් ඒවායේ මිල, රක්ෂණ හා ගැල් කුලිය කොපමණද? (ඉ) මේවායේ විකුණුම් මිල අඩු කර, දුප්පත් ධීවරයින්ගෙන් අයුතු ලාභ ගැනීම නැවැත්වීමට එතුමා වහාම කටයුතු කරනවාද?

கைத்தொழில், கடற்றொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கைக்கு இறக்குமதி செய்யும் உட்புற, வெளிப்புற கடல் எஞ்சின்கள் எவை? (ஆ) வர்க்க வாரியாகவும், பரிவலு வாரியாகவும், இவைகளின் த. கா. கே. விலைகள் என்ன? (இ) ஏழை மீனவர்களைச் சுரண்டுதலைத் தடுப்பது பொருட்டு விற்பனவு விலையைக் குறைப்பதற்கு உடன் நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Industries and Fisheries: (*a*) What are the inboard and outboard marine engines imported into Ceylon? (*b*) What are their c.i.f. prices variety-wise and horse power-wise? (*c*) Will he take immediate steps to reduce the selling prices and thereby prevent exploitation of the poor fishermen?

ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)

(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

(අ) දැනට ලංකාවට ආනයනය කරනු ලබන ඇතුළත සවි කරන හා පිටත සවි කරන ඇන්ජින් පහත දැක්වේ:

(ඒ) පර්කින්ස්
(බී) බුක්
(සී) ලිස්ටර්
(ඩී) පෙටර්
(ඊ) ඩියුට්ස්
(එෆ්) ජොන්සන්
(ජී) එවින්රූඩ්
(එච්) මර්කරි
(අයි) පෙන්ටා
(ජේ) යමහා

(ඒ) සිට (ඊ) දක්වා ඇතුළත සවි කරන ඇන්ජින්ය.
(එෆ්) සිට (ජේ) දක්වා පිටත සවි කරන ඇන්ජින්ය.

(ආ) ඒ ඒ වර්ග සඳහා මිල, රක්ෂණ හා ගැල් කුලියත් අශ්ව බල ප්‍රමාණයත් පහත දැක්වේ:

(ඒ)	පර්කින්ස්	අශ්ව බල	30	රු. 7,133.27	වෙළඳ කොටස් යටතේ ආනයනයන්
(බී)	බුක්	එම	29.5	රු. 6,596.75	
(සී)	ලිස්ටර්	එම	36	රු. 8,964.00	
(ඩී)	පෙටර්	එම	30	රු. 9,321.00	
(ඊ)	පෙටර්	එම	22	රු. 7,760.00	
(එෆ්)	ඩියුට්ස්	එම	18	රු. 6,817.50	
(ජී)	ඩියුට්ස්	එම	9	රු. 4,969.50	
(අයි)	ජොන්සන්	එම	6	රු. 1,436.87	
(අයි)	ජොන්සන්	එම	9.5	රු. 1,955.53	
(ජේ)	එවින්රූඩ්	එම	6	රු. 1,398.11	
(කේ)	මර්කරි	එම	7.5	රු. 1,725.75	
(එල්)	මර්කරි	එම	9.8	රු. 2,276.78	
(එම්)	පෙන්ටා	එම	12	රු. 1,882.35	
(එන්)	පෙන්ටා	එම	17½	රු. 2,076.00	
(ඕ)	යමහා	එම	8	රු. 849.28	

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සී. පී. ආර්. ගුණවර්ධන]

(ඉ) ඇන්ජින් සැපයීම හා ආනයනය කිරීම සඳහා විනිමය වෙන් කර දීමට පෙර තරඟකාරී මිළ ගණන් ලබා ගැනීමෙන් මේවායෙහි මිළ ගණන් සාධාරණ මට්ටමකට පැවැත්වීම සඳහා ධීවර දෙපාර්තමේන්තුව දැනටමත් කටයුතු කර ගෙන යයි. විවිහිස සඳහා යන වියදම දෙපාර්තමේන්තුව මගින් දරනු ලැබේ.

(அ) தற்பொழுது இலங்கைக்கு இறக்குமதி செய்யப்படும் உட்புற, வெளிப்புற கடல் என்ஜின்களாவன :—

(1) " பேர்க்கின்ஸ் "
(2) " புக் "
(3) " லிஸ்ரர் "
(4) " பெற்றர் "
(5) " டியுற்ஸ் "
(6) " ஜோன்சன் "
(7) " எவின்றூட் "
(8) " மேர்க்குறி "
(9) " "பென்ரா "
(10 " யாமகா "

(1) இருந்து (5) வரையுள்ளது உட்புற என்ஜின்கள். (6) இருந்து (10) வரையுள்ளது வெளிப்புற மோட்டார்கள்.

(*a*) The inboard and outboard engines imported into Ceylon at the present are :

(*a*) Perkins	(*b*) Bukh	(*c*) Lister
(*d*) Petter	(*e*) Deutz	(*f*) Johnson
(*g*) Evinrude	(*h*) Mercury	(*i*) Penta
	(*j*) Yamaha	

(*a*) to (*c*) are inboard engines and (*f*) to (*j*) are outboard motors.

(ஆ) இவ்வினத்தின் வி. ஈ. கே. விலையும் அதன் பிரிவுகளும் பின்வருமாறு :—

	ரூ.	ச.
(1) 30 பரிவலுகொண்ட " கோகின்ஸ் " ..	7,133	27
(2) 29.5 பரிவலுகொண்ட " புக் "	6,596	75
(3) 36 பரிவலுகொண்ட " லிஸ்டர் "	8,964	00
(4) 30 பரிவலுகொண்ட " பெற்றர் " ..	9,321	00
(5) 22 பரிவலுகொண்ட " பெற்றர் " ..	7,760	00
(6)18 பரிவலுகொண்ட " டியுற்ஸ் " ..	6,817	50
(7) 9 பரிவலுகொண்ட " டியுற்ஸ் " ..	4,969	50
(8) 6 பரிவலுகொண்ட " ஜோன்சன் " ..	1,436	87
(9) 9·5 பரிவலுகொண்ட " ஜோன்சன் "	1,955	53
(10) 6 பருவலுகொண்ட " எவின்றூட் " ..	1,398	11
(11) 7·5 பரிவலுகொண்ட " மேர்குறி " ..	1,725	75
(12) 9·8 பரிவலுகொண்ட " மேர்குறி " ..	2,276	78
(13) 12 பரிவலுகொண்ட " பென்ரா " ..	1,882	35
(14) 17½ பரிவலுகொண்ட " பென்ரா " ..	2,076	00
(15) 8 பரிவலுகொண்ட " யாமகா " ..	849	28

(இ) நாணயமாற்று ஒதுக்கீட்டிற்கு முன்னர், என்ஜின்களை வழங்குதலுக்கும் இறக்குமதிக்குமான இனமான கூறுவிலை பெற்று, விலைவாசியை நியாயமான நிலையில் வைப்பதற்கு கடற்றொழில் திணைக்களம் வேண்டிய நடவடிக்கைகளை எடுக்கின்றது. வெ. செ. ச. சா. விலை திணைக்களத்தினால் ஏற்றுக்கொள்ளப் படும்.

(*b*) The C. I. F. prices for the makes and horse-power are as follows:

			Rs.		
(*a*) Perkins	30	h.p. ..	7,133	27	Trade Quota Imports
(*b*) Bukh	29.5	,, ..	6,596	75	
(*c*) Lister	36	,, ..	8,964	0	
(*d*) Petter	30	,, ..	9,321	0	
(*e*) Petter	22	,, ..	7,760	0	
(*f*) Deutz	18	,, ..	6,817	50	
(*g*) Deutz	9	,, ..	4,969	50	
(*h*) Johnson	6	,, ..	1,436	87	
(*i*) Johnson	9.5	,, ..	1,955	53	
(*j*) Evinrude	6	,, ..	1,398	11	
(*k*) Mercury	7.5	,, ..	1,725	75	
(*l*) Mercury	9.8	,, ..	2,276	78	
(*m*) Penta	12	,, ..	1,882	35	
(*n*) Penta	17½	,, ..	2,076	0	
(*o*) Yamaha	8	,, ..	849	28	

(c) The Department of Fisheries is already taking action to keep the prices at a reasonable level by obtaining competitive quotations for supply and import of the engines prior to allocation of exchange. The cost of the FEEC, will be met by the department.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. පී. එල්. ශාන්තිදේවි මහත්මිය, අළුත්වල මහා විද්‍යාලය

திருமதி. ஏ. பீ. எல். சாந்திதேவி, அளுத்வல, மகா வித்தியாலயம்

MRS. A. P. L. SHANTHI DEVI, ALUTHWELA MAHA VIDYALAYA

83/69

එච්. ජී. ඒ. කාරියවසම් මයා. (බෙන්තර-ඇල්පිටිය)

(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)

(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) පසුගිය වර ශිෂ්‍යගුරු පත්වීම් දීමේ දී ඒ. පී. එල්. ශාන්තිදේවි නමැති මහත්මියට ගා/අළුත්වල මහා විද්‍යාලයට ශිෂ්‍යගුරු පත්වීමක් දෙන ලදද? (ආ) එම මහත්මිය ශිෂ්‍යගුරු විභාගයට වාඩිවූ තැනැත්තියක්ද? එසේ ශිෂ්‍ය ගුරු විභාගයට වාඩි වූයේ නම් කුමන මධ්‍යස්ථානයක කුමන අංකය කින්ද? (ඊ) ශිෂ්‍යගුරු විභාගයට වාඩිවී නැත්නම් ඇයට පත්වීමක් දුන්නේ කෙසේද? (උ) එසේ අනියම් පත්වීමක් දී ඇත්නම් එබඳු පත්වීම් තවත් කීයක් දී ඇත්දැයි එතුමා සඳහන් කරන වාද? (ඌ) ඇයට දී ඇත්තේ විද්‍යා ශිෂ්‍ය ගුරු පත්වීමක්ද නැතහොත් කලා ශිෂ්‍ය ගුරු පත්වීමක්ද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) மாணவ ஆசிரியர் பதவிகள் கடந்த முறை அளிக்கப்பட்டபொழுது ஏ. பீ. எல். சாந்திதேவி என்னும் பெண்மணிக்கு கா/அளுத்வல மகா வித்தியாலயத்தில் மாணவ ஆசிரியர் நியமனம் அளிக்கப்பட்டதா? (ஆ) அப் பெண்மணி மாணவ ஆசிரியர் பரீட்சைக்குத் தோற்றியவரா? (இ) அவ்விதம் இவர் தோற்றியிருந்தால் பரீட்சை எடுத்த இடமும், சுட்டிலக்கமும் யாவை? (ஈ) மாணவ ஆசிரியர் பரீட்சை எழுதவில்லையெனில், இவருக்கு நியமனம் அளிக்கப்பட்டதெப்படி? (உ) இவ்விதம் முறையற்ற நியமனம் அளிக்கப்பட்டிருந்தால், இத்தகைய நியமனங்கள் எத்தனை அளிக்கப்பட்டுள்ளன வென்பதை அவர் குறிப்பிடுவாரா? (ஊ) இப் பெண்மணிக்கு விஞ்ஞான மாணவர் ஆசிரியர் நியமனமா அல்லது கலை மாணவ ஆசிரியர் நியமனமா அளிக்கப்பட்டுள்ளது?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Was Mrs. A. P. L. Shanthi Devi appointed a pupil teacher to G/Aluthwela Maha Vidyalaya when appointments of pupil teachers were last made? (*b*) Did she sit the Pupil Teachers' Examination? (*c*) If so, at what centre and under what index number? (*d*) If she has not sat the Pupil Teachers' Examination, how was she given an appointment? (*e*) If this is an irregular appointment, will he state the number of other similar appointments? (*f*) Has she been appointed as a Science pupil teacher or an Arts pupil teacher?

ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)

(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

(අ) ඒ. පී. එල්. ශාන්තිදේවි මහත්මිය නොව ඒ. ජී. එල්. ශාන්තිදේවි මහත්මියට ශිෂ්‍ය ගුරු පත්වීමක් දී ඇත. (ආ) ඔව්. එහෙත් ඇ ශිෂ්‍ය ගුරු විභාගයේ "විද්‍යා" ප්‍රශ්න පත්‍රයට පෙනී සිටියේ නැත. (ඉ) අම්බලන්ගොඩ—ඕ. 801. (ඊ) ඇට විද්‍යා ශිෂ්‍ය ගුරු පත්වීමක් 67.5.2 වැනි දින දෙන ලදී. මෑ "විද්‍යා" විෂය ප්‍රශ්න පත්‍රයට පෙනී නොසිට "විද්‍යා" ශිෂ්‍යගුරු පත්වීමක් ලැබී ඇති බවට කරන ලද පැමිණිල්ලක් නිසා ඇගේ සේවය තාවකාලිකව වහාම නතර කර, පැමිණිල්ල ගැන වැඩිදුරටත් අමාත්‍යාංශය විසින් පරීක්ෂණයක් පවත්වන ලදී. මේ පරීක්ෂණයෙන් හෙළි වූයේ මෑ මේ පත්වීම ලැබීමට වංචනික අයුරින් කටයුතු කර නැති බවය. තවද, ඇ අවුරුද්දකට වඩා ශිෂ්‍ය ගුරුවරියක වශයෙන් සේවය කළ හෙයින්ද, ඒ පත්වීම ඇට ලැබීමේ හේතුවෙන් අනිකුත් විභාගවලට පෙනී සිටීමට අවශ්‍යතාවක් නැතැයි සාධාරණ බලාපොරොත්තුවක් ඇට ඇතිවූ හෙයින්ද, ඇ නැවත වරක් සේවයට බඳවා ගන්නා ලදී. (උ) මෙය අනියම් පත්වීමක් නොව සාධාරණව කරුණු සළකා බලා දී ඇති පත්වීමකි. අනියම් පත්වීම් කිසිවක් දී නැත. (ඌ) "විද්‍යා" ශිෂ්‍ය ගුරු පත්වීමකි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම්. කේ. මදුරාවතී මහත්මිය, රූගම ආණ්ඩුවේ මුස්ලිම් පාසල

செல்வி எம். கே. மதுராவதி, ருகமை அரசினர் முஸ்லிம் பாடசாலை

MISS. M. K. MADURAWATHIE, RUGAMA GOVERNMENT MUSLIM SCHOOL

85/69

ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදුව)

(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபறுதுவ)

(Mr. Prins Gunasekera—Habaraduwa)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වහරක මාගල්කන්දේ පදිංචි ඇම්. කේ. මදුරාවතී නමැත්තියට මඩකලපුවේ රූගම/ආ. මු. මි. පාසැලට 1969 ජනවාරි මාසයේ සිට ගුරු පත්වීමක් දී තිබේද? (ආ) ඇ ශිෂ්‍යගුරු විභාගයට පෙනී සිටියාද? සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබුවාද? (ඉ) නො එසේ නම්, පත්වීම දෙනු ලැබුවේ කෙසේද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) வகரக்கை மாகல்கந்தை என்னுமிடத்தில் வசிக்கும் எம். கே. மதுராவதி என்னும் பெண்மணிக்கு, 1969 ஜனவரி மாத முதல் மட்டக்களப்பு ருகமை/அரசினர் முஸ்லிம் கலவன் பாடசாலையில் ஆசிரியர் பதவி அளிக்கப்பட்டுள்ளதா? (ஆ) அவர் மாணவ ஆசிரியர் பரீட்சைக்குத் தோன்றினாரா? நேர்முகப் பரீட்சைக்கு அழைக்கப்பட்டாரா? (இ) இல்லையெனில், நியமனம் அளிக்கப்பட்டதெவ்விதம்?

asked the Minister of Education and Cultural Affairs: (*a*) Has M. K. Madurawathie of Magalkande in Waharaka been appointed to the Rugama Government Muslim Mixed School in Batticaloa with effect from January 1969? (*b*) Did she sit the Pupil Teachers' Examination? Was she called for the interview? (*c*) If not, how is it that she was given an appointment?

ගරු ඊරියගොල්ල

(கௌரவ ஈரியகொல்ல)

(The Hon. Iriyagolle)

(අ) වහරක මාගල්කන්දේ පදිංචි ඇම්. කේ. මදුරාවතී නැමති අයට නොව ඌරාපොල, හුණුපොල, අත්තනගල්ල යන ලිපිනය ඇති ඇම්. කේ. මදුරාවතී මෙනෙවියට සිංහල උපගුරු පත්වීමක් 1969.1.15 වැනි දින සිට මඩ/රූගම ආ. මු. මි. විද්‍යාලයට දී ඇත. (ආ) මෙය ශිෂ්‍ය ගුරු පත්වීමක් නොවේ. (ඉ) 1964 වර්ෂයේ දී පවත්වන ලද උතුරු හා නැගෙනහිර පළාත්වල පිහිටි දෙමළ මාධ්‍ය පාසැල්වලට සිංහල උපගුරුවරුන් තෝරා ගැනීමේ විභාගයේ ප්‍රතිඵල අනුව මෙම පත්වීම දී තිබේ.

බණිජ තෙල් පෙරීමේ යන්ත්‍රාගාරයට දළ තෙල් සැපයීම

எண்ணெய்ச் சுத்திகரிப்பு நிலையத்திற்கு சுத்திகரிக்கப்படாத எண்ணெய் வழங்கல்

SUPPLY OF CRUDE OIL TO OIL REFINERY

87/69

ටී. බී. ඉලංගරත්න මයා. (කොලොන්නාව)

(திரு. ரீ. பீ. இலங்கரத்ன—கொலொன்னுவ)

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) හපුගස්කන්දෙ බණිජ තෙල් පෙරීමේ යන්ත්‍රාගාරයට දළ තෙල් සැපයීම සම්බන්ධව පහත සඳහන් විස්තර එතුමා ඉදිරිපත් කරන්නේද? (i) දළ තෙල් සපයන්නේ කුමන රටකින්ද? (ii) කුමන ආයතන මගින්ද? (iii) එම ආයතන තෝරා ගන්නා ලද්දේ ටෙන්ඩර් මාර්ගයෙන්ද? (iv) ටෙන්ඩර් මාර්ගයෙන් නම් ඒ සඳහා ඉදිරිපත් වූ සියලුම ටෙන්ඩර්කරුවන්ගේ නම්, ලිපින හා ඉදිරිපත් කරන ලද කොන්දේසි මොනවාද? (ආ) හපුගස්කන්දෙ බණිජ තෙල් පෙරීමේ යන්ත්‍රාගාරය සම්බන්ධයෙන් හවුල් වී ක්‍රියාකරන විදේශීය ආයතනවල නම්, ලිපින හා ඒ ඒ ආයතන භාර රාජකාරි කුමක්දැයි සඳහන් කරන්නේද?

தேசியமயச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா: (அ) ஹப்புகஸ்கந்தையிலுள்ள எண்ணெய்ச் சுத்திகரிப்பு நிலையத்திற்கு, சுத்திகரிக்கப்படாத எண்ணெய் வழங்குதல் சம்பந்தமான பின்வரும் விபரங்களை அவர் கொடுப்பாரா: (i) சுத்திகரிக்கப்படாத எண்ணெய் எந்நாட்டிலிருந்து இறக்குமதி செய்யப்படுகிறது? (ii) எந்நிறுவனங்கள் மூலம் இது இறக்குமதி செய்யப்படுகிறது? (iii) இந்நிறுவனங்கள் கேள்விப்பத்திர அடிப்படையில் தெரிவு செய்யப்பட்டனவா? (iv) ஆமெனில் பல்வேறு கேள்வுப்பத்திரக்காரரினதும் பெயர்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கள் விலாசங்கள் ஆகியன யாவை, அவர்கள் ஒவ்வொருவரும் குறிப்பிட்ட நிபந்தனைகள் யாவை? (ஆ) இந்த எண்ணெய் சுத்திகரிப்பு நிலையத்துடன் தொடர்புள்ள வெளிநாட்டு நிறுவனங்களின் பெயர்கள், விலாசங்கள் ஆகியவற்றையும் அவை ஒவ்வொன்றினதும் கடமைகள் என்னென்ன என்பதையும் அவர் கூறுவாரா?

asked the Minister of Nationalized Services: (*a*) Will he furnish the following details regarding the supply of crude oil to the refinery at Hapugaskande: (i) From what country is the crude oil imported? (ii) Through what institutions is it imported? (iii) Were these institutions selected on the basis of tenders? (iv) If so, what are the names and addresses of the various tenderers and the terms offered by each of them? (*b*) Will he state the names and addresses of the foreign institutions associated with the oil refinery and also the precise function of each such institution?

ලිඛිත පිළිතුරු

ගරු වී. ඒ. සුගතදාස (ජනසතු සේවා ඇමති)

(*கௌரவ வி. ஏ. சுகததாச—தேசியமய சேவை அமைச்சர்*)

(The Hon. V. A. Sugathadasa—Minister of Nationalized Services)

(අ) (i) ඉරානය, (ii) (ඒ) අවශ්‍යතාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් මිළයට ගනු ලැබුවේ ලංඩන් එස්. ඊ. 1 හි "සීමාසහිත කොන්සොලිඩේටඩ් පෙට්රෝලියම් සප්ලයි" සමාගමෙනි. (බී) 1970 දී සැපයීම පිණිස සුළු ප්‍රමාණයක් නිව්යෝර්ක් නගරයෙහි කොන්ටිනෙන්ටල් තෙල් සමාගමෙන් ද මිළයට ගෙන ඇත. (iii) පහත සඳහන් දෑ උදෙසා ටෙන්ඩර් පත්‍ර කැඳවීමෙන් පසු ඒ සඳහා සමාගම් කිහිපයකින් මිළ ගණන් ලැබුණු අතර, "කොන්සලිඩේටඩ් පෙට්රෝලියම්" සමාගම තෝරා ගන්නා ලදී.

(ඒ) අමුතෙල් (සුද්ධ නොකළ) සැපයීම
(බී) මෙම තෙල් ගෙන ඒම සඳහා නැව් සැපයීම
(සී) ලාංකිකයන් පුහුණු කිරීමට ඇතැම් කාර්මික සහයෝගතා දැක්වීම සහ
(ඩී) වැඩිපුර ඇති නිෂ්පාදන ආපසු ගැනීම.

(iv) ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන ලද අයගේ නම් සහ ලිපිනයන් පහත පළවේ:

1. එසෝ ඉන්ටනැෂනල්,
   නිව්යෝක් නගරය.
2. කැලිපෝනියා ටෙක්සාස් තෙල් සංස්ථාව,
   380, මැඩිසන් ඇවනිවු,
   නිව්යෝක්.
3. "සීමාසහිත කොන්සොලිඩේටඩ් පෙට්රෝලියම්" සමාගම,
   ෂෙල් මධ්‍යස්ථානය,
   ලන්ඩන්, එස්. ඊ. 1.
4. සීමාසහිත ඩන්කන් සහෝදර සමාගම,
   ඩන්කන් ගොඩනැගිල්ල,
   31, නේතාජී සුබාස් පාර,
   තැ. පෙ. 189,
   කල්කටා 1.
   සහ
   පිලිප්ස් ජාත්‍යන්තර සංස්ථාව,
   ඔක්ලොහෝමා,
   අමෙරිකා එක්සත් ජනපදය.
5. ගල්ෆ් තෙල් සංස්ථාව,
   අමුතෙල් දෙපාර්තමේන්තුව,
   පිට්ස්බර්ග්,
   පෙන්සිල්වේනියා 15230,
   ඇමෙරිකා එක්සත් ජනපදය.
6. වී/ඕ "සුජෙනප්එක්ස්පෝර්ට්",
   ස්මොලන්ස්කාජා,
   සෙනාලා පිඑල්. 32/34,
   මොස්කව්,
   සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු සුගතදාස]

(ආ) සැපයීම් සහ සේවා අවශ්‍යතාවන් වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන ලද්දේ එසෝ ඉන්ටනැෂනල් සහ කොන්සොලිඩේටඩ් පෙට්රෝලියම් සමාගම් දෙක පමණි. සැපයීම්, නැව් ගාස්තු සහ ණය පහසුකම්වලට අදාළ කොන්දේසි ඉතාමත් වැදගති. අදාළ ටෙන්ඩර් මිළ ගණන් පහත පලවේ :

	අමුතෙල් වර්ගය	මිළ (සී. ඇන්ඩ් එෆ්.)	ණය ක්‍රමය
1. කොන්සොලිඩේටඩ් ...	අගාජාරි ...	ඩොලර් 12.15 මැට්‍රික් ටොන් 1	මාස 6 යි
2. එසෝ ඉන්ටනැෂනල් ...	අගාජාරි ...	ඩො. 12.32 මැට්‍රික් ටොන් 1	අමුතෙල් සඳහා මාස 3 නැව්ගාස්තු සඳහා පහසුකම් නැත.
3. ඩන්කන් සහෝදරයෝ ...	අගාජරි ...	ඩො. 12.50 මැට්‍රික් ටොන් 1	නැත
4. වි/ඕ සුජෙනෙඑජ්එක්ස්පෝට්	රුසියන් අමුතෙල් ...	ඩො. 14.52 මැට්‍රික් ටොන් 1 (සුවස් ඇළ ඔස්සේ)	මාස 3–4 දක්වා
		ඩො. 18.64 මැට්‍රික් ටොන් 1 (කේප් තුඩුව ඔස්සේ)	මාස 3–4 දක්වා
5. කැල්ටෙක්ස් ...	කලවම් අමුතෙල් ...	ඩොලර් 13.29 මැ. ටො. 1	මාස 4 යි.
6. ගල්ෆ් සංස්ථාව ...	අගාජාරි ...	දන්වා නොමැත ...	මාස 3 යි

මේ හැර "කොන්සොලිඩේටඩ්" සහ එසෝ ඉන්ටනැෂනල් සමාගම් සාධාරණ කොන්දේසි මත තාර්මික සහයෝගතා දැක්වීමට එකගත්වය පළකොට ඇත. "ගල්ෆ් සමාගම" කිසි අය කිරීමක් නොමැතිව තාර්මික සහයෝගතා දැක්වීමට එකඟත්වය පළ කොට ඇත. අනෙක් සමාගම් තාර්මික සහයෝගතා උදෙසා පිළිගතහැකි ක්‍රමයක් ඉදිරිපත් කොට නැත. ඉහත 4 හි සඳහන් සමාගම විසින් සැපයීමට බලාපොරොත්තු වන අමුතෙල් වර්ගය අගා ජාරි වර්ගය තරම් හොඳ වර්ගයක් නොවේ. තවද සෝවියට් දේශයේ මෙම අමුතෙල් ලබාගන්නේ නම් කේප් තුඩුව වටා එම ද්‍රව්‍ය ගෙන ඒම සඳහා නැව් ගාස්තු වශයෙන් සෑම ටොන් එකක් වෙනුවෙන් ඩොලර් 4.12 ක අමතර වියදමක් දැරීමට සිදුවේ. කොන්සොලිඩේටඩ් සමාගම විසින් අමුතෙල් සැපයීමට පොරොන්දු වී ඇති මිළ 1971 දී නැවත වෙනස් කිරීමට කොන්ත්‍රාත්තුවෙන් බලය තිබේ. එසෝ සමාගම විසින් සැපයීමට පොරොන්දු වූ මිළ අවුරුදු 5 ක් යනතෙක් එසේම තිබිය යුතු යයි ඔවුන් පවසන ලදී.

(ආ) තෙල් පිරිපහදුවේ කොන්ත්‍රාත්තුව ඉතාලියේ රජයට අනුබද්ධ ආයතනයක් වන ඊ. එන්. අයි. සමාගමේ ශාඛාවක් වන "ස්නාම් ප්‍රොජට්" සමාගම වෙත භාර දෙන ලදී. එම කොන්ත්‍රාත්තුව අනුව ලාංකික සිවිල් ඉංජිනේරු සමාගම්වල සේවය ලබා ගැනීමට ඔවුන්ට අවකාශ ලැබුණ නමුත් එම සේවාවන් ඔවුන් විසින් ලබා නොගන්නා ලදී. "යුනිවර්සල් ඔයිල් ප්‍රොඩක්ට්ස්" සමාගම අමුතෙල් වර්ගීය නිර්ණය කිරීමේදී සංස්ථාවට උපදෙස් දෙන ලද අතර, පිරිපහදුවේ ඇතැම් අංශ ඔවුන්ගෙන් බලපත්‍ර මත ලබාගන්නා ලද අවසර අනුව ක්‍රියා කිරීමට සිදුවේ. "ස්නාම් ප්‍රොජට් සමාගම" විසින් පිරිපහදුව ගොඩ නැගීමේ කටයුතු මොවුන් විසින් පරීක්ෂා කරන ලදී.

(*a*) (i) Iran. (ii) (*a*) Purchase of the bulk of the requirements was made from the Consolidated Petroleum Supply Co. Ltd. of Shell Centre, London S. E. 1. (*b*) A small quantity was purchased for delivery in 1970 from the Continental Oil Co. of New York ; (iii) The Consolidated Petroleum Co. was selected after tenders were invited for—

(*a*) Supply of Crude,
(*b*) Supply of freight,
(*c*) Rendering of technical assistance, including training of Ceylonese, and
(*d*) Buy-back of surplus products.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Continental Oil Co. was selected after quotations from a number of interesed independent suppliers were obtained; (iv) The names and addresses of the various tenders are—

(1) Esso International Inc., 15 West 51st Street, New York.

(2) Consolidated Petroleum Supply Co., Ltd. Shell Centre, Lon. S. E. 1.

(3) California Texas Oil Corporation, 380 Madison Avenue, New York (Caltex).

(4) Duncan Brothers & Co. Ltd. Duncan House, 31 Netaji Subhas Road, Post Box 189, Calcutta-1 and Phillips Petroleum International Corporation, Oklahoma, U. S. A.

ලිඛිත පිළිතුරු

(5) Gulf Oil Corporation, Crude Oil Dept., Pittsburgh Pa. 15230, U. S. A.

(6) V/O "SOJUZNEFTEEXPORT", Somlenskaja, Sennala Pl. 32/34, Moscow, U. S. S. R.

Only two parties, Esso International and Consolidated quoted terms in respect of all supply and service requirements in their tenders. The more important terms concern the price on cost and freight basis and credit in respect of payment of cost and freight. The relevant offers were :

		Crude Type	*C. & F. Price*	*Credit Terms*
1.	Consolidated ..	Agha Jari ..	£ 12.15 per metton..	6 months
2.	Esso International ..	Agha Jari ..	£ 12.32 per metton..	3 months for crude & no credit for freight
3.	Duncan Brothers ..	Agha Jari ..	£ 12.50 ..	No credit terms
4.	V/O "SOJUZNEF TEEXPORT"	Romashkins-kaya	(*a*) via Suez £ 14.52 per mettton	3-4 months
			(*b*) via Cape £ 18.64 per metton	3-4 months
5.	Caltex ..	Spiked Crude	£ 13.29 ..	4 months
6.	Gulf Corporation ..	Agha Jari ..	No price offered but prepared to negotiate	3 months

Besides, Consolidated and Esso International also offered technical assistance on reasonable terms. Gulf offered free technical assistance. The others did not offer any reasonable terms for technical assistance. The crude offered by No. 4 is inferior to Agha Jari. Also, Soviet crude would cost £ 4.12 per ton more if it is transported round the Cape. The price offered by Consolidated is subject to revision after two years, i.e. in 1971, whereas Esso International wanted their price to hold good for five years. (*b*) The Refinery contract was awarded to SNAM PROGETTI of Milan a subsidiary of the Italian State-owned Ente Nazionale Idrocarburi (ENI) Organization. In terms of the contract, they were permitted to sub-contract to local contractors civil engineering works but they did not do so. The Universal Oil Products Company acted as the consultants of the corporation for selection of the crude oil and for supervision of the construction of the refinery. The contractors were also required to use process designs developed by the Universal Oil Products Company for most of the production units under licence from them.

කිතුල්වල මිනින්දෝරු පිඹුර

கித்துல்வல நில அளவைப்படம்

SURVEY MAP OF KITULWELA

93/69

ලක්ෂ්මන් ජයකොඩි මයා. (දිවුලපිටිය)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலப்பிட்டிய)
(Mr. Lakshman Jayakody—Divulapitiya)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කිතුල්වල ග්‍රාමයෙහි මාර්ගම් යනාදිය දක්වෙන නිවැරදි මිනුම් දෝරු පිඹුරක් කොළඹ කච්චේරිය වෙත නිකුත් කරන ලෙසට මිනුම්දෝරු දෙපාර්තමේන්තුවට එතුමා නියෝග කරනවාද? (ආ) නො එසේනම් ඒ මන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මයා.]
காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) கித்துல்வல என்ற கிராமத்தின் எல்லைகள் முதலிய விபரங்களைக் காட்டுஞ் சரியான நில அளவைப்பட மொன்றை வெளியிடும்படி நில அளவைத் திணைக்களத்தைப் பணிப்பாரா? (ஆ) இல்லையெனில், ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Will he direct the Survey Deartment to issue to the Colombo Kachcheri the correct survey map of the village of Kitulwela stating the village boundaries, etc.? (*b*) If not, why?

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)

(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(අ) නැත. (ආ) කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලය ආදායම් නිලධාරි කොට්ඨාශයේ යටිගහ පත්තුවේ පිහිටි කිතුල්වල ගම ලංකා මැනුම් යටතේ, මැනීම් කර නැත. එබැවින් මෙම ගමේ මායිම් හා වෙනත් විස්තර පෙන්නුම් කරන ප්ලෑනක් නො පවතී.

(அ) இல்லை. (ஆ) கொழும்பு மாவட்டத்தில் ஹாபிடிகம் கோராளை வருவாய்த்துறை அலுவலரின் பகுதியில், யடிகஹ பத்துவில் சூழமைவுற்ற கிதுல்வல என்ற கிராமம் இலங்கை நில அளவை கீழ் அளவாய்வு செய்யாதபடியால் இந்தக் கிராமத்தின் எல்லைகளையும், மற்றும் நுணுக்க விபரங்களையும் காட்டும் படமொன்று இராது.

(*a*) No. (*b*) Kitulwela Village in Yatigaha Pattuwa of Hapitigam D. R. O's Division in Colombo District has not been block surveyed. As such a plan of this village showing its boundaries together with other details does not exist.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org